# විශාඛුපෝසථ සූත්‍රය

නා උයන ආරණ්‍යස්ථ ශ්‍රී සම්බුද්ධ
ශාසන අනුග්‍රහ සමිතිය
නා උයන ආරණ්‍ය සේනාසනය,
පන්සියගම.

සම්පාදක :-
පූජ්‍ය නිකපිටියේ ගුණරතන හිමි.

(ධර්මදානය පිණිසයි)

ශ්‍රී බුඃ වඃ 2561 වූ අධි වෙසක් මස පුර පසළොස්වක නම් තිථිය ලත් රවි ද    ව්‍යඃ වඃ 2018. 04. 29

# පෙරවදන

**"සබ්බ දානං ධම්ම දානං ජිනාති"**

**"ධර්ම දානය සියලු දානයන් පරදවා ජයගනී"**

බුදුරජානන් වහන්සේ වදාළ ධර්මය දේශනා කිරීම ද, කරවීම ද, දහම් පොත් බෙදාදීම ද ධර්ම දානයට අයත් වන්නේය. අනිත් සියලු දානයන්ට වඩා ධර්ම දානය උතුම් ය.

පූජ්‍ය නිකපිටියේ ගුණරතන ස්වාමින් වහන්සේ නා උයන ආරණ්‍යස්ථ ශ්‍රී සම්බුද්ධ ශාසන අනුග්‍රහ සමිතියේ ආරාධනය මත සකස්කර ඇති මෙම විශාඛුපෝසථ සූත්‍ර දේශනාව පෙළෙහි කෙටි දේශනයකි. පූජ්‍ය නිකපිටියේ ගුණරතන ස්වාමින්වහන්සේ අට්ඨකතා අනුසාරයෙන් වැදගත් කරුණු රාශියක් එකතුකර මෙම දහම් පොත සකස් කර ඇති ආකාරය ඉතා ප්‍රශංසනීය ය. පොත් කීපයක් පෙරලා දැනගත යුතු කරුණු රාශියක් මෙම දහම් පොත පරිශීලනය කිරීමෙන් පහසුවෙන් දැනගත හැක. මෙම දහම් පොත කියවද්දී මට දැනුනේ කුඩා ධර්ම විශ්වකෝෂයක පිටු පෙරලන්නා සේ ය. පූජ්‍ය ගුණරතන ස්වාමින් වහන්සේට මෙවැනි දහම් පොත් තව තවත් ලිවීමට අවස්ථාව ලැබේවායි ආශිංසනය කරමි. මෙම දහම් පොත පරිශීලනය කරන සැමටම අත්වන දහම් දැනුම නිවන් පිණිසම හේතුවේවා. මෙම ධර්ම දානමය කුසලය පූජ්‍ය ගුණරතන ස්වාමින් වහන්සේට නිවන් අවබෝධය පිණිසම උපනිශ්‍රය වේවා. හැදූ වැඩූ දෙමාපියන්ටත් මෙම කුසලය අත්පත් වීමෙන් නිවන් අවබෝධ කරත්වා.

මෙම දහම් පොත සකසා මුද්‍රණය කළ මුද්‍රණාලයාධිපතිතුමාත් සේවක මණ්ඩලයත් නිවන් අවබෝධ කරත්වා.

මේ වගට
සසුන් ලැදි,
පූජ්‍ය මීගොඩ සංඝසෝභන ස්ථවිර
2018-03-19.

# හැඳින්වීම

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

**"ද්වේ'මානි භික්ඛවෙ දානානි, ආමිසදානඤ්ච, ධම්මදානඤ්ච. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං දානානං යදිදං ධම්මදානන්ති".**
(ඛු: නි: ඉති: ති: නි: දාන සූත්‍රය)

මහණෙනි මේ දාන දෙකකි. ආමිස දානය හා ධර්ම දානයයි. මහණෙනි මේ දාන දෙක අතරින් මේ ධර්මදානය අග්‍ර වන්නේය.

දිය යුත්ත **දානය** නම් වේ. එයින් චීවර-පිණ්ඩපාත-සේනාසන-ගිලන්පස බෙහෙත් පරිෂ්කාරාදිය දන්දීම **ආමිස දානය** නම් වේ. ඒවා තණ්හා දිට්ඨි ආදියෙන් ස්පර්ශ කළයුතු බැවින් **ආමිසයයි** කියනු ලැබේ.

ඒ ආමිස චේතනාවෙන් පරිත්‍යාග කළයුතු බැවින් **ආමිස දානය** නම් වේ. මේ ආමිස වනාහී සියලු දානයන්ගේ නිදානය හෙවත් මූල හේතුවයි. සියලු සම්පත්තීන්ගේ මූලයයි.

මෙලොව යමෙක් මේ කුසලධර්මය, මේ අකුසලධර්මය, මේ වැරදිධර්මය ය, මේ නිවැරදිධර්මය ය, මේ නුවණැත්තන් විසින් ගැරහිය යුතු ධර්මය, මේ නුවණැත්තන් විසින් පැසසිය යුතු ධර්මය, මේ ධර්මය අහිත පිණිස දුක් පිණිස පවතී. මේ ධර්මය හිතසුව පිණිස පවතී; යනුවෙන් ත්‍රිවිධ ද්වාරයෙන් සිදුකරන කුසල-අකුසල වශයෙන්, කර්ම-කර්මපථ වශයෙන් බෙදමින්, කර්මය-කර්මවිපාකය වශයෙන් බෙදමින් මෙලොව පරලොව ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්වන්නාක් මෙන් ප්‍රකට කරමින් අකුසල ධර්මවලින් වළක්වමින් කුසල ධර්මයන්හි පිහිටුවමින් ධර්මදේශනා කිරීම, දහම් පොත් ලියා බෙදා දීමාදීය **ධර්මදානය** නම් වේ.

යමෙක් මේ ධර්ම අනිත්‍යාදී විශිෂ්ටාකාරයෙන් දතයුතු ධර්මයෝ ය, මේ ධර්ම අනිත්‍යාදී වශයෙන් දතයුතු දුක්ඛ ධර්මයෝ ය, මේ ධර්ම දුරු කළයුතු ය, මේ ධර්ම වැඩිය යුතු ය, මේ ධර්ම ප්‍රත්‍යක්ෂ කළ යුතු ය යැයි චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකට කරමින් නිර්වාණාවබෝධය පිණිස ප්‍රතිපත්ති මාර්ගය දේශනා කරයි ද, දහම් පොත් ලියා ධර්මදාන වශයෙන් බෙදා දෙයි

ද මෙය උසස්ම ධර්ම දානය අග්‍ර ම ධර්ම දානය වේ. මේ නිවන පිණිස හේතුවන ධර්මදානය හේතුවෙන් සියලු අනර්ථයන්ගෙන් මිදෙයි. සියලු සසර දුක් ඉක්මවයි.

මෙසේ අග්‍ර ආනිශංස ගෙනදෙන ධර්ම දානමය කුසලයක් සිදුකර ගැනීමේ අදහසින් යුතුව උපෝසථ සීලය පිළිබඳව පරිපූර්ණ වූ අර්ථ විවරණයක් මෙයින් ඉදිරිපත් වේ. මෙසේ වූ මහඟු ධර්මදානමය කුසලයක් සිදුකර ගැනීමට මූල හේතුව වූයේ නා උයන ආරණ්‍යස්ථ ශ්‍රී සම්බුද්ධ ශාසන අනුග්‍රහ සමිතියේ සභාපති පින්වත් **පේමරත්න මහත්මා** විසින් නා උයන ආරණ්‍යයෙහි පොහොය දිනයන්හි සීල භාවනාවෙහි යෙදෙන පින්වතුන්ගේ ප්‍රයෝජනය සඳහා විශාඛුපෝසථ සූත්‍රයෙන් ග්‍රන්ථයක් සකස්කර දෙනලෙස කළ ආරාධනයයි.

මෙම ග්‍රන්ථයෙන් උපෝසථ සීලයක් සමාදන් වන පින්වතුන්ට ආර්‍ය්‍ය මහෝත්තමයන්ගේ පැවතුම් අනුව පවතිමින් මනාකොට කෙලෙස් ලියාලන කුසල් ධර්ම වැඩිදියුණු කරන පිළිවෙත, පිරිසිදු මග කියා දෙයි. එසේම බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, දේවතානුස්සති යන අනුස්සති භාවනාවන් ද, අෂ්ටාංග උපෝසථ සීලය පිළිබඳව ද, සිල්ගුණ පිරීමට බාධා පමුණුවන කෙලෙසුන් පිළිබඳව ද පූර්ණ විවරණයක් ඉදිරිපත් වේ. එබැවින් මෙය කියවා බලන පින්වත් සැමට නිවැරදිව ආර්‍ය්‍ය මාර්ගය අනුගමනය කොට සියලු බාධක ජයගෙන සුවසේම නිර්වාණාවබෝධය සිදුකර ගැනීමට මෙම ධර්ම ග්‍රන්ථය ද, ධර්මදානමය කුසලය ද මහෝපකාරී වේවා!

මෙම උදාර ධර්ම දානමය කුසලය නිවීගෙන යන පහනකට තෙල් දමා නැවත පහන් ආලෝකය දීප්තිමත් කරමින් බොහො දෙනාට ආලෝකය ලබාදෙන්නාක් මෙන් නිවීගෙන ගිය ධ්‍යාන, සමාධි, සමාපත්ති, අභිඥා, විදර්ශනා ඥානාදී වූ ප්‍රතිපත්ති ශාසනය නැවත පණගන්වමින් නැවත බොහෝ කාලයක් වේනෙය්‍ය ජනයාට පර්‍ය්‍යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ ශාසනයන් ශක්තිමත් කරමින් සම්බුදු සසුනට මහත් ආලෝකයක් වූ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාව පිහිටුවා වදාළ රාජකීය පණ්ඩිත අති පූජනීය කඩවැද්දුවෙ ශ්‍රී ජිනවංශාභිධාන මහා ස්වාමින් වහන්සේට ද, තත් සංස්ථාවේ ප්‍රධානාචාර්‍ය්‍ය අති පූජනීය මාතර ශ්‍රී ඤාණාරාම මහා ස්වාමින් වහන්සේට ද, යෝගාශ්‍රම සංස්ථාවේ චූඩා

මාණික්‍ය බඳුව වැඩසිට සසුනඹර බබුළුවමින් දෙස් විදෙස් ධර්මකාමීන්ට පරම කල්‍යාණ මිත්‍රයන් වහන්සේ වූ ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය මහා කර්මස්ථානාචාර්ය අති පූජනීය නා උයනේ මහා ස්වාමින් වහන්සේට ද සුවසේම සමත්‍රිංශත් පාරමී ගුණ සපුරා ලොවුතුරු බුදුබව ලබන්නට හේතු වේවායි විශේෂයෙන් පුණ්‍යානුමෝදනා කරමි.

එසේම නිර්මල වූ ඍජු වූ සම්‍යක් ප්‍රතිපත්ති මාර්ගය ලොවට හඳුන්වා දෙමින් සසුනඹර බබුළුවමින් වයෝවෘද්ධව තපෝවෘද්ධව ගුණෝවෘද්ධව සීල වෘද්ධව මහා ගුණස්කන්ධයකින් පරිපූර්ණව සුපෙශල ශික්ෂාකාමී අල්පේච්ඡ දිවියක් ගෙවමින් වැඩසිටින අග්ගමහා කර්මස්ථානාචාර්ය අති පූජනීය උ ආචිණ්ණ (පා අවුක් සෙයාඩො) මහා ස්වාමින් වහන්සේට ද, නා උයන ආරණ්‍ය සේනාසනයෙහි ප්‍රධානාචාර්ය අති පූජනීය මීගොඩ සංඝසෝභන මහා ස්වාමින් වහන්සේ, ප්‍රධාන කර්මස්ථානාචාර්ය අති පූජනීය අඟුල්ගමුවේ අරියනන්ද මහා ස්වාමින් වහන්සේ ප්‍රධාන ප්‍රතිපත්තිකාමී මහසඟරුවනට ද ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම වාසී වූද, ලක්වැසි වූද, ලෝවැසි වූද සියලු මහසඟරුවනට ද ශාසනානුග්‍රහය දක්වමින් උසස් ගුණ සපුරා නිවන් සුව සුවසේ ලබත්වා යැයි ආශිර්වාද ප්‍රාර්ථනා කරමි. එසේම මවුපිය ඤාත්‍යාදී සැමට ද, සදේවක ලෝකවාසීන්ට ද නිවන් සුව සුවසේ ලබනට හේතුවේවා යි ප්‍රාර්ථනා කරමි.

මේ මහගු කුසලයෙහි දයකත්වය දරන්නා වූ නා උයන ආරණ්‍යස්ථ ශ්‍රී සම්බුද්ධ ශාසන අනුග්‍රහ සමිතියේ සැමට ද, මෙම ග්‍රන්ථයෙහි සෝදුපත් බලා නිවැරදි කොට දුන් ගරු ස්වාමින් වහන්සේලාට ද, මෙම ග්‍රන්ථය මනාව මුද්‍රණය කරදුන් යක්කල දිමුතු මුද්‍රණාලයෙහි අධිපති තුමා ප්‍රධාන කාර්ය මණ්ඩලයෙහි සැමට ද ශාසනානුග්‍රහය දක්වමින් උසස් ගුණ පුරා නිවන් සුව සුවසේ ලබන්නට හේතු වේවා යි ප්‍රාර්ථනා කරමි.

මෙයට මෙතැති,
නිකපිටියේ ගුණරතන හිමි,
2018 - 03 - 31

# පටුන


පෙරවදන ........ III

හැඳින්වීම ........ IV

විශාඛුපෝසථ සූත්‍රය ........ 1

❄ සූත්‍ර නිදානය ........ 1

❄ ප්‍රථම ධර්ම සංගායනාව ........ 2

☸ ආනන්ද තෙරුන් රහත්වීම ........ 9

☸ විනය සංගායනා කිරීම ........ 10

☸ ධර්මය සංගායනා කිරීම ........ 11

☸ ධර්ම විනය බෙද දැක්වීම ........ 12

❄ විශාකුපෝසථ සූත්‍ර සංගායනාව ........ 17

☸ නිසි බුද්ධෝපස්ථායෙකු නොවීම ........ 17

☸ නිත්‍ය උපස්ථායෙකු පත් කර ගැනීම ........ 19

☸ ප්‍රතික්ෂේප සතර ........ 20

☸ ආයාචනා සතර ........ 21

❄ විශාඛාවගේ උත්පත්තිය ........ 27

❄ විශාඛාව සෝවාන් ආර්‍ය්‍ය ශ්‍රාවිකාවක් වීම ........ 29

❄ සාකේත නුවර ඉදිවීම ........ 30

❄ විශාඛාවගේ විවාහය ........ 31

❄ මිගාර සිටු පවුල ආර්‍ය්‍ය ශ්‍රාවකයින් වීම ........ 43

❄ පූර්වාරාම මහා විහාරය ඉදිවීම ........ 46

❄ පූර්වාරාම විහාර පූජාව ........ 48

❄ ගෝපාලක උපෝසථය ........ 56

❄ නිඝණ්ඨ උපෝසථය ........ 57

❄ ආර්‍ය්‍ය උපෝසථය ........ 60

☸ බුද්ධ උපෝසථය ........ 60
☸ ධර්‍ම උපෝසථය........ 70
☸ සංඝ උපෝසථය ........81
☸ සීල උපෝසථය ........85
☸ දේවතා උපෝසථය........87
☸ ආයර්‍ය උපෝසථය........89
❄ උපෝසථ සීලයෙහි පිහිටිය යුතු ආකාරය ........ 96
❄ ශික්‍ෂාපදයන්හි අර්‍ථ විවරණය........98
☸ පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි ........98
☸ අදින්නාදනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි........106
☸ අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි. ........114
☸ මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි ........116
☸ සුරාමෙරය මජ්ජ පමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි ..... 120
☸ විකාලභොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි........123
☸ නච්ච ගීත වාදිත විසූකදස්සන මාලාගන්‍ධවිලෙපන ධාරන මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.........125
☸ උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි ........127
❄ උපෝසථ සිල් සමාදන්ව කළයුතු කථා හා නොකළ යුතු කථා ........128
☸ තිරච්ඡාන කථා සූත්‍රය........128
☸ සිල්වතුන් විසින් කළයුතු දස කථා........ 131
❄ සීලයට හානිකර වූ අන්තරායක ධර්‍ම සිවුතිස ........135

# විශාඛූපෝසථ සූත්‍රය

## නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස

### ❄ සූත්‍ර නිදානය

භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර මිගාර මාතා නම් වූ විශාඛා මහ උපාසිකාව විසින් සකස් කොට පූජා කරන ලද මිගාරමාතුප්‍රාසාදය නම් වූ පූර්වාරාමයෙහි වැඩසිටි දිනක මෙම විශාකූපෝසථ සූත්‍රය විශාඛා මහ උපාසිකාවට දේශනා කොට වදාළ සේක. ඒ පිළිබඳ අර්ථ විවරණය මෙසේය.

**"එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ."**

**"මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර මිගාරමාතු ප්‍රාසාදය නම් වූ පූර්වාරාමයෙහි වැඩ වසන සේක."**

බුද්ධුපස්ථායක වූ ආනන්ද තෙරුන් වහන්සේ විසින් ප්‍රථම සංගායනා කාලයෙහි ධර්ම සංගායනා කරන්නා වූ ආයුෂ්මත් මහා කාශ්‍යප මහරහතන් වහන්සේ විසින් විමසන ලදුව පන්සියයක් මහරහතන් වහන්සේලා හට මෙසේ ඉදිරිපත් කළේ ය. මෙම සූත්‍ර දේශනාව අංගුත්තර නිකායේ තික නිපාතයේ දෙවන පණ්ණාසකයේ මහා වර්ගයෙහි එන දසවන සූත්‍ර දේශනාවයි.

භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ වනාහී සියලු ධර්මයන් තමන් වහන්සේ විසින් ම අවබෝධ කරගත් සේක. ආචාර්යයවරයෙකු නොමැත්තේය. ලෝක නාථ වූ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදු රජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවෙහි පටන් සුභද්‍ර පරිබ්‍රාජක තුමා හික්මවීම දක්වා වූ පන්සාලිස් වස තුළ කළ

යුතු සියලු බුද්ධ කෘත්‍යයෙන් සම්පූර්ණ කොට කුසිනාරා නුවර උපවර්තන නම් මල්ල රජ දරුවන්ගේ සල් වනයෙහි යමක ශාල වෘක්ෂයන් අතර පනවන ලද උතුම් බුද්ධාසනයෙහි නැවත නො නැගිටිනා සෙය්‍යාවෙන් වැඩ හිඳ වෙසක් පුර පසළොස්වක පොහෝදින අළුයම් වෙලෙහි අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ සේක.

## ❄ ප්‍රථම ධර්ම සංගායනාව

තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය නිමිත්තෙන් රැස් වූ සත් ලක්ෂයක් භික්ෂු සංඝයා වහන්සේ අතර සංඝ ස්ථවිර වූ මහා කාශ්‍යප මහරහතන් වහන්සේ තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් සත්වන දින පාවා නුවර සිට කුසිනාරාව වෙත වඩිමින් සිට මඳක් විවේක ගැනීම පිණිස මාර්ගයෙන් ඉවත්ව එක් වෘක්ෂ මූලයක වැඩසිටි සේක. එකල්හි පාවා නුවර වැසි එක් උපාසකයෙක් බුද්ධ ශරීරයට ගෞරව දක්වා දෙවියන් විසින් ආකාශයෙහි සිට බුදු සිරුරට පූජා කරන ලද පාත්‍රයක් පමණ වූ දිව්‍යමය මදාරා මලකුත් රැගෙන පාවා නුවර වෙත යමින් සිට මහා කාශ්‍යප මහරහතන් වහන්සේ වෙත පැමිණ වැඳ සිටියේ ය. එවිට තෙරුන් වහන්සේ ඒ උපාසක තුමාගෙන් **"කොහි සිට එන්නේ ද"** යැයි අසා සිටියේ ය. ඔහු කුසිනාරාවෙහි සිට ආවෙමි යැයි කීවේ ය. **"අපගේ ශාස්තෲන් වහන්සේ දන්නෙහි ද"** යැයි තෙරුන් වහන්සේ විචාළේ ය. තථාගතයන් වහන්සේ පිරිනිවී සත් දවසක් වන බව කීවේ ය. එය අසා රහතන් වහන්සේලා ද, අනාගාමී ආර්යයන් වහන්සේලා ද ධර්ම සංවේග උපදවා ගත්හ. කාම රාග ව්‍යාපාද ප්‍රහීණ නොවුණු බැවින් සෝවාන්, සකෘදාගාමී ආර්යයන් වහන්සේලා ද, කල්‍යාණ පෘථග්ජන භික්ෂූන් වහන්සේලා ද අඬා වැලපෙන්නට වූහ.

ඒ අවස්ථාවේ සුභද්‍ර නම් මහලු පැවිද්දෙක් ඒ පිරිසෙහි සිටියේ ය. එම භික්ෂුව පූර්වයෙහි ආතුමා නුවර කරණවෑමියෙකුව සිට වයස්ගතව පැවිදි වූවෙකි. මහලු වයසේ සිටි බැවින් දරුවන් ලවා තම ගෙවත්තෙහිම කුටියක් සාදවාගෙන එහි සිටිමින් තම දරුවන්ගේ කෙස් රැවුල් කපමින් ජීවිකාව කළේ ය. එක් චාරිකා සමයක තථාගතයන් වහන්සේ එක්දහස් දෙසිය පනසක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමග

කුසිනාරා නුවර සිට ආතුමා නුවරට වැඩි සේක. එකල්හි එම භික්ෂුව තථාගතයන් වහන්සේ විශාල සඟ පිරිසක් සමග වඩින්නේය යැයි අසා සාමණේර භාවයෙන් සිටි තම දරුවන් දෙදෙනා අමතා **"දරුවනි, නුඹලා ගොස් හිස කෙස් කැපීමට උවමනා උපකරණ රැගෙන ගෙයක් පාසා ඇවිද මිනිසුන්ගේ කෙස් රැවුල් කපා ලුණු තෙල් හා අනුහව කළ යුතු දේ රැස්කරවු. භාග්‍යවතුන් වහන්සේ ප්‍රධාන සංඝයාට බෙහෙත් කැඳ දනයක් දෙන්නෙමු"** යැයි කීවේ ය. ඒ සාමණේර පැවිද්දෝ ද එසේ කළහ. භාග්‍යවතුන් වහන්සේ වැඩි කල්හි මිනිසුන්ගේ ද අත් උදව් ඇතිව එලෙස එක්රැස් කරන ලද දෙයින් භොජ්ජ යාගුවක් (ඝන කැඳක්) සෑද වූහ. ගිතෙල්, මී පැණි, මත්ස්‍ය, මාංශ, මල් ඵල රසාදිය ද, යම් කෑ යුතු දෙයක් වේ ද ඒ සියල්ල එහි දැම්මවී ය. තව ද හකුරු යොදා කරන ලද **"මධුගෝළක"** නම් කැවිලි ද පිළියෙල කරවීය. මෙයට **"අතිරස කැවුම්"** යැයි ද, **"මධුසීසක"** යැයි ද කියනු ලැබේ. මේ සියල්ල දන්නා භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග නගරයට පිඬු පිණිස වැඩි සේක. මිනිස්සු **"භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග නගරයට පිඬු පිණිස වඩියි, ඔබ කාට කැඳ පිළිගන්වන්නෙහි ද"** යැයි එම භික්ෂුවට කීහ. එවිට ඒ භික්ෂුව කලබල වී භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට ගොස්, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කැඳ පිළිගන්නා සේක්වා"** යැයි ආරාධනා කළේ ය. භාග්‍යවතුන් වහන්සේ **"මහණ, නුඹ කෙසේ කැඳ සැකසුවේ ද"** යැයි අසා ගර්හා කොට අකප්පිය සමාදනය ද, **"පූර්වයෙහි භාවිතා කළ කරණවෑම් බඩු පාවිච්චි නොකළ යුතුය"** යැයි ද මෙසේ ඒ භික්ෂුව නිමිති කොට දුෂ්කට සිකපද දෙකක් පනවා දහැම් කථාවක් කොට භික්ෂූන් අමතා මෙසේ වදාළ සේක. **"මහණෙනි, අනේක කල්ප කෝටි ගණනක් භෝජනය සොයන්නවුන් සමගම මේ දීඝී සංසාරයේ කල් ගත කරන ලදී. මෙය වනාහී නුඹලාට අකැප ය. මේ අධර්මයෙන් උපයා ගත් භෝජනය පරිභෝග කළවුන් අනේක වූ ආත්මභාව සිය දහස් ගණනක් අපායෙහි ම උපදින්නෙහි ය. ඉවත් වන්න, මෙය පිළිනොගන්න"** යැයි වදරා පිඬු පිණිස වැඩි සේක. එක් භික්ෂුවකුදු එය පිළි නොගත්හ. සුභද්‍ර භික්ෂුව නොසතුටුව **"මොහු සියල්ල දනිම් යි ඇවිදියි. ඉදින් නොගනු කැමැත්තෙහි නම් එය කිය යුතු නොවන්නේ ද, මා වෙහෙසීමෙන් කරන ලද සියල්ල මොහු විසින් නසන ලද්දේය. මොහු මා කෙරෙහි හිතවත් බවක් නැත්තේය"** යැයි තථාගතයන් වහන්සේ සමග වෛරී ව සිට තථාගතයන් වහන්සේ ජීවමාන ව සිටියදී

කිසිවක් කියන්නට නොහැකිව සිට පිරිනිවියේ යැයි අසා සතුටු ව අඬා වැලපෙන භික්ෂූන් අමතා මෙසේ කීවේ ය.

**"ඇවැත්නි, ශෝක නොකරවු. නොවැළපෙව්. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් සම්පූර්ණයෙන් මිදුණෝ වෙමු. ඒ මහා ශ්‍රමණයා මෙය නුඹලාට කැපය, මෙය නුඹලාට අකැපය යනාදී ලෙස සිකපද පනවමින් අපි පීඩාවට පත්කරනු ලැබුවෝ වෙමු. දැන් අපි ඒ ගැහැටවලින් නිදහස් වූවෝ වෙමු. එබැවින් දැන් අපි යමක් කැමැත්තෙමු නම් එය කරන්නෙමු. යමක් අකැමැත්තෙමු නම් එය නොකරන්නෙමු"** යැයි මේ වචනය කීවේ ය.

මේ වචනය මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට හදවතට වැදුණු පහරක් මෙන් ද, හිසට පහත් වූ වියලි හෙනයක් මෙන් ද හැඟී ගියේය. මහත් වූ ධර්ම සංවේගයක් හට ගත්තේ ය. තෙරුන් වහන්සේ සිතන සේක් **"සත් දිනකට පෙර භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ නමුත් අද ද ඒ බුදු සිරුර රන් පැහැයම ය. භාග්‍යවතුන් වහන්සේ විසින් දුකසේ ගොඩනැගූ සසුනෙහි පාපී කසටක්, කටුවක් හට ගත්තේ ය. මෙවන් පාපී පුද්ගලයන්ට වැඩෙන්නට ඉඩ ලැබුණ හොත් තවත් සහායකයන් ලැබ ශාසනය පසු බස්සවන්නට හැකි වන්නේ ය. ඉදින් වනාහී මම මේ මහල්ලා ව මෙහි දී ම රෙදි කඩක් අන්දවා අළු විසුරුවා බැහැර කරන්නෙම් නම්, මිනිස්සු ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ දේහය තිබිය දී ම ශ්‍රාවකයෝ විවාද ඇති කර ගනිති යැයි අපට දෙස් පවරන්නාහුය"** යැයි සිතා නැවත ද සිතන සේක් "භාග්‍යවතුන් වහන්සේ විසින් එකට එකතු නොකළ මල් රාශියක් මෙන් ධර්මය දේශනා කරන ලදී. එහි යම් සේ වාතය වැදීමෙන් සමහර මල් විසිරී යයි. එපරිද්දෙන් මෙබඳු පව්ටු පුද්ගලයන් නිසා කල් ගතවන විට විනයෙහි සිකපද එක දෙක බැගින් විනාශ වී යන්නේ ය. සූත්‍රයන්හි එකක් දෙකක් ප්‍රශ්න වාරයන් නැසී යන්නේ ය. අභිධර්මයෙහි එක දෙක වෙනස් වෙනස් වාරයන් නැසී යන්නේ ය. මෙසේ පිළිවෙලින් මුල නැසුණු කල්හි අපි පිසාචයන් හා සම වූවෝ වෙමු. එබැවින් ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමි. මෙසේ ඇති කල්හි ශක්තිමත් නූලකින් ගැට ගසන ලද මල් මාලාවක් මෙන් ධර්මය, විනය දෙක ස්ථිරව පිහිටන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මේ සඳහා ම මට පෙර ගමන් කළ සේක. අවවාද තුනකින් උපසම්පදාව දුන් සේක. කයින් සිවුරු මාරු

කළ සේක. මේ සියල්ලට වඩා අසාධාරණ වූ නවානුපූර්වී විහාර සමාපත්තීන්ගෙන් සම තැන තැබූ සේක. මෙසේ තමන් වහන්සේ හා සම තැන්හි තැබීමෙන් අනුග්‍රහ කරන ලද මට ධර්මය, විනය සංගායනාව හැර අන් කිනම් මඟකින් ණය නැති බවක් වන්නේ ද, සක්විති රජෙක් තමන්ගේ සන්නාහයත් ආශ්චර්යයත් දීමෙන් ස්වකීය කුල වංශය පිහිට වූ පුතුට මෙන් භාග්‍යවතුන් වහන්සේ **"මෙතෙම මාගේ සද්ධර්ම වංශය පිහිටුවන්නෙක් වන්නේ ය"** යැයි දැන මේ අසාධාරණ අනුග්‍රහයෙන් මට අනුග්‍රහ කළ සේක" යැයි සිතුවේ ය. එසේම "**මා වැනි භික්ෂූන් වහන්සේලා සිටියදී මේ පාපියෙකුට සසුනෙහි දියුණු වන්නට ඉඩක් නොතැබිය යුතු ය. යම්තාක් අධර්මය අවිනය නො බැබළේ ද ඒ තාක් ධර්මයත් විනයත් පසු බසින්නේ නැත. යම් විටෙක අධර්මය අවිනය බැබළේ ද එවිට ධර්මයත් විනයත් පසු බසින්නේ ය. එබැවින් අධර්මවාදීන් අවිනයවාදීන් බලවත් වීමට පෙර ධර්මවාදීන් විනයවාදීන් දුබල වීමට පෙර ධර්ම - විනය දෙක සංගායනා කරන්නේනම් මැනවි**" යැයි සිතා ඒ මොහොතේ කිසිවක් නොකියා කුසිනාරාව වෙත වැඩම කොට බුදු සිරුර තැන්පත් කරන ලද විසි රියන් උස සඳුන් දර සෑය වටා ප්‍රදක්ෂිණා කොට අධිෂ්ඨාන බලයෙන් බුදු සිරිපා තම නළලෙහි තබා වන්දනා කළේ ය. ඉන් පසු දේවානුභාවයෙන් ඒ චිතකය ගිනි ඇවිල ආදහනය වූයේ ය.

පරිනිර්වාණයෙන් පසු බුදු සිරුර සත් දිනක් ඒ ආසනයෙහි ම පැවතුණේ ය. ඒ කාලය සදේවක ලෝකවාසීන් විසින් වැඳුම් පිදුම් කළහ. සත්වන දින ආදහනය සිදුවිය. ඉන් පසු සත් දිනක් ධාතු පූජා කාලය වූහ. ඉන් පසු සර්වඥ ධාතු බෙදා දීමට සත් දිනක් ගත විය. මේ අවස්ථාවට සත් ලක්ෂයකට අධික භික්ෂු සංඝයා වහන්සේ රැස්ව සිටියහ. ඒ සර්වඥ ධාතු බෙදා දීමේ කටයුතු නිමා වූ පසුව මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ මෙවැනි භික්ෂු සන්නිපාතයක් නැවත දුර්ලභ යැයි සිතා භික්ෂු සංඝයා අමතා "ඇවැත්නි මම එක් සමයක පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමග පාවා නුවරින් නික්ම කුසිනාරාව බලා එන අතර තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය අසා භික්ෂූන් හඬා වැළපෙනවිට එක් පාපියෙක් "**ඇවැත්නි නොහඬන්න නොවැළපෙන්න.... යමක් අකැමැත්තෙමු නම් එය නොකරන්නෙමු**" යැයි මෙසේ කීවේ ය. පරිනිර්වාණයට පත් තථාගතයන් වහන්සේගේ බුද්ධ ශරීරය ආදහනය වීමටත් පෙර මේ නිර්ලජ්ජී පාප භික්ෂූන් ගේ

නැඟී සිටීම විය. ධර්‍මය ශාස්තෲන් වහන්සේ සමගම නැතිව ගියේ යැයි ද, ධර්‍මය ශාස්තෲවරයෙකු නැති එකක් ය යැයි ද සිතන පාපී භික්ෂූන් වහන්සේලා අලජ්ජි පක්ෂය ලැබ, කොටස්වලට බෙදී නොබෝ කලකින් ම සද්ධර්‍මය අතුරුදහන් කරන්නාහු ය යන මේ කාරණයක් වේ ද, මෙය විද්‍යමාන වන්නේ ය. යම්තාක් ධර්‍මය විනය පවත්නේ ද, ඒ තාක් බුද්ධ වචනය නොයික්මවා සිටින ශාස්තෲවරයෙකු ඇති එකක් වන්නේය. භාග්‍යවතුන් වහන්සේ විසින් ම "**යො වො, ආනන්‍ද, මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්‍ථා**" යනුවෙන් "**ආනන්දය, මා විසින් යම් ධර්‍මයක් දේශනා කරන ලද්දේ ද, යම් විනයක් පනවන ලද්දේ ද, ඒ ධර්‍ම - විනය දෙක මාගේ පරිනිර්‍වාණයෙන් පසු නුඹලාට ශාස්තෲ වන්නේය**" යැයි මේ කාරණය වදරන ලද්දේ ම ය. එබැවින් යම් සේ මෙම ශාසනය බොහෝ කල් පැවැත්මට සුදුසු වූවක් කොට ධර්‍මයත් විනයත් සංගායනා කරන්නෙමු" යැයි දන්වා සිටියහ.

භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි, එසේ නම් ස්ථවිරයන් වහන්සේම ඒ සඳහා භික්ෂූන් වහන්සේලා තෝරා ගන්නා සේක්වා**" යි කීහ. තෙරුන් වහන්සේ සියලු නවාංග ශාස්තෲ ශාසන සංඛ්‍යාත පර්‍යාප්තිධර වූ නොයෙක් සිය, දහස් ගණන් පෘථග්ජන, සෝතාපන්න, සකෘදගාමී, අනාගාමී, ශුෂ්ක විදර්ශක ක්ෂීණාශ්‍රව භික්ෂූන් හැර පියා ත්‍රිපිටක බුද්ධ වචනය හා සියලු පර්‍යාප්ති ප්‍රභේදයන්හි පාරප්‍රාප්ත සිවුපිළිසිඹියා පත් මහත් ආනුභාව ඇති, භාග්‍යවතුන් වහන්සේ විසින්ම අග්‍ර ස්ථානයෙහි තබන ලද ත්‍රිවිද්‍යා දී ප්‍රභේද ඇති ක්ෂීණාශ්‍රව භික්ෂූන් වහන්සේලා ම හාරසිය නවානූනමක් තෝරා ගත්හ. කුමක් සඳහා එක නමක් අඩු කළ සේක් ද යත්? ආනන්ද තෙරුන් වහන්සේට ඉඩ සලසනු සඳහා ය. ඒ වනවිට ආනන්ද තෙරණුවෝ රහත්ව නො සිටි බැවිනි. මේ ආනන්ද තෙරුන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ පසුපස යමින් අග්‍ර උපස්ථානය කරමින් බොහෝ ධර්‍ම - විනය කාරණා උගත්තේ ය. එබැවින් තෙරුන් වහන්සේ නොමැතිව ධර්‍ම සංගායනාව නොකළ හැකිය. ඉන් පසු අන් භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීමෙන් ආනන්ද තෙරුන් වහන්සේ ද තෝරා ගත්හ. ඉන් පසු ස්ථවිර භික්ෂූන් වහන්සේලාට "අපි ධර්‍ම, විනය සංගායනාව කොතැන්හි දී කරන්නෙමු ද" යැයි මේ සිත විය. එවිට එම භික්ෂූන් වහන්සේලාට මේ අදහස වූහ.

**"රජගහ නුවර භික්ෂාව ලැබීමට පහසු ය. බොහෝ සෙනසුන් ද ඇත. අජාසත් රජතුමා ගේ දැහැමි ආරක්ෂාව ද ලැබිය හැක. එබැවින් අපි රජගහ නුවර වස් වසමින් ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමු, අපගේ මේ කටයුත්ත බොහෝ කල් පවත්නකි. කිසියම් විරුද්ධ පුද්ගලයෙක් සඟ මැදට පැමිණ අර්බුද ඇති කිරීමට ඉඩ ඇත. එබැවින් අන් භික්ෂූන් වහන්සේලා රජගහනුවර වස් නො විසිය යුතුය. ධර්ම සංග්‍රාහක භික්ෂූන් වහන්සේලා පමණක් රජගහ නුවර වස් සමාදන් විය යුතුය"** යැයි අදහස වී ඤත්ති දුතිය කර්මයෙන් එලෙස සම්මත කර ගත්හ.

ඉන් පසු වස් එළඹෙන සමය ලංවන බැවින් මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, සංගායනාවට සම්මත රහතන් වහන්සේලාගෙන් අඩක් ගෙන රජගහනුවර බලා එක් මඟකින් වැඩි සේක. අනුරුද්ධ තෙරුන් වහන්සේ ද, රහතන් වහන්සේලාගෙන් අඩක් ගෙන රජගහනුවර බලා එක් මඟකින් වැඩි සේක. ආනන්ද තෙරුන් වහන්සේ ද, රජගහනුවර වඩිනු කැමති ව, භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය හා චීවර ගෙන මහත් වූ භික්ෂූන් වහන්සේලා පිරිසක් පිරිවරා ගෙන සැවැත් නුවර බලා චාරිකාවෙහි වැඩි සේක. ජේතවනාරාමයට වැඩ භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි ගඳකිළියෙහි දොර විවර කොට ඇඳ පුටු බැහැරට ගෙන ගසා දමා ගඳකිළිය හැමද මැලවුණු මල් ආදී කසල බැහැර කොට ඇඳ පුටු ඇතුළට ගෙන ගොස් සුදුසු තැන්හි තබා භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි කල්හි මෙන් කළ යුතු සියලු වතාවත් සිදුකළ සේක. ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙහි පටන් සිටීම් හිඳීම් බහුලව සිටි බැවින් සෙම් පිත් ආදී දෙස් කිපුණු ශරීරයෙන් සිටි බැවින් දෙවන දින කිරි විරේකයක් පානය කොට විහාරයෙහි ම වැඩසිටි සේක. පසු දින සුභ මානවකයාගේ ආරාධනාවෙන් ඔහුගේ නිවසට වැඩ ඔහු විසින් විචාරන ලද පැන විසඳමින් දීඝ නිකායෙහි ඇතුලත් **"සුභ සූත්‍රය"** වදළ සේක. අනතුරුව දෙව්රම් වෙහෙරෙහි කැඩුණු බිඳුණු තැන් පිළිසකර කරවා වස් එළඹෙන සමය ලංවන බැවින් උපකාරක එක් භික්ෂූන් වහන්සේ නමක් සමග රජගහ නුවරට වැඩි සේක.

එසමයෙහි වනාහී රජගහනුවර මහා විහාර දහ අටක් වූහ. එනම් **තල් වනය, වේළුවනය, සීත වනය, මද්දකුච්ඡි මිගදය, ජීවක අම්බ**

**වනය, මෝර නිවාපය, ලට්ඨි වනය** යන මේවා රජගහ නුවර සමීපයෙහි විය. එසේම **චෝර පපාතය,** ඉසිගිලි පර්වතය පාමුල වූ **කාලසිලාව,** වේභාර පර්වතය පාමුල වූ **සප්තපර්ණී ගුහාව,** සීතවන සොහොන් බිම සමීපයෙහි වූ **සප්තසොණ්ඩික පබ්බභාරය, ගෝතම කන්දරය, තින්දුක ගුහාව, තපෝද කන්දරය, ඉන්ද සාල ගුහාව, පිප්ඵලි ගුහාව,** ගුජ්ඣකූට පර්වතයෙහි වූ **සූකර කත ලෙන** යන මේවා රජගහ නුවර වටා පිහිටි ඒවා ය. භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු භික්ෂූන් වහන්සේලා මේ විහාර සියල්ල අත්හැර දමා ගිය බැවින් මකුළු දැල් බැඳී කොළ රොඩුවලින් ගැවසී පාලුවිය. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ද, අනුරුද්ධ තෙරුන් වහන්සේ ද සපිරිවරින් රජගහ නුවරට වැඩ අපවිත්‍ර වී පාලුවට ගොස් ඇති සෙනසුන් දැක "**භාග්‍යවතුන් වහන්සේගේ වචනයට ගරු කිරීම පිණිස ද, තීර්ථක උපවාදයෙන් මිදෙනු පිණිස ද පළමු මාසය අපවිත්‍ර සේනාසන පිරිසිදු කර කැඩුණු බිඳුණු තැන් පිළිසකර කරන්නෙමු**" යැයි මෙසේ සිතූහ.

තීර්ථකයෝ "**ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෝ ශාස්තෲන් වහන්සේ සිටි කල්හි පමණක් විහාරයන් පිළිදැගුම් කළහ. පිරිනිවි කල්හි ඒ වතාවත් අත්හැරියාහුය**" යැයි මෙසේ කියන්නාහු ය. භාග්‍යවතුන් වහන්සේ විසින් විහාරයන්හි කැඩුණු බිඳුණු තැන් පිළිසකර කිරීම වර්ණනා කරන ලදී. ඇවැත්නි එබැවින් අපි වස්කාලයෙහි පළමු මස විහාර පිළිසකර කරමු, මැද මාසයෙහි රැස්ව ධර්ම - විනය සංගායනා කරන්නෙමු යැයි කතිකා කරගෙන දෙවන දින රජ මාලිගයට වැඩ අජාසත්ත රජතුමා සම්මුඛ වී විහාර පිළිසකර කිරීමට අත් උදව් අවශ්‍ය බව කීහ. රජතුමා මිනිසුන් දුන්නේ ය. තෙරුන් වහන්සේලා විහාර පිළිසකර කරවා රජතුමාට ඒ බව දන්වා නැවත ද "**මහරජ, ධර්ම සංගායනාවක් කරනු කැමැත්තෙමු**" යැයි කීහ. රජතුමා එය අසා "**ස්වාමීනි, විශ්වාස ඇත්තෝ ව කරනු මැනවි. ස්වාමින් වහන්සේලාට ධර්මචක්‍රය වේවා. මා හට ආඥා බලය වේවා. ඒ සඳහා මා විසින් කුමක් කළ යුතු ද**" යැයි අසා සිටියේ ය. "මහරජ, ධර්මය - විනය සංගායනා **කරන්නා වූ භික්ෂූන් වහන්සේලාට වැඩ හිඳීමට තැනක් කරවා ගත යුතුය**" යැයි කීහ. "**එය කොතැන්හි කළ යුතු ද**" යැයි රජතුමා ඇසුවේය. "**වේභාර පර්වතය පාමුල වූ සප්තපර්ණී ගුහා ද්වාරයෙහි සුදුසුය**" යැයි තෙරුන් වහන්සේලා කීහ.

එකල්හි රජතුමා, විශ්වකර්‍ම දිව්‍ය පුත්‍රයා විසින් මවන ලද්දක් හා සමාන වූ, මැනවින් බෙදන ලද බිත්ති ඇති, කණු ඇති, පියගැටපෙළ ඇති, නන් වැදෑරුම් මල්කම් ලිය කම්වලින් විසිතුරු කරන ලද මහා මණ්ඩපයක් කරවා, නොයෙක් මල් දම් එල්වන ලද මනහර වියනක් කරවා, නොයෙක් රත්නයන්ගෙන් විසිතුරු වූ මැණික් ඔබ්බවන ලද මාලා කර්‍මයන්ගෙන් විසිතුරු වූ බිමක් එහි කරවා, බ්‍රහ්ම විමානයක් සේ සරසා, පන්සියයක් භික්ෂූන් වහන්සේලාට වැඩ හිඳීමට අනගි වූ පස තුරුණු පණවා, මණ්ඩපය මැද නැගෙනහිරට මුහුණ ලා සම්මා සම්බුදු රජාණන් වහන්සේට වැඩ හිඳීමට සුදුසු බුද්ධාසනයක් ද පනවා, එහි දකුණුපස උතුරු දෙසට මුහුණ ලා ථේරාසනයක් ද, ඇත් දළවලින් ලියවන ලද විසිතුරු විජිනිපතක් තබා "**ස්වාමීනි, මගේ කටයුතු නිමවන ලදී**" යැයි තෙරුන් වහන්සේලාට දන්වා සිටියේ ය.

## ☸ ආනන්ද තෙරුන් රහත්වීම

මේ වන විටත් ආනන්ද තෙරුන් වහන්සේ ශෛක්‍ෂව සිටි බැවින් රහතන් වහන්සේලා ආනන්ද තෙරුන් වෙත පැමිණ "**ආනන්දය, හෙට අපගේ රැස්වීම වන්නේය. නුඹ තවම ශෛක්‍ෂයෙකි, රැස්වීමට යෑමට නුසුදුස්සෙකි. එබැවින් අප්‍රමාදී විය යුතුය**" යැයි කීහ. ආනන්ද තෙරණුවෝ ද "**හෙට රැස්වීම වන්නේය. මා විසින් ශෛක්‍ෂව රැස්වීමට යෑම නොවටීය**" යැයි සිතා රාත්‍රියෙහි බොහෝ වේලාවක් කායගතා සති කමටහනින් යුතුව සක්මනෙහි යෙදී උත්සාහ කළ නමුත් විශේෂාධිගමයක් නොවූ බැවින්, මඳක් විවේක ගෙන නැවත උත්සාහයෙහි යෙදෙන්නෙමි යැයි සිතා, අළුයම් වෙලෙහි සක්මනින් බැස පා සෝද විහාරයට පිවිස, විඩා හරින්නෙමි යැයි ඇඳෙහි වැඩ හිඳ කොට්ටය වෙත හිස එළ වූ සේක. දෙපා පොළොවෙන් මිඳුණාහ. හිස කොට්ටයට නොපැමිණියේ ය. මේ අතර රහත් වූ සේක. මෙසේ හිඳීම, සිටීම, සක්මන් කිරීම සැතපීම යන සිව් ඉරියව්වෙන් තොරව රහත් වූහ. **එබැවින් මේ බුදු සසුනෙහි සිව් ඉරියව්වෙන් තොරව යම් භික්ෂූන් වහන්සේ නමක් රහත් වූයේ නම් ඒ ආනන්ද තෙරුන් වහන්සේය** යැයි කිව යුතු වන්නේය.

පසු දින ස්ථවිර තෙරුන් වහන්සේලා බත්කිස කොට පාත්‍ර චීවර තැන්පත් කොට තබා ධර්ම මණ්ඩපයෙහි රැස්ව තමන් වහන්සේලාට නියමිත ආසනයන්හි වැඩහුන් සේක. ආනන්ද තෙරුන් වහන්සේ ගේ ආසනය පමණක් හිස් විය. ආනන්ද තෙරුන් වහන්සේ තමන් රහත්ව වැඩි බව හඟවනු පිණිස භික්ෂූන් වහන්සේලා සමග නොවැඩියේ ය. භික්ෂූන් වහන්සේලා **"මේ ආසනය කවරෙකු සඳහා ද"** යැයි විචාළහ. **"මෙය ආනන්ද තෙරුන් වහන්සේ සඳහා"** යැයි කීහ. ආනන්ද තෙරුන් වහන්සේ ඒ මොහොතේ සිටි ආවාසයෙන් පොළොව කිමිද මණ්ඩපයෙන් මතුව තමන් වහන්සේට නියමිත ආසනයෙහි වැඩසිටි සේක. මේ හේතුවෙන් ආනන්ද තෙරුන් වහන්සේ රහත්ව වැඩි බව සියලු භික්ෂූන් වහන්සේලා ම පිළිගත්හ.

## ☸ විනය සංගායනා කිරීම

මෙසේ ධර්ම සංග්‍රාහක මහා රහතන් වහන්සේලා ධර්ම මණ්ඩපයෙහි රැස් වූ කල්හි සංඝ ස්ථවිර වූ මහා කාශ්‍යප තෙරුන් වහන්සේ **"ඇවැත්නි, ධර්මය විනය දෙකෙන් කවරක් පළමුව සංගායනා කරන්නෙමු ද"** යැයි භික්ෂු සංඝයා ඇමතූ සේක. භික්ෂූන් වහන්සේලා **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, විනය නම් බුද්ධ සාසනයාගේ ආයුෂයයි. විනය පිහිටි කල්හි ශාසනය සිටියේ වෙයි. එබැවින් පළමුව විනය සංගායනා කරමු"** යැයි කීහ. **"කවුරුන් ප්‍රධාන කොට ගෙන විනය සංගායනා කළ යුතුද"** යැයි කාශ්‍යප තෙරුන් වහන්සේ ඇසුවේ ය. **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, මේ උපාලි තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ විසින් ම විනයධරයන් අතර අග්‍ර ස්ථානයෙහි තබා වදාළ සේක. එබැවින් උපාලි තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ගෙන සංගායනා කරමු"** යැයි භික්ෂූන් වහන්සේලා කීහ. ඉන් පසු කාශ්‍යප තෙරුන් වහන්සේ විනය විචාරීමට **"සුණාතු මෙ, ආවුසො, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මන්තං උපාලිං විනයං පුච්ඡෙය්‍යං"** යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන ථේරාසනයෙහි වැඩසිටි සේක. උපාලි තෙරුන් වහන්සේ විනය විසඳීමට **"සුණාතු මෙ, භන්තෙ, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මතා මහාකස්සපෙන විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යං"** යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන අසුනින් නැගිට සිවුර ගැට වටු

ගන්වාගෙන, වැඩිහිටි ස්ථවිර භික්ෂූන් වැඳ, විජිනිපත ගෙන ධර්මාසනයෙහි වැඩහුන් සේක. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ උපාලි තෙරුන් වහන්සේගෙන් මෙසේ විනය විචාල සේක.

**"ඇවැත්නි, උපාලිය, භාග්‍යවතුන් වහන්සේ පළමු පාරාජිකාව කොතැනක දී පනවා වදාළ සේක් ද"** යැයි ඇසීය. උපාලි තෙරුන් වහන්සේ **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, විශාලා මහනුවර දී පනවා වදාළ සේක"** යැයි විසඳුවේ ය. **"කවුරුන් අරබයා පනවා වදාළ සේක් ද"** යැයි ඇසීය. **"කලන්දක පුත්‍ර සුදින්න තෙරුන් අරබයා පනවා වදාළ සේක"** යැයි විසඳුවේ ය. **"කුමන වස්තුවෙහි පනවා වදාළ සේක් ද"** යැයි ඇසීය. **"මෛථුන ධර්ම ප්‍රතිසේවනයෙහි පනවා වදාළ සේක"** යැයි විසඳුවේ ය. ඉන් පසු සියලු දෙනා වහන්සේ ම එකතුව පළමු පාරාජිකා සිකපදය නිදන සහිතව සන සජ්ඣායනා කළහ. මෙලෙස සෙසු සික්ෂා පදයන් ද, භික්ෂු භික්ෂුණී උභතෝ විභංගය ද, දෙවිසි ඛන්ධකයන් ද, සොළොස් පරිවාරයන් ද සහිත සියලු විනය පිටකය සංගායනා කොට උපාලි තෙරුන් වහන්සේ විජිනිපත තබා ධර්මාසනයෙන් බැස වැඩිහිටි තෙරුන් වහන්සේලා වැඳ තමාට පැමිණි අසුනෙහි වැඩහුන් සේක.

## ☸ ධර්මය සංගායනා කිරීම

විනය සංගායනාවෙන් අනතුරුව ධර්මය සංගායනා කරනු කැමති මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, භික්ෂු සංඝයා වහන්සේ අමතා **"ධර්මය සංගායනා කරන්නා වූ අප විසින් කවුරුන් ප්‍රධාන කොට ගෙන කළ යුතු ද"** යැයි අසා සිටියේ ය. භික්ෂූන් වහන්සේලා **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි බොහෝ ධර්මයන් ඉගෙන ගත්තෙකි. භාග්‍යවතුන් වහන්සේ විසින් කරුණු පසකින් අග්‍ර ස්ථානයෙහි තබන ලද්දෙහි ය. එබැවින් මේ ආනන්ද තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ගෙන සංගායනා කරමු"** යැයි කීහ. ඉන් පසු කාශ්‍යප තෙරුන් වහන්සේ ධර්මය විචාරීමට **"සුණාතු මෙ, ආවුසො, සඞෙඝා. යදි සඞඝස්ස පත්තකල්ලං, අහං ආයසමන්තං ආනන්දං ධම්මං පුච්ඡෙය්‍යං"** යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන ථේරාසනයෙහි වැඩසිටි සේක. ආනන්ද තෙරුන් වහන්සේ ධර්මය විසඳීමට **"සුණාතු මෙ, භන්තෙ, සඞෙඝා. යදි**

**සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මතා මහාකස්සපෙන ධම්මං පුට්ඨො විස්සජ්ජෙය්‍යං"** යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන අසුනින් නැගිට සිවුර ගැට වටු ගන්වා ගෙන වැඩිහිටි ස්ථවිර භික්ෂූන් වහන්සේලා වැඳ විජිනිපත ගෙන ධර්මාසනයෙහි වැඩහුන් සේක. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ආනන්ද තෙරුන් වහන්සේගෙන් මෙසේ ධර්මය විචාල සේක.

**"ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්ම ජාල සූත්‍රය කොතැනක දී දේශනා කොට වදාළ සේක් ද"** යැයි ඇසීය. ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, රජගහ නුවරටත් නාලන්ද නුවරටත් අතර අම්බලට්ඨිකා රජ උයනෙහි වූ රාජාගාරයෙහිදී දේශනා කොට වදාළ සේක"** යැයි විසඳුවේ ය. **"කවුරුන් අරබයා දේශනා කොට වදාළ සේක් ද"** යැයි ඇසීය. **"ස්ථවිරයන් වහන්ස, සුප්පිය පරිබ්‍රාජකයා ද බ්‍රහ්මදත්ත මානවකයා ද අරබයා දේශනා කොට වදාළ සේක"** යැයි විසඳුවෙහි ය. මෙසේ බ්‍රහ්ම ජාල සූත්‍රයෙහි නිදානය ද විචාළහ. පුද්ගලයා ද විචාළහ. ඉන් පසු **"ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ සාමඤ්ඤ ඵල සූත්‍රය කොතැනක දී දේශනා කොට වදාළ සේක් ද"** යැයි ඇසීය. ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, රජගහනුවර ජීවක අඹ වනයෙහි දී දේශනා කොට වදාළ සේක"** යැයි විසඳුවෙහි ය. **"කවුරුන් අරභයා දේශනා කොට වදාළ සේක් ද"** යැයි ඇසීය. **"වේදේහිපුත්‍ර අජාසත්ත රජතුමා අරබයා දේශනා කොට වදාළ සේක"** යැයි විසඳුවෙහි ය. මෙසේ සාමඤ්ඤඵල සූත්‍රයෙහි නිදානය ද විචාළහ. පුද්ගලයා ද විචාළහ. මේ ක්‍රමයෙන් සියලු සූත්‍ර පිටකය ද, සියලු අභිධර්ම පිටකය ද සංගායනා කළහ. මෙසේ සංගායනා කරන ලද්දේ වූ ධර්ම - විනය විවිධාකාරයෙන් බෙදා දැක්වූහ.

## ☸ ධර්ම විනය බෙදා දැක්වීම

මේ සියලු බුද්ධ වචනය රස වශයෙන් **එක්** වැදෑරුම් වේ. ධර්මය - විනය වශයෙන් **දෙ** වැදෑරුම් වේ. වචන වශයෙන් **තෙ**වැදෑරුම් වේ. **පිටක වශයෙන් ද තෙවැදෑරුම් වේ. නිකාය වශයෙන් පස් වැදෑරුම්**

**වේ. අංග වශයෙන් නව වැදෑරුම් වේ. ධර්මස්කන්ධ වශයෙන් සුවාසූ දහසක් වේ.**

### ❖ බුද්ධ වචනය රස වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද?

භාග්‍යවතුන් වහන්සේ අනුත්තර සම්මා සම්බෝධියට පැමිණ දම්සක් සූත්‍රය පැවැත්වීමේ පටන් පිරිනිවන් මඤ්චකය දක්වා වදාළ සියලු බුද්ධ වචනය, මහා සමුද්‍රයෙහි කොතැනින් ජලබිඳක් ගත්තේ ද එකම ලුණු රසය වන්නා සේ, දහම් පදයක් පදයක් පාසා ම සත්වයන් නිවනට පමුණුවන ගුණයෙන් යුක්ත බැවින් නිවන් රසයෙන් යුක්ත ය.

### ❖ ධර්ම විනය වශයෙන් දෙ වැදෑරුම් වන්නේ කෙසේ ද?

කාය - වාක් සංවරය පිණිස පනවා වදාළ සියලු බුද්ධ වචනය **"විනය"** නම් වේ. සිතෙහි පවත්නා කෙලෙසුන්ගේ තදංග විෂ්කම්භන සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය පිණිස දේශනා කොට වදාළ අවශේෂ බුද්ධ වචනය **"ධර්ම"** නම් වේ.

### ❖ වචන වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද?

බුදු බවට පැමිණ පටිච්ච සමුප්පාද හේතුඵල ධර්මය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මනසිකාර කිරීමෙන් ඇති වූ පහන් සංවේගය වචන බවට පෙරලී ප්‍රථමයෙන් ම බුදු මුවින් පිටවුණු :-

**"අනෙක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං,**
**ගහකාරකං ගවෙසන්තො - දුක්ඛා ජාති පුනප්පුනං"**

**"ගහකාරක දිට්ඨොසි - පුන ගෙහං න කාහසි,**
**සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකූටං විසඞ්ඛතං,**
**විසඞ්ඛාරගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගා"ති.**

යන මේ ගාථා දෙක ප්‍රථම බුද්ධ වචනයයි.

පරිනිර්වාණ මඤ්චකයෙහි සැතපී අවසාන වශයෙන් වදාළ "**හන්දදනි, භික්ඛවෙ, ආමන්තයාමි වො, වයධම්මා සඞ්ඛාරා, අප්පමාදෙන සම්පාදෙථ**" යන මෙය අන්තිම බුද්ධ වචනයයි. මේ අතරතුර පන්සාළිස් වසක් මුළුල්ලෙහි වදාළ සියල්ල මධ්‍යම බුද්ධ වචනයයි.

### පිටක වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද?

ප්‍රථම සංගායනාවේ දී සංගායනාවට නැගුණා වූ ද, නො නැගුණා වූ ද සියල්ල එක් කොට "උභය ප්‍රාතිමෝක්ෂය, උභය විභංගය, දෙවිසි කඳුවත්, සෝළස පරිවාර" යන මේ සියල්ල "**විනය පිටකය**" නම් වේ. "දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය" යන මේ සියල්ල "**සූත්‍ර පිටකය**" නම් වේ. "ධම්මසංගණී, විභංග, ධාතුකථා, පුග්ගල පඤ්ඤත්ති, කථා වත්ථු, යමක, පට්ඨාන" යන ප්‍රකරණ සත "**අභිධර්ම පිටකය**" නම් වේ.

### නිකාය වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේ ද?

බ්‍රහ්ම ජාල සූත්‍රයෙහි පටන් දීඝී වූ සූත්‍ර තිස්හතරක් ඇති වර්ග තුනකින් යුත් සංග්‍රහය "**දීඝනිකාය**" නම් වේ. මූලපරියාය සූත්‍රයෙහි පටන් මධ්‍යම ප්‍රමාණයෙන් යුත් සූත්‍ර එකසිය දෙපණසකින් යුක්ත වූ වර්ග පසළොසකින් යුත් සංග්‍රහය "**මජ්ඣිම නිකාය**" නම් වේ. ඕඝතරණ සූත්‍රයෙහි පටන් සත් දහස් සත්සිය දෙසැටක් සූත්‍ර ඇති සංයුත්ත පනස් හයකින් යුත් සංග්‍රහය "**සංයුත්ත නිකාය**" නම් වේ. චිත්ත පරියාදය සූත්‍රයෙහි පටන් සූත්‍ර නවදහස් පන්සිය සත් පනසකින් යුත් වර්ග එකසිය සත් සැත්තෑවක් ඇති නිපාත එකොළොසකින් යුත් සංග්‍රහය "**අංගුත්තර නිකාය**" නම් වේ. එසේම මේ නිකාය සතරට ඇතුලත් නොවූ "ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමානවත්ථු පෙතවත්ථු, ථෙරගාථා, ථෙරීගාථා, පටිසම්භිධා, අපදාන, ජාතක, නිද්දේස, බුද්ධවංස, චරියා පිටක" යන කුඩා ග්‍රන්ථ පසළොස ද, "විනය පිටකය හා අභිධර්ම පිටකය" යන දෙක ද ඇතුළත් ව මේ සියල්ල "**ඛුද්දක නිකාය**" නම් වේ. මෙසේ නිකාය වශයෙන් පස් වැදෑරුම් වේ.

### අංග වශයෙන් නව වැදෑරුම් වන්නේ කෙසේ ද?,

"සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල" යන මේ නවයයි. මෙය "**නවාංග ශාස්තෘ ශාසනය**" නම් වේ.

❖ "උභතෝ විභංගය, නිද්දේස, ඛන්ධක, පරිවාර" යන මේවා ද, සුත්තනිපාතයෙහි ඇතුළත් "මංගල සූත්‍රය, රතන සූත්‍රය, නාලක සූත්‍රය, තුවටක සූත්‍රය" ආදී සූත්‍ර නාමයෙන් දැක්වෙන සියලු බුද්ධ වචනය "**සුත්ත**" නම් වේ.

❖ සියලු ගාථා සහිත සූත්‍ර "**ගෙය්‍ය**" නම් වේ. සංයුත්ත නිකායෙහි සගාථ වර්‍ගය ද, අන් සියලු සගාථ සූත්‍රයන් ද මෙහි ඇතුළත් වේ.

❖ සියලු අභිධර්‍ම පිටකය ද, සියලු නිර්‍ගාථක සූත්‍රයන් ද, අන් අංග අටෙහි සංග්‍රහ නොවූ සියලු බුද්ධ වචනය ද "**වෙය්‍යාකරණ**" නම් වේ.

❖ "ධම්මපද, ථෙරගාථා, ථෙරීගාථා" යන මේවා ද, සුත්තනිපාතයෙහි සූත්‍ර සංඛ්‍යාවට නොගැනෙන ගාථා වශයෙන් ඇති සියල්ල ද "**ගාථා**" නම් වේ.

❖ සොම්නස් සහගත සිතින් උපන් ගාථාවන්ගෙන් ප්‍රතිසංයුක්ත අසූදෙකක් සූත්‍ර "**උදාන**" නම් වේ.

❖ "වුත්තඤ්හෙතං භගවතා" ආදී ලෙස නැවත දේශනා කරන ලද එක සිය දෙළොසක් සූත්‍ර "**ඉතිවුත්තක**" නම් වේ.

❖ අපණ්ණක ජාතකය ආදී කරුණක් ඇති කල්හි ම දේශනා කරන ලද පන්සිය පණසක් පමණ පූර්‍ව බෝධිසත්ව චර්‍ය්‍යාවන් "**ජාතක**" නම් වේ.

❖ "චත්තාරොමෙ, භික්ඛවෙ, අච්ඡරියා අබ්භූතා ධම්මා ආනන්දෙ" යනාදී ලෙස පැවති සියලුම ආශ්චර්‍ය්‍යය අද්භූත ධර්‍මයන්ගෙන් ප්‍රතිසංයුක්ත සූත්‍ර දේශනා "**අබ්භූතධම්ම**" නම් වේ.

❖ "චූළවෙදල්ල සූත්‍රය, මහාවෙදල්ල සූත්‍රය, සම්මාදිට්ඨි සූත්‍රය, සක්කපඤ්හ සූත්‍රය, සංඛාරභාජනීය සූත්‍රය, මහාපුණ්ණම සූත්‍රය"

ආදී සංවාද ස්වරූපයෙන් නුවණත් සතුටත් ලබමින් විචාරන ලදුව වදාළ සියලු සූත්‍ර "වෙදල්ල" නම් වේ.

**ධර්මස්කන්ධ වශයෙන් සුවාසූදහසක් වන්නේ කෙසේ ද?,**

ධර්ම සංගායනාවේ දී ආනන්ද තෙරුන් වහන්සේ විසින් මෙසේ වදරණ ලද්දේය.

**"ද්වාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො"**

**"මම, භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙයාසූදහසක් උගතිමි. සැරියුත් මුගලන් ආදී මහරහතන් වහන්සේලා සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙදහසක් උගතිමි. මෙසේ මාගේ සිතෙහි ධරන්නා වූ ධර්මය ප්‍රමාණ වශයෙන් සුවාසූ දහසකි"** යැයි වදළේ ය.

එහි එක් අනු සන්ධියක් ඇති සූත්‍රයක් එක ධර්මස්කන්ධයකි. අනු සන්ධි බොහෝ ඇති සූත්‍රයන්හි ඒ අනු සන්ධි ගණනින් ධර්මස්කන්ධ ගණන් ගත යුතුය. දෙවියන් විසින් "**කති ඡින්දෙ කති ජහෙ**" යනාදී ලෙස ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ දී ඒ ප්‍රශ්න ගාථාවක් එක ධර්මස්කන්ධයකි. එයට භාග්‍යවතුන් වහන්සේ "**පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ**" යනාදී ලෙස වදාළ පිළිතුරු ගාථාව එක ධර්මස්කන්ධයකි. අභිධර්මයෙහි එක එක දුකමාතිකා, තිකමාතිකාවන් බෙදීම ද, එක එක චිත්තවාර බෙදීම ද, එක එක ධර්මස්කන්ධ වේ. විනයෙහි වස්තු ඇත, මාතෘකා ඇත, පදභාජනීය ඇත, අන්තරාපත්ති ඇත, ආපත්ති ඇත, අනාපත්ති ඇත, තිකපරිච්ඡේද ඇත. එහි එක එක කොට්ඨාශ එක එක ධර්මස්කන්ධ වේ. මෙසේ සියල්ල එකතුව ධර්මස්කන්ධ වශයෙන් සුවාසූදහසකි.

## ❄ විශාඛුපෝසථ සූත්‍ර සංගායනාව

පඤ්චසතික සංගායනාවේ දී මූලාසනයෙහි වැඩසිටි මහා කාශ්‍යප මහරහතන් වහන්සේ අසන සේක් "**ආනන්දය, තථාගතයන් වහන්සේ මෙම විශාඛුපෝසථ සූත්‍රය කොතැනකදි දේශනා කළ සේක් ද?**" ධර්මාසනයෙහි වැඩසිටියා වූ ආනන්ද මහරහතන් වහන්සේ එය විසඳන සේක් "**ස්වාමීනි කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, සැවැත් නුවර මිගාරමාතු ප්‍රාසාදය නම් වූ පූර්වාරාමයෙහි දී දේශනා කොට වදාළ සේක**" යැයි කීවේ ය. මහා කාශ්‍යප රහතන් වහන්සේ "**ආනන්දය, කවුරුන් අරභයා වදාළ සේක් ද**" යැයි ඇසුවේ ය. ආනන්ද තෙරුන් වහන්සේ "**ස්වාමීනි කාශ්‍යප ස්ථවිරන් වහන්ස, විශාඛා මහ උපාසිකාව අරභයා වදාළ සේක**" යැයි කීවේ ය. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ "**කුමන කරුණක් හේතුකොටගෙන වදාළ සේක් ද**" යැයි ඇසුවේ ය. ආනන්ද තෙරුන් වහන්සේ "ස්වාමීනි ස්ථවිරයන් වහන්ස, විශාඛා මහ උපාසිකාව පණ්ණරසී උපෝසථ දිනයෙක පෙහෙවස් සමාදන්ව තථාගතයන් වහන්සේ වෙත පැමිණි විටෙක **උපෝසථ සීලය** පිළිබඳව පැහැදිලි කරමින් දේශනා කොට වදාළ සේක" යැයි කීවේ ය.

බුද්ධ උපස්ථායක වූ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගන්නා ලද මේ සූත්‍රය සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගත වූ තැන දී මහා කාරුණික වූ සම්මාසම්බුදු රජාණන් වහන්සේ ගේ අධිෂ්ඨානය පරිදි මේ උතුම් සද්ධර්මය වෛනෙය්‍ය ජනයාගේ ප්‍රයෝජනය පිණිස බොහෝ කලක් පැවැත්මට භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගත් බව දැක්වීමට මෙසේ ඉදිරිපත් කළේ ය. එහි පිළිවෙළ කථාව මෙසේ ය.

## ☸ නිසි බුද්ධෝපස්ථායෙකු නොවීම

ප්‍රථම බෝධිය වූ විසි වර්ෂය තුළ තථාගතයන් වහන්සේට නිත්‍ය උපස්ථායකයෙකු නොවී ය. ඒ කාලපරිච්ඡේදයෙහි දී "**නාගසමාල, නාගිත, උපවාන, සුනක්ඛත්ත, චුන්ද සාමණේර, සාගත, රාධ, මේඝිය**"

යන තෙරුන්වහන්සේලා ද ඇතැම් විටෙක **"ආනන්ද තෙරනුවෝ"** ද උපස්ථාන කළහ.

එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ, **නාගසමාල තෙරුන් වහන්සේ** උපස්ථායක කොට දීඝී මාගීයට පිළිපන්නේ දෙමන් සන්දියකට පැමිණ, එයින් එක් මගකින් වැඩි සේක. එවිට නාගසමාල තෙරුන් වහන්සේ **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අපි මේ මගින් වඩිමු"** යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"නැත මහණ, මා විසින් මේ මාගීයෙන් යා යුතුය"** යැයි වදාළ සේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තුන් වතාවක් වදාළ නමුත් නාගසමාල තෙරණුවෝ **"එසේ නම් භාග්‍යවතුන් වහන්ස, පාත්‍ර චීවර ගත මැනව"** යැයි කියා භාග්‍යවතුන් වහන්සේ ගේ පාත්‍ර චීවර බිම තබා ගියේය. පසුව භාග්‍යවතුන් වහන්සේ තම පාත්‍රචීවර ගෙන එකලාව වැඩි සේක. අන් මගින් ගිය නාගසමාල තෙරුන් වනයෙහි දී සොරුන්ට හසු වූහ. පාත්‍ර චීවර ද පැහැර ගත්හ, හිස ද පැලූහ. ඉන් පසු තෙරණුවෝ **"මට භාග්‍යවතුන් වහන්සේ හැර අන් පිහිටක් නැත"** යැයි සිතා භාග්‍යවතුන් වහන්සේ සොයා ආයේ ය. භාග්‍යවතුන් වහන්සේ මේ කිම්ද යැයි ඇසූ සේක. තෙරණුවෝ සිදු වූ සියල්ල කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ **"මහණ, ඔය කරුණ දැනගෙනම ඒ මගින් යෑම වැළකුවෙමි"** යැයි වදාළ සේක.

එසේම තවත් දිනක භාග්‍යවතුන් වහන්සේ **මේඝිය තෙරුන් වහන්සේ** උපස්ථායකයෙකු වශයෙන් කැදවාගෙන පාචීනවංශ මුව වනයෙහි ජන්තු නම් ගමට වැඩි සේක. එහි පිඬුසිඟා ගිය මේඝිය තෙරුන් වහන්සේ අලංකාර වූ අඹ වනයක් දැක භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ මෙසේ කීවේ ය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ගේ පාත්‍ර චීවර බාර ගන්නා සේක්වා. මම මේ වනයට ගොස් මහණ දම් පුරමි යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ තුන් වතාවක් ම වැළකූ නමුත් ගියේ ය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ ම තම පාත්‍ර චීවර රැගෙන එකලාවම වැඩි සේක. තෙරණුවෝ ඒ අඹ වනයට ගොස් භාවනාවට පටන් ගත්තේ ය. එහෙත් සුළු වේලාවකින් ම අකුසල විතකීයන්ගෙන් පීඩිත ව මට භාග්‍යවතුන් වහන්සේ හැර අන් පිහිටක් නැතැයි සිතා භාග්‍යවතුන් වහන්සේ සොයා ආයේ ය.

භාග්‍යවතුන් වහන්සේ **"මේඝිය, මම ඔය කරුණ දැනගෙනම ඒ ගමන වැළකුයෙමි"** යැයි වදාළ සේක.

## ☸ නිත්‍ය උපස්ථායෙකු පත් කර ගැනීම

පසු කළෙක බුද්ධත්වයෙන් විසිවන වර්ෂයෙහි දී සැවැත්නුවර ජේතවනාරාමයට වැඩියා වූ භාග්‍යවතුන් වහන්සේ, අග්‍ර ශ්‍රාවක, අසූ මහා ශ්‍රාවක මහරහතන් වහන්සේලා ප්‍රධාන විශාල භික්ෂුන් වහන්සේලා පිරිසක් පිරිවරා උතුම් බුද්ධාසනයෙහි වැඩ හිඳිමින්, මෙසේ වදාළ සේක. **"මහණෙනි, මම දැන් වයෝවෘධයෙමි. මට උපස්ථානයට පැමිණෙන ඇතැම් භික්ෂුන් වහන්සේලා මේ මගින් යමු යැයි කී විට, නැත භාග්‍යවතුන් වහන්ස, මේ මගින් යමු යැයි කියා මගේ පාත්‍ර - චීවර බිම දමා යති. එබැවින් මා හට නිත්‍ය උපස්ථායකයෙකු සම්මත කෙරේවා"** යැයි භික්ෂු සංඝයාට පැවරූ සේක. එවිට මහා සංඝයා හට මහත් සංවේගයක් ඇතිවූහ.

එවේලෙහි සැරියුත් මහරහතන් වහන්සේ නැගිට චීවරය ගැට වටු කොට පොරවා ගෙන භාග්‍යවතුන් වහන්සේට අභිවාදනය කොට **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ ම ප්‍රාර්ථනා කරගෙන ඒකාසංඛ්‍යය කල්ප ලක්ෂයක් පෙරුම්දම් පිරුවෙමි. මා වැනි වූ මහත් ප්‍රඥවන්තයෙකු උපස්ථානයට සුදුසු නොවන්නෙහි ද? මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරමි"** යැයි කිවේය.

භාග්‍යවතුන් වහන්සේ එය අසා **"කම් නැත සාරිපුත්‍රය, නුඹ යම් දිශාවක වාසය කරන්නේ ද, ඒ දිශාව නොසිස් ය. එබැවින් ඔබගෙන් උවටැන් කරවා ගැනීමක් අවශ්‍ය නැත"** යැයි ප්‍රතික්ෂේප කළහ. මෙසේ මුගලන් මහරහතන් වහන්සේ, මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ආදී මහරහතන් වහන්සෙලා ද, වෙන වෙනම උපස්ථානය ඉල්ලා සිටියහ. භාග්‍යවතුන් වහන්සේ ඒ සියලු දෙනා වහන්සේගේ ම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සේක. එසේ වුව ද ආනන්ද තෙරුන්වහන්සේ නිහඬව ම සිටියේ ය. එවිට අන් භික්ෂුන් වහන්සේලා ආනන්ද තෙරුන් වහන්සේ අමතා **"ආනන්දය, ඔබ භාග්‍යවතුන් වහන්සේ වෙතින් උපස්ථායක තනතුර ඉල්වාගනුව"** යැයි කීහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ

**"ඇවැත්නි, ඉල්වාගත් තනතරු කෙබඳු වේ ද? කිම, භාග්‍යවතුන් වහන්සේ මා නොදක්නා සේක් ද, භාග්‍යවතුන් වහන්සේ කැමති වන සේක් නම් ආනන්දය, මට උපස්ථාන කරන්න"** යැයි වදරණ සේක යැයි කිවේය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"මහණෙනි, ආනන්ද අනුන් විසින් උත්සාහ කළ යුත්තෙකු නොවේ. තමන් ම ඒ බව දැන මට උපස්ථාන කරන්නේ ය"** යැයි වදාළහ. එවිට භික්ෂූන් වහන්සේලා **"ආනන්දය, නැගී සිටින්න දස බලධාරීන් වහන්සේ ගේ උපස්ථානය ඉල්ලන්න"** යැයි කිහ. එවිට ආනන්ද තෙරුන්වහන්සේ නැඟිට චීවරය ගැටවටුගන්වා පොරවා ගෙන භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ ඇඳිළි බැඳ ප්‍රතික්ෂේප කිරීම් සතරක් ඉල්ලා සිටියේ ය.

## ☸ ප්‍රතික්ෂේප සතර

1. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන චීවර මට නොදෙන සේක්වා.
2. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන පිණ්ඩපාතය මට නොදෙන සේක්වා.
3. භාග්‍යවතුන් වහන්සේ සමග එක ගඳකිළියෙහි විසිමට මට අවසර නොදෙන සේක්වා.
4. භාග්‍යවතුන් පිළිගත් ආරාධනාවලට මා කැඳවා ගෙන නොයන සේක්වා.

**"භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රතික්ෂේප සතර පිළිගන්නා සේක් නම් මම උපස්ථාන කරමි"** යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ, **"ආනන්දය, නුඹ කවර ආදීනවයක් දැක මේ ප්‍රතික්ෂේප සතර ඉල්වන්නෙහි ද"** යැයි අසා වදාළහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඇතැම් කෙනෙක් ආනන්ද තෙරුන් ලාභ අපේක්ෂාවෙන් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නේය යැයි මේ වචනය කියන්නේ ය. එබැවින් මේ ප්‍රතික්ෂේප සතර ඉල්ලමි"** යැයි කීවේ ය. නැවත මේ ආයාචනා සතර ද ඉල්ලා සිටියේ ය.

## ☸ ආයාචනා සතර

1. මා විසින් බාර ගත් දන ආරාධනාවලට භාග්‍යවතුන් වහන්සේ වඩින සේක්වා.
2. භාග්‍යවතුන් වහන්සේ දැකීමට පිටතින් පැමිණෙන පැවිදි ගිහි ආගන්තුකයන් පමා නොවී භාග්‍යවතුන් වහන්සේ වෙත යොමු කරවීමට මට අවසරය දෙන සේක්වා.
3. ධර්මය - විනය පිළිබඳව සැකයක් උපන් විගස ඒ මොහොතෙහි දී ම එය විසඳා ගැනීමට භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණීමට මට අවසරය දෙන සේක්වා.
4. භාග්‍යවතුන් වහන්සේ මා නැති තැනක දී දේශනා කරන ධර්මයන් නැවත මා හට දේශනා කරන සේක්වා.

**"භාග්‍යවතුන් වහන්සේ මේ ආයාචනා සතර පිළිගන්නා සේක් නම් මම උපස්ථාන කරමි"** යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"ආනන්දය, නුඹ කුමන ආනිසංසයක් දැක මේ ආයාචනා සතර ඉල්වන්නෙහි ද"** යැයි අසා වදාළහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, සැදැහැති සත්පුරුෂයෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි අවකාශ නොලැබ මා හමුවට පැමිණ, ස්වාමීනි! ආනන්ද ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සමග හෙට මාගේ ගෙයි දනට වඩින සේක්වා"** යැයි ආරාධනා කොට යයි. භාග්‍යවතුන් වහන්සේට එයට අවකාශ නැති විට ඒ සත්පුරුෂයන් භාග්‍යවතුන් වහන්සේ හමුවට පමුණුවාලීමටත් සැක දුරුකර ගැනීමටත් අවකාශ ලබති. එසේ නොලැබුණු කල්හි **"කුමකට නම් මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ උපස්ථායක වූයෙහි ද, අපට මෙපමණකුදු අනුග්‍රහයක් නැත"** යැයි දෙස් නගන්නේ ය.

තව ද භාග්‍යවතුන් වහන්සේ නැති විටෙක ඇතැම් සත්පුරුෂයෝ මා හමුවට පැමිණ **"ඇවැත්නි, මේ සූත්‍රය, මේ ජාතකය, මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ කොතැනක දී දේශනා කළ සේක්ද"** යැයි මගෙන් ඇසුව හොත් එය කිව යුතු වන්නේය. නොහැකි වුව හොත් **"මේ ආනන්ද තෙරුන් වහන්සේ කුමකට නම් භාග්‍යවතුන්**

**වහන්සේගේ සෙවණැල්ල මෙන් පාත්‍ර - චීවර ගෙන යමින් පසුපස ඇවිද්දෙහි ද? මෙපමණවත් දෙයක් නොදන්නෙහි ද?"** යැයි මා හට දෙස් නගන්නේ ය. එබැවින් මේ ආනිශංස දැක මා නැති තැන දෙසූ ධර්‍මයන් නැවත මා හට දේශනා කරන ලෙස ඉල්ලමි යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ එම ඉල්ලීම් අට පිළිගෙන උපස්ථායක තනතුර දුන් සේක. එතැන් පටන් ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ නිත්‍ය උපස්ථායක වූයේ ය.

මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උපස්ථායක වීමට කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි පුරන ලද පාරමිතා ගුණ ඇති මහෝත්තමයෙකි. මේ වරය ලත් දින පටන් ඇල් පැන් - උණු පැන් - දැහැටි සපයමින්, පිට පිරිමදිමින්, පාද පිරිමදිමින්, ගඳකිළි පිරිවෙන හමදිමින්, මේ වේලාවෙහි භාග්‍යවතුන් වහන්සේට මේ දෙය ලැබෙන්නට වටී ය, මේ වේලාවෙහි මේ දෙය කරන්නට වටී ය යැයි දවස මුළුල්ලෙහි ම බුද්ධෝපස්ථානයෙහි යෙදී සිටියේ ය. එසේම රාත්‍රී කාලයෙහි දඬු වැට පහනක් ගෙන නව වාරයක් භාග්‍යවතුන් වහන්සේ සැතපුණු ගඳකිළිය වටා ඇවිදින්නේ ය. මෙසේ කරන්නේ භාග්‍යවතුන් වහන්සේ මා ඇමතූ විටෙක මා නිදි බරව සිටියේ නම්, එවිට ප්‍රති උත්තර දීමට නොහැකි වන්නේය යැයි ඒ පහන අතින් නුමුදා ම රෑ පහන් කරන්නේ ය. මෙසේ මහත් ගුණ ඇති ආනන්ද තෙරුන් වහන්සේ මේ බුදු සසුනෙහි **"බහුශ්‍රැත භික්‍ෂූන් අතර අග්‍ර වූහ. සතිමන්ත භික්‍ෂූන් අතර අග්‍ර වූහ. ගතිමන්ත භික්‍ෂූන් අතර අග්‍ර වූහ. ධෘතිමන්ත භික්‍ෂූන් අතර අග්‍ර වූහ. බුද්ධ උපස්ථායක භික්‍ෂූන් අතර අග්‍ර වූහ"**. මෙසේ අග්‍ර ස්ථානාන්තර පසකින් පිදුම් ලැබූහ.

ඒ මේ ආනන්ද තෙරුන් වහන්සේට එක් වරකට බණවර හැටක් (ගාථා පසළොස් දහසක්) ධාරණය වන්නේය. එය දීඝ නිකාය තරම් වූ ප්‍රමාණයකි. වසර විසි පහක් ම භාග්‍යවතුන් වහන්සේ පසුපස යමින් බොහෝ ධර්‍මයන් ඉගෙන ගත්තේ ය. ඒ නිසාම පඤ්චසතික සංගායනාවෙහි දී ආනන්ද තෙරණුවෝ :-

**"ද්වාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො"**

යනුවෙන් **"මම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී ධර්‍මස්කන්ධ දෙයාසූදහසක් උගතිමි. සැරියුත් මුගලන් ආදී මහරහතන් වහන්සේලා සමීපයෙහි දී ධර්‍මස්කන්ධ දෙදහසක් උගතිමි. මෙසේ මාගේ සිතෙහි ධරන්නා වූ ධර්‍මය ප්‍රමාණ වශයෙන් සුවාසූ දහසකි"** යැයි වදාළේ ය. මෙසේ ත්‍රිපිටක බුද්ධ වචනයෙන් බොහෝ දෑ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගන්නා ලද මේ ආනන්ද තෙරුන් වහන්සේ එම ධර්‍ම සංගීතියෙහි දී **"විශාඛුපෝසථ සූත්‍රය"** නමින් මෙසේ සංගායනාවට නැගූහ. එහි අර්‍ථ විවරණය මෙසේ ය.

**"එවං මෙ සුතං"** මා විසින් මෙසේ අසන ලදී. මෙය වනාහී මා විසින් අවබෝධ නොකරන ලද්දකි. ප්‍රත්‍යක්‍ෂ නොකරන ලද්දකි. යනුවෙන් තමන් වහන්සේ අත්හැර, මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේ වෙතින් ම උගත්තෙමි යැයි අවධාරණය කොට දක්වන්නේය.

**"එවං"** යනුවෙන් තථාගතයන් වහන්සේ විසින් මාගේ ශාසනයෙහි බහුශ්‍රැත භික්‍ෂූන් අතර ද, යහපත් පැවතුම් ඇති භික්‍ෂූන් අතර ද, මනා සිහිය ඇති භික්‍ෂූන් අතර ද, ධාරණ ශක්තිය ඇති භික්‍ෂූන් අතර ද, උපස්ථායක භික්‍ෂූන් අතර ද මේ ආනන්ද තෙරුන් වහන්සේ අග්‍ර යැයි වදාළ බුද්ධ වචනයට අනුරූප වූ තමන්ගේ ධාරණ ශක්තිය දක්වමින් **"මා විසින් මෙසේ අසන ලදී. එය ද අර්‍ථ වශයෙන් ද ව්‍යඤ්ජන වශයෙන් ද නො අඩුය. නොවැඩිය. මෙය මෙසේ ම මිස අන් අයුරකින් නොදත යුතුය"** යැයි සත්වයන් ගේ ඇසීමේ කැමැත්ත උපදවයි.

**"මෙ"** යනු මා විසින් යනුයි. භාග්‍යවතුන් වහන්සේ යම් සේ දේශනා කළ සේක ද, එසේම මා විසින් අඩු වැඩි නොකර වෙනස් නොකර මා විසින්ම භාග්‍යවතුන් වහන්සේ වෙතින් උගත්තෙමි යනුවෙන් දක්වමින් භාග්‍යවතුන් වහන්සේ මේ ධර්‍මය දේශනා කළ ධර්‍ම ශාස්තෲවරයාණන් වහන්සේ වශයෙන් දක්වා තමන් ශ්‍රාවකයෙකු කොට දක්වයි.

**"සුතං"** යනු අසන ලදී යනු යි. ඒ ඇසීම වනාහි අනිකෙකු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දැනගෙන මට කීවා නොවේ.

භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී මගේ කණින් ම අවධානය යොමු කොට මනා ධර්‍ම ගෞරවයෙන් ම අසා දැන ගත්තෙමි යැයි දක්වයි.

එසේම මේ ආනන්ද තෙරුන් වහන්සේ වනාහි මිහිරි හඬින් ධර්‍මදේශනා කරන්නා වූ බහුශ්‍රැත වූ විචිත්‍ර ධර්‍ම කථිකයෙකි. මේ ආනන්ද තෙරුන් වහන්සේ මෙසේ වාක් චාතුර්‍ය්‍යයෙන් යුක්තව මහේශාක්‍ය මහරහතන් වහන්සේලා ඉදිරියෙහි මේ උතුම් බුද්ධ වචනය සංගායනා කරන කල්හි එය දැකීමට ශ්‍රවණය කිරීමට අප්‍රමාණ දෙවියෝ ද බ්‍රහ්මයෝ ද රැස් වූහ. ඔවුන් අතරින් ඇතැම් දෙවියන්ට මෙබඳු සැකයක් උපන්හ. **"තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද ශාක්‍ය වංශිකයෙකි. මේ ආනන්ද තෙරුන් වහන්සේ ද ශාක්‍ය වංශිකයෙකි. භාග්‍යවතුන් වහන්සේ ගේ සුළු පියා වූ අමිතෝධන ශාක්‍ය රජතුමාගේ පුත්‍රයා ය. රූපයෙන් ද ස්වරයෙන් ද ශෝභමානය. භාග්‍යවතුන් වහන්සෙගේ දයාදය ද ලබති. භාග්‍යවතුන් වහන්සේ ම මේ ආනන්ද තෙරුන් වහන්සේ කරුණු පසකින් අග්‍ර තැන්හි තැබූහ. ආශ්චර්‍ය්‍ය ධර්‍ම සතරකින් යුක්ත වූවෙකු ද වෙති. සැමට ප්‍රියමනාප වූයේ වේ. දැන් භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්‍මදයාදය ලැබ බුදු වූයේය"** යැයි සිතූහ. එබැවින් ආනන්ද තෙරුන් වහන්සේ දෙවියන් තුළ වූ ඒ සිත තම සිතින් දැන එසේ වූ අද්භූත වූ ගුණ සම්භාවනාව නො ඉවසන සුළු වූයේ දෙවියන්ට ඇති වූ ඒ රැවටුණු අදහස් දුරු කරමින් ශාස්තෘන් වහන්සේට ඉමහත් ගෞරවය දක්වා තමන්ගේ ශ්‍රාවක බව **"එවං මෙ සුතං"** යනුවෙන් ප්‍රතිඥා කළේ ය.

තවද **"එවං මෙ සුතං"** යනුවෙන් **"මා විසින් මේ ධර්‍මය චතුවෛශාරද්‍ය විශාරද වූ, දසබල ධාරී වූ, උත්තමස්ථානයෙහි පිහිටියා වූ, සිංහනාද සමාන නාද ඇත්තා වූ, සියලු සත්වයන්ට උත්තම වූ, ධර්‍මේශ්වර වූ, ධර්‍මරාජ වූ, ධර්‍මාධිපති වූ, ධර්‍මද්වීප වූ, ධර්‍මසරණ වූ, සද්ධර්‍ම වර චක්‍රවර්ති වූ, සම්මා සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ ගේ සම්මුඛයෙන් පිළිගන්නා ලද්දේ වෙමි. මෙහි අර්‍ථයෙහි හෝ ධර්‍මයෙහි හෝ පදයෙහි හෝ ව්‍යඤ්ජනයෙහි හෝ සැකයක් හෝ විමතියක් හෝ නොකළ යුතුය"** යැයි සියලු දෙව් මිනිසුන් ගේ මේ ධර්‍මයෙහි අශ්‍රද්ධාව නසන සේක. ශ්‍රද්ධාව උපදවන සේක.

**"එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ"** එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාඛා මහ උපාසිකාව විසින් සාදවා පූජා කරන ලද පූර්වාරාමයෙහි වැඩසිටි සේක.

මෙහි **"එකං සමයං"** යන මෙහි සංවත්සර, ඍතු, මාස පක්ෂ දින පූර්වාහ්නය, මධ්‍යාහ්නය, අපරාහ්නය ප්‍රථම යාමය, මධ්‍ය යාමය, පශ්චිම යාමය වශයෙන් කාලය දැක්වීම **"සමය"** නම් වේ. මෙහි සමය බොහෝ වේ. පූරිත පාරමිතා ගුණ ඇති මහ බෝසතාණන් වහන්සේ දසදහසක් ලෝකධාතු වැසි දිව්‍ය බ්‍රහ්මයන් ගේ ආරාධනයෙන් පඤ්ච මහා විලෝකනයන් බලා සුදුසු මවු කුසෙහි පිළිසිඳ ගැනීම **"ගර්භාවක්‍රාන්ති සමය"** නම් වේ. උයනක දී මවු කුසෙන් බිහි වීම **"ජාති සමය"** නම් වේ. එතැන් පටන් සතර පෙර නිමිති දැකීම දක්වා ගිහි ව විසීම **"සංවේග සමය"** නම් වේ. පුතෙකු උපන් දම පැවිදි රුවක් දැක මහාභිනිෂ්ක්‍රමණය කිරීම **"අභිනිෂ්ක්‍රමණ සමය"** නම් වේ. අඩුම තරමින් සත් දිනක් හෝ දුෂ්කර ක්‍රියා කිරීම **"දුෂ්කර ක්‍රියා සමය"** නම් වේ. බෝධි මූලයට වැඩ අපරාජිත පර්‍යංකයෙහි වැඩ හිඳිමින් මාර පරාජය කිරීම **"මාරවිජය සමය"** නම් වේ. ඒ එකම පර්‍යංකයෙහි වැඩ හිඳිමින් තුන් යම් රාත්‍රියෙහි පුර්වේනිවාස ඥානය, දිව්‍යශ්‍රෝත ඥානය, ආශ්‍රවක්ෂය ඥානය ලැබීමත් සමගම සර්වඥතාඥාන ඥාන ප්‍රතිලාභයෙන් අභිසම්බෝධියට පැමිණීම **"අභිසම්බෝධි සමය"** නම් වේ. සත් සති ගත කිරීම ද, නිරෝධ සමාපත්ති, ඵල සමාපත්ති, ධ්‍යාන සමාපත්ති සුව විඳීම **"දිට්ඨධම්ම සුඛවිහරණ සමය"** නම් වේ. බ්‍රහ්මාරාධනාවෙන් දම්සක් සූත්‍රය දෙසීමෙහි පටන් ධර්මදේශනා කිරීම **"ධර්මදේශනා සමය"** නම් වේ. සූවිසි කෝටි ලක්ෂ වාරයක් නවානුපූර්ව විහාර සමාපත්ති සුව විඳ එයින් නැගී සිට අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පරිනිර්වාණයට පැමිණීම **"පරිනිර්වාණ සමය"** නම් වේ.

ඒ සමයන් අතර මෙහි **"එකං සමයං"** යනු එක් ධර්ම දේශනා සමයක දී යනුයි. ඒ දේශනා සමය ද, **"ඥාන කෘත්‍ය, කරුණා කෘත්‍ය"** සමයන් අතර **"කරුණා කෘත්‍ය"** සමයකි. **"ආත්ම හිත ප්‍රතිපත්ති සමය, පරහිත ප්‍රතිපත්ති සමය"** යන ප්‍රතිපත්ති සමයන් අතර **"පරහිත ප්‍රතිපත්ති"** සමයකි. රැස් වූ විට කළ යුතු වූ **"ධර්මකථා සමය, දේශනා ප්‍රතිපත්ති සමය"** යන සමයන් අතර **"ධර්මකථා"** සමයකි. මේ සියල්ල අතරින් මෙය **"දේශනා සමයකි"**.

**"භගවා"** යනු ගුණයෙන් විශිෂ්ට වූ සත්වයන්ට උත්තම වූ ලෞකික ලෝකෝත්තර සැප නිපදවන්නා වූ දන සීලා දී පාරමී භාවයට පැමිණි කුසල් ඇති බැවින් ද, දස ක්ලේශ, අකුශල මූල, දුෂ්චරිත ආදී අනේක විධ වූ ක්ලේශයන් බිඳ හළ බැවින් ද, ආශ්චර්‍ය්‍ය භාග්‍යා දී කීර්ති ප්‍රශංසාවට ගෞරවයට ලක්වන ගුණයෙන් යුක්ත වන බැවින් ද, අවබෝධ කළ යුතු වූ සියලු ධර්‍ම කුශලත්‍රිකා දී ලෙස බෙද දැක් වූ බැවින්ද **"භගවා"** නම් වන සේක.

තවද මෙහි **"එවං මෙ සුතං"** යන වචනයෙන් ඇසූ පරිදි ඉගෙන ගත් පරිදි ධර්‍මය දේශනා කරන්නා වූ දේශකයෝ භාග්‍යවතුන් වහන්සේගේ ධර්‍ම ශරීරය පමණක් ම දේශනා කරති. එබැවින් **"මේ ධර්‍මය වනාහී ශාස්තෲවරයෙකු නොමැති එකක් නොවේ. මේ නුඹලාගේ ශාස්තෲවරයාය"** යැයි භාග්‍යවතුන් වහන්සේ නොදැකීමෙන් රූපකයෙහි පිරිනිවීම දක්වයි. එමගින් **"මේ ආර්‍ය්‍ය ධර්‍මය දේශනා කරන ලද්ද වූ දසබල ධාරී වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද, වජ්‍ර සමාන කයක් ඇත්තේ නමුදු පරිනිර්‍වාණයට පත් වූ සේක් නම්, එබඳු ශක්තියක් නැති අන්‍යයන් විසින් දුබල ජීවිත කෙරෙහි කුමන කරුණක් හේතුකොටගෙන ජීවිතාශාව ඉපදවිය යුත්තේ ද"** යැයි ජීවිත මදෙන් මත් වූ ජනතාව සංවේගයට පත් කරයි. ඔවුනට සද්ධර්‍මයෙහි උත්සාහ උපදවයි. මෙසේ **"එවං"** යන්නෙන් දේශනා සම්පත්තිය ද **"මෙ සුතං"** යන්නෙන් ශ්‍රාවක සම්පත්තිය ද **"එකං සමයං"** යන්නෙන් කාල සම්පත්තිය ද **"භගවා"** යන්නෙන් දේශක සම්පත්තිය ද දක්වයි.

**"සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ "**සැවැත් නුවර සමීපයෙහි වූ විශාඛා මහ උපාසිකාව විසින් සාදවා ආරාමයක් කොට පූජා කරන ලද පූර්‍වාරාමයෙහි වැඩසිටි සේක යන මෙහි **"සාවත්ථියං "**යනු මෙනම් නම් ඇති නගරයයි .

ස්වස්ථ ඍෂිවරයා හට වාසභූමිය වූ බැවින් මේ භූමිය **"සාවස්ථී"** නම්විය. මිනිසුන්ට අවශ්‍ය උපභෝග පරිභෝග භාණ්ඩ මෙහි ගබඩාකොට ඇති බැවින් **"සියල්ල ඇත්තේය"** යනාර්ථයෙන් සාවත්ථී නම්විය.

මෙසේ සියල්ල පරිපූර්ණ වූ මේ සැවැත් පුරයෙහි එන්න, කන්න, බොන්න ආදී වූ දශවිධ ශබ්දයන්ගෙන් වෙන් නොවූ ආහාර පානාදියෙන් පරිපූර්ණ වූ කොසොල් රට වැසියන්ගේ මේ අග නගරය වනාහී රම්‍ය වූද, දර්ශනීය වූද, මනෝරමණීය වූ පුණ්‍ය භූමියක් වූයේය. අභිවෘධියෙන් යුක්ත වූ විපුලබවට පත් සාරවත් වූ සමෘධිමත් වූ දෙවියන්ගේ ආලකමන්දව වැනි වු මේ සැවැත්නුවර උතුම්ය. බුද්ධ කාලයෙහි පසේනදී කෝශල මහරජතුමාගේ වාසභූමිය වූයේ ද මෙහිය. පිහිටීම් වශයෙන් අචිරවතී නදී තීරයෙහි විය. මේ නදිය වක්‍රාකාරව ගලායන බැවින් නගරයෙහි උතුරු දකුණු දෙදිශාවෙන්ම නදිය විය. බුදුරජාණන් වහන්සේගෙන්ම ධර්මය ශ්‍රවණය කොට මගඵල ලැබූවෝ පන්කෝටියක් වූහ. අනාථපිණ්ඩික සිටුතුමා විශාකා මහෝපාසිකාව වැනියවුන් නිසා මේ නුවර බැබළීමට ගියේය.

"**විහරති**" යනු දිව්‍ය බ්‍රහ්ම ආර්‍ය විහරණයන්ගෙන් යම් විහරණයකින් වාසය කරයි යනුයි. එනම් ගමන් කිරීම සිටීම සැතපීම යන සිව් ඉරියව් පවත්වමින් වාසය කිරීමයි. භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වයෙන් තුන්වන වර්ෂයෙහිදී මේ සැවැත් නුවරට වැඩි පළමු වතාවෙහිදී ම නව මසක් වැඩසිටිසේක. ඉන් පසු ද හතරවන වස් කාලයෙහි ද, විසි එක්වන වස්කාලයෙහි පටන් සතළිස් හතරවන වස්කාලය අවසන්වීම දක්වා වූ විසිපස් වසරක කාලයක් මේ සැවැත් නුවරම වැඩසිටි සේක.

"**මිගාරමාතුපාසාදෙ**" මිගාරමාතු ප්‍රාසාදයෙහි ය. එහි අනු පිලිවෙල කථාව මෙසේ ය.

## ❄ විශාඛාවගේ උත්පත්තිය

බුදු රජාණන් වහන්සේ ලොව පහළ වූ කාලයෙහි දඹදිව මහාජනපද සොළසක් වූහ. ඒ ජනපදයන් අතර අංග, මගධ නම් ජනපද දෙක බිම්බිසාර මහ රජතුමාට අයත් විය. අංග රටේ **අංගුත්තරාප ජනපදයෙහි** ඉතා දියුණුවට පත් සශ්‍රීක වූ "**භද්දිය**" නම් නගරයක් විය. ඒ භද්දිය නුවර මහත් පුණ්‍ය සෘද්ධි ඇති "**ජෝතිය, ජටිල, මෙණ්ඩක,**

**පුණ්ණක, කාකවලිය**" යැයි මහධන සිටුවරු පස්දෙනෙකු වූහ. එම සිටුවරු "**අමිතභෝගී**"[1] සිටුවරු නම් වූහ. මේ ධන සිටුවරුන් අතර මෙණ්ඩක සිටුතුමා එනුවර ප්‍රධාන සිටුවරයා වූයේ ය.

ඒ මෙණ්ඩක සිටුතුමාට මෙබඳු සෘද්ධියානුභාවයක් වූයේ ය. හිස සෝද නහා කොටුගෙය හමදවා නිවස ප්‍රධාන දෙරටුව සමීපයෙහි හිඳියි. අහසින් සුවඳ හැල් වී ධාරා ඇවිත් ඔහුගේ කොටුගෙය පුරවයි.

එම සිටුතුමාගේ භාර්‍යාව **චන්ද්‍රපදුමා දේවිය** ය. එතුමියට මෙබඳු සෘද්ධියානුභාවයක් විය. සහල් නැළි සතරක බතක් හා එකම ව්‍යඤ්ජන ඇතිළියක් ළඟ හිඳගෙන දාසිදස් කම්කරුවන්ට ඒ ආහාර බෙදයි. ඇය එම ආසනයෙන් නො නැඟිටින්නේ ද ඒ තාක් ඒ ආහාර බඳුන් හිස් නොවේ.

එම දෙපලට **ධනඤ්ජය** නම් එකම පුත්‍රයෙකු වූයේ ය. එතුමාට මෙබඳු සෘද්ධියානුභාවයක් විය. කහවණු දහසකින් යුත් පසුම්බියක් ගෙන දාසිදස් කම්කරුවන්ට වැටුප් ගෙවයි. එතුමාගේ අතෙහි ඇතිතාක් එම පසුම්බිය හිස් නොවේ.

එම ධනඤ්ජය සිටුතුමාගේ භාර්‍යාව **සුමනා දේවිය** ය. එතුමියට මෙබඳු සෘද්ධියානුභාවයක් විය. ද්‍රෝණ සතරකින් යුත් වී කූඩයක් ගෙන දාසිදස් කම්කරුවන්ට සය මසක වැටුප් වශයෙන් ඒ වී බෙදයි. ඇය එතැනින් නැඟී නොසිටිනා තාක් ඒ වී කූඩය හිස් නොවේ.

එම නිවසෙහි වැඩ කරන **පුණ්ණ** නම් දසයාට මෙබඳු සෘද්ධියානුභාවයක් විය. කුඹුරට ගොස් එක් නඟුලක් බැඳ සී සානවිට එක් පසක සී විටි සතක් බැගින් සෑවෙයි.

මේ මෙණ්ඩක සිටුතුමාගේ පුත්‍ර වූ ධනඤ්ජය සිටුතුමාගේ දියණිය වූවා විශාකාව ය. මේ විශාඛාව මෙයින් කල්ප ලක්ෂයකට පෙර සාර[2] කල්පයෙහි පියුමතුරා භාග්‍යවතුන් වහන්සේගේ ලොව පහළ වූ

[1] අපමණ සම්පත් විඳින

[2] එක බුදුකෙනෙකු පහළවන කල්පය සාර කල්පය නම් වේ.

කාලයෙහි හංසවතී නුවර උසස් කුල ගෙයක ඉපිද වැඩිවිය පැමිණ සපිරිවරින් ගොස් බණ අසන්නී ය. එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ ධර්‍ම දේශනාව කෙළවර එක් උපාසිකාවක් තම බුදු සසුනෙහි දායිකාවන් අතර අග්‍ර තනතුරෙහි තබා වදාළ සේක. එය දැක මෙතුමිය ද බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට මහා දන් දී අනාගත බුදු සසුනක එම තනතුර ලැබීමට ප්‍රාර්ථනා කරන ලද්දේ ය.

ඉන් පසු කල්ප ලක්‍ෂයක් දෙව් මිනිස් සැප විඳිමින් ඇවිත් කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ගේ කාලයෙහි කාශි රට කිකී රජතුමාගේ නිවසෙහි උපන්නා ය. එම කසී රජතුමාට "**සමණී, සමණගුත්තා, භික්ඛුනී, භික්ඛුදායිකා, ධම්මා, සුධම්මා, සංඝදාසී**" යැයි දියණිවරු සත්දෙනාගෙන් සැමටම බාල **සංඝදාසී** නමින් උපන්නී මේ විශාඛාව ය. එම කාශ්‍යප බුදු සසුනෙහිදී ද මේ සියලුදෙනාම අවුරුදු විසිදහසක් මුළුල්ලෙහි දානාදී මහත් පින්කම් කොට එයින් චුතව බුද්ධාන්තරයක් දෙව් මිනිස් සැප විඳ අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ කාලයෙහි "**ඛේමා, උප්පලවණ්ණා, පටාචාරා, ප්‍රජාපතී ගෝතමිය, ධම්මදින්නා, මහාමායා දේවිය, විශාඛාව**" වශයෙන් මනුලොව උපන්හ. විශාඛාව අංග රට භද්දිය නුවර මෙණ්ඩක සිටුපුත් ධනඤ්ජය සිටුවරයාට දියණියව උපන්නා ය.

## ❄ විශාඛාව සෝවාන් ආර්‍ය්‍ය ශ්‍රාවිකාවක් වීම

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් දසවන මස මහත් භික්ෂු පිරික් පිරිවරා චාරිකා කරන සේක් මේ භද්දිය නුවරට වැඩි සේක. මෙණ්ඩක සිටුතුමා එය අසා තම පුත්‍ර වූ ධනඤ්ජය සිටුතුමාගේ දියණිය (මිණිබිරිය) වූ සත් හැවිරිදි විශාකාව කැඳවා දියණිය! නුඹට ද මඟුලකි. අපට ද මඟුලකි. නුඹගේ පිරිවර ළදැරියන් පන්සියය සමගින් රිය පන්සියයක නැඟී දැස්සන් පන්සියයක් පිරිවරන ලදුව භාග්‍යවතුන් වහන්සේට පෙරගමන් කරව යැයි කීවේ ය. විශාකාව තම සීයාගේ කථාව අසා ඉමහත් සතුටින් තම පිරිවර දැරියන් සමග රිය පන්සියයක නැඟී ගොස් කාරණාකාරණයන් දැනීමෙහි දක්‍ෂ වූ බැවින් රියෙන් බැස පා ගමනින් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ එකත්පසෙක සිටියා ය.

භාග්‍යවතුන් වහන්සේ විශාඛාවට චරිත වශයෙන් බලා දහම් දෙසූ සේක. ඇය ඒ ධර්ම දේශනාව අසා සෝවාන් ඵලයෙහි පිහිටියා ය. මෙසේ ධර්ම චක්ෂුසය ලැබූ විශාඛාව පසුද දනය පිණිස භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කොට නික්ම ගොස් පසු ද තම නිවසෙහි ප්‍රණීත ලෙස කෑ යුතු බිදිය යුතු දෙය මනාව සකසා බුදුපාමොක් මහසඟන වළඳවා මෙලෙස අඩමසක් මහා දන් දුන්නා ය.

## ❄ සාකේත නුවර ඉදිවීම

පසේනදි කොසොල් මහ රජතුමා හා බිම්බිසාර මහ රජතුමා දෙමස්සිනෝ වූහ. පසේනදි කෝශල රජතුමා "**මගේ රාජ්‍යයෙහි අපමණ සම්පත් ඇති කුලයක් නම් නැත. බිම්බිසාර රජතුමාගේ රාජ්‍යයෙහි එසේ වූ අමිතභෝගී මහධන සිටුවරු පස්දෙනෙකු ඇත්තාහ. එබැවින් ඒ එක සිටුවරයෙකු කොසොල් රටට ලබාදෙන්න**" යැයි බිම්බිසාර මහ රජතුමාට දැන්වී ය. ඒ කුලයන් සොළවාලීමට මට නොහැකිය යැයි බිම්බිසාර මහ රජතුමා කීවේ ය. මම ඒ එක කුලයක් රැගෙන මිසක් නොයන්නෙමි යැයි කොසොල් රජතුමා කීවේ ය. බිම්බිසාර මහ රජතුමා එම කාරණය ඇමති මඬුල්ල හා කථා කළේ ය. ඇමති මඬුල්ල "**මහරජ ඒ කුලයක් සොළවාලීම මහ පොළව සෙළවීමක් බඳුය**" යැයි කියා එයට අකමැතිව සිටු පුත්‍රයෙකු යවන ලෙස කීහ. එබැවින් මෙණ්ඩක මහ සිටුතුමාගේ පුත්‍ර වූ ධනඤ්ජය සිටුතුමා කොසොල් රටට ලබාදීමට සම්මත කරගත්හ. බිම්බිසාර මහ රජතුමා ධනඤ්ජය සිටුමතුමා මහත් හරසරින් කොසොල් මහ රජතුමාට භාර කළේ ය. කොසොල් මහ රජතුමා ද මහත් සත්කාරයෙන් සිටුතුමා ප්‍රධාන වූ පිරිස කැඳවාගෙන යන අතර ඉතා සවස් වූ බැවින් අතරමඟ සපිරිවරින් නවාතැන් ගත්හ. ධනඤ්ජය සිටුතුමා මේ කාගේ රටක් ද යැයි කොසොල් රජතුමාගෙන් ඇසී ය. මෙය මගේ රාජ්‍යය යැයි රජතුමා කීවේ ය. සැවත් නුවරට තව කොතෙක් දුරදැයි සිටුතුමා ඇසුවේ ය. තව සත් යොදුනක් ඇතිබව රජතුමා කීවේ ය. එවිට සිටුතුමා මහ රජතුමාගෙන් අවසර ගෙන එහිම වාසස්ථාන සකස්කර ගත්තේ ය. පසුව එම භූමිය සැවැත් නුවර සේ වූ මහත් දියුණුවට ගිය නගරයක් විය. එහි සවස නවාතැන් ගත් බැවින් "**සාකේත නුවර**" නම් විය.

## ❄ විශාඛාවගේ විවාහය

මේ කාලයෙහි සැවැත් නුවර වැසි මිගාර නම් ධන සිටුවරයෙකු විය. එතුමාගේ පුත්‍ර වූ පූර්ණවර්ධන කුමාරයාට එම සිටුතුමා සුදුසු තැනකින් විවාහයක් කරගන්නා ගෙස කීයේ ය. එතුමා විවාහ දිවියට අකමැති විය. මව්පියන් නැවත නැවත බල කරන බැවින් "**කේස කල්‍යාණය, මාංශ කල්‍යාණය, දන්ත කල්‍යාණය, ඡවි කල්‍යාණය, වයස් කල්‍යාණය**" යන පඤ්ච කල්‍යාණයෙන් යුත් ස්ත්‍රියක් හැර අන් කෙනෙකු විවිහ කරගන්නේ නැතැයි දන්වා සිටියේ ය. මිගාර සිටුතුමා බ්‍රාහ්මණයන් එකසිය අටදෙනෙකුන් තම නිවසට කැඳවා කිරිබත් අනුභව කරවා පඤ්ච කල්‍යාණයෙන් යුත් ස්ත්‍රීන් ලොව ඇත්තේ ද යැයි ඇසුවේ ය. එසේ ය මහසිටාණෙනි ඇත යැයි ඔවුහු කීහ.

එවිට එම බ්‍රාහ්මණයන්ගෙන් අටදෙනෙකුන් වෙන් කරවා කහවනු ලක්‍ෂයක් වටිනා රනින් කළ මාලයක් අතට දී ඔවුන් එබඳු ස්ත්‍රියක් සෙවීමට යැවුවේ ය. ඔවුහු කොසොල් රට බොහෝ තැන්වල ඇවිද එබඳු ස්ත්‍රියක් සොයාගත නොහැකිව ආපසු එන ගමනෙහි දී නැකැත් සැනකෙලියක් දවසක සාකේත නුවරට පැමිණ ගං ඉවුරක ශාලාවක සිටියහ. එදින සොළොස් හැවිරිදි පමණ වූ විශාකාව තම පිරිවර කාන්තාවන් සමග දිය නාන්නට එම ගං ඉවුර වෙත පැමිණියහ. ඒ මොහොතේ මහත් වැස්සක් වසින්නට විය. විශාකාවගේ පිරිවර ස්ත්‍රීහු එම වැස්සෙන් නොතෙමෙනු පිණිස එම ශාලාව වෙත වේගයෙන් දුව ආහ. විශාකාව වනාහි ස්ත්‍රී ලීලාව නොයික්මවා ඇත් ගමනින් සෙමින් තෙමෙමින් පැමිණියා ය. එම බ්‍රාහ්මණයෝ විශාකාව එසේ එනු දැක මහා පිනැති දැරියක් එන්නීය යැයි කියා බලාසිට ඇයගේ සිරුරෙහි පිහිටි "**කේශ කල්‍යාණය, මාංශ කල්‍යාණය, ඡවි කල්‍යාණය, වයස් කල්‍යාණය**" යන ලක්‍ෂණ සතර දැක "**දන්ත කල්‍යාණය**" දකිනු කැමතිව විශාකාව සමග කථාවක් ඇතිකර ගැනීමට සිතා "**අපේ මේ දුව බොහොම අලසය, මැයගේ හිමියා කාඩි හොදි ටිකක්වත් ලබානම් එය මහ පුදුමයකි. ඒකාන්තයෙන් ඔහු හිඟන්නෙකු බවට පත්වන්නේ ය. මෙබඳු අලස ස්ත්‍රීන් ඉන්න නිවස කෙසේ නම් වැඩිදියුණු වන්නේ ද**" යැයි කීහ.

එයැසූ විශාකාව "පියවරුනි! එසේ නොකියනු මැනවි. මම මේ සියලු ස්ත්‍රීන්ට වඩා බලගතු වෙමි. පියවරුනි! මම කරුණු දෙකක් නිසා නොදිව්වෙමි. එයින් පළමුවැන්න නම් මේ ලෝකයෙහි සතරදෙනෙකු දුවන කල්හි අශෝභන වෙති.

1. ඔටුණු පලන් රජතුමා සර්වාභරණයන්ගෙන් සැරසී දුවන කල්හි නොහොබී.
2. රජුගේ මඟුල් ඇතු හස්තාභරණයන්ගෙන් සැරසී දුවන කල්හි නොහොබී.
3. පැවිද්ද පාත්‍ර චීවර ධරව දුවන කල්හි නොහොබී.
4. ස්ත්‍රිය දුවන කල්හි නොහොබී.

අනෙක් කරුණ නම් ස්ත්‍රිය වනාහී වෙළඳ භාණ්ඩයක් වැනි ය. අප දුවන කල්හි පය පැකිල හෝ හැඳි වස්ත්‍රය පැකිලී වැටී අතක් හෝ පයක් බිඳී ගියේ වේ ද, ඒ හේතුවෙන් යම් ආබාධයක් හෝ ශරීර විකෘතියක් වේ ද ඒ හේතුකොට පළුදු වූ භාණ්ඩයක වටිනාකම අඩු වන්නා සේ එම ස්ත්‍රියගේ ද වටිනාකම අඩු වන්නේ ය. එබඳු වූ ස්ත්‍රිය බාරගන්නට කෙනෙකු කැමති නොවන්නේ ය. එයින් වන්නේ අපගෙන් මවුපිය සහෝදරාදීන්ට උපකාරයක් පිහිටක් නොවී ඔවුනට අප පෝෂණය කරමින් දිවිය පුරා කරදර විඳීමට ය. මේ කරුණු හොඳින් දන්නා බැවින් මම නොදිව්වෙමි" යැයි කීවා ය.

රිදී සීනුවක නාදයක් බඳු වූ විශාඛාවගේ ඒ මධුර කථාවෙන් ද, දන්ත කල්‍යාණය දැකීමෙන් ද අතිශයින් පැහැදුණු ඒ බ්‍රාහ්මණවරු ගෙනෙන ලද රන් මාලය විශාකාවගේ කරෙහි පැළඳූහ. එවිට විශාඛාව "පියවරුනි! නුඹලා කිනම් රටකින් කිනම් කුලයකින් පැමිණියෙහු ද" යැයි ඇසුවා ය. "අපි වනාහී සැවැත් නුවර මිගාර සිටු කුලයෙන් පැමිණියෙමු" යැයි එම බ්‍රාහ්මණවරු කීහ. විශාඛාව "හිමියා කවරෙකු වන්නේ ද" යැයි ඇසුවා ය. "පූර්ණවර්ධන කුමාරයෝ ය" යැයි ඔවුහු කීහ.

විශාඛාව මේ කියන කුලය අපට ගැලපෙන සුදුසු කුලයකැයි දැන රන් මාලය පැළැන්දීම ඉවසා තම පියාණන් වෙත නිවසට යෑම පිණිස රථයක් එවන ලෙස පණිවිඩ යැවුවා ය. රන් මාලා කර ලූ ද

පටන් උසස් මහත් කුලවල කාන්තාවෝ පා ගමනින් ගමන් නොකර රියෙන්ම ගමන් කරති. ධනඤ්ජය සිටුතුමා විශාකාව ප්‍රධාන පරිවාර ස්ත්‍රීන් පිණිස රථ පන්සියයක් යැව්වේ ය. විශාඛාව පරිවාර ස්ත්‍රීන් සමග එම රියවලින් තම නිවෙස්නට ගියා ය. එම බ්‍රාහ්මණයෝ ද පිටුපසින් ගියහ.

ධනඤ්ජය සිටුතුමා එම බ්‍රාහ්මණවරු දැක **"නුඹලා කිනම් රටකින් කිනම් කුලයකින් පැමිණියෙහු ද"** යැයි ඇසුවේ ය. **"අපි වනාහී සැවැත් නුවර මිගාර සිටු කුලයෙන් පැමිණියෙමු"** යැයි එම බ්‍රාහ්මණවරු කීහ. **"සිටු පුත්‍රයා කවරෙකු වන්නේ ද"** යැයි ඇසුවේ ය. **"පූර්ණවර්ධන කුමාරයෝ ය"** යැයි ඔවුහු කීහ. පොහොසත්කම කොපමණ ද යැයි ඇසුවේ ය. **"කහවණු සතළිස් කෝටියකි"** යැයි කීහ. එවිට සිටුතුමා **"නුඹලාගේ සිටුතුමාගේ පොහොසත්කම මාගේ පොහොසත්කමෙන් තුට්ටුවක් තරම්වත් නොවන්නේ ය. අලගු (ඔට්ටු) තබන්නටවත් එය මඳ ය. කම් නැත මාගේ දියණියන්ට ආරක්‍ෂාව පමණක් ලැබෙන්නේ නම් එය ප්‍රමාණවත් ය. අනෙකකින් මට වැඩක් නැත"** යැයි කියා ඔවුන්ගේ අදහස පිළිගෙන දින කිහිපයක් ඔවුන් නවත්වාගෙන ආදර සැලකිලි දක්වා පිටත් කොට හැරියේ ය.

ඒ බ්‍රාහ්මණයෝ ද ඉතා සතුටින් සැවැත් නුවරට ගොස් අප බලාපොරොත්තු වූ පරිදි උසස් කුලකාන්තාවක් ලැබුයේ ය යැයි මිගාර සිටුතුමාට කීහ. කාගේ දුවක් ද යැයි ඇසූ විට ධනඤ්ජය සිටුතුමාගේ දියණිය යැයි කීහ. මහා කුලයකින් කාන්තාවක් ලැබීම පිළිබඳව අතිශය සතුටට පත් මිගාර සිටුතුමා කල් නොයවාම ඇය මෙහි පමුණුවාගත යුතුය යැයි කියා කොසොල් රජතුමාට ද එම කාරණය දන්වා සිටියේ ය. රජතුමා ද සතුටුව මේ මහා කුලය මා විසින් බිම්බිසාර මහ රජතුමාගෙන් ලබාගෙන සාකේත නුවර පදිංචි කර වූ කුලය යි. එබැවින් එම කුලයට මම ද සංග්‍රහ කළ යුතුය යැයි සිතා **"මහ සිටාණෙනි! දැරිය කැඳවාගෙන එන දින මඟුල් පෙරහැරට මම ද එන්නෙමි, තවත් ඒ සඳහා උවමනා යමක් වෙතොත් දන්වන්න"** යැයි කීයේ ය.

මිගාර සිටුතුමා නොබෝ දිනකින් ම සුභ මොහොතින් කොසොල් රජතුමා ප්‍රධාන රාජ්‍ය වාසී බොහෝ පිරිවර ජනයා සමග පිටත්ව ගොස් සාකේත නුවරට අඩ යොදුනක් තිබියදී නතරව මහ

රජතුමා ප්‍රධාන පිරිස ආ බව ධනඤ්ජය සිටුතුමාට දන්වා යැවී ය. ධනඤ්ජය සිටුතුමා ඒ සියල්ලන් වෙත යැවිය යුතු තෑගි භෝග යවා විශාඛාව කැඳවා **"දුව! ඔබගේ මාමණ්ඩිය වූ මිගාර සිටුතුමා කොසොල් මහ රජතුමා ද කැටුව සැවැත් නුවරින් පිටත්ව අවුත් මෙයට අඩ යොදුනකින් එපිට නොදුරු තැනක නැවතී සිටිති. ඔවුහු මෙහි ආ විට ඔබගේ මාමණ්ඩියට ද, කොසොල් රජතුමාට ද, යුව රජතුමාට ද නැවතීමට තැනක් පිළියෙල විය යුතු ය"** යැයි කීයේ ය. කල්ප ලක්ෂයක් පිරූ පාරමී ඇති මහත් ප්‍රඥවක් ඇති විශාඛාව රජ යුවරජ සිටු ආදීන්ට ද, ඇත් අස් ආදීන්ට ද, ඇත්ගොව් අස්ගොව් ආදීන්ට ද, අන් සියලු පිරිවර ජනයාට ද මෙසේ මෙසේ සංග්‍රහ කළ යුතු ය යැයි දැසි දස් කම්කරු ජනයාට විධාන කොට යෙදෙව්වා ය.

ධනඤ්ජය සිටුතුමා එදිනම කඹුරන් පන්සියයක් ගෙන්වා මහාලතා පසාධනය තනන්නට ඔවුන්ට රන්නික දහසක් ද, රිදී, මුතු, මැණික්, පබලු, වීදුරු ආදී අවශ්‍ය සියල්ල නිදහස් කොට දුන්නේ ය. මෙසේ ටික දිනක් ගෙවීගිය පසු කොසොල් මහ රජතුමා ධනඤ්ජය සිටුතුමා හට **"මහ සිටුතුමණි! අප මෙහි පැමිණ බොහෝ දිනක් ගතවූහ. පිරිසද විශාලය. සත්කාර කිරීම ද අපහසු ය. එබැවින් දූරිය කැඳවාගෙන යන දිනයක් නියම කරන්න"** යැයි හසුනක් යැවුහ. එය බලා ධනඤ්ජය සිටුතුමා කොසොල් මහ රජතුමා හට **"මහ රජතුමණි! දැන් වැසි කාලය පැමිණියේ ය. මේ සිව්මස ගමන් යෑම අපහසු ය. නුඹවහන්සේගේ බලකායට යමක් යමක් ලැබීමට වටී ද? ඒ සියල්ල මට භාර ය. එබැවින් දේවයන් වහන්සේ මා විසින් දූරිය එවන තෙක් රැඳී සිටින සේක්වා"** යැයි දන්වා යැවී ය.

එතැන් පටන් සාකේත නුවර එකම නැකැත් උත්සවයක් මෙන් විය. මෙලෙස තෙමසක් ඉක්ම ගියේ ය. ඒ තාක් මහාලතා පසාධනයෙහි කටයුතු ද නිමාවට පත් නොවී ය. කොසොල් රජතුමා ප්‍රධාන පිරිසට සංග්‍රහ කරන්නෝ ඇවිත් නොමැති අන් දෙයක් නම් නැත. බලකායට බත් පිසීමට දර හිඟබව කීහ. එවිට ධනඤ්ජය සිටුතුමා **"දරුවෙනි! ඇත්හල්, අස්හල්, ගවහල් කඩා ඒ දැවවලින් බත් පිසවු"** යැයි කීහ. ඒවා ද අඩ මසකට පමණක් සෑහුණේ ය. සේවකයෝ නැවත ද දර හිඟබව කීහ. එවිට ධනඤ්ජය **සිටුතුමා "දරුවෙනි! මෙකල්හි දර සෙවීම දුෂ්කර ය. රෙදි ගබඩා විවෘත කොට රළු වස්ත්‍ර ගෙන තෙල් සැළියෙහි ඔබා**

වැටිකොට ඒවායෙන් ආහාර පිසව්" යැයි අන කළේ ය. ඒවා ද අඩ මසකට සෑහුණේ ය. මෙලෙස සිව්මස ගෙවී ගියේ ය.

මහාලතා පසාධනය ද සාද නිමවිය. එම පලඳනාවෙහි කපු නූලෙනි කළ මැස්මක් නැත. සියලු මැසුම් රිදී නූලෙන් කර ඇත. එය කයෙහි පැලඳි විට පාදයන්හි පිටිපතුළ දක්වා මුළු සිරුරම වැසී යන්නේ ය. එහි ඒ ඒ තැන මුදු සවිකොට ගැට රනින් කරන ලද්දේ ය. පුඬු රිදියෙන් කරන ලද්දේ ය. එයින් හිස මුදුනෙහි එකකි. කන් දෙක මත දෙකකි. බෙල්ලෙහි දෙපසෙහි දෙකකි. දෙ වුරෙහි දෙකකි. වැලමිටි දෙකෙහි දෙකකි. උකුල දෙපසෙහි දෙකකි. පලඳනාව මුදුනෙහි මොණර රූපයක් කරන ලද්දේ ය. එහි දකුණු පස රනින් කරන ලද පියාපත් පන්සියයකි. වම් පස ද පියාපත් පන්සියයකි. තුඩ පබලුවෙන් කරන ලද්දේ ය. ඉඳුනිල් මිණිවලින් දෙනෙත් කරන ලද්දේ ය. බෙල්ල හා පිල් කලඹ ද ඉඳුනිල් මැණික්වලින් නිමවන ලද්දේ ය. පිල්දඬු හා කෙණ්ඩා රනින් කරන ලද්දේ ය. විශාඛාවගේ හිස මුදුනෙහි පැලඳි මේ ආභරණයෙහි වූ මොණර රූපය කඳු මුඳුනක පිල් විදහා නටන මොණරෙකුට වඩා වෙනසක් නැත. පත්නළ දහසෙහි නාදය දිව්‍ය සංගීත නාදයක් සේ ද, තූර්‍ය්‍ය නාදයක් සේ ද පවත්නේ ය. එය දුරසිට බලන්නන්ට පෙනෙන්නේ පණ ඇති මොණරෙකු සේ ය. මේ පසාදනය වටිනාකමින් කහවණු නව කෝටියකි. එය තැනීමට කම්කරුවන්ට දුන් කුලියම කහවනු නව ලක්‍ෂයකි. පෙර කාශ්‍යප දසබලධාරින් වහන්සේගේ ශාසනයෙහි දී මෙතුමිය දහසක් භික්‍ෂු සංඝයාට සිවුරු පිණිස වස්ත්‍ර ද, ඉදිකටු හා නූල් ද, ඒ සිවුරුවලට පෙවීමට පඬු ද පූජාකළ පිනෙන් මේ පළඳනාව ලැබුවා ය.

ධනඤ්ජය සිටුතුමා විශාකාව පිණිස මංගල ඇඳුම් සැකසීමේ කටයුතු නිමවා කොසොල් රජතුමාට හා මිගාර සිටුතුමාට සිය නිවසට පැමිණෙන ලෙස දන්වා යවා රජතුමා ප්‍රධාන වූ පිරිස පැමිණි කල්හි ආගන්තුක සත්කාර දක්වා පිළිගෙන ඒ සියල්ලන්ටම විශාඛාවගේ විධානය පරිදි සත්කාර කළහ. ඉන්පසු ධනඤ්ජය සිටුතුමා කුල සිරිත් නොයික්මවා සුභ මොහොතින් දියණිය පාවා දී දයාද වශයෙන් කහවණු පිර වූ ගැල් පන්සියයක, රන් බඳුන් පිර වූ ගැල් පන්සියයක, රිදී බඳුන් පිර වූ ගැල් පන්සියයක, පටසළු කසීසළු පිර වූ ගැල් පන්සියයක, ගිතෙල් බඳුන් පිර වූ ගැල් පන්සියයක, හැල්සහල් පිර වූ

ගැල් පන්සියයක, නඟුල් හීවැල් ආදි කෘෂි උපකරණ පිර වූ ගැල් පන්සියයක යැයි සියල්ල පන්සියය බැගින් දුන්නේ ය. තව ද විශාඛාවට අත් උදවුවට මෙහෙකාර ස්ත්‍රීන් එක්දහස් පන්සියයක් යැවී ය. තුන් ගව්වක් දිග රියන් එකසිය සතළිසක් ප්‍රදේශයෙහි ඇඟින් ඇඟ ගැටෙන ප්‍රමාණයේ පිර වූ කිරදෙනුන් ද දුන්නේ ය. එහෙත් ගාල් පැන ගොනුන් ද දෙනුන් ද සැටදහස බැගින් නික්මුණහ. පෙර කාශ්‍යප බුදු සසුනෙහි ළදරු භික්ෂූන්ට මේ කිරි ඉතා හොඳ ය, ගුණ ය යැයි කියා පෙරැත්ත කරමින් කිරි වැළඳ වූ පිනෙන් මෙසේ වි ය.

ධනඤ්ජය සිටුතුමා "**හෙටදින දුවණිය යවන්මේ**" යැයි සිතා එදින රාත්‍රියෙහි විශාඛාව සමීපයෙහි හිඳුවා "**දරුව! ස්වාමි කුලයෙහි වසන්නිය විසින් මේ මේ හැසිරීම් ඉගෙනීම වටීය**" යැයි අවවාද දසයක් දුන්නේ ය. ඒවා මෙසේ ය.

1. මයිලණුවන්ගේ ගෙයි වසන්නිය විසින් ඇතුළත ගිනි පිටතට නොගෙනිය යුතු ය.
2. පිටත ගිනි ඇතුළට නොපිවිසවිය යුතු ය.
3. දෙන්නාටම දිය යුතු ය.
4. නොදෙන්නාට නොදිය යුතු ය.
5. දෙන්නාට ද, නොදෙන්නාට ද දිය යුතු ය.
6. සුව සේ හිඳිය යුතු ය.
7. සුව සේ වැළඳිය යුතු ය.
8. සුව සේ හෙවිය යුතු ය.
9. ගිනි පිදිය යුතු ය.
10. ඇතුළත දෙවියන් නැමදිය යුතු ය.

ධනඤ්ජය සිටුතුමා විශාඛාවට මෙසේ අවවාද දෙනවිට සමීප කාමරයෙහි සිටි මිගාර සිටුතුමා ඒ සියල්ල අසා සිටියේ ය.

ධනඤ්ජය සිටුතුමා පසුදින සියලු සෙනග රැස් කරවා රජ සෙනග මැද කෙළඹියන් අටදෙනෙකු භාරකරුවන් වශයෙන් තෝරා **"ඉදින් මගේ දුව ගියතැන දෙසක් හටගනී ද, නුඹලා විසින් එය නිවැරදි කළ යුතුය"** යැයි කියා විනිශ්චය කටයුතු ඔවුනට භාරකොට නවකෙළක් වටිනා මහාලතා පසාධනයෙන් විශාඛාව සරසවා නහන සුණු (සබන්) ආදිය පිණිස කහවණු පණස්හතර කෝටියක් ධනය දී සපිරිවරින් පිටත්කොට හැරියේ ය. විශාඛාව සපිරිවෙරින් සැවැත් නුවර දෙරටුව දක්වා වැසුණු යානයකින් ගොස් නුවර දෙරටුව සිට තමා දකිනු කැමති සියල්ලන්ට දැකගැනීම පිණිස විවෘත රියක නැඟී සිටගෙන මිගාර සිටු නිවස දක්වා ගියා ය. සැවැත් නුවර වාසීහු මහා සැප සම්පත්තියෙන් පිරුණු විශාඛාව දැක **"විශාඛාව කියන්නේ මෙතුමියට ද, රූපයත් සැපතත් මෙතුමියටම හොබීය"** යැයි කීහ.

මෙලෙස විශාඛාව මහත් සැපතින් මිගාර සිටුතුමාගේ නිවසට පැමිණියා ය. පැමිණි දිනයෙහි ද සැවැත් නුවර වාසීහු **"ධනඤ්ජය සිටුතුමා තම නුවරට පැමිණි අපට මහත් සත්කාර කළේ ය"** යැයි විශාඛාවට පඬුරු යැවූහ. විශාඛාව එලෙස එවූ එවූ පඬුරු ඒ නුවරෙහිම ඒ ඒ කුලයන්හි ප්‍රයෝජනවත් කටයුතුවල යෙදෙවූවා ය. එදිනම රාත්‍රියෙහි විශාඛාවගේ එක් ආජානෙය්‍ය අස් වෙළඹකට දරු උපතක් සිදුවිය. විශාඛාව තම දාසීන් ලවා දඬුපහන් ගන්වාගෙන එහි ගොස් ඒ වෙළඹ උණු දියෙන් නහවා තෙල් ගල්වා තමන් වසන තැනට ගියා ය.

මිගාර සිටුතුමා ද තම පුත්‍රයාගේ අවාහ මංගල උත්සවය සත් දිනක්ම සිදු කළේ නමුත් ඒ අසල ජේතවනාරාමයෙහි වැඩ සිටින සම්මා සම්බුදු රජාණන් වහන්සේ හෝ අනෙකුත් ආර්‍ය්‍ය මහෝත්තමයන් වහන්සේලා සිහි නොකළේ ය. සත්වැනි දින දන් පිළියෙල කර සිය නිවසෙහි නග්න ශ්‍රමණයින් වඩා හිඳුවා විශාඛාව වෙත **"මගේ දුව රහතන් වහන්සේලා වඳින්න පැමිණෙන්න"** යැයි පණිවුඩයක් යැව්වේ ය. ආර්‍ය්‍ය ශ්‍රාවිකාවක් වූ විශාඛාව රහත්ය යන වචනය අසා සතුටුව නිවටුවන් සිටින තැනට ගොස් ඔවුන් දැක **"මෙබන්දෝ නම් රහතන් වහන්සේලා වෙත් ද, විළිබිය නැත්තවුන්ගේ සමීපයට කුමක් හෙයින් මාමණ්ඩිය මා කැඳෙව්වේ ද?"** යැයි චී චී යැයි නින්ද කොට තම වාසස්ථානයට නික්ම ගියා ය. නග්න ශ්‍රමණයෝ ඇය දැක සිටාණන් අමතා **"කිමෙක් ද ගෘහපතිය, නුඹ අනිකියක නොලැබුවෙහි ද? ශ්‍රමණ**

ගෞතමයන්ගේ ශ්‍රාවිකාවක් වූ මහා කාලකණ්ණියක මේ නිවසට පිවිසියෙහු ද? වහා ඇය මේ නිවසින් බැහැර කරව" යැයි ගැරහූහ.

සිටුතුමා "මොවුන්ගේ වචනයෙන් මට මෙතුමිය නිවසින් බැහැර කිරීමට නොහැකිය, මැය මහා කුලයක දියණියකි" යැයි සිතා "ආචාර්යවරුනි! කුඩා දරුවෝ දැන හෝ නොදැන වරද කරති. නුඹ වහන්සේලා නිශ්ශබ්ද වුව මැනවි" යැයි කියා නග්නයින් පිටත්කොට යවා මහා පළඟක හිඳගෙන රන් හැන්දක් ගෙන විශාඛාව බලා සිටියදී රන් තලියක දිය නුමුසු මී පායාසය අනුභව කරමින් සිටියේ ය. එවේලෙහි පිඬු සිඟායන එක් තෙරනමක් එම නිවස ඉදිරියට වැඩියේ ය. මිගාර සිටුවරයා තෙරුන් දැක ද, නොදක්නාක් මෙන් මුව යටිකුරු කොට කිරිබත අනුභව කළේ ය. එවිට විශාඛාව මගේ මාමණ්ඩිය තෙරුන් වහන්සේ දැකත් නොදක්කා සේ හිඳ කිරිබත් කයි යැයි නොයිවසිලිමත්ව තෙරුන් වහන්සේ දිසාවට හැරී "ස්වාමීන් වහන්ස! අන් තැනැක් බලා වඩින්න, මගේ මාමණ්ඩිය පැරන්නක් කති" යැයි කීවා ය. එයැසූ සිටුවරයා දණ්ඩෙන් පහර ලත් නයෙකු සේ කිපී අත තිබූ කිරිබත් තලිය පසෙක දමා "පෙණෙයි ද මැය, නිගණ්ඨයන් කියත්දීත් ගෙයින් පිට නොකෙළෙමි, මේ මංගල අවස්ථාවෙහිම මා අසුචි කන්නෙකු කරන්නී ය. මැය මෙහි නවත්වාගැනීම නුසුදුසු ය. වහාම මේ ගෙයින් පිටකරවු" යැයි කීයේ ය. එහි සිටි දාස කම්කරු ආදී සියල්ලෝම විශාඛාවගේ පිරිවර ජනයා වූහ. එබැවින් විශාඛාවට එරෙහිව වචන මාත්‍රයක් කීමට තරම් සමතෙකු එහි නොවූයේ ය.

එකල්හි විශාඛාව මාමණ්ඩියගේ කථාව අසා "පියාණෙනි! මෙපමණ වචනයකින් අපි නොයමු. මම නුඹ වහන්සේ විසින් දිය තොටින් කුම්බ දාසියක මෙන් නොගෙනෙන ලද්දෙමි. ජීවත්වන මවුපියන්ගේ දූවරු නම් මෙපමණකින් නොනික්මෙති. මේ කරුණ නිසාම මගේ පියා මෙහි එන දිනයෙහි කෙළෙඹියන් අට දෙනෙකුන් කැඳවා ඉදින් මගේ දුව නිසා යම් දොසක් උපදී ද, එය නිවැරදි කරවු යැයි පවසා ඔවුන්ගේ අතෙහි තැබී ය. එබැවින් ඔවුන් කැඳවා මගේ දෙස් නිදෙස් බව පිරිසිදු කරවුව මැනව" යැයි කීවා ය.

මිගාර සිටුතුමා "මැය යහපතක් කියන්නීය" යැයි එම බ්‍රාහ්මණයින් අටදෙනා ගෙන්වා "බ්‍රාහ්මණවරුනි! මේ දැරිය මෙහි ඇවිත්

සත්වැනි දිනයෙහි නොපිරිපුන් වූම මඟුල් ගෙයෙහි හුන්නා වූ මා අසුචි කන්නෙක්ය" යැයි කීවා ය. "දියණියනි! එය සැබෑද?" යැයි ඔවුහු විශාඛාවගෙන් ඇසූහ. එවිට විශාඛාව "පියවරුනි! මගේ මාමණ්ඩිය අසුචි කෑමට කැමැත්තේ ය යැයි අදහස් කොට මම එසේ නොකීවෙමි. එක් පිඬුසිඟා යන තෙරුන් වහන්සේ නමක් ගෙදොරට වැඩිය කල්හි මෙතෙමේ උන් වහන්සේ ගැන සැලකිල්ලක් නොදක්වා දිය නුමුසු පායාසය අනුභව කළේ ය. මේ හේතුවෙන් මම ස්වාමීන් වහන්ස! අන් තැනැක් බලා වඩින්න, මගේ මාමණ්ඩිය මේ දිවියෙහි පින් නොකරයි, පැරණි පින කයි" යන්න පමණක් කීවෙමි යැයි පැවසුවා ය. එවිට එම බ්‍රාහ්මණවරු "ආර්යයෙනි! මෙහි දෙසක් නැත, අපගේ දියණිය සුදුසු කරුණක් කියයි. ඔබතුමා කුමක් සඳහා කිපුනේ ද?" යැයි කීහ.

එවිට මිගාර සිටුතුමා "ආර්යවරුනි! ඒ කාරණය නිදෙස් බව පිළිගනිමි. එහෙත් මේ දැරිය මෙහි ආ දිනයෙහිම රාත්‍රියෙහි මාගේ පුතු කෙරෙහි හැඟීමක් නැතිව තමන් කැමති තැනක ගියා ය" යැයි කීයේ ය. "එය සැබෑ ද?" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "පියවරුනි! මම කැමති තැනකට නොගියෙමි, මේ නිවසෙහි ආජානෙය්‍ය අශ්ව වෙළඹ වැදූ කල්හි හැඟීමකුදු නොකොට හිඳීම නුසුදුසු ය යැයි සිතා දඬුපහන් ගෙන්වාගෙන දාසසන් පිරිවරාගෙන එහි ගොස් ඒ වෙළඹට ප්‍රසව පරිහාර කරවීමි" යැයි කීවා ය.

එවිට එම බ්‍රාහ්මණවරු මිගාර සිටුතුමාට "ගෘහපතිය! අපගේ දියණිය නුඹගේ නිවසෙහි දසීන් විසිනුදු නොකළ යුතු වැඩක් කරන ලද්දේ ය. එසේ ඇති කල්හි නුඹ කුමන දෙසක් දක්නෙහි ද?" යැයි ඇසූහ. මිගාර සිටුතුමා "එහි ද නිදෙස් බව පිළිගනිමි" යැයි කියා නැවත ද "බ්‍රාහ්මණවරුනි! මැයගේ පියා මෙහි එන දිනයෙහි අවවාද දෙමින් ඇතුළත ගිනි පිටත නොගෙනිය යුතුය යැයි කීවේ ය. කිමෙක් ද, අප විසින් දෙපසින් අසල්වැසි ගෙවලට ගිනි නොදී සිටිය හැකි ද?" මෙසේ කීවේ ය.

"දියණිය! එය සැබෑ ද?" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "පියවරුනි! මාගේ පියා මේ ගිනි අරභයා කථා නොකළේ ය. ගේ ඇතුළත නැදි ආදී මාගමුන්ගේ යම් රහස් කථාවක් හටගනී ද, එය එහි දාසසන්ට නොකිය යුතු ය. මෙබඳු කථා වැඩුණු කල්හි ඒවා කලහ

**පිණිස පවතියි. පියවරුනි! මාගේ පියා මේ සඳහා ඇතුළත ගිනි පිටත නොගෙනිය යුතුය"** යනුවෙන් කියන ලද්දේය යැයි කීවා ය.

එය ද එසේ වේවා! **"මැයගේ පියා පිටතින් ගිනි ඇතුළට නොපිවිසිය යුතුය"** යැයි කීවේ ය. **"ඇතුළත ගිනි නිවුනු කල්හි පිටතින් ගිනි නොගෙනීමට අපට හැකි ද?"** යැයි සිටුතුමා කේවේ ය. **"දියණිය! එය සැබෑ ද?"** යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව **"පියවරුනි! මාගේ පියා එම ගිනි සඳහා මෙසේ නොකීවේ ය. යම් දෙසක් දූසිදස් කම්කරුවන් විසින් කියන ලද්දේ වෙයි ද? එය ඇතුළත ජනයාට නොකිය යුතු ය. මෙබඳු කථා වැඩුණු කල්හි කලහ ඒවා කලහ පිණිස පවතියි. පියවරුනි! මාගේ පියා මේ සඳහා පිටතින් ගිනි ඇතුළට නොපිවිසිය යුතුය"** යනුවෙන් කියන ලද්දේය යැයි කීවා ය.

එය ද එසේ වේවා! **"තව ද, මැයගේ පියා දෙන්නාටම දිය යුතුය යැයි කීවේ ය. එය කුමක් ද?"** යැයි සිටුතුමා ඇසුවේ ය. **"දියණිය! එය සැබෑ ද?"** යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව **"පියවරුනි! යම් කෙනෙකු ණයක් හෝ වෑ පොරවාදී ආයුධයක් හෝ ඉල්වාගෙන ගොස් නැවත ගෙනවිත් දේ ද? ඔවුන්ටම දිය යුතුය යැයි මාගේ පියා විසින් මේ සඳහා දෙන්නහුටම දිය යුතුය"** යනුවෙන් කියන ලද්දේය යැයි කීවා ය.

එය ද එසේ වේවා! **"තව ද, මැයගේ පියා නොදෙන්නාට නොදිය යුතුය යැයි කීවේ ය. එය කුමක් ද?"** යැයි සිටුතුමා ඇසුවේ ය. **"දියණිය! එය සැබෑ ද?"** යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව **"පියවරුනි! යම් කෙනෙකු ණයක් හෝ වෑ පොරවාදී ආයුධයක් හෝ ඉල්වාගෙන ගොස් නැවත ගෙනවිත් නොදේ ද? ඔවුන්ට නැවත නොදිය යුතුය යැයි මාගේ පියා විසින් මේ සඳහා නොදෙන්නහුට නොදිය යුතුය"** යනුවෙන් කියන ලද්දේය යැයි කීවා ය.

එය ද එසේ වේවා! **"තව ද, මැයගේ පියා දෙන්නාට ද නොදෙන්නහුට ද දිය යුතුය යැයි කීවේ ය. එය කුමක් ද?"** යැයි සිටුතුමා ඇසුවේ ය. **"දියණිය! එය සැබෑ ද?"** යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව **"පියවරුනි! දිළිඳු නෑ මිතුරන් පැමිණි කල්හි ණයක් හෝ වෑ පොරවාදී ආයුධයක් හෝ ඉල්වාගෙන ගොස් නැවත ගෙනවිත්**

**දෙන්නේ හෝ නොදෙන්නේ වේ ද? ඒ කෙසේ වෙතත් ඔවුන්ට දිය යුතුය යැයි මාගේ පියා විසින් මේ සඳහා දෙන්නාට ද නොදෙන්නහුට ද දිය යුතුය"** යනුවෙන් කියන ලද්දේය යැයි කීවා ය.

එය ද එසේ වේවා! "**තව ද, මැයගේ පියා සුව සේ හිඳිය යුතුය යැයි කීවේ ය. එය කුමක් ද?"** යැයි සිටුතුමා ඇසුවේ ය. "**දියණිය! එය සැබෑ ද?"** යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "**පියවරුනි! නැඳි මයිලනුවන් නැඟිටිය යුතු තැන්හි ඉඳගෙන හිඳීම නොකොට නැඟිටිය යුතුය යැයි මාගේ පියා විසින් මේ සඳහා සුව සේ හිඳිය යුතුය"** යනුවෙන් කියන ලද්දේය යැයි කීවා ය.

එය ද එසේ වේවා! "**තව ද, මැයගේ පියා සුව සේ වැළඳිය යුතුය යැයි කීවේ ය. එය කුමක් ද?"** යැයි සිටුතුමා ඇසුවේ ය. "**දියණිය! එය සැබෑ ද?"** යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "**පියවරුනි! නැඳි මයිලනුවන් ස්වාමියා වැළඳීමට පෙර නොවළඳ මුලින්ම ඔවුන් වළඳවා සියල්ලන් විසින් ලද නොලද දේ දැන පසුව තමන් වැළඳිය යුතුය යැයි මාගේ පියා විසින් මේ සඳහා සුව සේ වැළඳිය යුතුය"** යනුවෙන් කියන ලද්දේය යැයි කීවා ය.

එය ද එසේ වේවා! "**තව ද, මැයගේ පියා සුව සේ හොවිය යුතුය යැයි කීවේ ය. එය කුමක් ද?"** යැයි සිටුතුමා ඇසුවේ ය. "**දියණිය! එය සැබෑ ද?"** යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "**පියවරුනි! නැඳි මයිලනුවන් ස්වාමියාට පෙර සයනයට නැඟ නොනිදිය යුතුය. ඔවුන්ට කළයුතු වත් පිළිවෙත් කොට සියල්ලන්ටම පසුව නිදිය යුතුය යැයි මාගේ පියා විසින් මේ සඳහා සුව සේ හොවිය යුතුය"** යනුවෙන් කියන ලද්දේය යැයි කීවා ය.

එය ද එසේ වේවා! තව ද, මැයගේ පියා විසින් "**ගිනි පිදිය යුතුය"** යැයි කීවේ ය. එය කුමක් ද? යැයි සිටුතුමා ඇසුවේ ය. "**දියණිය! එය සැබෑ ද?"** යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "**පියවරුනි! නැඳි මයිලනුවන් ස්වාමියා ගිනි කඳන් මෙන් ද, නා රජුන් මෙන් ද දැකීමට වටීය යැයි මාගේ පියා විසින් මේ සඳහා ගිනි පිදිය යුතුය යැයි කියන ලද්දේය"** යනුවෙන් කියන ලද්දේය යැයි කීවා ය.

එය ද එසේ වේවා! තව ද, මැයගේ පියා විසින් "ඇතුළත දෙවියන් නැමදිය යුතුය" යැයි කීවේ ය. එය කුමක් ද? යැයි සිටුතුමා ඇසුවේ ය. "දියණිය! එය සැබෑ ද?" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "පියවරුනි! ආවේණික ගෙයෙහි වාසය කරන කාලයෙහි පටන් අපගේ ගෙදෙරට පැමිණුණු පැවිද්දෙකු දැක ගේ තුළ යම් කෑ යුත්තක් බිදිය යුත්තක් ඇත්තේ ද? එයින් පැවිද්දන්ට දන් දී කෑම වරීය වරීය යැයි මාගේ පියා විසින් මේ සඳහා ඇතුළත දෙවියන් නැමදිය යුතුය" යනුවෙන් කියන ලද්දේය යැයි කීවා ය.

ඉක්බිති එම බ්‍රාහ්මණවරු මිගාර සිටුතුමා අමතා "මහ සිටාණෙනි! නුඹ වනාහී පැවිද්දන් දැක නොදෙනු කැමැත්තෙකු බව හැඟෙයි" යැයි කීහ. එවිට සිටුවරයා එයට පිළිතුරක් නැතිව බිම බලාගෙන හුන්නේ ය. එකල්හි එම බ්‍රාහ්මණවරු "කිමෙක් ද? සිටාණෙනි! අපගේ දියණියගේ අන් දෙසකුත් ඇත්තේ ද" යැයි ඇසූහ. හෙතෙමේ "ආයසීයෙනි නැත" යැයි කීවේ ය. "එසේනම් කුමක් හෙයින් නිදෙස් වූ මැය පිටමං කළෙහි ද" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ.

එකෙණෙහි විශාඛාව "පළමුව මගේ මාමණ්ඩියගේ වචනයෙන් එක ක්ෂණයෙන් පිටව යෑම නුසුදුසු බැවින් මම නොගියෙමි. මා මෙහි පැමිණෙන දිනයෙහි මගේ දෙස් නිදෙස් පිරිසිදු කිරීම සඳහා මගේ පියා නුඹලාගේ අතෙහි තබා දුන්නේ ය. දැන් මගේ යෑම මම ම දැනගනිමි" යැයි පවසා "ගමනට දැසිදසුන් යානාදිය සූදානම් කරවු" යැයි අණ කරන ලද්දේ ය.

ඉක්බිති මිගාර සිටුතුමා එම බ්‍රාහ්මණයින්ගේ අත ගෙන විශාඛාව අමතා "දියණිය මා විසින් නොදැන කියන ලද්දට සමාවන්න" යැයි කීවේ ය. එවිට විශාඛාව "පියාණෙනි! ක්ෂමා කරමි. ඔබගේ ක්ෂමා කළ යුත්තට ක්ෂමා කරමි. මම වනාහී බුදු සසුනෙහි නොසැලෙන පැහැදීම් ඇති කුලයක දියණියක් වෙමි. අපි භික්ෂු සංඝයාගෙන් තොරව නොපවතිමු. ඉදින් මගේ කැමැත්තෙන් භික්ෂු සංඝයා පිළිදැගුම් කිරීමට ලබන්නෙම් නම් වසමි" යැයි කීවා ය. එවිට මිගාර සිටුතුමා "දරුව! නුඹ කැමති පරිද්දෙන් නුඹේ ශ්‍රමණයින් වහන්සේලා පිළිදැගුම් කරව" යැයි කීවේ ය.

## ❄ මිගාර සිටු කුලය ආර්‍යයීය ශ්‍රාවකයින් වීම

ඉක්බිති විශාඛාව භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කොට දෙවැනි දිනයෙහි නිවස පුරවමින් බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වඩා හිඳෙව්වා ය. නග්න පිරිස ද ශාස්තෘෘන් වහන්සේ මිගාර සිටුවරයාගේ ගෙට වැඩිබව දැන එහි ගොස් ගෙය පිරිවරා හුන්හ. විශාඛාව දක්ෂිණෝදකය දී සියලු සත්කාර පිළියෙල කොට මිගාර සිටුතුමා හට **"මගේ මාමණ්ඩිය පැමිණ භාග්‍යවතුන් වහන්සේ වළඳවත්වා"** යැයි හසුනක් යැව්වා ය. සිටුතුමා නිගණ්ඨයින්ගේ වචනය අසා **"මගේ දුව සම්බුදුන් වහන්සේ වළඳවාවා"** යැයි විශාඛාවට පැවසී ය. විශාඛාව නොයෙක් අග්‍ර රසයෙන් යුත් භෝජනයෙන් බුද්ධ ප්‍රමුඛ මහසඟරුවන වළඳවා බත්කිස නිම වූ කල්හි මිගාර සිටුතුමාට **"මගේ මාමණ්ඩිය පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ ධර්මකථාව අසත්වා"** යැයි යළි හසුනක් යැව්වා ය. එවිට සිටුතුමා **"දැන් නොගියේ නම් එය බලවත් අයුක්තියකි"** යැයි සිතා ධර්මකථාව ඇසීමේ කැමැත්තෙන් යනවිට නග්න ශ්‍රමණයෝ **"ගෘහපතිය! එසේනම් ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ධර්මය අසන්නේ නම් තිරයකින් පිටුපස හිඳ අසව"** යැයි කියා ඔවුහු කලින්ම ගොස් තිරයකින් වට කරන ලද්දේහු ය. මිගාර සිටුතුමා ගොස් භාග්‍යවතුන් වහන්සේ නොපෙනෙන ලෙස තිරයෙන් පිටුපස හුන්නේ ය. එවිට තථාගතයන් වහන්සේ **"මහ සිටාණෙනි! නුඹ තිරයෙන් පිටත හෝ හිඳුව, බිත්තියෙක් පිටත හෝ පර්වතයෙන් පිටත හෝ සක්වළින් පිටත හෝ හිඳුව. මම වනාහී සම්මා සම්බුද්ධ නම් වෙමි. මගේ හඬ නුඹට අස්වන්නට හැක්කෙමි"** යැයි රන්වන් ඵල ඇති අඹ ගසක් කඳින් ගෙන සොළවන්නාක් මෙන් ධර්ම දේශනා කළ සේක. දේශනාව අවසන්හි සිටුතුමා සෝවාන් ඵලයෙහි පිහිටා තිරය ඔසවා ශාස්තෘෘන් වහන්සේ වෙත ගොස් දැතින් ශ්‍රී පාදයන් පිරිමදිමින් මුවෙන් පා සිඹිමින් **"ස්වාමීනි මම මිගාර වෙමි"** යැයි තෙවරක් තමන්ගේ නම කියා භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී පාද මූලයෙහි වැටී වැඳ භාග්‍යවතුන් වහන්සේ අමතා **"ස්වාමීනි! මෙතෙක් කල් මම කොතැනට දෙන ලද දානය මහත්ඵල ඇත්තේද යැයි නොදැන සිටියෙමි. මේ දියණිය නිසා අද එය දැනගතිමි. සියලු අපා භයින් නිදහස් වීමි. මේ දියණිය මෙහි පැමිණියේ මට වැඩ පිණිසමය"** යැයි පවසා ශාස්තෘෘන් වහන්සේ සමීපයෙහිදීම විශාඛාවට **"දරුව නුඹ අද පටන් මගේ මව"** යැයි කියා විශාඛාව තමන්ගේ මවු

තනතුරෙහි තැබුවේ ය. එතැන් පටන් විශාඛාව **"මිගාරමාතා"** නම් වූවා ය. එම හේතුවෙන්ම විශාඛාවට උපන් පළමු පුත්‍රයාට **"මිගාර"** යැයි නම් තැබුවේ ය.

විශාඛාව පසුදින සඳහා ද භාග්‍යවතුන් වහන්සේට දානය පිණිස ආරාධනා කළා ය. එදින ශාස්තෲන් වහන්සේ කළ දේශනයෙන් විශාඛාවගේ නැන්දනිය සෝවාන් වූවා ය. එතැන් පටන් මිගාර සිටු නිවස බුදු සසුනට විවෘත වූ දොර ඇත්තේ විය. මිගාර සිටුතුමා "**මේ දියණිය මට බොහෝ උපකාර වූවා ය, එබැවින් ඇය කෙරෙහි මා තුළ ඇති ප්‍රසාදය දැක්විය යුතු ය, මේ මේල පසාධනය ද බර වැඩි ය, නිතර කයෙහි පැළඳීමට ද බැරි ය, එබැවින් නිතර කයෙහි පැළඳීමට සුදුසු ආභරණයක් කරදිය යුතු ය**" යැයි සිතා කහවණු ලක්ෂයක් වියදම් කොට "**ඝනමට්ට**" නම් ආභරණයක් කරවා, බුද්ධප්‍රමුඛ මහා සංඝරත්නය සිය නිවසට වැඩමවා මහා දානයක් දී සුවඳ මුසු පැන් සොළොස් කළයකින් විශාඛාව නහවා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි දී ඒ ආභරණය පළඳවා භාග්‍යවතුන් වහන්සේගේ පා වැන්දේ ය. ශාස්තෲන් වහන්සේ අනුමෙවෙනි බණ වදරා විහාරයට වැඩි සේක.

විශාඛාව ද දානාදී පින්කම් කරමින් ශාස්තෲන් වහන්සේ වෙතින් අට වරයක් ලැබ අහස් තලයෙහි චන්ද්‍ර මණ්ඩලය මෙන් සැමතැන්හි ප්‍රසිද්ධ වූවා ය. ඇයට පුත්‍රයෝ දසදෙනෙකුන් ද, දූවරු දසදෙනෙකුන් ද වූහ. එම දරුවන් විසිදෙනාට ද පුත්‍රයෝ දසදෙනෙකුන් හා දූවරු දසදෙනෙකුන් වශයෙන් දරුවෝ වූහ. ඔවුන් සෑම දෙනාහටම ද පුත්‍රයෝ දසදෙනෙකුන් හා දූවරු දසදෙනෙකුන් වශයෙන් දරුවෝ වූහ. මෙසේ විශාඛාවගේ දූ පුතුන්, මුණුබුරු මී මුණුබුරු පරපුර අටදහස් සාරසිය විස්සකි. මේ සියලු දෙනාම නිරෝගීමත්ව අවුරුදු එකසිය විස්සක් ජීවත් වූහ. මේ විශාඛාව අවුරුදු එකසිය විස්සක් ජීවත් වූ නමුත් පැසුනු හිසකෙස් ගසක් නැතිව සොළොස් හැවිරිදි තරුණියක මෙන් වූවා ය.

පසු කලෙක සැවැත් නුවර නැකැත් උත්සවයක් පවත්නා විටෙක ඇතුල් නුවර ගුණධර්ම වශයෙන් ගතයුතු දෙයක් නොදක විශාඛාව මහාලතා පසාධනය ද පැළඳ, තම දසීන් පිරිවරාගෙන ශාස්තෲන් වහන්සේගෙන් ධර්ම කථාවක් ඇසීම පිණිස ජේතවනාරාමය

වෙත ගොස් **"භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සමීපයට උඩඟු වෙසින් යෑම නුසුදුසුය"** යැයි සිතා එම පසාධනය කයෙන් මුදා එය එක් දසියකට දී ශාස්තෘන් වහන්සේ වෙත එළඹ වැඳ එකත්පසෙක හුන්නා ය. මේ පසාධනය දැරීමට ඇතුන් පස්දෙනෙකුන්ගේ කායබල ඇති ස්ත්‍රියකට හැර අනෙකියකට නොහැකි ය. එම දසිය ද විශාඛාවගේ පිනටම උපන් එවැනිම කාය බලයක් ඇති තැනැත්තියකි. ශාස්තෘන් වහන්සේ විශාකාව දැහැමි කථාවෙන් කරුණු දක්වමින්, එහි සමාදන් කරවමින්, තියුණු කරවමින්, සතුටු කරවමින් ධර්මදේශනා කළ සේක. ඇය ඉතා සතුටින් ධර්මශ්‍රවණය කොට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණුකොට පිටත්ව ගියා ය. මහාලතා පසාධනය තබාගත් දසිය ද ගඳකිළි පිරිවෙණ ඉදිරියෙහි එය තබාගෙන සිට විශාඛාව සමග ආපසු යනවිට පසාධනය අමතකව ගියා ය.

සෑම දිනකම ධර්ම ශ්‍රවණය කොට පිරිස නැගිට ගිය පසු ආනන්ද තෙරුන් වහන්සේ භික්ෂු භික්ෂුණී උපාසකෝපාසිකාවන්ට අමතකව ගොස් ඇති යමක් ඇත්තේදැයි සොයා බලන්නේ ය. එදින ද එලෙස සොයා බලන විට විශාඛාවගේ මේල පළඳනාව තිබෙනු දැක එය භාග්‍යවතුන් වහන්සේට දන්වූයේ ය. භාග්‍යවතුන් වහන්සේ **"එසේනම් ආනන්දය එය සුරක්ෂිත කොට තබන්න"** යැයි වදාළ සේක. ආනන්ද තෙරණුවෝ එසේ කළේ ය.

විශාඛාවගේ දසිය මඟ දුරක් ගොස් එය සිහි වී ආපසු හැරුනා ය. එවිට විශාඛාව එය කොතැනක තබන ලදද යැයි අසා ගඳකිළි පිරිවෙණ ඉදිරිපස යැයි කී කල්හි **"දැස්ස! එසේනම් ගොස් එය රැගෙන එව, යම් ලෙසකින් ආනන්ද තෙරුන් වහන්සේ එය කොතැනක හෝ ආරක්ෂාව පිණිස අරන් තබන ලද්දේ නම් මා විසින් එය තෙරුන් වහන්සේට පූජා කරන ලද්දේ ය. එසේ වුවහොත් නොගෙන එන්න"** යැයි දන්වා දසිය යැවුවා ය. දසිය ආරාමයට ගියවිට ආනන්ද තෙරණුවෝ **"එය ගඳකිළි පිරිවෙණෙහි තරප්පුවේ පසෙක තබා ඇත රැගෙන යන්න"** යැයි වදාළේ ය. එම දසිය විශාඛාවගේ අදහස ආනන්ද තෙරණුවන්ට කියා එය එහිම තබා විශාඛාව වෙත ගොස් ආයුෂ්‍යන් වහන්සේ එය අරන් තබා ඇති බව කීවා ය. එවිට විශාඛාව **"දුව ආයුෂ්‍යන් වහන්සේ විසින් ආරක්ෂා කොට තබන ලද ඒ පසාධනය නැවත මගේ කයෙහි පැළඳීම නුසුදුසු ය. එය ආරාමයෙහි තැබූ කල්හි**

**ආයර්‍යයන් වහන්සේලාට ද හිරිහැරයකි. එහෙයින් එය විකුණා දඹුවමක් කරන්නෙමි"** යැයි කියා නැවත දසිය යවා එය ගෙන්වාගත්තා ය.

විශාඛාව කඹුරන් (රන්කරුවන්) තම නිවසට ගෙන්වාගෙන එහි මිල විමසුවා ය. ඔවුහු එය කහවණු නව කෝටියක් වටිනා බව ද, කම්කරු මිල ම කහවණු ලක්‍ෂයක් යැයි ද කීහ. එවිට විශාඛාව ඒ ඇඳුම කරත්තයක තබා **"මෙය ගෙනගොස් විකුණා මුදල් ගෙන එව"** යැයි කියා ඔවුන්ට බාරකොට යැවුවා ය. ඔවුහු එය ගෙන නුවර පුරා ඇවිද්ද නමුත් එය මිලට ගන්නෙකු නුවර නොවී ය. එය යමෙකු මිල දී ගත්තේ නමුත් පැලඳීමට සුදුසු පින් ඇති ස්ත්‍රීහු ලොව දුර්ලභ ය. මේ මේල පලඳනාව පැලඳීමට මේ අන්තර් කල්පයෙහි මිහිකත තුළ පින් ඇතිව සිටියේ **"විශාඛාව, බන්ධුල මල්ලිකාව හා බරණැස් සිටු දියණිය"** යන තිදෙනා පමණකි.

## ❄ පූර්වාරාම මහා විහාරය ඉදිවීම

ඉන්පසු විශාඛාවම එය මිල දී ගෙන ඒ කහවණු නවකෝටි එක් ලක්‍ෂයක මහා ධනස්කන්ධය ගැලක තබාගෙන ජේතවනාරාමයට රැගෙන ගොස් පසෙක තබා ශාස්තෘන් වහන්සේ වෙත ගොස් වැඳ භාග්‍යවතුන් වහන්සේ අමතා **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මාගේ දසිය විසින් අමතක කොට ගිය මේල පළඳනාව ආනන්ද තෙරුන් වහන්සේ විසින් ආරක්‍ෂා කොට තබන ලද්දේ ය. ආයර්‍යයන් වහන්සේ විසින් ආරක්‍ෂා කොට තැබූ එය දැන් මගේ කයෙහි පැළඳීමට නුසුදුසු ය. එබැවින් එය විකුණා භික්‍ෂු සංඝයාහට අවශ්‍ය කැප භාණ්ඩයක් ගෙනවිත් පූජාකිරීමට සිතා විකිණීමට යැවූ නමුත් එය මිළට ගන්නෙකු නුවර නොවී ය. එබැවින් එය මම ම මිල දී ගෙන එම ධනය ආරාමයට රැගෙන ආවෙමි, ස්වාමීනි මෙය ශාස්තෘන් වහන්සේට පූජාකරමි"** යැයි කීවා ය. ශාස්තෘන් වහන්සේ **"විශාඛාවෙනි! රන් රුවන් නම් පැවිද්දන්ට නොවටනේ ය"** යැයි වදරා එය ප්‍රතික්ෂේප කළ සේක. එවිට විශාඛාව **"එයින් භාග්‍යවතුන් වහන්සේට හෝ සංඝයාට අවශ්‍ය දෙයක් රැගෙන ආ හැකි ය. භාග්‍යවතුන් වහන්සේ ඒ සඳහා කළ යුත්තක් වදරණ සේක්වා"** යැයි දන්වා සිටියා ය. භාග්‍යවතුන් වහන්සේ **"විශාඛාවෙනි!**

**එසේ නම් මේ නුවර නැගෙනහිර දෙර සංඝයා උදෙසා සුදුසු විහාරයක් කරවීම වටීය"** යැයි වදාළ සේක. විශාඛාව **"එසේය ස්වාමීනි"** යැයි එය ගෞරවයෙන් පිළිගෙන එම කහවණු නවකෝටිය දී ඉඩමක් ගෙන තවත් කහවණු නවකෝටියක් වියදම් කොට ආරාමයක් ගොඩනැගීමට පටන් ගත්තා ය.

භාග්‍යවතුන් වහන්සේ මේ කාලයෙහි එක් දිනක සුපුරුදු ලෙස අළුයම් වෙලෙහි මහා කරුණා සමවතින් නැගී පිහිටවිය යුතු සත්වයන් කවුරවුන්දැයි ලොව බලා වදරණ සේක් දෙව්ලොවින් ච්‍යුතව භද්දිය නුවර සිටු කුලයෙහි උපන් භද්දිය සිටු පුත්‍රයාගේ මගඵල නිවන්සුව ලැබීමට ඇති හේතු සම්පත් දක එදින අනාථපිණ්ඩික සිටුතුමාගේ නිවසෙහි දන් වළඳ උතුරු දිසාව බලා වැඩිසේක.

භාග්‍යවතුන් වහන්සේ යම් දිනක විශාඛාවගේ නිවසෙහි දන් වැළඳූ සේක් නම්, එදින දකුණු දෙරින් නික්ම ගොස් ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සේක. යම් දිනක ජේතවනාරාමයෙහි දන් වැළඳූ සේක් නම් එදින නැගෙනහිර දෙරින් නික්ම ගොස් පූර්වාරාමයෙහි වැඩ වාසය කරන සේක. යම් දිනයක උතුරු දෙස බලා වඩින සේක් නම් එය දක්නා මනුෂ්‍යයෝ භාග්‍යවතුන් වහන්සේ චාරිකාවෙහි වඩිනා බව දනිති. එදින භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි දන් වළඳ උතුරු දෙසට වැඩි සේක යැයි ඇසූ විශාඛාව වේගයෙන් ගොස් භාග්‍යවතුන් වහන්සේට වන්දනා කොට **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මම මෙතෙක් වියදම් කොට භාග්‍යවතුන් වහන්සේ උදෙසා විහාරයක් කරවමි, එබැවින් චාරිකාවෙහි නොවැඩ නවතිනු මැනව"** යැයි කීවා ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ **"විශාඛාවෙනි! මේ ගමන නතර කළහැකි ගමනක් නොව, යා යුතුම ගමනකි"** යැයි වදාළ සේක. එවිට විශාඛාව **"යම්කිසි හේතු සම්පත් ඇති සත්වයෙකු දක වඩින ගමනක් විය යුතුය"** යැයි සිතා **"එසේනම් ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මා විසින් මෙහි කළ නොකළ දෙය සොයා බැලීමට භික්ෂුනමක් නවත්වා වැඩිය මැනව"** යැයි කීවා ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ **"විශාඛාවෙනි! එසේනම් ඒ සඳහා නුඹ කැමති භික්ෂුවකගේ පාත්‍රය ගත මැනව"** යැයි වදාළ සේක.

විශාඛාව මෙබඳු කටයුතුවලදී ආනන්ද ස්වාමීන් වහන්සේටම ප්‍රිය කරන නමුත් මෙම විහාර කර්මාන්තයෙහි ඉක්මනින් නිමවීම අපේක්ෂා කොට ඍද්ධි විෂයෙහි අග තැන්පත් මුගලන් මහ රහතන් වහන්සේගේ පාත්‍රය ගත්තා ය. එවිට මුගලන් මහ රහතන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ මුහුණ බැලුවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ මුගලන් මහ රහතන් වහන්සේ අමතා **"මහා මොග්ගල්ලානය! නුඹ සපිරිවරින් මෙහි නවතිනු මැනව"** යැයි වදාළ සේක. මුගලන් මහ රහතන් වහන්සේ තම පිරිවර පන්සියනමක් පමණ භික්ෂූන් සමග නතර වූහ. විහාර කර්මාන්තය කරන කම්කරුවෝ මුගලන් මහ රහතන් වහන්සේගේ ආනුභාවයෙන් යොදුන් පනස - සැට පමණ දුර ගොස් ගල් වැලි හා විශාල ගස් ආදිය කරත්තවල පටවාගෙන ඉතා පහසුවෙන් එදම පැමිණෙති. ඒවා කරත්තවලට පැටවීමාදී කටයුතු ඉතා පහසුවෙන් සිදු වෙති. අපමණ බර පැට වූ නමුත් කරත්තවල අලවංගු ආදිය නොනැමෙති නොකැඩෙති. මෙසේ ඉතා පහසුවෙන් කෙටි කලකින්ම යට මහලෙහි කාමර පන්සියයක් ද, උඩුමහලෙහි කාමර පන්සියයක් ද වශයෙන් යුක්ත වූ එම විහාර කර්මාන්තය මුගලන් මහ රහතන් වහන්සේගේ ආනුභාවයෙන් නව මසකින් නිමාවට පත්කළ හැකි විය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරාගෙන මාස නවයක් පුරා මහා මණ්ඩල චාරිකාවක් වැඩ නිමවා සැවැත් පුරයට ආපසු වැඩි සේක.

## ❄ පූර්වාරාම විහාර පූජාව

භාග්‍යවතුන් වහන්සේ චාරිකාව නිමවා සැවැත් නුවර ජේතවන මහා විහාරයට වැඩම කරන බව අසා විශාඛාව භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට ගොස් ආරාධනා කොට නමන් සැදූ ආරාමයට වැඩම කරවාගෙන ඇවිත් **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මේ සාර මාසය මහසඟරුවන සමග මෙහිම වැඩහිඳිනු මැනව, වෙන තැනකට නොවැඩීම මැනවි, මම සාර මාසයක් විහාර පූජාව කරන්නෙමි."** යැයි කියා ආරාධනා කොට බුද්ධප්‍රමුඛ මහා සංඝයා තම ආරාමයෙහි වඩා හිඳුවා විහාර පූජාව පටන් ගත්තා ය. එතැන් පටන් විශාඛාව තම ආරාමයෙහි දී බුද්ධ ප්‍රමුඛ සංඝරත්නයට මහදන් දෙයි, පුද සත්කාර කරයි. මෙලෙස පුද පෙරහර දක්වමින් සාර මාසයක් ගතකොට අවසන්

දිනයෙහි සියලු දෙනා වහන්සේටම සිවුරු පිණිස වටිනා සළු පිළිගැන්වූවා ය. ඉතා කුඩා භික්‍ෂුවකට පූජා කළ සළුව කහවණු දහසක් අගනේ විය. එසේම සියලු දෙනා වහන්සේලාටම පාත්‍ර පුරා බෙහෙත් පිළිගැන්වූවා ය. මෙලෙස විශාඛාවට දනය පිණිස කහවණු නවකෝටියක් වැය විය. මෙසේ ඉඩම මිලයට ගැනීමට නවකෝටියක් ද, ආරාමය ගොඩනැගීමට නවකෝටියක් ද, ආරාම පූජාවට නවකෝටියක් ද වශයෙන් විශාඛාව බුදු සසුනට කහවණු විසිහත්කෝටියක් ධනය පූජා කරන ලද්දේ ය. මෙසේ මේ අන්තර් කල්පයෙහි මෙබඳු මහත් පූජාවක් කළ ස්ත්‍රියක් විශාඛාව හැර අන් තැනැත්තියක් මේ පෘථුවි තළයෙහි නැත.

විශාඛාව විහාර පූජාව අවසාන දිනයෙහි තම දරු මුණුබුරන් කැටිව ගොස් "**මා පෙර පැතූ සියල්ල මුදුන් පැමිණියේ ය**" යැයි අතිශයින් සතුටට පැමිණ ප්‍රාසාදය වටේ යමින් මිහිරි හඬ නගා මෙලෙස උදන් අනන්නට වූවා ය.

**කදහං පාසාදං රම්මං - සුධාමත්තිකලෙපනං,**
**විහාරදනං දස්සාමි - සඞ්කප්පො මය්හ පූරිතො.**

කෛලාශ කූට පර්වතය මෙන් සුදෙන් බබලන මැටි සුණු ආදියෙන් පිරියම් කොට මිනිස් ලොවට වෛජයන්ත ප්‍රාසාදයක් හා සමාන වූ ප්‍රාසාදයක් කරවා කවර කලෙක දන් දෙම් ද යැයි සිතා ප්‍රාර්ථනා කරගෙන ආවා වූ එම ප්‍රාර්ථනයත් සමෘද්ධ විය.

**කදහං මඤ්චපීඨඤ්ච - භිසිබිම්බොහනානි ච,**
**සෙනාසනභණ්ඩං දස්සාමි- සඞ්කප්පො මය්හ පූරිතො.**

ඇඳ පුටු කොට්ට මෙට්ට ආදී වූ සේනාසන භාණ්ඩයන්ගෙන් පිරිපුන් ප්‍රාසාදයක් කරවා කවර කලෙක දන් දෙම් ද, යැයි සිතා පාර්ථනා කරගෙන ආවා වූ එම ප්‍රාර්ථනයත් සමෘද්ධ විය.

**කදාහං සලාකභත්තං - සුචිං මංසූපසෙචනං,**
**භොජනදානං දස්සාමි - සබ්බපෙසා මය්හ පූරිතො.**

අති පවිත්‍ර රස මසවුළෙන් යුක්තව ආහාර පාන සපයා කවර කලෙක භික්ෂු සංඝයාට දන් දෙම් ද, යැයි සිතා ප්‍රාර්ථනා කරගෙන ආවා වූ එම ප්‍රාර්ථනයත් සමෘද්ධ විය.

**කදාහං කාසිකං වත්‍ථං - ඛොමකප්පාසිකානි ච,**
**චීවරදානං දස්සාමි - සබ්බපෙසා මය්හ පූරිතො.**

කෝම කෝසෙය්‍ය කපු ආදී වූ පිළී කප්පවා සිවුරු කරවා කවර කලෙක චීවර පූජා කරන්නෙම් ද, යැයි සිතා ප්‍රාර්ථනා කරගෙන ආවා වූ එම ප්‍රාර්ථනයත් සමෘද්ධ විය.

**කදාහං සප්පිනවනීතං - මධුතෙලඤ්ච ඵාණිතං,**
**භෙසජ්ජදානං දස්සාමි - සබ්බපෙසා මය්හ පූරිතො'ති"**

ගිතෙල් වෙඩරු තලතෙල් මී පැණි හකුරු ආදී බෙහෙත් සකසා කවර කලෙක ඖෂධ දන්දෙම් ද, යනුවෙන් ප්‍රාර්ථනා කරගෙන ආවා වූ එම ප්‍රාර්ථනයත් සමෘද්ධ විය.

භික්ෂූන් වහන්සේලා විශාඛාව මෙලෙස කියමින් විහාරය වටා සපිරිවෙරින් ඇවිදීම දැක භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! අපි මෙතෙක් කලක් විශාඛාව ගී කියන බවක් අසා නැත. අද විශාඛාව තම දරු මුණුබුරන් කැටුව ගී කියමින් විහාරය වටා ඇවිදින්නී ය. කිමෙක් ද ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! ඇයගේ ශරීරයෙහි පිත කිපී ද, නැතහොත් උමතු වී ද"** යනුවෙන් අසා සිටියහ.

එවිට භාග්‍යවතුන් වහන්සේ **"මහණෙනි! මාගේ දියණිය ගීත ගායනා නොකරයි. ඇයගේ අදහස දැන් සම්පූර්ණය. එබැවින් තමාගේ ප්‍රාර්ථනා සියල්ල සම්පූර්ණය යැයි සතුටට පත්ව උදන් අනමින් හැසිරෙයි"** යැයි වදාළ සේක. එවිට භික්ෂූන් වහන්සේලා **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! විශාඛාව කවදා නම් එබඳු පැතුමක් කරන ලද්දේ ද?"** යැයි අසා සිටියහ. එවිට භාග්‍යවතුන් වහන්සේ විශාඛාවගේ අතීත ප්‍රාර්ථනාව මෙසේ වදාළ සේක.

මහණෙනි! මේ මහා භද්‍ර කල්පයෙන් මහා කල්ප ලක්‍ෂයකට පෙර අවුරුදු ලක්‍ෂයක් මනුලොව ආයුෂය ඇති කල්හි පියුමතුරා (පදුමුත්තර) නම් ලෝක නායක වූ සර්‍වඥ සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වූයේ ය. ඒ භාග්‍යවතුන් වහන්සේ ගමන් වඩිනා විට අනූ රියන් පමණ පෙති ඇති, තිස් රියන් පමණ කෙසුරු ඇති, කළ නවයක් පමණ රේණු ඇති, දෙළොස් රියන් පමණ වූ හෙළ පියුම් රත් පියුම් පිපෙමින් එක් පියවරකින්වත් අත් නොහැරී චක්‍ර ලක්‍ෂණයන්ගෙන් යුත් ශ්‍රී පාද යුග්මය පිළිගන්නා බැවින් ඒ බුදුරජාණන් වහන්සේ **"පියුමතුරා"** නම් වූහ. ඒ භාග්‍යවතුන් වහන්සේ උපන් නගරය හංසවතී නුවර ය. පියාණෝ ආනන්ද නම් රජතුමා ය. මෑණියෝ සුජාතා නම් බිසව ය. ඒ බුදුරජාණන් වහන්සේට සැමකල්හි රහත් භික්‍ෂූහු ලක්‍ෂයක් පිරිවර වූහ. දෙවලය සුජාතය යන තෙරුන්වහන්සේලා අග්‍රශ්‍රාවකයෝ වූහ. සුමන තෙරණුවෝ උපස්ථායක විය. අමිතා අසමා යනුවෙන් අග්‍ර ශ්‍රාවිකාවෝ දෙදෙනෙක් වූහ. බෝධි වෘක්‍ෂය සලල නම් විය. විතින්නය, තිස්සය යනුවෙන් අග්‍ර උපස්ථායකයෝ දෙදෙනෙක් වූහ. හත්ථාය විචිත්තාය යනුවෙන් අග්‍ර උපස්ථායිකාවෝ දෙදෙනෙක් වූහ. රන් ඇගෑවක් (පහන් ගසක්) බඳුව, දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයෙන් යුත් (පදුමුත්තර) බුදුරජාණන් වහන්සේ අට පණස් රියන් ශරීරය ඇති වූහ. පදුමුත්තර භාග්‍යවතුන් වහන්සේට අග්‍ර උපස්ථායිකාව වූ උපාසිකාවක් භාග්‍යවතුන් වහන්සේ වෙතින් අට වරයක් ඉල්ලා මවු තනතුරෙහි සිට උදය සවස විහාරයට යමින් බුද්ධප්‍රමුඛ මහා සංඝයාට නිතර උපස්ථාන කරයි. එතුමිය සමග සැමදෑ යෙහෙළියක ද යයි. එතුමිය එම උපස්ථායිකාව භාග්‍යවතුන් වහන්සේ සමග ඉතා විශ්වාසවන්තව බව හා ප්‍රිය මනාප බව දැක **"බුදුරජාණන් වහන්සේලාට ප්‍රිය මනාප වීමට කුමක් කළ යුතු ද"** යැයි සිතා බුදුරජාණන් වහන්සේ වෙත එළඹ වැඳ **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මෙම උපාසිකාව මේ බුදු සසුනෙහි කවුරු නම් වේ ද"** යැයි ඇසුවා ය. භාග්‍යවතුන් වහන්සේ **"පින්වතිය, එතුමිය මාගේ සසුනෙහි අග්‍ර උපස්ථායිකාව වන්නීය"** යැයි වදාළ සේක. එවිට එතුමිය **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! අග්‍ර උපස්ථායිකාවක වන්නට කුමක් කළ යුතු ද"** යැයි ඇසුවා ය. පින්වතිය, **"ඒ සඳහා කල්ප ලක්‍ෂයක් දනාදී පාරමී පිරිය යුතුය"** යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! දැනුත් එසේ කළ හැකි ද?"** යැයි අසා හැකිබව වදාළ කල්හි බුද්ධප්‍රමුඛ ලක්‍ෂයක් භික්‍ෂූන් වහන්සේලා තම නිවසට වඩමවා සත් දිනක් මුළුල්ලෙහි මහා දන් දී

සත්වන දින සිවුරු පිණිස පිළී පූජාකොට බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාමුල වැටී වැඳ, "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මම සත් දිනක් මුළුල්ලෙහි බුද්ධප්‍රමුඛ ලක්‍ෂයක් මහසඟරුවනට සිත් සේ දන් දී සිවුරු පිණිස පිළී පූජා කිරීමේ මහඟු කුසල බලයෙන් දෙව් මිනිස් සක්විති සම්පත්තියක් නොපතමි. භාග්‍යවතුන් වහන්සේ හා සමාන බුදුරජාණන් වහන්සේ නමකගේ ශාසනයක අට වරයක් ලබා මව් තනතුරෙහි සිට සිවුපසයෙන් උපස්ථාන කරන්නියන් අතර ප්‍රධාන වන්නට ලැබේවා**" යැයි කියා සිටියා ය. භාග්‍යවතුන් වහන්සේ "**මැයගේ මේ ප්‍රාර්ථනාව සමෘද්ධ වේ ද**" යැයි අනාගතංස ඥාණයෙන් බලා සමෘද්ධ වන බව දැක, "**මෙයින් කල්ප ලක්‍ෂයකින් මතු මහා භද්‍රකල්පයෙහි ලොව පහළවන ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශාසනයෙහි දී විශාඛා නම් උපාසිකාවක වී ඒ බුදුරජාණන් වහන්සේ හමුවෙහි අට වරයක් ලැබ මවු තනතුරෙහි පිහිටා බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට උපස්ථාන කරන උපාසිකාවන් අතර අග්‍ර වන්නේය**" යැයි වදාළ සේක.

එතුමියට කල්ප ලක්‍ෂයකින් ලැබෙන එම සම්පත්තිය අද අද ලැබෙන්නක් සේ වැටහී මහත් පින්කම් සිදුකොට ආයු කෙළවර දෙව්ලොව උපන්නා ය. මෙලෙස දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳිමින් ඇවිත් කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ කාලයෙහි බරණැස් නුවර කිකී නම් කාශි රජතුමාගේ දියණියන් සත්දෙනාගෙන් බාල දියණිය වූ "**සංඝදාසියව**" ඉපිද වැඩිවිය පැමිණ බොහෝ කලක් දනාදී පින්කම් කොට ඒ කාශ්‍යප දසබලධාරීන් වහන්සේ හමුවෙහිදී ද අනාගත "**බුදුරජාණන් වහන්සේ නමකගේ ශාසනයක අට වරයක් ලබා මව් තනතුරෙහි සිට සිවුපසයෙන් උපස්ථාන කරන්නියන් අතර ප්‍රධාන වන්නට ලැබේවා**" යැයි ප්‍රාර්ථනා කරන ලද්දේ ය. එතැන් සිට ද දිව්‍ය මනුෂ්‍ය සැප විඳිමින් පාරමී පුරමින් පැමිණ මෙකල්හි ධනඤ්ජය සිටුතුමාට දියණියව උපන්නා ය. දැන් ඇය මාගේ සසුනෙහි මහත් සේ පින් කරයි. "**මහණෙනි! මෙසේ මාගේ සසුනෙහි අග තනතුරු ලැබීමට පතා කල්ප ලක්‍ෂයක් පිරූ පාරමී ගුණ පිරූ මාගේ දියණිය ගායනා නොකරයි. තම ප්‍රාර්ථනාවන් මුදුන් පත්ව ඇති බව දැක උදන් අනන්නීය**" යැයි වදරා එම කාරණය මුල්කොට ධර්මදේශනා කරන සේක් මෙම ගාථාව වදාළ සේක.

**යථාපි පුප්ඵරාසිම්හා - කයිරා මාලාගුණෙ බහූ,**
**එවං ජාතෙන මච්චෙන - කත්තබ්බං කුසලං බහුං.**

(ධම්මපදය පුෂ්ප වර්ගය)

(දක්‍ෂවූ මාලාකාරයෙක්) බොහෝ මල් එකතු කොට මල්දම් කරන්නේ යම්සේ ද, එපරිද්දෙන්ම උපන්නාවූ මිනිසා විසින් බොහෝ කුසල් කටයුතු ය. යන මේ ධම්මපද දේශනාව වදාළ සේක.

පසුකලෙක **"එතදග්ගං, භික්ඛවෙ, මම සාවිකානං දයිකානං යදිදං විසාඛා මිගාරමාතා"** යනුවෙන් **"මහණෙනි! යම් මිගාරමාතා විශාඛාව නම් උපාසිකාවක් ඇත් ද, දීමෙහි ඇලුනා වූ මාගේ ශ්‍රාවිකා උපාසිකාවන් අතර එතුමිය අග්‍ර වේය"** යැයි විශාඛා මහ උපාසිකාව අග තණතුරෙහි තබා වදාළ සේක.

මෙසේ විශාඛාව විසින් කහවණු විසිහත් කෝටියක ධනයන් වැයකොට සාදවා බුදු සසුනට පූජාකරන ලද පූර්වාරාමය නම් වූ මිගාරමාතු ප්‍රාසාදයෙහි භාග්‍යවතුන් වහන්සේ සය අවුරුද්දක් විශාඛාවට අනුග්‍රහ දැක්වීම පිණිස වැඩසිටි සේක.

මෙහිදී ආරාමය දැක්වීමෙන් යම් ගෙදුරුගමක් ඇසුරු කොට සතර ඉරියව් පවත්වමින් පහසු විහරණයෙන් වාසය කිරීමට යෝග්‍ය වාසස්ථානය දැක්වීම වේ. මෙහි සැවැත් නුවර දැක්වීමෙන් ගොදුරු ගම දක්වයි. ආරාමය දැක්වීමෙන් පැවිද්දට යෝග්‍ය නිවාසස්ථානය දක්වයි. තවද සැවැත් නුවර දැක්වීමෙන් භාග්‍යවතුන් වහන්සේගේ ගිහි ජනයාට අනුග්‍රහ කිරීම ද, ආරාමය දැක්වීමෙන් පැවිද්දන්ට අනුග්‍රහ කිරීම ද දක්වයි. එසේම නගරය දැන්වීමෙන් සිවුපසය ලැබීමෙන් අත්ථකිලමතානු යෝගයෙන් දුරු වීම ද, ආරාමය දැක්වීමෙන් වස්තු කාම ප්‍රහාණයෙන් වෙන් වීමේ උපාය ද දක්වයි. එසේම නගරය දැක්වීමෙන් ධර්ම ශ්‍රවණය ද, ආරාමය දැක්වීමෙන් ඒ ධර්මයෙහි යෙදීම ද දක්වයි. තව ද ගොදුරු ගම දැක්වීමෙන් කරුණාවෙන් ජනයා වෙත එළඹීම ද, ආරාමය දැක්වීමෙන් ඒ ගෘහවාසයෙහි ආදීනව දැක ඒවාගෙන් නිදහස්වීම ද දක්වයි. තව ද ගොදුරු ගම දැක්වීමෙන් සත්වයන්ට හිතසුව ඇති කිරීමේ අදහස ද, ආරාමය දැක්වීමෙන් අනුන්ට හිතසුව ඇති කිරීමෙහි

නොගැලී සිටීම ද දක්වයි. තව ද ගොදුරු ගම දැක්වීමෙන් ධාර්මික සැපය අත නොහැරීම නිමිති කොට ඇති පහසු විහරණය ද, ආරාමය දැක්වීමෙන් උත්තරිමනුෂ්‍ය ධර්මයෙහි යෙදීම නිමතිකොට ඇති පහසු විහරණය ද දක්වයි. තව ද ගොදුරු ගම දැක්වීමෙන් මිනිසුන්ට බොහෝ උපකාර බව ද, ආරාමය දැක්වීමෙන් දෙවියන්ට බොහෝ උපකාර බව ද දක්වයි. තව ද ගොදුරු ගම දැක්වීමෙන් ලෝක ජනයා අතර ඉපද ඔවුන් අතරම වැඩුණු බව ද, ආරාමය දැක්වීමෙන් ලෝකය හා නො ඇලුණු බව ද දක්වයි. මෙතෙක්නි මේ සූත්‍ර දේශනාව පිළිබඳ වූ නිදන වර්ණනාව දක්වන ලද්දේ ය. මෙතැන් පටන් සූත්‍ර සාරය පිළිබඳ වූ අනු පිළිවෙල අර්ථ වර්ණනාව දැක්වෙන්නේ ය.

**අථ ඛො විසාඛා මිගාරමාතා තදහුපොසථෙ යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.**

එකල්හි, මිගාර මාතාව වූ විශාඛා උපාසිකාව එදවස පොහෝ දිනයෙහි භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියාය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්නා ය.

මෙහි "**තදහුපොසථෙ**" යන මෙහි "**තදහු**" යනු එදවස ය. "**උපොසථෙ**" යනු සීලයෙන් හෝ ආහාර වර්ජනයෙන් යෙදී විසීමයි. මෙම "**උපොසථ**" යන වචනය වනාහී උපසම්පන්න භික්ෂූන් වහන්සේලාගේ පොහොය විනය කර්මය කිරීම, ගිහි පින්වතුන් සමාදන්වන අටසිල් දසසිල් ආදී සීලය, ආහාර වර්ජනය කිරීම, (උපෝසථ නාගරාජයා) ආදී කථාවන්හි නාමය, (සිල් සමාදන්ව) විසිය යුතු දවස යන අර්ථයන්හි යෙදේ. මෙහි වනාහී වාසය කරන දවස කියන ලදී. මෙම උපෝසථ දවස ද **අටවක පොහොය, චාතුද්දසී පොහොය, පණ්ණරසී පොහොය** වශයෙන් තෙවැදෑරුම් වේ. මෙහි දී සොළොස් කලාවෙන් පිරිපුන් චන්ද්‍ර මණ්ඩලය ඇති පුර පසළොස්වක පොහොය දිනය කියන ලදී.

"**යෙන භගවා තෙනුපසඞ්කමි**" ඉහත කියන ලද විශාඛා මහ උපාසිකාව විසින්ම සාදවා පූජා කරන ලද මිගාරමාතු ප්‍රාසාදය නම් වූ පූර්වාරාමයෙහි වැඩ සිටින කලෙක එක් පසළොස්වක පොහොය දිනයක

අෂ්ටාංග උපෝසථ සීලය සමාදන්ව සුවඳ මල් ආදිය ගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියා ය.

"**උපසඞ්කමිත්වා**" එසේ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ, "**භගවන්තං අභිවාදෙත්වා**" සම වූ දස නියෙන් දිලිසෙන දෙහොතින් සරසන ලද සිරසින් භාග්‍යවතුන් වහන්සේ වැඳ, "**එකමන්තං නිසීදි**" පිටුපසින් ද නොසිට, ඉදිරියෙන් ද නොසිට, ඉතා ආසන්නයේ ද නොසිට, ඉතා දුර ද නොසිට, බිත්ති ආදියට සමීපයෙහි ද නොසිට, උඩු සුළඟෙහි ද නොසිට, ඉතා පහත් තැනක ද නොසිට, උස් තැනක ද නොසිට වම් පසින් හෝ දකුණු පසින් එක් පසෙක වාඩි වී භාග්‍යවතුන් වහන්සේ දිසාවට ඇඳිලි බැඳ හුන්නා ය.

ලොව පහළ වන සම්මා සම්බුදු රජාණන් වහන්සේලා හමුවට ගිහි පැවිදි දෙව් මිනිස් ආදී කවරෙකු හෝ පැමිණෙන්නේ වේ ද, ඒ සියල්ලන් සමග පිළිසඳර කථා කරන සේක. මෘදු වූ ප්‍රිය වචනයෙන් කථා කරන සේක. කථාවෙන් අන්‍යයන් සතුටු කරන සේක. නිරන්තරයෙන්ම ප්‍රීති සහගත මුහුණින් යුතුව සිටින සේක. කවර කෙනෙකු හෝ තමන් වෙත පැමිණි කල්හි පළමුව කථා කරන සේක. පරිපූර්ණ වූ පද ව්‍යඤ්ජන සහිතව මධුර ස්වරයෙන් ධර්මදේශනා කරන සේක.

භාග්‍යවතුන් වහන්සේ එලෙස එකත්පසෙක හුන්නා වූ විශාඛා මහ උපාසිකාවගෙන් මෙසේ අසාවදාළ සේක.

"**හන්ද කුතො නු ත්වං, විසාඛෙ, ආගච්ඡසි දිවා දිවස්සාති?**" "විශාඛාවෙනි! මේ ඉර මුදුන් වූ දවල් කාලයෙහි කුමක් කරමින් සිට ආවෙහි ද?" යැයි වදාළ සේක.

එවිට විශාඛා මහ උපාසිකාව "**උපොසථාහං භන්තෙ, අජ්ජ උපවසාමීති**" "ස්වාමීනි, මම අද පෙහෙවස් සමාදන්ව උපවාසය කරමි" යැයි කීය.

එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. "**තයො ඛො මෙ, විසාඛෙ, උපොසථා. කතමෙ තයො? ගොපාලකුපොසථො, නිගණ්ඨුපොසථො, අරියුපොසථො**".

විශාඛාවෙනි, මේ උපෝසථ තුනක් වෙත්. කවර තුනක්ද? යත්, **ගෝපාලක උපෝසථය, නිගණ්ඨ උපෝසථය, අරිය උපෝසථය** යන මේ තුනය. මෙහි ගොපල්ලන් සමග සමානකළ උපෝසථය **ගෝපාලක උපෝසථය** නම් වේ. නිගණ්ඨයින් රකින උපෝසථය **නිගණ්ඨ උපෝසථය** නම් වේ. ආර්‍ය්‍ය මහෝත්තමයන් රකින උපෝසථය **අරිය උපෝසථය** නම් වේ.

## ❄ ගෝපාලක උපෝසථය

විශාඛාවෙනි, ගෝපාලක උපෝසථ කෙසේ වන්නේද?

ගව පාලකයෝ වනාහී දිනපතා ලබන වැටුපෙන් හෝ පස්දින, දසදින, අඩමාසය, සයමාසය, අවුරුද්ද ආදී කාල පරිච්ඡේද වශයෙන් ගවයන් ගෙන රකිති. මෙහි වනාහී දිනපතා ලබන වැටුපෙන් ගවයන් රකින්නකු අදහස් කරන ලදී. මේ ගව පාලකයා සවස් කාලයෙහි "**මේ ඔබගේ ගවයෝය**" යැයි එම ගවයන් හිමියන්ට බාර දී තම වාසස්ථානයට ගොස් ආහාර ගෙන නිමවා ඇඳට ගොස් මෙසේ සිතන්නේ ය. "**අද ගවයෝ අසවල් අසවල් තන්හි හැසිර තණ කෑහ. අසවල් අසවල් තන්හි පැන් පූහ. හෙට ගවයෝ අසවල් අසවල් තැන්හි හැසිරෙන්නාහ. අසවල් අසවල් තන්හි පැන් බොන්නාහ**" කියායි.

විශාඛාවෙනි, එපරිද්දෙන්ම මේ ලෝකයෙහි පෙහෙවස් සමාදන් වූ ඇතැමෙක් මෙසේ සිතයි. කෙසේ ද, "**අද මම මේ මේ කෑ යුතු දෙය කෑවෙමි. මේ මේ පානය කළ යුතු දේ පානය කෙළෙමි. මම හෙට මේ මේ කෑ යුතු දේ කන්නෙමි. මේ මේ පානය කළ යුතු දේ බොන්නෙමි**'' කියායි. හෙතෙම ඒ ලෝභ සහගත සිතින් දවස ඉක්මවයි. විශාඛාවෙනි, මේ ආර්‍ය්‍ය උපෝසථයට අයත් අෂ්ඨාංගුපෝසථ සීලයෙහි පිහිටා කයින් වචනයෙන් අකුසල් සිදු නොවූයේ ද, තෘෂ්ණා සහගත සිතින් කිළිටි

සිතින් යුක්තව අපිරිසිදු විතර්ක ඇතිව සිටි බැවින් (ගොපල්ලන් හා සමාන වූ අදහස ඇති බැවින්) ගෝපාලක උපෝසථයට අයත් තැන්හි පිහිටියේ වේ.

විශාඛාවෙනි, මෙසේ වසන ලද ගෝපාලක උපෝසථය හීන අදහස් ඇති බැවින් මහත් ඵල ඇත්තේ නොවෙයි. මහානිසංස ඇත්තේ නොවෙයි. කල්ප ලක්‍ෂ ගණන් විපාක දීමට සමත් මහේශාක්‍ය කුසලයක විපාක සේ මහත් වූ පැතිරීම් ඇත්තේ නොවෙයි. කුසල විපාකාලෝකයෙන් බැබලීමක් නොවෙයි.

## ❄ නිඝණ්ඨ උපෝසථය

විශාඛාවෙනි, නිඝණ්ඨ උපෝසථය කෙසේ වේ ද?

විශාඛාවෙනි, නිඝණ්ඨ නම්වූ ශ්‍රමණ වර්ගයක් ඇත. ඔවුහු තම ශ්‍රාවකයන් මෙසේ සමාදන් කරවති. කෙසේද? **"පින්වත, මෙහි එව. පූර්ව දිශාවෙහි යොදුන් සියයකින් එපිට සත්වයෝ වෙත් නම්, ඔවුන් කෙරෙහි දඬු මුගුරු බහා තබව. පශ්චිම දිශාවෙහි යොදුන් සියයකින් එපිට සත්වයෝ වෙත් නම්, ඔවුන් කෙරෙහි දඬු මුගුරු බහා තබව. උතුරු දිශාවෙහි යොදුන් සියයකින් එපිට සත්වයෝ වෙත් නම්, ඔවුන් කෙරෙහි දඬු මුගුරු බහා තබව. දකුණු දිශාවෙහි යොදුන් සියයකින් එපිට සත්වයෝ වෙත් නම්, ඔවුන් කෙරෙහි දඬු මුගුරු බහා තබව"** කියායි. මෙසේ සමහර සතුන් කෙරෙහි කරුණාව පිණිස, අනුකම්පාව පිණිස සමාදන් කරවති. සමහර සත්වයන් කෙරෙහි අකරුණාව පිණිස, අනනුකම්පාව පිණිස සමාදන් කරවති.

ඔවුහු පොහෝ දිනයෙහි ශ්‍රාවකයන් මෙසේ සමාදන් කරවති. කෙසේද? **"පින්වත් පුරුෂය, මෙහි එව. සියලු වස්ත්‍ර බහා තබා, මම කිසි තැනක කිසිවෙකුට බරක් නොවෙමි. අන්‍යයන්ට පළිබෝධ ඇත්තෙකු කරදර ඇත්තෙකු නොවෙමි. මට කිසි තැනෙක්හි, කිසියම් දෙයෙක්හි පළිබෝධයක් නැත. බැඳීමක් නැත. මගේ ඇතුලත හෝ පිටත හෝ කිසි තැනෙක්හි ඇඳුම් ආදී කිසි පිරිකරක බරක් බාධාවක් නැත. ඒවා**

සෙවීමේ පළිබෝධයත් මට නැත. මම සිඳහළ පළිබෝධ ඇත්තෙකු වෙමි" යැයි කියායි.

ඔහුගේ මවු පියෝ මේ අපගේ පුත්‍රයා යයි දනිත්. ඔහු ද මේ මගේ මවු පියෝ යයි දනිත්. ඔහුගේ අඹු දරුවෝ ද මේ අපගේ පියා යැයි දනිත්. ඔහු ද මේ මගේ අඹු දරුවෝ යයි දනිත්. ඔහුගේ දාසි දස් කම්කරුවෝ ද මේ අපගේ ස්වාමියායයි දනිත්. ඔහු ද මේ මගේ දාසි දස් කම්කරුවෝ යැයි දනිත්. මෙසේ යම් කලෙක සත්‍යයෙහි සමාදන් කරවිය යුත්තාහු ද, එකල බොරුවෙහි සමාදන් කරවත්. මෙලෙස වරදවා සිත පිහිටුවා ගැනීම් වශයෙන් පැවති හෙයින් ඔහුගේ මුසාවාද කීම යැයි කියමි.

බුදු සසුනෙහි ආර්‍ය්‍යය බවට පමුණුවන සත්‍ය දර්‍ශනය ඇත. එබැවින් මේ සසුනෙහි යෝගාවර තෙමේ සමථයානිකව ධ්‍යාන සමාධියෙන් නැගීසිට හෝ ශුෂ්ක විදර්‍ශනාවෙන් හෝ නාමරූප සම්මර්‍ශන ඥාණය ද, හේතුඵල ප්‍රත්‍යයන් පරිග්‍රහ කරන ප්‍රත්‍ය පරිග්‍රහ ඥාණය ද, නාම රූපයන්හි ඉපදීම බිඳීම දකින උදයවය ඥාණය ද, නාමරූපයන්ගේ බිඳීම දකින භංග ඥාණය ද, එයින් සංස්කාරයන් කෙරෙහි ඇති අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් බිඳීම දැකීමෙන් බිය දකින භයතුපට්ඨාන ඥාණය ද, සංස්කාර ධර්‍මයන් කෙරෙහි අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් දැකීමෙන් කාම රූප අරූප යන සියලු භව - ඒ භවයන්හි අණ්ඩජ ජලාබුජ සංසේදජ ඔපපාතික වශයෙන් පහලවීම සිදුවන යෝනි - මනුෂ්‍ය ගති දේවගති ප්‍රේතගති තිරච්ඡානගති නිරයගති යන පඤ්ච ගති - නානත්තකායා නානත්තසඤ්ඤී ආදී සත්ත විඤ්ඤාණට්ඨිති - නානත්තකායා නානත්තසඤ්ඤී ආදී නව සත්තාවාස යන මේ සසරෙහි ඇවිදීම සිදුවන කිසි තැනෙක සංස්කාරයන්ගෙන් වන්නා වූ අනර්‍ථයන්ගෙන් ආරක්‍ෂාවක් උවදුරු වළකාළීම පිණිස සැඟවීමට තැනක්, යා යුතු තැනක්, පිළිසරණක් නැතිබව දැකීමාදී බොහෝ ආදීනව දකින ආදීනවානුපස්සනා ඥාණය ද, එලෙස ආදීනව දැකීමෙන් ත්‍රෛභූමික සංස්කාරයන් කෙරෙහි කලකිරෙන නිබ්බිද ඥාණය ද, එලෙස ත්‍රෛභූමික සංස්කාරයන් කෙරෙහි කලකිරීම නිසා ඒ කිසිවක නොයැලී නොබැඳී එයින් නිදහස්වනු කැමැත්ත ඇතිවන මුඤ්චිතුකම්‍යතා ඥාණය ද, එලෙස කලකිරුණු ත්‍රෛභූමික සංස්කාරයන්ගෙන් නිදහස්වීම පිණිස එම සංස්කාරයන්ම අනිත්‍ය දුක්ඛ

අනාත්ම වශයෙන් විදර්ශනා කරන පටිසංඛානුපස්සනා ඥාණය ද, එලෙස දකීමෙන් සංස්කාරයෝ ශූන්‍යය යැයි පිළිගෙන මෙහි සත්ව පුද්ගල ආත්ම ස්වභාවයක් නැත යැයි සත්‍ය වශයෙන් දක සංඛාරුපේක්ෂා ඥාණයට පැමිණ චතුකෝටික ශූන්‍යතාව පරිග්‍රහ කරයි. එනම්

1. මම කියා කිසිතැනෙක ආත්ම ස්වභාවයක් නැත.
2. තමාගේ කියා ආත්ම ස්වභාවයෙන් අන් කිසිවෙකුට පළිබෝධ කළ නොහැක.
3. මම කියන ඔබ්දය හැර අන් කිසිවකුගේ ද ආත්ම ස්වභාවයක් නැත.
4. අන්‍යයන්ට ද ආත්ම ස්වභාවයෙන් පෙනීසිටිමින් මා හට පළිබෝධ කළ නොහැක.

මේ නිගණ්ඨයින්ට වනාහී මෙබඳු සම්‍යක් දර්ශනයක් නැති බැවින් චතුකෝටික ශූන්‍යතා දශර්ණය ක් ඇති නොවේ. එහෙයින් ඔවුහු මව නැත, පියා නැත, මම කියා කෙනෙකු කිසි තැනෙක නැත යනාදිය කීම සත්‍ය දර්ශනයකින් නොදක කියන බැවින් මුසාවාද කීමක් යැයි වදාළ සේක.

හෙතෙම ඒ රාත්‍රිය ගෙවීමෙන් පසු දෙවන දිනයෙහි ඇඳෙහි හොවින්නේ ද, පුටුවෙහි හිඳින්නේ ද, කැඳ පානය කරන්නේ ද, බත් වළඳන්නේ ද නිකෙලෙස් සහිත බව කියා අනුන් රවටා නුදුන්නාවූම (නොපුදන ලද) ඇඳ පුටු කැඳ බත් ආදී පරිභොග කරයි. මේ ඔහුගේ අදින්නාදනය (අනුන් රැවටීමෙන් කරන සොරකම) යයි කියමි. විශාඛාවෙනි, මෙසේ නිගණ්ඨයින් රකින පොහොය "**නිඝණ්ඨ උපෝසථය**" නම් වේ.

විශාඛාවෙනි, මේ ආය්‍යර්‍ය උපෝසථයට අයත් අෂ්ඨාංගුපෝසථ සීලයෙහි පිහිටා බොරුවෙන් සොරකමින් අනුන් රවටා කිළිටි සිතින් යුක්තව විසීම නිගණ්ඨුපෝසථයට අයත් තැන්හි පිහිටියේ වේ.

විශාඛාවෙනි, මෙසේ වසන ලද නිගණ්ඨ උපෝසථය හීන අදහස් ඇති බැවින් මහත් ඵල ඇත්තේ නොවෙයි. මහානිසංස ඇත්තේ නොවෙයි. කල්ප ලක්ෂ ගණන් විපාක දීමට සමත් මහේශාක්‍ය කුසලයක

විපාක සේ මහත් වූ පැතිරීම් ඇත්තේ නොවෙයි. කුසල විපාකාලෝකයෙන් බැබලීමක් නොවේ.

## ❄ ආයඝීය උපෝසථය

විශාඛාවෙනි, ආයඝීය උපෝසථය කෙසේ වේ ද?

විශාඛාවෙනි, කෙලෙසුන්ගෙන් කිලුටු වූ සිතින් විසූ උපෝසථය මහත්ඵල නොවන බැවින් පිරිසිදු සිතින් පෙහෙවස් සමාදන්ව වසන්නහුටම එය මහත් ඵල මහත් ආනිශංස ඇත්තේ වේ. එබැවින් ඒ කිලිටි සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම කළයුතු වේ.

විශාඛාවෙනි, කිලුටු වූ සිත කෙසේ උපක්‍රමයෙන් (උපායෙන්) පිරිසිදු කිරීම වෙයි ද? යම් කර්‍මස්ථානයක් වැඩීමෙන් සිත පිරිසිදු වේ යැයි වදරා, එය දැක්වීමට මේ අනුස්සති භාවනාවන් වදාළ සේක.

## ☸ බුද්ධ උපෝසථය

විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආයඝී ශ්‍රාවකයා කරුණු අටකින් තථාගතයන් වහන්සේගේ ගුණ සිහි කරයි. එම අට ගුණය දීඝ නිකායේ මහා ගෝවින්ද සූත්‍රයෙහි මෙසේ දැක්වේ.

එක් සමයක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ඣකූට පර්‍වතයෙහි වැඩසිටින විටෙක පඤ්චසිඛ ගාන්ධර්‍ව දිව්‍ය පුත්‍රයා මධ්‍යම රාත්‍රියෙහි භාග්‍යවතුන් වහන්සේ හමුවට පැමිණ සකසා වැඳ එකත්පසෙක සිට මෙසේ කීවේ ය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මෙයින් දින කිහිපයකට පෙර එළඹි වස් පවාරණය කරන වප් පොහෝ දින සම්පූර්ණ හඳ ඇති රාත්‍රියෙහි තව්තිසා දෙව්ලොව මහත් දිව්‍ය සමාගමයක් වූහ.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! යම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේගේ සසුනෙහි බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිර තව්තිසා දෙව්ලොව දෙවියන් අතර අලුත උපන්නාහු වෙත් ද, ඔවුහු අන් දෙවියන් අභිබවා වර්‍ණයෙන් ද යසසින් ද බබලති. ඒ කාරණයෙන් තව්තිසා වැසි දෙවියෝ බලවත් ප්‍රීතියට සතුටට පත්වෙති. එකල්හි සක්දෙවිඳු තව්තිසා වැසි දෙවියන්ගේ පැහැදීම දැන මෙසේ කීහ.

පින්වත්නි, ඒකාන්තයෙන් ශක්‍රයා සහිත වූ තව්තිසා වැසි දෙවියෝ තථාගතයන් වහන්සේට ද ධර්‍මයට ද සංඝයාට ද නමස්කාර කරමින් ප්‍රීති වෙත්. උසස් ශරීර වර්‍ණ ඇත්තා වූ ද, යසස් ඇත්තා වූ ද අලුත් දෙවියන් දක්කාහ. සුගතයන් වහන්සේ කෙරෙහි උතුම් හැසිරීම කොට මේ දෙව්ලොවට පැමිණියා වූ ඒ දිව්‍යපුත්‍රයෝ ශරීරයේ පැහැයෙන් ද යසසින් හා ආයුෂයෙන් ද අන් දෙවියන් ඉක්මවා බබලන්නාහ. මහත් ප්‍රඥ ඇති භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෝ මේ දිව්‍යලෝකයෙහි විශෙෂ බවට පැමිණියාහු ය. සක්‍රයා සහිතවූ තව්තිසා වැසි දෙවියෝ මේ කාරණය දැක තථාගතයන් වහන්සේට ද ධර්‍මයට ද සංඝයාටද වඳිමින් ප්‍රීති වෙත්.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඒ කාරණය හේතුකොටගෙන තව්තිසා දෙවියෝ බොහෝ සෙයින්ම සතුටු සිත් ඇත්තෝ ප්‍රමුදිත සිත් ඇත්තෝ හටගත් සතුට ඇත්තෝ වෙති.

"**පින්වත්නි, ඒකාන්තයෙන් දිව්‍ය සමූහයා දියුණු වෙත්. අසුරයෝ පිරිහෙත්ය**" කියායි.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එකල්හි සක්දෙව් රජ ඒ තව්තිසා වැසි දෙවියන්ගේ පැහැදීම දැන ඒ දිව්‍ය සමූහයා අමතා "**දෙව්වරුනි, ඒ භාග්‍යවතුන් වහන්සේගේ සත්‍ය ගුණ අට අසන්නට කැමැත්තාහුදැයි**" ඇසීය. "**නිදුකාණෙනි, අපි ඒ භාග්‍යවතුන් වහන්සේගේ සත්‍ය ගුණ අට අසන්නට කැමැත්තෙමු**" යැයි කීවාහු ය. එකල්හි, සක්‍රදෙවේන්ද්‍රතෙමේ තව්තිසා වැසි දෙවියන්ට භාග්‍යවතුන් වහන්සේගේ සත්‍ය වූ ගුණ අට ප්‍රකාශ කෙළේ ය.

1. ඒ භාග්‍යවතුන් වහන්සේ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ට වැඩ පිණිස, හිත පිණිස, සැප පිණිස පිළිපන් සේක් වේ ද, මෙසේ බොහෝ දෙනාට සැප පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ට වැඩ පිණිස, හිත පිණිස, සැප පිණිස පිළිපන් මේ අංගයෙන් යුක්ත වූ අන් ශාස්තෘවරයෙකු ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අතීතයෙහි ද නොමදක්නෙමු. වර්තමානයෙහි ද නොම දක්නෙමු.

2. ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දේශනා කරන ලද්දේ ය. මෙලොවදීම ඵල ලැබිය හැකි ය. කල් නොයවාම ලැබෙන ඵල ඇත්තේ ය, එව බලව යැයි අන්‍යයන් කැඳවාලීමට සුදුසු ගුණ ඇත්තේ ය. නුවණැතියන් විසින් තම සිතට පමුණුවාගෙනම දත යුත්තේ ය. මෙසේ තම නුවණින් එළඹ දැක්ක යුතු වූ ධර්මයක් දේශනා කරන්නා වූ මේ අංගයෙන් යුක්තවූ ශාස්තෘවරයෙකු ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අතීත කාලයෙහි ද නොම දැක්කෙමු. වර්තමානයෙහි ද නොම දක්නෙමු.

3. ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ කුසලය යැයි මනාව පනවන ලද්දේ ය. මේ අකුසලය යැයි මනාව පනවන ලද්දේ ය. මේ වරදය, මේ නිවරදය, මේ සේවනය කළයුතු ධර්මය, මේ සේවනය නොකටයුතු ධර්මය, මේ හීන (ලාමක) ධර්මය. මේ උතුම් ධර්මය, මේ කුසලාකුසල ධර්මයන්ට සමාන ධර්මයෝය යැයි මනාව පනවන ලද්දේ ය. මෙසේ කුසලාකුසල, සාවද්‍ය නිවරදය, සේවනය කටයුතු, සේවනය නොකටයුතු, හීන, ප්‍රණීත, කුසලාකුසල ධර්මයන්ට සමාන ධර්ම යන මේ ධර්මයන් පනවන්නා වූ මේ අංගයෙන් යුක්ත වූ ශස්තෘවරයෙකු ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අතීතයෙහි ද නොදන්නෙමු, වර්තමානයෙහි ද නොමදක්නෙමු.

4. ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට නිර්වාණයට පැමිණෙන පිළිවෙත මනාව පනවන ලද්දේ ය. යම් සේ ගංගානම් ගඟෙහි ජලය යමුනා ගඟෙහි ජලය හා සන්සන්දනය වේ ද, එසේම නිවන ද නිවනට යන පිළිවෙත ද සන්සන්දනය වේ. මෙසේ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට නිවනට පැමිණෙන

ප්‍රතිපදාව මනාකොට පනවන ලද්දී ය. ඒ නිර්වාණය හා පිළිවෙත හොඳින් සැසඳෙයි. මෙසේ නිර්වාණයට පැමිණෙන පිළිවෙතක් පනවන්නා වූ මේ අංගයෙන් යුක්තවූ ශාස්තෘවරයෙකු ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අතීතයෙහිද නොමදක්නෙමු. වර්තමානයෙහි ද නොම දක්නෙමු.

5. ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනාකොට වදාළ පිළිවෙතෙහි පිහිටියා වූ සෝවාන් මාර්ගයෙහි පටන් අර්හත් මාර්ගය දක්වා වූ සප්ත ශෛක්ෂකයන්ගේ ද, සියලු අයුරින් සසුන් බඹසර හැසිරීම සම්පූර්ණ කළ රහතන් වහන්සේලාගේ ද ලබන ලද සහයෝගය ඇත්තේම ය. ඒ භාග්‍යවතුන් වහන්සේ ඒ ආර්‍ය පුද්ගල වූ ශ්‍රාවකයන් ඉදිරියෙහි ද ඵල සමාපත්තීන්හි යෙදී වසන සේක. ඒ ශ්‍රාවකයන බැහැර කොට ද සිතින් දුරුකොට එකලාව ද ඵල සමාපත්තීන්හි යෙදී වාසය කරන සේක. මෙසේ ඒකාරාමතාවයෙහි යෙදුනා වූ මේ අංගයෙන් යුක්ත වූ ශාස්තෘවරයෙකු ඒ තථාගතයන් වහන්සේ හැර අතීතයෙහි ද නොම දක්නෙමු. වර්තමානයෙහි ද නොමදක්නෙමු.

6. ඒ භාග්‍යවතුන් වහන්සේට බොහෝ ප්‍රත්‍ය ලාභ උපන්නේ ය. කීර්තිය ද විශේෂයෙන් උපන්නේ ය. ක්‍ෂත්‍රියයන්ගේ පටන් සියලු දෙවි මිනිසුන් භාග්‍යවතුන් වහන්සේම ප්‍රියකරන සුලු ව වෙසෙති. ඒ භාග්‍යවතුන් වහන්සේ පහ වූ මද ප්‍රමාද ආදිය ඇතිව ආහාර ගනිති. මෙසේ මාන මදදී කෙලෙසුන්ගෙන් තොරව ආහාර ගන්නා වූ මේ අංගයෙන් යුක්ත වූ ශාස්තෘවරයෙකු ඒ තථාගතයන් වහන්සේ හැර අතීත කාලයෙහි ද නොම දක්නෙමු. වර්තමානයෙහි ද නොම දක්නෙමු.

7. ඒ භාග්‍යවතුන් වහන්සේ යම් පරිද්දෙකින් ධර්මානුශාසනා කරන සේක් ද, එසේම කරන සේක. යම් සේ කටයුතු කරන සේක් ද, එසේම අනුශාසනා කරන සේක. මෙසේ ඒ භාගයවතුන් වහන්සේ යථාවාදී තථාකාරී වන සේක් ද, තථාකාරී යථාවාදී වන සේක් ද, මෙසේ ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් යුක්ත වූ මේ අංගනේ යුක්ත වූ ශාස්තෘවරයෙකු ඒ භාග්‍යවතුන් වහන්සේ හැර අතීත කාලයෙහි ද නොම දක්නෙමු. වර්තමානයෙහි ද නොම දක්නෙමු.

8. ඒ භාග්‍යවතුන් වහන්සේ පහ කරණලද සැක ඇත්තේය. පහ වූ "කෙසේ ද කෙසේද" යැයි පැවති සැක ඇත්තේ ය. සම්පූර්ණ වූ සියලු අදහස් ඇත්තේ ය. ආර්‍ය්‍ය මාර්ගයෙන් සියලු කෙලෙස් වැනසූ සේක. මෙසේ දුරු කළ සැක ඇත්තාවූ පහව ගිය 'කෙසේද කෙසේද' යැයි පැවති සැක ඇත්තා වූ සම්පූර්ණ මනොරථ ඇත්තා වූ ආර්‍ය්‍ය මාර්ගයෙන් කෙලෙස් දුරු කරන ලද්දේ වූ මේ අංගයෙන් යුක්ත වූ ශාස්තෘවරෙයකු භාග්‍යවතුන් වහන්සේ හැර අතීත කාලයෙහි ද නොම දක්නෙමු. වර්තමානයෙහි ද නොම දක්නෙමු.

තව ද "**තථාගත**" යන වචනය අට කරුණකින් මෙසේ විස්තර වේ.

❖ "තථා ආගතොති තථාගතො"

**පූර්වයෙහි පහළ වූ බුදුරජාණන් වහන්සේලා අනුව ආ බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

පූර්වයෙහි පහළ වූ විපස්සී සිඛී වෙස්සභූ ආදී බුදුරජාණන් වහන්සේලා නියත විවරණය ලැබූ තැන් පටන් සමත්‍රිංශත් පාරමිතා ධර්ම පූර්ණය කොට අංග - නේත්‍ර - ධන - රාජ්‍ය - පුත්‍ර දර යන පඤ්ච මහා පරිත්‍යාග කොට, පූර්ව යෝග[1] පූර්ව චර්‍ය්‍යා[2] ධර්මඛ්‍යාන[3] ඤාතත්‍ථ චර්‍ය්‍යාදිය ද, සත් තිස් බෝධි පාක්ෂික ධර්මයන් ද පූර්ණය කොට බුදු බව දක්වා පැමිණ වදාළ සේක් ද, එලෙස ම අපගේ භාග්‍යවතුන් වහන්සේ ද, දීපංකර භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි පටන් සමත්‍රිංශත් පාරමිතා ධර්ම පූර්ණය කොට, අංග - නේත්‍ර - ධන - රාජ්‍ය - පුත්‍ර දර යන පඤ්ච මහා පරිත්‍යාග කොට පූර්ව යෝග පූර්ව චර්‍ය්‍යා ධර්මඛ්‍යාන ඤාතත්‍ථ චර්‍ය්‍යාදිය ද සත් තිස් බෝධි පාක්ෂික ධර්මයන් ද පූර්ණය කොට බුදු බව දක්වා පැමිණ වදාළ බැවින් "**තථාගත**" නම් වේ.

---

[1] පූර්ව භවයන්හි දී කළ දන සීලාදී ක්‍රියා
[2] පූර්ව භවයන්හි දී පුරුදු කළ පැවතුම්
[3] ධර්ම දේශනා කිරීම

❖ "තථා ගතොති තථාගතො"

**පූර්වයෙහි පහළ වූ බුදුරජාණන් වහන්සේලා අනුව ගිය බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

පූර්වයෙහි පහළ වූ විපස්සී සිඛී වෙස්සභූ ආදී බුදුරජාණන් වහන්සේලා යම් සේ උපන් ඇසිල්ලෙහි සම වූ පාතයන්ගෙන් උතුරු දෙසට සත් පියවරක් වැඩි සේක් ද, දෙවියන් විසින් ස්වේතච්ත්‍ර දරණ කල්හි සියලු දෙස බැලූ සේක් ද, "**අගෙගාහමසමි ලොකසස**" යනා දී සිංහ නාද කළ සේක් ද අප භාග්‍යවතුන් වහන්සේ ද එලෙස ම ගිය බැවින් "**තථාගත**" නම් වේ.

❖ "තථලකඛණං ආගතොති තථාගතො"

**ඇත්තා වූ සත්‍ය ලක්ෂණයන්ට නුවණින් පැමිණි බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

"**තථ**" යනු සත්‍යයට නමකි. භාග්‍යවතුන් වහන්සේ සියලු රූපී අරූපී (නාම රූප) ධර්මයන්ගේ සත්‍ය වශයෙන් ඇත්තා වූ පඨවි ධාතුවෙහි කර්කශ ලක්ෂණය, ආපෝ ධාතුවෙහි වැගිරෙන ලක්ෂණය, තේජෝ ධාතුවෙහි උණුසුම් ලක්ෂණය, වායෝ ධාතුවෙහි සැලෙන ලක්ෂණය, විඤ්ඤාණ ධාතුවෙහි විශේෂයෙන් දැන ගැනීමේ ලක්ෂණය ආදී ස්වලක්ෂණයන් ද, සියලු සංස්කාර ධර්මයන්හි ඇත්තා වූ අනිත්‍ය - දුක්ඛ - අනාත්ම යන සාමාන්‍ය ලක්ෂණයන් ද මනාකොට දත් බැවින් "**තථාගත**" නම් වේ.

❖ "තථධමෙම යාථාවතො අභිසමබුදෙධාති තථාගතො"

**තථ ධර්ම ඇති ලෙස අවබෝධ කල බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

දුක්ඛය සමුදය නිරෝධය මාර්ගය යන චතුරාර්‍ය සත්‍යය ධර්මයන් කිසි කලෙකවත් වෙනස් නොවී එලෙස ම පවත්නා බැවින් "**තථ**" නම් වේ. කිසි කලෙක අසත්‍ය නොවන ධර්ම බැවින් "**අවිතථ**" නම් වේ. අන්

අයුරකින් නො පවතින බැවින් "**අනඤ්ඤථ**" නම් වේ. මෙසේ චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය ඇති සැටියෙන් අවබෝධ කළ බැවින් භාග්‍යවතුන් වහන්සේ "**තථාගත**" නම් වේ.

❖ "**තථදස්සිතාය තථාගතො**"

**සත්‍ය ලෙස දක්නා බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

සත්වයන්ගේ ඇස් කන් නාස දිව කය යන ද්වාරයන්ට අරමුණු වන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන ධර්මයන් කෙරෙහි මුලා නොවී, ඇස යනු පූර්ව ජාතියෙහි දී ඇසෙන් රූප දැකීම හේතුවෙන් මතුවට ද රූප දැකීමේ කැමැත්ත නිදන කොට කර්මයෙන් හටගත් පෙනීමේ ශක්තිය ගෙන දෙන භූත රූප උපාදය රූප සමූහයකි, යනාදී ලෙස හේතු-ඵල දර්ශනය තුළින් ඇතිලෙස දක්නා ලද බැවින් භාග්‍යවතුන් වහන්සේ "**තථාගත**" නම් වේ.

❖ **තථවාදිතාය තථාගතො,**

**සත්‍ය වූ වෙනස් නොවන ධර්ම දේශනා ඇති බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

භාග්‍යවතුන් වහන්සේ යම් රැයක සම්මා සම්බුද්ධත්වයට පැමිණි සේක් ද, යම් රැයක අනුපාදිශේෂ පරිනිර්වාණයෙන් පිරිනිවන් පා වදාළ සේක් ද, මේ අතර පන්සාළිස් වසක් මුළුල්ලෙහි දේශනා කොට වදාළ "**සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධර්ම, වෙදල්ල**" යන නවාංග ශාස්තෘ ශාසනයෙන් යුත් සත්‍ය ධර්මය කිසි කලෙක වෙනස් නොවන බැවින් ද, නොවරදවාම ඒ ධර්මය අනුව සියල්ල සිදුවන බැවින් ද "**තථ**" නම් වේ. මෙසේ නොවරදින ධර්මයක්ම දේශනා කොට වදාළ බැවින් භාග්‍යවතුන් වහන්සේ "**තථාගත**" නම් වේ.

❖ **තථාකාරිතාය තථාගතො,**

**යථාවාදී තථාකාරී බැවින් ඒ භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් වචනයෙන් දේශනා කොට වදාරණ දේ කායික පැවතුම්වලට පරස් නොවී අනුකූල වන ලෙස වදාරණ සේක. කයින් කරන දේ කරන දේශනාවන්ට පරස් නොවන ලෙස කරන සේක. මෙලෙස ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ වචනය යම් සේ ද, කායික ක්‍රියාවන් ද එලෙස ම ය. කායික ක්‍රියාවන් යම් සේ ද, වචනය ද එසේම ය. මෙසේ "**යථාවාදී තථාකාරී** බැවින් ද, **තථාකාරී යථාවාදී බැවින් ද**" ඒ භාග්‍යවතුන් වහන්සේ "**තථාගත**" නම් වේ.

❖ "අභිභවනට්ඨේන තථාගතොති"

**අභිභවනය නොකළ හැකි බැවින් භාග්‍යවතුන් වහන්සේ තථාගත නම් වේ.**

ඒ භාග්‍යවතුන් වහන්සේ උඩින් භවාග්‍රය ද, යටින් අවීචිය ද, කෙළවර කොට ඇති සරසින් විශ්වය පුරා පවතින අපරිමාණ ලෝක ධාතුන්හි සියලු සත්වයන් සීලයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන් විමුක්තියෙන් විමුක්ති ඤාණ දර්ශනයෙන් ඉක්මවන සේක. සියලු සත්වයන් ඒ ගුණයන්ගෙන් යට කොට සිටින සේක. ඒ සියලු සත්වයන්ට අතුල්‍ය (අසමාන) වන සේක. අප්‍රමෙය්‍ය (මැනිය නොහැකි) වන සේක. නිරුත්තර (උසස්, ශ්‍රේෂ්ඨ) වන සේක. දෙවියන්ට අතිදේව වන සේක. ශක්‍රයන්ට අතිශක්‍ර වන සේක. බ්‍රහ්මයන්ට අති බ්‍රහ්ම වන සේක. සියලු සත්වයන්ට උතුම් වන සේක. එබැවින් ඒ භාග්‍යවතුන් වහන්සේ "**තථාගත**" නම් වේ.

විශාඛාවෙනි! නැවත ද එම අරිය ශ්‍රාවකතෙමේ **මෙසේ** තථාගතයන් වහන්සේගේ ගුණ සිහි කරයි. (මෙහිදී සියලු ලෞකික ලෝකෝත්තර ගුණයන් එක්කොට එට කරුණකින් දක්වන ලද්දේ ය. නැවත ද එම ගුණයන් වෙන්කොට ගුණ නවයක් වශයෙන් තෙරුම් ගැනීමේ පහසුව පිණිස දක්වන ලද්දේ ය. ඒවා මෙසේ ය.)

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ බැවින් ද, සියලු කෙලෙස් සතුරන් නැසූ බැවින් ද, සංසාර චක්‍රය පැවැත්මට හේතුවන කෙලෙස් බැමි සිඳ දැමූ බැවින් ද, මෙලෙස කෙලෙසුන්ගෙන් තොර ව ඉතා පිරිසිදු සිත් ඇති හෙයින් ආමිස ප්‍රතිපත්ති පූජා වන්ට සුදුසු වූ බැවින් ද, රහසිනිදු අකුසල් සිතක් හෝ ඇති නොවන බැවින් ද "**අර්හත්**" නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කළ යුතු දුක්ඛ සත්‍යය අවබෝධ කොට වදාළ බැවින් ද, ප්‍රහාණය කළ යුතු සමුදය සත්‍යය ප්‍රහාණය කොට වදාළ බැවින් ද, ප්‍රත්‍යක්ෂ කළ යුතු නිරෝධ සත්‍යය ප්‍රත්‍යක්ෂ කොට වදාළ බැවින් ද, මාර්ගය වශයෙන් වැඩිය යුතු ආර්යාෂ්ටාංගික මාර්ගය වැඩූ බැවින් ද, සංස්කාර විකාර ලක්ෂණ ප්‍රඥප්ති නිර්වාණ යන දත යුතු සියලු ධර්මයන් දැන වදාළ බැවින් ද "**සම්මා සම්බුද්ධ**" නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ පුබ්බෙනිවාස ඥානය - දිව්‍යචක්ෂු ඥානය ආශ්‍රවක්ෂය ඥානය යන **ත්‍රි විද්‍යාවන්ගෙන්** ද, විපස්සනා ඥානය - මනොමය සෘද්ධි ඥානය - සෘද්ධිවිධ ඥානය - දිව්‍යසෝත ඥානය - චේතෝපරිය ඥානය - පුබ්බෙනිවාස ඥානය - දිව්‍යචක්ෂු ඥානය ආශ්‍රවක්ෂය ඥානය යන **අෂ්ට විද්‍යාවන්ගෙන්** ද, සීල සංවරය - ඉන්ද්‍රිය සංවරය - භෝජනයෙහි පමණ දැනීම - නිදිවැරීම - ශ්‍රද්ධාව - හිරිය - ඔත්තප්පය - බහුශ්‍රැත භාවය - වීර්යය - සතිය - ප්‍රඥාව - ප්‍රථම ධ්‍යානය - දුතිය ධ්‍යානය - තතිය ධ්‍යානය - චතුර්ථ ධ්‍යානය යන **පසළොස් චරණ ධර්මයන්ගෙන්** ද යුක්ත වන බැවින් "**විජ්ජා චරණ සම්පන්න**" නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ පිරිසිදු ආර්ය මාර්ගයේ ගමන් ගත් බැවින් ද, සුන්දර නිර්වාණයට ගමන් ගත් බැවින් ද, සතර මාර්ග ඥානයෙන් නැසූ කෙලෙස් නැවත නූපදවමින් ගමන් ගත් බැවින් ද, දීපංකර බුදුරජාණන් වහන්සේ හමුවෙහි පටන් බෝධි මණ්ඩලය දක්වා මධ්‍යම ප්‍රතිපදාවෙහි ගමන් ගත් බැවින් ද "**සුගත**" නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ පඤ්චස්කන්ධ ලෝකය සර්වප්‍රකාරයෙන් අවබෝධ කොට වදාළ බැවින් ද, ලෝකය ලෝක ස්වභාවය - ලෝක සමුදය - ලෝක නිරෝධය - ලෝක නිරෝධෝපාය වශයෙන්

අවබෝධ කොට වදාළ බැවින් ද, සංස්කාර ලෝකය - සත්ව ලෝකය - අවකාශ ලෝකය යන ත්‍රිවිධ ලෝකය සර්වප්‍රකාරයෙන් අවබෝධ කොට වදාළ බැවින් ද **"ලොකවිදූ"** නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ සීලයෙන් - සමාධියෙන් - ප්‍රඥාවෙන් - විමුක්තියෙන් - විමුක්ති ඥානදර්ශනයෙන් ලොව අන් සියල්ලන්ට වඩා උත්තරීතර වන බැවින් ද, දමනය කළ යුතු දිව්‍ය - බ්‍රහ්ම - මනුෂ්‍යයා - යක්ෂ - රාක්ෂ - සිද්ධ විද්‍යාධර, තිරිසන්ගත සත්වයන් උත්තරීතර ලෙස දමනය කොට වදාළ බැවින් **"අනුත්තර පුරිසදම්මසාරථී"** නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ සත්වයන්ට මෙලොව අභිවෘද්ධිය පිණිස ද - පරලෝක අභිවෘද්ධිය පිණිස ද - නිර්වාණය පිණිස ද අනුශාසනා කොට වදාළ බැවින් ද, ජාති කාන්තාරය - ජරා කාන්තාරය - ව්‍යාධි කාන්තාරය - මරණ කාන්තාරය - සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස කාන්තාරයන්ගෙන් සත්වයන් එතර කළ බැවින් දෙව් මිනිසුන්ට **ශාස්තෘ** (ගුරුවර) වන බැවින් **"සත්ථා දේවමනුස්සානං"** නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ දුක්ඛාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කළ බැවින් ද, දුක්ඛ සමුදයාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කළ බැවින් ද, දුක්ඛ නිරෝධාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කළ බැවින් ද, දුක්ඛ නිරෝධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කළ බැවින් ද එසේම අන්‍යයන්ට අවබෝධ කර වූ බැවින් ද **"බුද්ධ"** නම් වන සේක.

❖ ඒ භාග්‍යවතුන් වහන්සේ සමත්‍රිංශත් පාරමී ධර්ම සංඛ්‍යාත පුණ්‍ය භාග්‍යයෙන් සමන්වාගත බැවින් ද, ක්ලේශාදී පඤ්ච මාරයන් බිඳ හළ බැවින් ද, ඓශ්චර්‍ය්‍යාදී භාග්‍ය ධර්මයන්ගෙන් සමන්වාගත බැවින් ද, භජනය කළ යුතු විවේක විහරණ විමෝක්ෂාදී උත්තරි මනුෂ්‍ය ධර්ම භජනය කළ බැවින් ද, සසර ගමනට හේතු වූ තෘෂ්ණාව වමාරා දමා නිර්වාණ සැපයට සැපත් වූ බැවින් ද **"භගවා"** නම් වන සේක.

මෙසේ තථාගතයන් වහන්සේගේ ලෞකික ලෝකෝත්තර බුද්ධ ගුණ සිහි කරන්නා වූ ඔහුගේ උපදින සිත් පරම්පරාව ප්‍රසන්න

වෙයි. පහදියි. සතුට උපදියි. ඔහුගේ සිතේ ක්ලේශයෝ (පඤ්ච නීවරණ) වෙත්ද, ඒ ක්ලේශයෝ පහව යත්.

විශාඛාවෙනි, කිලුටු වූ හිස උපක්‍රමයෙන් පිරිසිදු වෙයි. විශාඛාවෙනි, කිලුටු වූ හිස උපක්‍රමයෙන් කෙසේ පිරිසිදු වේ ද? නෙල්ලි කල්කය නිසා ද, මැටි නිසා ද, ජලය නිසා ද, ඊට සුදුසු වූ පුරුෂයාගේ උත්සාහය නිසා ද වෙයි. විශාඛාවෙනි, මෙසේ කිලුටු වූ හිස උපක්‍රමයෙන් පිරිසිදු වෙයි.

විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකයා ඉහත කී ලෙස තථාගතයන් වහන්සේගේ ගුණ සිහි කරයි ද, එසේ තථාගතයන් වහන්සේගේ බුද්ධ ගුණ සිහි කරන්නා වූ ඔහුගේ සිත පහදියි. සතුට උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත් ද, ඒ ක්ලේශයෝ පහ වෙත්.

විශාඛාවෙනි! කිලිටි වූ හිසෙහි පළඳනා පැළඳ නැකැත් සැනකෙලි පවත්වන්නහු නොහොබී. එසේම කිලිටි වූ සිතින් උපෝසථාංගයන් අධිෂ්ඨාන කොට සමාදන් වූ උපෝසථය මහත්ඵල, මහත් ආනිශංස ඇත්තේ නොවෙයි. පිරිසිදු සිතින් උපෝසථාංගයන් අධිෂ්ඨාන කොට සමාදන් වූ උපෝසථයම මහත්ඵල, මහත් ආනිශංස ඇත්තේ වෙයි.

විශාඛාවෙනි, මෙසේ බුදුගුණ සිහිකරන ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ බ්‍රහ්ම උපෝසථය සමාදන්ව වෙසේය යයි ද, **සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ** නැමති බ්‍රහ්මයා සමග වෙසේය යැයි ද කියනු ලැබේ. සම්‍යක් සම්බුද්ධ නැමති බ්‍රහ්මයා අරභයා සිත පහදවයි. එයින් ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහ වෙත්. මෙසේ කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයි.

## ☸ ධර්ම උපෝසථය

විශාඛාවෙනි, කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයි. විශාඛාවෙනි, කෙසේ නම් කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයිද?

විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ, භාග්‍යවතුන් විසින් දේශනා කරණ ලද ධර්මය **"ස්වාක්ඛාතය, සණ්දිට්ඨිකය, අකාලිකය, එහිඑස්සිකය, ඔපනයිකය, නුවණැත්තන් විසින් වෙන වෙනම දතයුතුය"** යි ධර්මයෙහි ගුණ සිහි කරයි.

❖ "ස්වාක්ඛාතො භගවතා ධම්මො"

ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කොට වදාළ සපරියාප්තික නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය මනාකොට දේශනා කරන ලද්දේ ය. ඒ පර්‍ය්‍යාප්ති ධර්මය වනාහී **"ආදී කල්‍යාණ මජ්ඣෙ කල්‍යාණ පරියොසාන කල්‍යාණ"** යන ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්ත බැවින් ද, අර්ථ සම්පන්න ව්‍යඤ්ජන සම්පන්න සර්ව සම්පූර්ණ පිරිසිදු බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ වන බැවින් ද **"ස්වාක්ඛාත"** නම් වන්නේ ය.

සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් දේශනාකොට වදාළ සුවාසූදහසක් ධර්මස්කන්ධයෙන් විසි එක්දහසක් ධර්මස්කන්ධ ඇති සූත්‍ර පිටකයෙහි කල්‍යාණ භේදය මෙසේ ය.

භාග්‍යවතුන් වහන්සේ වදාළ සතර පද ගාථාවක මුල් පදය **ආදිය** හෙවත් **මුල** වේ. මැද දෙපදය **මධ්‍යය** වේ. සිවුවන පදය **පරියොසානය** හෙවත් **අග** වේ.

එක් අනු සන්ධියක් ඇති සූත්‍රයක සූත්‍ර නිදානය **මූලය** නම් වේ. **"ඉදමවොච භගවා අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති"** යන මේ නිගමනය **අවසානය** නම් වේ. ඒ දෙක අතර කොටස **මධ්‍යය** නම් වේ.

නොයෙක් අනු සන්ධි ඇති සූත්‍රයක සූත්‍ර නිදානය **මූලය** නම් වේ. **ඉදමවොච භගවා** ආදී නිගමන කථාව **අවසානය** නම් වේ. ඒ අතර වූ අනු සන්ධි සියල්ල **මධ්‍යය** නම් වේ.

සූත්‍ර විනය පිටකද්වයෙහි කල්‍යාණ භේදය මෙසේ ය.

භාග්‍යවතුන් වහන්සේ විසින් කාය වාක් සංවරය තුළින් ක්ලේශ වූපසමණය පිණිස පනවා වදාළ විනය පිටකය ද, සිතෙහි කෙලෙසුන් නැගී සිටීමට නොදී පාලනය කිරීම පිණිස ද, තෘෂ්ණා දෘෂ්ටි සංක්ලේශ ප්‍රහාණය පිණිස දේශනාකොට වදාළ සූත්‍ර පිටකය ද හේතු කාරණා ඇති විටම වදාළ බැවින් **ආදී කල්‍යාණ** වේ.

වේනෙය්‍ය ජනයාට අනුරූප බැවින් හා දේශනා කරනු ලබන සීලාදියෙහි අර්ථ පරස්පර නොවන බැවින් හා හේතු උදාහරණ සහිත බැවින් **මධ්‍යය කල්‍යාණ** වේ.

අසන්නවුන්ට ශ්‍රද්ධාව උපදවා නා නා අරමුණෙහි සිත විසිර යා නොදී කුසලාරම්මණයෙහි එකඟ කොට බැඳ තබන බැවින් නිගමන වශයෙන් **පරියෝසාන කල්‍යාණ** වේ.

සූත්‍ර විනය අභිධර්ම යන පිටකත්‍රයෙහි කල්‍යාණ භේදය මෙසේය.

බුද්ධ අනුශාසනාව වූ අර්ථ කථා සහිත සියලු ත්‍රිපිටක ධර්මය ද විශේෂයකින් තොරව සීල සමාධි ප්‍රඥා වශයෙන් මෙසේ ම වේ. ශාසනයෙහි "**සීලය**" **මූලය** වේ. "**සමාධිය**" **මධ්‍යය** වේ. "**ප්‍රඥාව**" **අවසානය** වේ.

තව ද ශාසනයෙහි "**සීල සමාධි ප්‍රඥා**" **තුන මූලය** වේ. "**විදර්ශනාව හා ආර්‍ය්‍ය මාර්ගය**" **මධ්‍යය** වේ. "**ආර්‍ය්‍ය ඵලය හා නිවන**" **අවසානය** වේ.

මෙසේ ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්ත වූ ශ්‍රී සද්ධර්මය දේශනා කරන භාග්‍යවතුන් වහන්සේ යම් ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාවක් - මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවක් වදාරත් ද, නා නා නය ක්‍රමයෙන් දක්වත් ද ඒ උභය බ්‍රහ්මචර්‍ය්‍යාවම තම තමාට යෙදෙන යෙදෙන පරිදි අර්ථ සම්පත්තියෙන් යුක්ත බැවින් සාර්ථකය. ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත බැවින් සව්‍යඤ්ජනය.

එහි ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව නම් **අධිසීල ශික්ෂා, අධිචිත්ත ශික්ෂා, අධිපඤ්ඤා ශික්ෂා** යන ත්‍රිවිධ ශික්ෂාව හා සියලු පාලි ධර්මය යි. මාර්ග

බ්‍රහ්මචර්‍ය්‍යාව නම් ඒ ශික්‍ෂාත්‍රයෙන් කියැවෙන ආර්‍ය්‍ය මාර්ගය යි. මේ ත්‍රි ශික්‍ෂා සංඛ්‍යාත ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව ද, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව ද අර්‍ථ සම්පත්තියෙන් යුක්ත බැවින් **"සාර්‍ථ"** වේ. පාලි ධර්‍ම සංඛ්‍යාත ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව අර්‍ථ සම්පත්තියෙන් හා ඛ්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත බැවින් **"සාර්‍ථ"** ද, **"සඛ්‍යඤ්ජන"** ද වේ.

ඒ ද්විධ ශාසන - මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වනාහී **"සංකාසන, පකාසන, විවරණ, විභජන, උත්තානිකරණ, පඤ්ඤත්ති"** යන සය වැදෑරුම් අර්‍ථයෙන් යුක්ත බැවින් **අර්‍ථ සහිත** වේ. **"අක්ඛර, පද, ඛ්‍යඤ්ජන, ආකාර, නිරුත්ති, නිද්දේස"** යන සය වැදෑරුම් ශබ්ද සම්පත්තියෙන් යුක්ත බැවින් **ව්‍යඤ්ජන සම්පන්න** වේ. එහි :-

යමක සංක්‍ෂේපයෙන් අර්‍ථ හැඟවීම **"සංකාසන"** නම් වේ. පළමුවෙන් අර්‍ථය හැඟවීම **"පකාසන"** නම් වේ. සංක්‍ෂේපයෙන් කියන ලද්ද විස්තර වශයෙන් කීම **"විවරණ"** නම් වේ. පළමුව කියන ලද්ද නැවත නැවත බෙද දැක්වීම **"විභජන"** නම් වේ. ඒ විවරණය තව තවත් ප්‍රකට කොට කීම **"උත්තානිකරණ"** නම් වේ. ධර්‍මය තේරුම් ගතහැකි ලෙස, අසන්නන්ගේ සිත් සතුටුවන ලෙස විග්‍රහ කොට බෙද දැක්වීම **"පඤ්ඤත්ති"** නම් වේ.

මෙහි දැක් වූ **සංකාසන, පකාසන** දෙකෙන් **උද්දේසය**[1] ද, **විවරණ, විභජන,** දෙකෙන් **නිද්දේසය**[2] ද, **උත්තානිකරණ, පඤ්ඤත්ති පටිනිද්දේසය**[3] ද දක්වන ලදී.

එහි **උද්දේසය "උග්ඝටිතඤ්ඤූ"** පුද්ගලයින් සඳහා ය. නිද්දේසය **"විපචිතඤ්ඤූ"** පුද්ගලයින් සඳහා ය. පටිනිද්දේසය **"ඤෙය්‍ය"** පුද්ගලයින් සඳහා ය.

---

[1] **"චත්තාරි අරියසච්චානි"** ආදී ලෙස මාතෘකාව (සාරාංශය) දැක්වීම

[2] **"දුක්ඛං අරියසච්චං, දුක්ඛසමුදයං අරියසච්චං"** යනාදී ලෙස මාතෘකාපද විස්තරකර දැක්වීම

[3] **"කතමඤ්ච භික්ඛවෙ දුක්ඛං අරියසච්චං? ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා"** යනාදී ලෙස පදයක් පාසා අර්‍ථ විවරණය කොට බෙද දැක්වීම

එම බුද්ධ දේශනාව අක්ෂර පරිපූර්ණ කොට දේශනා කරන සේක. යමෙකු විසින් කරනු ලබන දේශනාවක් පරිපූර්ණ එක් ව්‍යඤ්ජනාක්ෂරයකින් යුක්ත වේ ද, තොල ස්පර්ශ වී ශබ්දය පිට නොවේ ද, විසිරී ගිය උච්චාරණ ඇත්තේ වේ ද, අනුනාසිකව පමණක් හඬ පිට වේ ද ඔහුට දමිළ කිරාත යවන ආදී අනාර්‍යයන්ගේ භාෂා මෙන් ව්‍යඤ්ජන පූර්ණත්වයක් නැති බැවින් එබඳු දේශනා **"අබ්‍යඤ්ජන දේශනා"** නම් වේ.

භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව වනාහි :-

**"සිථිලං ධනිතඤ්ච දීඝරස්සං - ගරුකං ලහුකඤ්ච නිග්ගහීතං,**
**සම්බන්ධං වවත්ථිතං විමුත්තං - දසධා බ්‍යඤ්ජනබුද්ධියා පභෙදෙ"**

යන දසවිධ ව්‍යඤ්ජන බුද්ධියෙහි ප්‍රභේද දසයකින් පරිපූර්ණ වේ. එහි

- ❖ **සිථිල** :- වර්ගාක්ෂරයන්හි පළමු වන **"ක, ච, ට, ත, ප"** යන අකුරු පස හා තෙවන **"ග, ජ, ඩ, ද, බ"** යන අකුරු පසය.
- ❖ **ධනිත** :- වර්ගාක්ෂරයන්හි දෙවන **"ඛ, ඡ, ඨ, ථ, ඵ"** යන අකුරු පස හා සිවුවන **"ඝ, ඣ, ඪ, ධ, භ"** යන අකුරු පස ය.
- ❖ **දීර්ඝ** :- **"ආ, ඊ, ඌ"** ආදී දීර්ඝ අක්ෂරයෝ ය.
- ❖ **රස්ස** :- **"අ, ඉ, උ"** ආදී හ්‍රස්ව අක්ෂර අක්ෂරයෝ ය.
- ❖ **ගරුක** :- **"නක්ඛමති"** ආදී ලෙස හල් අකුරක් අගට යොද දීර්ඝ අක්ෂර කීම.
- ❖ **ලහුක** :- **"න ඛමති"** ආදී ලෙස හල් අකුරක් අගට නොයොද හ්‍රස්ව අක්ෂර කීම.
- ❖ **නිග්ගහීත** :-**"0"** බින්දුව හෙවත් අනු නාසික (අනුස්වාර) ශබ්දය.
- ❖ **සම්බන්ධ** :- **"තුණ්හී අස්ස"** යන්න **"තුණ්හස්ස"** යනුවෙන් පද දෙකක් සන්ධි කොට කීම.

- ❖ **වවත්ථිත** :- "**තුණ්හී අස්ස**" යනුවෙන් පර පදය සමග සම්බන්ධ නොකොට කීම.

- ❖ **විමුත්ත** :- "**එසං ඤත්ති**" යනුවෙන් අනුනාසික නොකොට "**එසා ඤත්ති**" යනුවෙන් විවෘතව කීම.

මෙලෙස දසවිධ ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්ත වූ ධර්ම දේශනා ඇති බැවින් බුද්ධ දේශනාව "**සබ්‍යඤ්ජන**" නම් වේ.

මෙහි අක්ෂර නම් "**අකුරු**" ය. යා - සා ආදී එක් අකුරක් ඇති පද අක්ෂර වශයෙන්ම සලකනු ලැබේ. එක් අක්ෂරයක් හෝ විභක්තීන්ට නැගී අර්ථ ප්‍රකාශ කෙරෙයි නම් එය "**පද**" නම් වේ.

තව ද අකුරු දෙකකින් වැඩි වූයේ "**පද**" නම් වේ. පද කිහිපයක් එක් වීමෙන් සෑදෙන වාක්‍යය "**බ්‍යඤ්ජන**" නම් වේ.

වාක්‍යය විභාග කිරීම "**ආකාර**" නම් වේ. "**ඵුසති එසෝ, වෙදයතීති වෙදනා**" යනාදී ලෙස විග්‍රහ හෙවත් නිර්වචන දැක්වීම "**නිරුක්ති**" නම් වේ. එසේ වූ නිර්වචන විස්තර කිරීම "**නිර්දේශ**" නම් වේ.

මෙසේ වූ බුද්ධ දේශනාව **අර්ථ සහිත** ය. යමෙකුගේ ආහාර පාන ස්ත්‍රී පුරුෂ ආදීන්ගේ වර්ණනා ආශ්‍රිත දේශනාවක් වේ ද, හෙතෙම අර්ථ සහිතව නො දෙසයි. භාග්‍යවතුන් වහන්සේ වනාහී එබඳු දේශනා හැර **සතර සතිපට්ඨාන** ආදී බෝධි පාක්ෂික ධර්ම ඇතුළත් කොටම ධර්ම දේශනා කරන සේක. එබැවින් ඒ බුද්ධ දේශනාව "**සාර්ථක දේශනා**" යැයි කියනු ලැබේ.

තව ද අර්ථ ගම්භීරත්වයෙන් හා ප්‍රතිවේධ ගම්භීරත්වයෙන් යුක්ත බැවින් ධර්මය "**අර්ථ සහිත**" නම් වේ. ධර්ම ගම්භීරත්වයෙන් හා දේශනා ගම්භීරත්වයෙන් යුක්ත බැවින් ධර්මය "**බ්‍යඤ්ජන සහිත**" නම් වේ.

මෙහි **අර්‍ථ** නම් පාලි දේශනාවෙහි අර්‍ථයයි. **ප්‍රතිවේධ** නම් පාලිය හා පාලි අර්‍ථයාගේ යථාවබෝධයයි. **ධර්‍ම** නම් පාලියයි. **දේශනා** නම් මනසින් නිශ්චය කළ පාලිය දෙසීමයි.

පණ්ඩිතයන් විසින් දතයුතු බැවින් ද, විචාරය කරන්නන්ගේ චිත්ත ප්‍රසාදය ඇති කරවන බැවින් ද **අර්‍ථ සහිත** ය. ඇදහිය යුතු බැවින් ද, ලෞකික ජනයාගේ චිත්ත ප්‍රසාදය ඇති කරවන බැවින් ද **ව්‍යඤ්ජන සහිත** ය.

තව ද ගැඹුරු අදහස් ඇති බැවින් **අර්‍ථ** සහිත ය. නොගැඹුරු පද ඇති බැවින් **ව්‍යඤ්ජන** සහිත ය.

මේ මේ තැන අපරිපූර්‍ණය යැයි ඇතුළු කළ යුත්තක් නැතිව සියලු ආකාරයෙන් සම්පූර්‍ණ බැවින් "**සර්‍ව සම්පූර්‍ණය**" මේ මේ කොටස් වැඩි ඒවාය යැයි බැහැර කළයුතු කිසිවක් නැතිව සියල්ල නිදෙස් බැවින් **පිරිසිදු ය.**

තව ද සීල විශුද්ධි ආදී සම්‍යක් ප්‍රතිපත්තියෙන් අධිගමය සිදුවන බැවින් අර්‍ථ සහිතය. පර්‍යාප්තියෙන් ආගමය ව්‍යක්ත වන බැවින් (ත්‍රිපිටක බුද්ධ වචනය ඉගෙනීමෙන් නිවන වෙත ඍජුවම පමුණුවන බැවින්) ව්‍යඤ්ජන සහිත ය. සීල, සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්ති ඤාණ දර්‍ශන යන පඤ්ච ධර්‍මස්කන්ධයෙන් යුක්ත බැවින් සර්‍ව සම්පූර්‍ණ ය. දෘෂ්ටි මානාදී උපක්ලේශ නැති බැවින් ද, නිවන පිණිස පවත්නා බැවින් ද, ලෝක විශයෙහි අපේක්‍ෂා නැති බැවින් ද පිරිසිදු ය.

මේ මේ තැන අපරිපූර්‍ණය යැයි ඇතුළු කළයුත්තක් නැතිව සියලු ආකාරයෙන් සම්පූර්‍ණ බැවින් "**සර්‍ව සම්පූර්‍ණය**" මේ මේ කොටස් වැඩි ඒවාය යැයි බැහැර කළයුතු කිසිවක් නැතිව සියල්ල නිදෙස් බැවින් **පිරිසිදු ය.**

ඒ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව වනාහී අඩු ද නොවූ, වැඩි ද නොවූ සියලු ආකාරයෙන් පරිපූර්‍ණය. උපක්ලේශ රහිත වූයේ ය. යමෙක් ධර්‍ම දේශනාවක් කරන විට ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා අපේක්‍ෂා කොට කරයි ද, ඒ දෙසුම අපිරිසිදු දෙසුමකි. භාග්‍යවතුන්

වහන්සේ වනාහී ලෝක ආමිෂ අපේක්‍ෂා රහිතව අන්‍යයන්ට යහපත කිරීමේ මෛත්‍රීය පැතිරුණු මොලොක් සිතින් ම ධර්ම දේශනා කරන සේක. එබැවින් බුද්ධ දේශනාව පාරිශුද්ධ දේශනාවකි.

භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව වනාහී බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරන්නකි. මේ බ්‍රහ්මචර්‍ය්‍යාව වනාහී "**දානය, උපස්ථානය, පඤ්චසීලය, සතර බ්‍රහ්ම විහරණ, මෛථුනයෙන් වැළකීම, ස්වදාර සන්තෝෂය, වීර්‍ය්‍යය, අෂ්ටාංග උපෝසථ සීලය, ආර්‍ය්‍ය මාර්ගය, ශාසනය**" යන අර්ථයන්හි යෙදේ. මෙහි **සීල සමාධි ප්‍රඥා** යන ශික්‍ෂාත්‍රයෙන් සම්පූර්ණ "**බුද්ධ ශාසනය**" කියන ලදී. එබැවින් බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරති යැයි කියනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේ ආදි කල්‍යාණ යනාදී ලෙස පිරිසිදුව දේශනා කරන ධර්මය ත්‍රී ශික්‍ෂාවන්ට ඇතුළත් කොට ම ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරති. ශ්‍රේෂ්ඨ අර්ථයෙන් බ්‍රහ්මයන් මෙන් වස්තු කාම ක්ලේශ කාමයන්ගෙන් තොරව හැසිරීමයි. එබැවින් බ්‍රහ්මයන්ගේ ද, බුද්ධාදී උතුමන්ගේ හැසිරීම මෙයින් ප්‍රකාශ කරයි. මෙලෙස මහත් ගුණ ඇති බැවින් ධර්මය "**ස්වාක්ඛාත**" නම් වන්නේ ය.

අන්‍ය තීර්ථකයන්ගේ ධර්මයන්හි අර්ථ විපර්‍ය්‍යාසය ඇත්තේ වේ. ඔවුහු අන්තරායකර යැයි කියන ධර්ම අන්තරායකර නොවේ. නෛර්‍ය්‍යාණිකය යැයි කියන ධර්ම නෛර්‍ය්‍යාණික නොවේ. එබැවින් ඔවුන්ගේ ධර්ම "**දුරක්ඛාත**" නම් වේ. ස්වාක්ඛාත නොවේ. බුදු රජාණන් වහන්සේ වදාළ ධර්මය අන්‍ය තීර්ථකයන්ගේ ධර්මයන් මෙන් අර්ථ විපර්‍ය්‍යාස නොවේ. අන්තරායකර යැයි කියන ධර්ම අන්තරායකරම වේ. නෛර්‍ය්‍යාණිකය යැයි කියන ධර්ම නෛර්‍ය්‍යාණිකම වේ. එය කිසි කලෙකවත් වෙනස් නොවේ.

මෙලෙස බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මයෙහි කිසි කලෙකවත් අර්ථ විපර්‍ය්‍යාසයක් නොවන්නේ ය. එබැවින් "**සුට්ඨු අක්ඛාත = සවාකඛාත**" මනාව වදාළේය යනාර්ථයෙන් පර්‍ය්‍යාප්ති ධර්මය **ස්වාක්ඛාත** නම් වේ.

ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට නිර්වාණයට පැමිණෙන පිළිවෙත හොඳින් ප්‍රකාශ කරන ලද්දේ ය. ඒ නිර්වාණයත් මාර්ගයත් දෙක හොඳින් සංසන්දනය වේ. යම්සේ ගංගානම් ගඟෙහි

ජලය යමුනා ගඟෙහි ජලය හා එකතු වේ ද එසේම භාග්‍යවතුන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට නිවනට පැමිණෙන ප්‍රතිපදාව මනාකොට ප්‍රකාශ කරන ලද්දේ ය. ඒ නිර්වාණය හා නිවන ලබන පිළිවෙත හොඳින් ගැළපෙන්නේ ය. මෙලෙස විපර්‍යාසයක් නැති බැවින් ලෝකෝත්තර ධර්මය ද **ස්වාක්ඛාත** නම් වේ.

මෙලෙස අර්ථ සහිත බැවින් ද, ව්‍යඤ්ජන සහිත බැවින් ද, සර්ව සම්පූර්ණ, පිරිසිදු බ්‍රහ්මචර්‍යාව ප්‍රකාශ කරන බැවින් ද ශ්‍රී සද්ධර්මය "**ස්වාක්ඛාත**" නම් වන්නේ ය.

### ❖ "සන්දිට්ඨිකො භගවතා ධම්මො"

ආර්‍ය මාර්ගය ආර්‍ය ඵලය නිර්වාණය පිළිබඳව මනා වූ දර්ශනය ලෝකෝත්තර භාවනා මාර්ගය වශයෙන් ප්‍රත්‍යක්ෂ ලෙස දක්නහුම සසර භය නවතාලයි. පූරිත පාරමී ඇතියවුන්ට සෝතාපන්නාදී සතර මාර්ගය, සතර ඵලය හා නිර්වාණය යන නව ලෝකෝත්තර ධර්මය මෙලොවදීම ප්‍රත්‍යක්ෂයෙන් දැක කෙලෙසුන් දිනිය හැකි හෙයින් ආර්‍ය මාර්ගය "**සන්දිට්ඨික**" නම් වේ.

මෙලෙස ආර්‍ය මාර්ගය පුද්ගල සන්තානගත රාගාදී කෙලෙසුන් නැති කරන බැවින් ද, එය අන්‍යයන්ගේ සිත්හි වැඩුණු ශ්‍රද්ධාදියෙන් නොගොස් තම සිතෙහි පහළවන ප්‍රත්‍යවේක්ෂා ඥාණයන් තුළින්ම තමා විසින් ම දැක්ක යුතු බැවින් ද නවලෝකෝත්තර ධර්මය "**සන්දිට්ඨික**" නම් වේ.

### ❖ "අකාලිකො භගවතා ධම්මො"

කල් නොයවා විපාක දෙන බැවින් සෝවාන් මාර්ගය ආදී ලෝකෝත්තර මාර්ග සතර "**අකාලික**" නම් වේ. තමාගේ ඵලය ලබාදීමට නියම වූ කාලයක් නැත්තේ ද එය අකාලය නම් වේ.

ලෞකික කුසලාකුසල කර්ම එලෙස ඊ ළඟ චිත්තක්ෂණයෙහි දී විපාක නොදී උපපජ්ජ වේදනීය[1] වශයෙන් ද, අපරාපරිය වේදනීය[2] වශයෙන් ද විපාක ඵල ලබාදෙති. දිට්ඨධම්ම වේදනීය[3] වශයෙන් පස් දවසක් හෝ සත් දවසක් ඉක්ම ඵල ලබාදෙති.

ලෝකෝත්තර කුසලය වනාහී එසේ නොවී මාර්ග සිතට අනතුරුව නොවරදවාම ඵල සිත ලබා දෙයි. එබැවින් ලෝකෝත්තර මාර්ගය "**අකාලික**" නම් වේ.

❖ "ඵහිපස්සිකො භගවතා ධම්මො

එන්න මේ ධර්මය අසන්න, මෙහි යෙදී ධර්මය තුළ කියැවෙන දේ සත්‍යද යැයි විමසා බලන්න යනුවෙන් අන්‍යයන්ට කීමට එහි අන්‍යයන් යෙදවීමට උත්සාහ ඇතිකරවීමට සුදුසුකමක් මේ ධර්මය තුළ ඇති බැවින් "**ඒහිපස්සික**" නම් වේ.

මේ උතුම් ධර්මය වනාහී ඒකාන්තයෙන් විද්‍යමාන බැවින් ද, පිරිසිදු බැවින් ද එසේ කීමට සුදුසු වන්නේම ය. කිසිවක් නැතිව අත මිට මොලවා මෙහි රන් රුවන් ඇත, එන්න බලන්න යැයි කීම නුසුදුසු ය. එසේම මළ මූත්‍ර වැනි දෙයක් මිට මොලවාගත් විට අතෙහි කිසිවක් ඇත්තේ නමුත් ඇත්තේ අසූචියක් බැවින් එන්න බලන්න යැයි කීමට නුසුදුසු ය. එය වසාලීමට සුදුසු ය.

සම්මා සම්බුදු රජාණන් වහන්සේ වදාළ ලෝකෝත්තර ධර්මය වනාහී වලාකුළු නැති අහසෙහි බැබලෙන පුන්සඳ මඬල සේ ඒකාන්තයෙන් විද්‍යමාන බැවින් ද, පඬුවන් පලසෙක තැබූ ජෝතිරංග මාණික්‍යක් සේ ඒකාන්තයෙන් පිරිසිදු බැවින් ද එන්න බලන්න යැයි කීමට සුදුසු ය. එබැවින් තථාගත ධර්මය "**ඒහිපස්සික**" නම් වේ.

---

[1] මරණින් මතු ඊළඟ භවයෙහි ඒකාන්තයෙන් විපාක දෙන ධ්‍යාන කුසල කර්ම හා ආනන්තර්‍ය අකුසල කර්ම

[2] නිවනට පැමිණෙන තෙක් සසර පුරාවට අවස්ථා ලැබෙන පරිදි විපාක ගෙනදෙන කුසලාකුසල කර්ම

[3] මෙලොවදීම විපාක දෙන කර්ම

### ❖ "ඕපනයිකො භගවතා ධම්මො"

භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ ධර්මය අන් සියලු කටයුතු පසුවට තබා තම සිතට පමුණුවාගත යුතු, සිත තුළ උපදවාගත යුතු බැවින් "**ඕපනයික**" නම් වේ.

හිස හෝ හැඳි වස්ත්‍රය ගිනි ගත්තෙකු ඒ හිස හෝ වස්ත්‍රය පිළිබඳ අපේක්ෂාව අතහැර සමථ විදර්ශනා භාවනාවන්හි සිත පිහිටුවා සෝවාන් ආදී මඟ ඵල නිවන ප්‍රත්‍යක්ෂ කළහැකි වේ නම්, ඒ දුක හා සියලු සංසාර දුක් අවසන් කරදෙන බැවින් නවලෝකෝත්තර ධර්මය "**ඕපනයික**" නම් වේ.

### ❖ "පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී භගවතා ධම්මො"

භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ ධර්මයට අනුව පිළිපදින්නා වූ සත්පුරුෂයන්ට "**උග්ඝටිතඤ්ඤ, විපචිතඤ්ඤ, ඤෙය්‍ය**" ආදී ලෙස "මා විසින් මාර්ගය වඩන ලද්දේ ය, ඵලය ලබන ලද්දේ ය, නිර්වාණය සාක්ෂාත් කරන ලද්දේ ය" යැයි තම සිත තුළම ප්‍රත්‍යක්ෂ වශයෙන් දතයුතු බැවින් "**පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී**" නම් වන්නේ ය.

මෙසේ ධර්මය සිහි කරන්නා වූ තැනැත්තාගේ සිත පහදියි. සතුට උපදයි. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යති.

විශාඛාවෙනි, කිලුටු වූ ශරීරය උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි. විශාඛාවෙනි, කිලුටු වූ ශරීරය කෙසේ උපක්‍රමයෙන් පිරිසිදු කරන්නේද?

කුරුවින්ද ගල් කුඩු වලින් සාදන ලද ඇඟ උලන ගල නිසා ද, ඇඟ ගාන සුණු නිසා ද, ජලය නිසා ද, ඊට සුදුසු වූ පුරුෂයාගේ උත්සාහය නිසා ද කිලුටු වූ කය උපක්‍රමයෙන් පිරිසිදු වෙයි. (කය ජලයෙන් තෙමා ඇඟ ගාන සුණු (සබන්) කයෙහි ගා කුරුවින්ද ගල් කුඩු වලින් සාදන ලද ගලෙන් අතුල්ලා සේදීමෙන් කය පිරිසිදු වේ.)

විශාඛාවෙනි, කෙසේ කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයිද?

විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ, 'භාග්‍යවතුන් විසින් ධර්මය **ස්වාක්ඛාත ය, සන්දිට්ඨිකය, අකාලිකය, එහිපස්සිකය, ඔපනයිකය, "පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී"** යැයි ධර්මය සිහි කරයි ද, ධර්මය සිහි කරන්නා වූ ඔහුගේ සිත පහදියි. සතුට උපදයි. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යති.

විශාඛාවෙනි, මෙලෙස ආර්‍ය්‍යශ්‍රාවකයා ධර්ම උපෝසථයෙහි වසයි. ධර්මය හා සමග වාසය කරයි. ධර්මය අරභයා ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහ වෙත්. විශාඛාවෙනි, මෙසේ වනාහි කිලිටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි.

## ☸ සංඝ උපෝසථය

විශාඛාවෙනි, කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි. විශාඛාවෙනි, කෙසේ නම් කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයිද?

විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකයා **"භාග්‍යවත්හුගේ ශ්‍රාවක පුත්‍ර සංඝරත්නය සුපටිපන්නය උජුපටිපන්නය. ඤායපටිපන්නය. සාමීචිපටිපන්නය. යම් ඒ පුරිස යුග සතරක්ද, පුරුෂ පුද්ගලයෝ අට දෙනෙක්ද ඇත්තාහුද, භාග්‍යවත්හුගේ ඒ ශ්‍රාවක සංඝ තෙම ආහුණෙය්‍ය ය. පාහුනෙය්‍ය ය, දක්ඛිණෙය්‍ය ය. අඤ්ජලි කරණීය ය, ලෝකයාගේ අනුත්තර පින් කෙත ය"** යැයි සංඝයා සිහි කරයි.

### ❖ "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො"

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක පුත්‍ර භාවයට පැමිණියා වූ මහා සංඝරත්නය **"අධිසීල, අධිචිත්ත, අධිපඤ්ඤා සංඛ්‍යාත"** සුන්දර වූ ප්‍රතිපදාවට මනාව පිළිපන් බැවින් ද, ආර්‍ය්‍ය මාර්ග ප්‍රතිපදාව නම් වූ **"සම්‍යක් ප්‍රතිපදාවට"** පිළිපන් බැවින් ද, නැවත නූපදනා ලෙස

කෙලෙසුන් දුරුකරන්නා වූ "**අනිවර්ති ප්‍රතිපදාවට**" පිළිපන් බැවින් ද, නිවනට අනුලොම්ව පවත්නා වූ "**අනුලෝම ප්‍රතිපදාවට**" පිළිපන් බැවින් ද, නිවනට අවිරුද්ධ ප්‍රතිපදාව වූ "**අපච්චනික ප්‍රතිපදාවට**" පිළිපන් බැවින් ද, නිවනට අනුරූප වූ "**ධර්මානුධර්ම ප්‍රතිපදාවට**" මනාකොට පිළිපන් බැවින් "**සුපටිපන්න**" නම් වන්නේ ය.

### ❖ "උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො"

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක පුත්‍ර භාවයට පැමිණියා වූ අෂ්ටාර්‍ය පුද්ගල මහා සංඝරත්නය ඒ සම්‍යක් ප්‍රතිපදාව නම් වූ "**ඍජු ප්‍රතිපදාවට**" මනාව පිළිපන් බැවින් ද, ගෝ මුත්‍ර වංකයක් වැනිව වංක නැති "**අවංක ප්‍රතිපදාවට**" මනාව පිළිපන් බැවින් ද, චන්ද්‍රලේඛා වංකයක් වැනිව වංක නැති "**අකුටිල ප්‍රතිපදාවට**" මනාව පිළිපන් බැවින් ද, නංගලසීස වංකයක් වැනිව වංක නැති "**අජිම්හ ප්‍රතිපදාවට**" මනාව පිළිපන් බැවින් ද, කාමසුඛල්ලිකානුයෝගය අත්තකිලමතානුයෝගය යන අන්ත දෙකට නොපැමිණි "**මධ්‍යම ප්‍රතිපදාවට**" පිළිපන් බැවින් ද, කායද්වාරය - වාග්ද්වාරය, මනෝද්වාරය යන ත්‍රිවිධ ද්වාරයන්ගෙන් සිදුවන සියලු ක්‍රියාවන්හි ඇද කුද දුරු කිරීම පිළිපන් බැවින් ද "**උජුපටිපන්න**" නම් වන්නේ ය.

### ❖ "ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො"

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකපුත්‍ර භාවයට පැමිණියා වූ අෂ්ටාර්‍ය පුද්ගල මහා සංඝරත්නය "**ඤාය**" නම් වූ නිර්වාණාවබෝධය පිණිස පවත්නා වූ නිර්දෝෂී උපාය මාර්ගය වූ ආර්‍ය අෂ්ටාංගික මාර්ගයට පිළිපන් බැවින් "**ඤායපටිපන්න**" නම් වන්නේ ය.

### ❖ "සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො"

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකපුත්‍ර භාවයට පැමිණියා වූ අෂ්ටාර්‍ය පුද්ගල මහා සංඝරත්නය සසර දුකින් මුදවාලීමට සමත් "**සාමීචි පිළිවෙතට**" පිළිපන් බැවින් ද, සදේවක ලෝකවාසීන් විසින්

ශ්‍රද්ධාවෙන් කරනු ලබන ගරු සැළකිලි ආදිය පිළිගැනීමට සුදුසු ප්‍රතිපදවට පිළිපන් බැවින් ද "**සාමීචිපටිපන්න**" නම් වන්නේ ය.

❖ **"ආහුනෙය්‍යො භගවතො සාවකසඞෙඝා"**

යොදුන් සිය දහස් ගණන් දුර පිහිටි දෙව්ලොව වැනි වූ ඉතා දුරසිට නමුත් ගෙනවිත් පූජාකරන්නන්ට එම පූජාවන් මහත්ඵල කරදෙන බැවින් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකපුත්‍ර භාවයට පැමිණියා වූ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල මහා සංඝරත්නය "**ආහුනෙය්‍ය**" නම් වන්නේ ය.

❖ **"පාහුනෙය්‍යො භගවතො සාවකසඞෙඝා"**

නොයෙක් දිසාවලින් පැමිණ තම ඥාති මිත්‍රාදීන්ට සංග්‍රහ කරණු පිණිස පිළියෙල කළ භෝජනය ඔවුනට නොදී මහසඟරුවනට පූජා කිරීමෙන් එම කුසලය මහත්ඵල කරදෙන බැවින් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකපුත්‍ර භාවයට පැමිණියා වූ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල මහා සංඝරත්නය "**පාහුනෙය්‍ය**" නම් වන්නේ ය.

❖ **"දක්ඛිනෙය්‍යො භගවතො සාවකසඞෙඝා"**

පරලොව සුව පතා පිරිනමන දක්ෂිණාව පිළිගැනීමෙන් එය මහත් ඵල කරලීමට සමත් ගුණ ඇති බැවින් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකපුත්‍ර භාවයට පැමිණියා වූ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල මහා සංඝරත්නය "**දක්ඛිනෙය්‍ය**" නම් වන්නේ ය.

❖ **"අඤ්ජලිකරණීයො භගවතො සාවකසඞෙඝා"**

සමස්ථ ලෝක සත්වයා විසින් දෙහොත් මුදුනෙහි තබා ඇඳිලි බැඳ කරනු ලබන නමස්කාරයට සුදුසු ගුණ ඇති බැවින් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකපුත්‍ර භාවයට පැමිණියා වූ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල මහා සංඝරත්නය "**අඤ්ජලිකරණීය**" නම් වන්නේ ය.

❖ **"අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස භගවතො සාවකසඞ්ඝො"**

සරුසාර භූමියක වපුල බීජයෙන් ගොවියා සතුටු කරන මහත් අස්වැන්නක් ලබා දෙන්නා සේ "**අනංගන ප්‍රතිපදාව, නාලක ප්‍රතිපදාව, තුවටක ප්‍රතිපදාව, රථවිනීත ප්‍රතිපදාව, සල්ලේඛ ප්‍රතිපදාව, චතුපච්චය සන්තෝෂක භාවනාරාමතාදීපක මහා අරියවංස ප්‍රතිපදාව**" ආදී කෙලෙස් ලියාලීමට සමත් සීල සමාධි ප්‍රඥා විමුත්ති විමුත්තිඤාණදස්සන ආදී ගුණ වඩන උසස් ප්‍රතිපදාවන්හි පිහිටා කෙලෙසුන් ජයගෙන අති පාරිශුද්ධියට පත් සන්තාව ඇතිව අනන්ත ගුණ සමන්වාගත හෙයින් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකපුත්‍ර භාවයට පැමිණියා වූ අෂ්ටායර්‍ය පුද්ගල මහා සංඝරත්නය "**අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස**" නම් වන්නේ ය.

මෙලෙස මහා සංඝරත්නයෙහි ගුණ සිහි කරන්නා වූ ඔහුගේ සිත පහදියි. ප්‍රමෝදය උපදයි. සිතෙහි යම් උපක්ලේශයෝ වෙත් නම් ඒ උපක්ලේශයෝ පහව යති. යම්සේ අපිරිසිදු වස්ත්‍රය උපක්‍රමයෙන් පිරිසිදු වේ ද, එලෙසිනි.

විශාඛාවෙනි, කෙසේ කිලුටු වූ වස්ත්‍රය උපක්‍රමයෙන් පිරිසිදු වේ ද? උණුසුම නිසා ද, අලු කාරම් නිසා ද, ගොම නිසා ද, ජලය නිසා ද, පුරුෂයාගේ ඊට සුදුසු උත්සාහය නිසා ද. කිලිටු වූ වස්ත්‍රය මෙසේ උපක්‍රමයෙන් පිරිසිදු වේ. (අලු කාරම්, ගොම, ජලයෙහි බහා රත්කොට ඒ හුමාලයෙන් දෙතුන් වරක් තැම්බීමෙන් වස්ත්‍ර පිරිසිදු වේ.)

විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආයර්‍ය ශ්‍රාවක තෙමේ, 'භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝරත්නය සුපටිපන්නය. උජුපටිපන්නය. ඤායපටිපන්නය. සාමීචිපටිපන්නය. යම් ඒ පුරිස යුග සතරක් හා පුරුෂ පුද්ගලයෝ අට දෙනෙක් ඇත්තාහු ද, භාග්‍යවත්හුගේ ඒ ශ්‍රාවක සංඝ තෙම ආහුණෙය්‍ය වෙයි. පාහුනෙය්‍ය වෙයි. දක්ඛිණෙය්‍ය වෙයි. අඤ්ජලි කරණීය වෙයි. ලෝකයාගේ අනුත්තර පුන්‍ය ක්ෂේත්‍රය වේය' යැයි සංඝයා සිහි කරයි ද, සංඝයා සිහි කරන්නා වූ ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදයි. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යති.

විශාඛාවෙනි, ඒ ආයඞී පුද්ගලයන් අටදෙනාගේ ගුණයන් අරහයා සමාදන් වූ බැවින් මේ උපෝසථය "**සංඝුපෝසථය**" නම් වේ. එබැවින් ශ්‍රාවක තෙමේ සංඝ උපෝසථයෙහි වාසය කරන්නේය යැයි ද, සංඝයා හා සමග වාසය කරන්නේය යැයි ද කියනු ලැබේ. සංඝ රත්නය අරහයා ඔහුගේ සිත පහදියි. ප්‍රමෝදය උපදියි. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහ වෙත්. විශාඛාවෙනි, මෙසේ වනාහි කිලිටු සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයි.

## ☸ සීල උපෝසථය

විශාඛාවෙනි, කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි. විශාඛාවෙනි, කිලුටු වූ සිත උපක්‍රමයෙන් කෙසේ පිරිසිදු වෙයිද?

විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආයඞී ශ්‍රාවකයා "**අහො වත මෙ සීලානි අඛණ්ඩානි, අච්ඡිද්දානි, අසබලානි, අකම්මාසානි, භුජිස්සානි, විඤ්ඤුප්පසත්ථානි, අපරාමට්ඨානි, සමාධි සංවත්තිකානි**" යනුවෙන් "**සාධු! සාධු! මගේ සීලය කඩ නොවූ, සිදුරු නොවූ, පුල්ලි නොවූ, කැලැල් නොවූ, තෘෂ්ණාවට යටත් නොවූ, නුවණැතියන් විසින් ප්‍රශංසා කරණ ලද, තෘෂ්ණා දෘෂ්ටීන් විසින් අල්වා නොගන්නා ලද සමාධිය පිණිස පවත්නා එකකි**" යැයි ගුණ වශයෙන් තමාගේ සීලය සිහි කරයි.

ගිහි වූ හෝ පැවිදි වූ හෝ යමෙකු ගේ සීලයෙහි කොන් කැඩුණු වස්ත්‍රයක මෙන් මුලින් හෝ අගින් හෝ එක ශික්ෂාපදයකුදු නොකැඩුණේ ද එය "**අඛණ්ඩ**" නම් වේ.

මැද සිදුරු වූ වස්ත්‍රයක් මෙක් මැදින් එක ශික්ෂාපදයකුදු නොකැඩුණේ ද එය "**අච්ඡිද්ද**" නම් වේ.

පිටෙහි හෝ කුසෙහි දික් - රවුම් ආදී හැඩ ඇති, කලු - රතු ආදී නොයෙක් පැහැති ගවදෙනක් මෙන්, එක පිළිවෙලට සිකපද නොබිඳ රැකීම "**අසබල**" නම් වේ.

නොයෙක් පැහැයෙන් විසිතුරු වූ තිත් ඇති ලවදෙනක් මෙන් තැනින් තැනින් සිකපද නොබිඳ රැකීම "**අකලමාස**" නම් වේ.

ඉහත කියන ලද "**අඛණ්ඩ, අච්ඡිද්ද, අසබල, අකම්මාස**" යන අංගයන්ගෙන් යුත්තව පිරිසිදුව රක්නා ලද සීලය තෘෂ්ණා දසත්වයෙන් නිදහස් කරවන බැවින් "**භුජිස්ස**" නම් වේ.

එබඳු නොකිලිටි සීලයම බුදු පසේබුදු මහරහත් ආදී උතුමන්ගේ ප්‍රශංසාවට ලක්වන බැවින් "**විඤ්ඤුප්පසත්ථ**" නම් වේ.

එබඳු වූ සීලය රක්නහු විසින් "**මම මෙලෙස සිල් රැකීමෙන් දෙවියෙක් වන්නෙමි, ප්‍රසිද්ධ කෙනෙකු වන්නෙමි**" යැයි තණ්හා දිට්ඨි වශයෙන් නොගන්නා බැවින් ද "**නුඹගේ මේ සීලයෙහි මේ මේ දෙස් ඇතය**" යැයි කිසිවෙකුට දෙස් නොකිය හැකි ලෙස රක්නා ලද නිදෙස් වූ සීලය "**අපරාමට්ඨ**" නම් වේ

එසේ වූ සීලය උපචාර සමාධි අපර්ණා සමාධි විදර්ශනා ඥාන උපදවාලීමට සමත් බැවින් "**සමාධිසංවත්තනික**" නම් වේ.

මෙලෙස තමා විසින් ගරුකොට රක්නා ලද සීලය සිහි කරන්නා වූ ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යති.

විශාඛාවෙනි, කිලුටු වූ කැඩපතකින් මනාව සරසා පැහැපත් කළ ශරීරය බලන කල්හි පැහැදිලිව නොපෙනෙයි. පිරිසිදු කැඩපතකින් බලන කල්හි මනාව පෙනෙයි. එබැවින් ඒ කිලිටි වූ කැඩපත උපක්‍රමයෙන් පිරිසිදු කළ යුතු ය.

විශාඛාවෙනි, කිලුටු වූ කැඩපත උපක්‍රමයෙන් කෙසේ පිරිසිදු වෙයි ද? තෙල් නිසා ද, අළු නිසා ද, කොස්ස නිසා ද, පුරුෂයාගේ ඒ සඳහා වූ උත්සාහය නිසා ද පිරිසිදු වේ. (ඒ කැඩපත තෙලින් තෙමා පෙඟුණු විට අලු දමා අස්ලොමින් හෝ නියඟ කෙඳිවලින් කළ බුරුසුවෙන් (කොස්ස) මැදීමෙන් කැඩපත පිරිසිදු වේ.) මෙලෙස පිරිසිදු කළ කැඩපතින් රූප දර්ශනය පහසු වෙයි.

විශාඛාවෙනි, මෙසේ කිලුටු වූ කැඩපතින් නිසිලෙස රූප දර්ශනය නොවන්නා සේ කිලිටි වූ සිත ඇතිවිට සමාදන් වූ උපෝසථය මහත් ඵල මහත් ආනිශංස නොවෙයි. එබැවින් උපක්‍රමයෙන් කැඩපත පිරිසිදු වන්නා සේ කිලිටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කළ යුතු ය.

විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකයා කඩ නොවූ, සිදුරු නොවූ, කබර නොවූ, කැලැල් නොවූ, තෘෂ්ණාවට යටත් නොවූ, නුවණැතියන් විසින් ප්‍රශංසා කරණ ලද, තෘෂ්ණා දෘෂ්ටීන් විසින් අල්වා නොගන්නා ලද සමාධිය පිණිස පවත්නා තමාගේ සීලය සිහි කරයි ද, සීලය සිහි කරන්නා වූ ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතෙහි යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යති.

විශාඛාවෙනි, මේ ආර්‍ය්‍ය ශ්‍රාවකයා සීලය සිහිකිරීම් වශයෙන් සමාදන් වූ සීලූපෝසථයයෙහි වසන්නෙකු, නිත්‍ය සීලය උපෝසථ සීලය හා සමග වාසය කරන්නෙකු වෙයි. එයින් ඔහුගේ සිත සීලය අරබයා පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යති. විශාඛාවෙනි, මෙසේ කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි.

## ☸ දේවතා උපෝසථය

විශාඛාවෙනි, කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයි. විශාඛාවෙනි, කෙසේ කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වෙයි ද?

විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකයා චාතුර්මහාරාජික දෙව්ලොව දෙවියෝ ඇත්තාහ. තව්තිසා දෙව්ලොව දෙවියෝ ඇත්තාහ. යාම දෙව්ලොව දෙවියෝ ඇත්තාහ. තුසිත දෙව්ලොව දෙවියෝ ඇත්තාහ. නිර්මාණරතී දෙව්ලොව දෙවියෝ ඇත්තාහ. පරිනිර්මිත වසවර්ති දෙව්ලොව දෙවියෝ ඇත්තාහ. එයින් මත්තෙහි බ්‍රහ්ම කායික දෙවියෝ ඇත්තාහ. යම්බඳු වූ ශ්‍රධාවකින් යුක්ත වූ ඒ දෙවියෝ මෙයින් චුතව එහි උපන්නාහු ද, මා හටද එබඳු වූ ශ්‍රද්ධාවක් ඇත. යම්බඳු වු වූ සීලයකින් යුක්ත වූ ඒ දෙවියෝ මෙයින් චුතව එහි උපන්නාහු ද, එබඳු වු සීලයක් මටද ඇත. යම්බඳු වූ ශ්‍රැතයකින් යුත් ඒ දෙවියෝ

මෙයින් චුතව එහි උපන්නාහු ද, මටද එබඳු වූ ශ්‍රැතයක් ඇත. යම්බඳු වූ ත්‍යාගයකින් යුත් ඒ දෙවියෝ මෙයින් චුතව එහි උපන්නාහු ද, මටද එබඳු වූ ත්‍යාගයක් ඇත. යම්බඳු වූ ප්‍රඥවකින් යුත් ඒ දෙවියෝ මෙයින් චුතව එහි උපන්නාහු ද, මටද එබඳු වූ ප්‍රඥවක් ඇත, යැයි ඒ දෙවියන් සාක්‍ෂ්‍ය කොට තමාගේ ද, ඒ දෙවියන්ගේ ද ශ්‍රද්ධාව ද, සීලය ද, ශ්‍රැතය ද, ත්‍යාගය ද, ප්‍රඥව ද සිහි කරන්නා වූ ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ ප්‍රහීණ වෙති.

විශාඛාවෙනි, කිලුටු වූ රන් ආභරණයක් පැළඳ නැකැත් ක්‍රීඩාවන්හි යෙදෙන කල්හි අලංකාරමත් නොවෙයි. එබැවින් එම පළඳනාව උපක්‍රමයෙන් පිරිසිදු කළ යුතු ය. විශාඛාවෙනි, කිලුටු වූ ආභරණය කෙසේ උපක්‍රමයෙන් පිරිසිදු වන්නේ ද? විශාඛාවෙනි, උඳුන නිසා ද, ලුණු නිසා ද, ගෙරුක (මැටි) චූර්ණය නිසා ද, පිඹින නලය හා පෙරලන අඬුව නිසා ද, ඊට සුදුසු වූ රන්කරුගේ උත්සාහය නිසා ද කිලුටු වූ ආභරණය උපක්‍රමයෙන් පිරිසිදුවීම වෙයි. (ලුණු, මැටි චූර්ණය උඳුනෙහි බහා පිරිසිදු කළයුතු රන් ආභරණ එහි දමා නලයෙන් පිඹිමින් ගින්න සමව පවත්වාගනිමින්, අඬුවෙන් ඒ මේ අත පෙරලමින් කරන රන්කරුගේ උත්සාහය නිසා ආභරණ පිරිසිදු වේ.)

එපරිද්දෙන්ම කිලුටු වූ සිත ඇතිව පිහිටියා වූ උපෝසථය මහත් ඵල මහත් ආනිශංස නොවෙයි. පිරිසිදු සිත ඇතිවිට සමාදන් වූ උපෝසථයම මහත් ඵල මහත් ආනිශංස වෙයි. විශාඛාවෙනි, උපක්‍රමයෙන් පිරිසිදුවීම වෙයි.

විශාඛාවෙනි, කෙසේ කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු වේ ද?

විශාඛාවෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකයා චාතුර්මහාරාජික දෙවියෝ ඇත්තාහ. තව්තිසා දෙවියෝ ඇත්තාහ. යාම දෙවියෝ ඇත්තාහ. තුසිත දෙවියෝ ඇත්තාහ. නිර්මානරතී දෙවියෝ ඇත්තාහ. පරිනිර්මිත වසවර්ති දෙවියෝ ඇත්තාහ. එයින් මත්තෙහි බ්‍රහ්ම කායික දෙවියෝ ඇත්තාහ. යම්බඳු වූ ශ්‍රධාවකින් යුක්ත වූ ඒ දෙවියෝ මෙයින් චුතව එහි උපන්නාහු ද, මා හටද එබඳු වූ ශ්‍රද්ධාවක් ඇත. යම්බඳු වූ වූ සීලයකින් යුක්ත වූ ඒ දෙවියෝ මෙයින් චුතව එහි උපන්නාහු ද,

එබඳු වූ සීලයක් මටද ඇත. යම්බඳු වූ ශ්‍රැතයකින් යුත් ඒ දෙවියෝ මෙයින් චුතව එහි උපන්නාහු ද, මටද එබඳු වූ ශ්‍රැතයක් ඇත. යම්බඳු වූ වූ ත්‍යාගයකින් යුත් ඒ දෙවියෝ මෙයින් චුතව එහි උපන්නාහු ද, මටද එබඳු වූ ත්‍යාගයක් ඇත. යම්බඳු වූ වූ ප්‍රඥවකින් යුත් ඒ දෙවියෝ මෙයින් චුතව එහි උපන්නාහු ද, මට ද එබඳු වූ ප්‍රඥවක් ඇත. තමාගේ ද, ඒ දෙවියන්ගේ ද ශ්‍රද්ධාව ද, සීලය ද, ශ්‍රැතය ද, ත්‍යාගය ද, ප්‍රඥව ද සිහි කරන්නා වූ ඔහුගේ සිත පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත් නම් ඒ ක්ලේශයෝ පහව යති.

මෙසේ දෙවියන් සාක්ෂ්‍ය ස්ථානයෙහි තබා තමාගේ ගුණ සිහිකරන්නහු විසින් සමාදන් වූ උපෝසථය **"දේවතා උපෝසථය"** නම් වේ. එබැවින් දේවතා උපෝසථයෙහි වසයි යැයි ද, දෙවියන් සමග වාසය කෙරේය යැයි ද කියනු ලැබේ. ඔහුගේ සිත දෙවියන් අරබයා පහදියි. ප්‍රීතිය උපදියි. ඔහුගේ සිතේ යම් ක්ලේශයෝ වෙත් නම්, ඒ ක්ලේශයෝ පහ වෙත්. විශාඛාවෙනි, මෙසේ කිලුටු වූ සිත උපක්‍රමයෙන් පිරිසිදු කිරීම වෙයි.

## ☸ ආර්‍ය්‍ය උපෝසථය

විශාඛාවෙනි, ඒ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ මෙසේ සිතයි. කෙසේද?

රහතන් වහන්සේලා ප්‍රාණවධාදී අකුසල සිදුවීමට හේතුවන කෙලෙසුන් කර්මක්ෂයකර ඥානයෙන් සම්පූර්ණයෙන් ප්‍රහාණය කොට ඇති බැවින් දිවි ඇතිතාක් පරපණ නැසීමේ චේතනා සංඛ්‍යාත දුසිල් බව අතහැර ප්‍රාණඝාතය දුරුකොට, ප්‍රාණඝාතයෙන් වෙන්ව වාසය කරයි. එසේම අනුන් නැසීම පිණිස දණ්ඩක් හෝ සැතක් හෝ රැගෙන නොපැවතීමෙන් බහාතැබූ දඬු ඇත්තෝ ව බහාතැබූ අවි ආයුධ ඇත්තෝව වෙසෙති.

ධර්මගරුක භාවයෙන් ද, අකුසල් මුලින් උපුටා දැමූ බැවින් ද ලෞකික ලෝකෝත්තර කුසල ධර්මයන්ට පමණක් සීමා වූ සන්තාන ඇති බැවින් ද, ධර්මයම ආත්මභාවයට අධිපති බැවින් පව පිළිකුල් කරන ලක්ෂණය ඇති ලැජ්ජාවෙන් (හිරියෙන්) යුක්ත වූවෝව වෙසෙති. පුහුදුන්

ජනයාට මෙන් ලොකාධිපතිභාවයෙන් (ලෝකයාට බියෙන්) අකුසලයන්ගෙන් වැළකීමේ බිය (ඔත්තප්පයක්) රහතන් වහන්සේලාට නැත. මෙලෙස යම් ධර්මතාවන්ගෙන් ප්‍රාණ වධාදියෙන් වෙන්වීම සිදුවේ ද, එම හේතුවෙන් ලැජ්ජාව මෛත්‍රිය කරුණාව යන ධර්මයන්ගෙන් යුක්තව සියලු සත්වයන් කෙරෙහි දයාව ඇතිව, හිතානුකම්පා ඇතිව සියලු සත්වයන් කෙරෙහි එක හා සමාන සිතින් වාසය කරති.

මම ද, මේ රාත්‍රිය ද, මේ දහවල ද ප්‍රාණඝාතය දුරුකොට, ප්‍රාණඝාතයෙන් වැළකී, බහා තැබූ දඬු ඇතිව, බහා තැබූ ආයුධ ඇතිව, ලජ්ජා ඇතිව, දයා ඇතිව, සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පා ඇතිව, වාසය කරමි. මම මේ අඞ්ගයෙන් ද රහතන් වහන්සෙලාට අනුව පිළිපදිමි. එසේ කරන්නා වූ මා විසින් රහතන් වහන්සේලා අනුගමනය කරන ලද්දේ වෙමි. උපෝසථය ද කරන ලද්දේ වෙමි.

රහතන් වහන්සේලා දිවි ඇතිතාක් නුදුන් දෙය ගැනීම දුරුකොට, නුදුන් දෙය ගැනීමෙන් වෙන්ව, දුන් දෙයක්ම ගනිමින්, දුන් දෙයක්ම කැමති වෙමින්, සොර නොවූ, පිරසිදු වූ ආත්ම භාවයෙන් වාසය කරති. මම ද, මේ රාත්‍රිය ද, මේ දහවල ද නුදුන් දෙය ගැනීම දුරුකොට, නුදුන් දෙය ගැනීමෙන් වෙන්ව, දුන් දෙයම ගනිමින්, දුන් දෙයම කැමති වෙමින්, සොර නොවූ පිරිසිදු වූ ආත්ම භාවයෙන් යුතුව වාසය කරමි. මම මේ අංගයෙන් ද රහතන් වහන්සෙලාට අනුව පිළිපදිමි. එසේ කරන්නා වූ මා විසින් උපෝසථය ද කරන ලද්දේ වන්නේ ය.

රහතන් වහන්සේලා දිවි ඇතිතාක් ගම් - නියම්ගම් වැසියන්ට අයත් වූ පහත් ලාමක ධර්මයක් වන මෛථුනය නම් වූ අබ්‍රහ්මචර්‍යාව දුරුකොට, ස්ත්‍රීන් විසින් කරන ඇඟ ඉලීම - පිරිමැදීම - නැවීම - සම්බාහනාදිය නොයිවසීම් සංඛ්‍යාත බ්‍රහ්මචර්‍යායාවෙහි යෙදී වාසය කරති. මම ද, මේ රාත්‍රිය ද මේ දහවල ද එලෙස අබ්‍රහ්මචර්‍යාව පහකොට බ්‍රහ්මචාරීව වාසය කරමි. මම මේ අඞ්ගයෙන් ද රහතන් වහන්සෙලාට අනුව පිළිපදිමි. මෙසේ කරන්නා වූ මා විසින් උපෝසථය ද කරන ලද්දේ වන්නේ ය.

රහතන් වහන්සේලා දිවි ඇතිතාක් මුසාවාදය හැර, මුසාවාදයෙන් වැළකී, සත්‍යය කියමින්, සත්‍යයෙන් සත්‍යය ගළපමින්, ස්ථිර වචන කියමින්, ඇදහිය හැකි වචන කියමින්. ලෝකයා වංචා නොකරත් ද, මම ද අද මේ රාත්‍රිය ද, මේ දහවල ද බොරුකීම අත්හැර, බොරුවෙන් වැලැකී, ඇත්ත කියමින්, ඇත්තෙන් ඇත්ත ගලපමින්, ස්ථිර වචන කියමින්, ඇදහිය හැකි වචන කියමින් ලෝකයා වංචා නොකරමි. මම මේ අංගයෙන් ද රහතන් වහන්සේලා අනුව පිළිපදිමි. එසේ කරන්නා වූ මා විසින් උපෝසථය ද කරන ලද්දේ වෙයි.

රහතන් වහන්සේලා දිවි ඇතිතාක් මදයට හා ප්‍රමාදයට හේතු වූ රහමෙර පීම හැර, මදයට හා ප්‍රමාදයට හේතු වූ රහමෙර පානයෙන් වැලකුණාහු ය. මම ද අද මේ රාත්‍රිය ද, මේ දහවල ද, මදයට හා ප්‍රමාදයට හේතු වූ රහමෙර පානයෙන් වෙන්වෙමි. මම මේ අංගයෙන් ද රහතන් වහන්සෙලාට අනුව පිළිපදිමි. එසේ කරන්නා වූ මා විසින් උපෝසථය ද කරන ලද්දේ වෙයි.

රහතන් වහන්සේලා දිවි ඇතිතාක් එක වේලේ වළඳන බත් ඇත්තාහ. රාත්‍රී භෝජනයෙන් වැළකුණාහු වෙති. විකාල භෝජනයෙන් වැළකුණාහු වෙති. මම ද අද මේ දහවල ද, මේ රාත්‍රිය ද එක බතක් ඇත්තෙක් වෙමි. රාත්‍රි භොජනයෙන් වැළකී, විකාල බොභෝජනයෙන් වැළකී වෙසෙමි. මම මේ අඞ්ගයෙන් ද රහතන් වහන්සෙලාට අනුව පිළිපදිමි. එසේ කරන්නා වූ මා විසින් උපෝසථය ද කරන ලද්දේ වෙයි.

රහතන් වහන්සේලා දිවි ඇත්තාක් නැටීම, ගී කීම, බෙර ආදිය ගැසීම, නැටුම් වැයුම් ආදී විහිළු දැකීම, මල් සුවඳ විලවුන් පාවිච්චිය, සැරසීම ආදියෙන් ශරීරය අලඞ්කාර කරගැනීම යන මෙයින් වෙන් වූවාහු ද, මම ද අද මේ රාත්‍රිය ද දහවල ද නැටිම, ගී කීම, බෙර ආදිය ගැසීම, නැටුම් වැයුම් ආදී විහිළු දැකීම, මල් සුවඳ විලවුන් පාවිච්චිය සැරසීම ආදියෙන් කය අලඞ්කාර කර ගැනීම යන මෙයින් වෙන් වෙමි. මම මේ අඞ්ගයෙන් ද රහතන් වහන්සෙලාට අනුව පිළිපදිමි. එසේ කරන්නා වූ මා විසින් උපෝසථය ද කරන ලද්දේ වෙයි.

රහතන් වහන්සේලා දිවි ඇතිතාක් උස් ආසන, මහා ආසන හැර උස් ආසන මහා ආසනයෙන් වෙන් වූවාහු, මිටි රියන් පමණ

ඇඳෙහි හෝ තණ ඇතිරියෙහි හෝ සයනය කරති. මම ද අද මේ රාත්‍රිය ද, දහවල ද උස් ආසන, මහා ආසන හැර, මිටි රියනක් පමණ ඇඳෙහි හෝ තණ ඇතිරියක හෝ සයනය කරමි. මම මේ අඞ්ගයෙන් ද රහතන් වහන්සෙලාට අනුව පිළිපදිමි. එසේ කරන්නා වූ මා විසින් උපෝසථය ද වසන ලද්දේ වෙයි.

විශාඛාවෙනි, මෙසේ විසූ ආර්‍ය්‍ය උපෝසථය මහත්ඵල වේ. මහත් ආනිසංස වේ. මහත් බැබලීම ඇත්තේය. මහත් පැතිරීම ඇත්තේය. කොපමණ මහත්ඵල මහත් ආනිසංස, මහත් බැබලීම් මහත් පැතිරීම් ඇත්තේ ද? යත් :-

විශාඛාවෙනි, යම්සේ අඟු, මගධ, කාශි, කොශල, වජ්ජි, මල්ල, චෙතිය, වත්ස්‍ය, කුරු, පඤ්චාල, මජ්ජ, සූරසේන, අස්සක, අවන්ති, ගන්ධාර, කාම්බෝජ බඳු වූ බොහෝ සත්රුවන් ඇති මේ සොළොස් ජනපදයන්ගෙන් යුත් මේ දඹදිව ඓශ්චර්‍ය්‍යයෙන් අධිපති වූ චක්‍රවර්ති රජ්‍යය යමෙක් කරන්නේ ද, ඒ සක්විති රාජ්‍යය අඞ්ග අටකින් යුක්ත උපෝසථයාගේ සොළොස්වන කලාවෙන් කලාවකුදු[1] නොවන්නේ ය. ඊට හේත කවරේද? විශාඛාවෙනි, දිව්‍ය සැපය හා සමකර බැලූ කල චක්‍රවර්ති රාජ්‍යය ස්වල්ප දෙයකි.

විශාඛාවෙනි, මනුෂ්‍ය වර්‍ෂ පනසක් වේ ද, මෙය චාතුර්මහාරාජික දෙවියන්ට එක් රෑ දහවලකි. එසේ වූ තිස් රැයක් මාසයකි. එලෙස දෙළොස් මසක් සංවත්සරයකි. එසේ වූ වර්‍ෂ පන්සියයක් චාතුර්මහාරාජික වැසි දෙවියන්ගේ ආයු ප්‍රමාණය වෙයි.

විශාඛාවෙනි, මේ ලෝකයෙහි ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු හෝ අඞ්ග අටකින් යුත් උපෝසථය වැස, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු චාතුර්මහාරාජික දෙවියන් අතර උපදින්නේය, යන මේ කාරණය විද්‍යමාන වේ. විශාඛාවෙනි, දිව්‍ය සැපය හා සමකර බැලූ කල මනුෂ්‍ය සක්විති රජකම ස්වල්පය යැයි මේ සඳහා කියන ලදී.

---

[1] යමක් කොටස් දහසයකට බෙද එයින් එකක් ගෙන එය ද දහසයකට බෙද මෙලෙස දහසය වතාවක් බෙදූවිට ලැබෙන කොටස් දහසයෙන් එකක් සොලොස්වන කලාවෙන් කලාවක් නම් වේ.

විශාඛාවෙනි, මනුෂය වර්‍ෂ සියයක් වේ ද, මෙය තව්තිසා වැසි දෙවියන්ට එක් රෑ දහවලකි. එසේ වූ තිස් රැයක් මාසයකි. එසේ වූ දෙළොස් මසක් සංවත්සරයකි. එසේ වූ වර්‍ෂ දහසක් තව්තිසා වැසි දෙවියන්ගේ ආයු ප්‍රමාණය වෙයි.

විශාඛාවෙනි, මේ ලෝකයෙහි ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු හෝ අඞ්ග අටකින් යුත් උපෝසථය වැස, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු තව්තිසා දෙවියන් අතර උපදින්නේය, යන මේ කාරණය විද්‍යමාන වේ. විශාඛාවෙනි, දිව්‍ය සැපය හා සමකර බැලූ කල මනුෂ්‍ය සක්විති රජකම ස්වල්පය යැයි මේ සඳහා කියන ලදී.

විශාඛාවෙනි, මනුෂ්‍ය වර්‍ෂ දෙසියයක් වේ ද, මෙය යාම දෙව්ලෝ වැසි දෙවියන්ට එක් රෑ දහවලකි. එසේ වූ තිස් රැයක් මාසයකි. එසේ වූ දෙළොස් මසක් සංවත්සරයකි. එසේ වූ දිව්‍ය වර්‍ෂ දෙදහසක් යාම දෙව්ලෝ වැසි දෙවියන්ගේ ආයු ප්‍රමාණය වෙයි.

විශාඛාවෙනි, මේ ලෝකයෙහි ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු හෝ අඞ්ග අටකින් යුත් උපෝසථය වැස, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යාම දෙවියන් අතර උපදින්නේය යන මේ කාරණය විද්‍යමාන වේ. විශාඛාවෙනි, දිව්‍ය සැපය හා සමකර බැලූ කල මනුෂ්‍ය සක්විති රජකම ස්වල්පය යැයි මේ සඳහා කියන ලදී.

විශාඛාවෙනි, මනුෂ්‍ය වර්‍ෂ සාරසියයක් වේ ද, මෙය තුෂිත දෙව්ලොව වැසි දෙවියන්ට එක් රෑ දහවලකි. එසේ වූ තිස් රැයක් මාසයකි. එසේ වූ දෙළොස් මසක් සංවත්සරයකි. එසේ වූ දිව්‍ය වර්‍ෂ සාරදහසක් තුෂිත දෙව්ලොව වැසි දෙවියන්ගේ ආයු ප්‍රමාණයයි.

විශාඛාවෙනි, මේ ලෝකයෙහි ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු හෝ අඞ්ග අටකින් යුත් උපෝසථය වැස, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු තුසිත දෙවියන් අතර උපදින්නේය, යන මේ කාරණය විද්‍යමාන වේ. විශාඛාවෙනි, දිව්‍ය සැපය හා සමකර බැලූ කල මනුෂ්‍ය සක්විති රජකම ස්වල්පය යැයි මේ සඳහා කියන ලදී.

විශාඛාවෙනි, මනුෂ්‍ය වර්‍ෂ අටසියයක් වේ ද, මෙය නිර්‍මාණරතී දෙවියන්ට එක් රෑ දහවලකි. එසේ වූ තිස් රැයක් මාසයකි. එසේ වූ දෙළොස් මසක් සංවත්සරයකි. එසේ වූ දිව්‍ය වර්‍ෂ අටදහසක් නිර්‍මාණරතී දෙවියන්ගේ ආයු ප්‍රමාණයයි.

විශාඛාවෙනි, මේ ලෝකයෙහි ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු හෝ අඞ්ග අටකින් යුත් උපෝසථය වැස, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු නිර්‍මාණරතී දෙවියන් අතර උපදින්නේය, යන මේ කාරණය විද්‍යමාන වේ. විශාඛාවෙනි, දිව්‍ය සැපය හා සමකර බැලූ කල මනුෂ්‍ය සක්විති රජකම ස්වල්පයයි මේ සඳහා කියන ලදී.

විශාඛාවෙනි, මනුෂය වර්‍ෂ දහසය සීයයක් (1600) වේ ද, මෙය පරනිර්මිත වසවර්ති දෙව්ලොව වැසි දෙවියන්ට එක් රෑ දහවලකි. එසේ වූ තිස් රැයක් මාසයකි. එසේ වූ දෙළොස් මසක් සංවත්සරයකි. එසේ වූ දිව්‍ය වර්‍ෂ දහසයදහසක් පරනිර්මිත වසවර්ති දෙව්ලොව දෙවියන්ගේ ආයු ප්‍රමාණයයි.

විශාඛාවෙනි, මේ ලෝකයෙහි ස්ත්‍රියක් හෝ පුරුෂයෙකු හෝ අඞ්ග අටකින් යුත් උපෝසථය වැස, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු පරනිර්මිත වසවර්ති දෙවියන් අතර උපදින්නේය, යන මේ කාරණය විද්‍යමාන වේ. විශාඛාවෙනි, දිව්‍ය සැපය හා සමකර බැලූ කල මනුෂය සක්විති රජකම ස්වල්පය යැයි මේ සඳහා කියන ලදී.

භාග්‍යවතුන් වහන්සේ මෙම කරුණු ගාථා වශයෙන් නැවත ද මෙසේ වදාළහ.

**පාණං න හානෙ න චදින්නමාදියෙ**
**මුසා න භාසෙ න ච මජ්ජපො සියා,**
**අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා**
**රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනං.**

සතුන් නොමැරීම, අන්සතු වස්තුව නොගැනීම, බොරු නොකීම, මත්පැන් නොබීම කරන්නෙකු විය යුතුයි. මෛථුන සංඛ්‍යාත

ශ්‍රේෂ්ඨ නොවන හැසිරීමෙන් වැලකීම, රාත්‍රී ආහාරය ද, දහවල විකාල භෝජනය ද නොකළ යුතුයි.

**මාලං න ධාරෙ න ච ගන්‍ධමාචරෙ,**
**මඤ්චෙ ඡමායං ච සයෙථ සන්‍ථතෙ,**
**එතං හි අට්ඨඞ්ගිකමාහුපොසථං,**
**බුද්ධෙන දුක්ඛන්‍තගුනා පකාසිතං.**

මල් මාලා දරීම, සුවඳ පාවිච්චිය නොකළ යුතුයි. මිටි රියන් ඇඳෙහි හෝ බිම තණ ඇතිරියෙහි හෝ සයනය කළ යුතුයි. මෙලෙස පරපණ නැසීමෙන් වැළකීමාදියෙහි නොහැසිරෙන්නහු විසින් විසූ පෙහෙවස අඞ්ග අටකින් යුක්තවන බැවින් අෂ්ටාංගුපෝසථය යැයි දුක් කෙළවර කළ බුදුරජාණන් වහන්සේ විසින් වදාරණ ලදී.

**චන්‍දො ච සූරියො ච උභො සුදස්සනා**
**ඔභාසයං අනුපරියන්‍ති යාවතා,**
**තමොනුද තෙ පන අන්‍තලික්ඛගා**
**නභෙ පභාසන්‍ති දිසාවිරොචනා.**

යහපත් දැකුම් ඇති, අඳුරු දුරු කරණ චන්‍ද්‍රයා ද, සූර්‍ය්‍යයා ද යන දෙදෙන බැබලෙමින් හැසිරෙත් ද, අඳුර නසමින් අහසෙහි සැරිසරන ඒ දෙදෙන දිශා බබුළුවමින් අහසෙහි රැස් නඟත් ද,

**එතස්මිං යං විජ්ජති අන්‍තරෙ ධනං**
**මුත්තා මණි වෙළුරියඤ්ච භද්දකං,**
**සිඞ්ගී සුවණ්ණං අථ වාපි කඤ්චනං**
**යං ජාතරූපං හටකන්‍ති වුච්චති.**

මේ දෙක අතර වූ මුතු හා මැණික් ද, යහපත් වූ වෛඩූර්‍ය්‍ය මැණික් ද, ගව අං හැඩය හා ප්‍රමාණය ඇති සිංගී නම් රුවන් ද, නොහොත් පර්‍වතවල ඇතිවන රුවන් ද, බුදුසිරුරෙහි පැහැය මෙන් රන්වන් වූ ස්වර්‍ණ ද යන යම් ධනයක් ඇත්තේ වේ ද, යම් රුවනක් රුවන්ම වේ ද, කුහුඹුවන් විසින් ගෙනෙන ලද "**හාටකය**" යැයි කියනු ලබන රන් හා යම්බඳු ධනයක් වේ ද,

**අට්ඨඞ්ගුපෙතස්ස උපොසථස්ස**
**කලම්පි තෙ නානුභවන්ති සොළසිං,**
**චන්දප්පභා තාරගණා ච සබ්බෙ.**

ඒ මුතු මැණික් අඞ්ග අටකින් යුත් උපෝසථයාගේ සොළොස්වන කලාවෙන් කලාවකුදු නොවටනේ ය. අන් සියලු තාරකාවන්ගේ ආලෝකය චන්ද්‍රාලෝකයෙන් සොළොස්වන කලාවෙන් කලාවකුදු නොවන්නාක් මෙනි.

**තස්මා හි නාරී ච නරො ච සීලවා,**
**අට්ඨඞ්ගුපෙතං උපවස්සුපොසථං,**
**පුඤ්ඤානි කත්වාන සුඛුද්‍රයානි**
**අනින්දිතා සග්ගමුපෙන්ති ඨානන්ති.**

එසේ හෙයින් සීලවන්ත ස්ත්‍රී පුරුෂයන් අඞ්ග අටෙන් යුත් උපෝසථය වැස, සැප සැප ගෙනදෙන පින් කොට, කිසිකෙනෙකුගෙන් නින්ද නොලබන දිව්‍ය ලෝකයට පැමිණෙති.

## ❄ උපෝසථ සීලයෙහි පිහිටිය යුතු ආකාරය

අෂ්ටාංග උපෝසථ සීලය හා ගහට්ඨ දස සීලය සමාදන් වන්නා වූ පින්වතුන් විසින් පෙහෙවස් සමාදන් වීමට පෙර දින තමා විසින් කළ යුතු කටයුතු අවසන් කිරීමෙන් හෝ මේ මේ දෙය මෙසේ කරවු යැයි කියා ආහාර සැපයීම් ආදී කෘත්‍යයන් නියමිත අයට පැවරීමෙන් හෝ ඒවා පසුවට කල් තැබීමෙන් හෝ තමන් ඒ සියල්ලෙන් නිදහස් විය යුතු ය. තව ද කයෙහි ආභරණ පළඳ ඇත් නම් ඒවා ශරීරයෙන් බැහැර කොට තැබිය යුතු ය. පසුද අළුයම නැගිට මුහුණ කට දෝවනය කොට උණුපැන් ලීටරයක් පමණ පානය කොට වැසිකිළි කැසිකිළි ආදී ශරීර කෘත්‍යයන් සිදු කොට සුදු වතින් සැරසී වම් උරය වැසෙන සේ උතුරු සළුවක් පැළඳ හැකිනම් ආරණ්‍යයකට හෝ පන්සලකට ගොස් භික්ෂූන් වහන්සේ නමක් හෝ සාමණේරයන් වහන්සේ නමක් වෙත එළඹ අරුණ නැගීමෙන් පසුව සිල් සමාදන් විය යුතු ය. භික්ෂු සාමණේරයන්

වහන්සේලා නැති විට සීලය පිළිබඳව දැනුමැති උපාසකයෙකු හෝ උපාසිකාවක් වෙත එළඹ සිල් සමාදන් විය යුතු ය. සමාදන් වන විට ද සිතින් මුමුණන්නේ නැතිව හඬ නගා සිල් සමාදන් විය යුතු ය. සිල් පද නොදන්නා වූ හා නොතේරෙන්නවුන් විසින් බුදු රජාණන් වහන්සේ විසින් පනවා වදාළ උපෝසථය අධිෂ්ඨාන කරමි යැයි භික්ෂූන් වහන්සේ නමක් හෝ සාමණේරයන් වහන්සේ නමක් ඉදිරියෙහි ද, භික්ෂු සාමණේරයන් වහන්සේලා නැති විට උපාසකයෙකු හෝ උපාසිකාවක ඉදිරියෙහි කිව යුතු ය. එයින් සීලයෙහි පිහිටීම වේ. ඒ කිසිවෙකු නොලබන්නකු විසින් තමා විසින්ම අධිෂ්ඨාන කළ යුතු ය. එයද හඬනගා කිව යුත්තේම ය. ආහාර පාන අන්‍යයන් විසින් පිළිගන්වන්නේ නම් ඔවුන් කෙරෙහි මෛත්‍රියෙන් ඒවා පරිභෝග කළ යුතු ය. නැතහොත් තමා විසින්ම කල් ඇතිව සියල්ල සූදානම් කොට තබාගෙන ඒවාගෙන් ආහාරය සකස්කර ගත යුතු ය. පෙහෙවස් වසන්නහු විසින් අන්‍යයන්ට බාධා වන ලෙස කායික වාචසික කටයුතු නොකළ යුතු ය. අයවැය ගණිමින් කල් නො ගෙවිය යුතු ය. තම නිවසෙහි සිට ම පෙහෙවස් වසන්නහු විසින් ගෘහ කර්මාන්තවලින් වෙන්ව සමාදන්ව ගත් සීලය ආවර්ජනා කරමින් වත් පිළිවෙත් කිරීම, බුද්ධ පූජා හා වන්දනා කිරීම, බුදුගුණ, මෛත්‍රී, අසුභ, මරණසති ආදී භාවනාවක යෙදීම, ධර්ම ශ්‍රවණය කිරීම, ධර්ම සාකච්ඡා කිරීමාදී කුසල් පිරිය යුතු ය. ආහාරපාන, ගිලන්පස ආදිය පරිභෝගයෙහි දී ප්‍රත්‍යවේක්ෂා නුවණින් යුතුව ඒවා පූජා කරන්නවුන් කෙරෙහි මෛත්‍රියෙන් යුතුව පරිභෝග කළ යුතුය. සිල් සමාදන්ව දවල් දවස පමණක් වෙසෙන්නේ නම් එය "**අර්ධ උපෝසථය**" නම් වේ. දවසක් පුරාවට සීලයෙහි පිහිටා සිටින්නවුන් විසින් පැය විසිහතරක්ම සීලයෙහි පිහිටා සිටිය යුතු ය. මේ සියල්ල පිළිබඳ වැඩි විස්තර **අති පූජනීය රේරුකානේ චන්දවිමල මහානායක මාහිමිපාණන් වහන්සේ** විසින් රචිත "**පොහොය දිනය**" ග්‍රන්ථය බලා දත යුතු ය.

# ❄ උපෝසථ සීලය සමාදනය

ඔකාස අහං භන්තෙ, තිසරණෙන සද්ධිං අට්ඨංග සමන්නාගතං උපොසථ සීලං ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ.

දුතියම්පි---තතියම්පි අහං භන්තෙ, තිසරණෙන සද්ධිං අට්ඨංග සමන්නාගතං උපොසථ සීලං ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ. අනුකම්පං උපාදය.

බුද්ධං සරණං ගච්ඡාමි.....

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
2. අදින්නාදනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
3. අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
4. මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
5. සුරාමෙරය මජ්ජ පමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
6. විකාලභොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
7. නච්ච ගීත වාදිත විසූකදස්සන මාලාගන්ධවිලෙපන ධාරන මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
8. උච්චාසයන මාහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

# ❄ ශික්ෂාපදයන්හි අර්ථ විවරණය

## ☸ පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි

සත්වයෙකුගේ ජීවිතයක් කර්ම ශක්තියට හා පවතින ආයුෂ කාලයට අනුව පවතින්නට නොදී අනෙකෙකුගේ උපක්‍රමයකින් විනාශ කිරීම ප්‍රාණඝාතය නම් වේ. ආදර ගෞරවයෙන් තෙරුවන් සරණ ගිය බෞද්ධයා විසින් එම වරදින් වැළකීමට භාග්‍යවතුන් වහන්සේ පනවා වදළ ප්‍රාණඝාතයෙන් වැළකීමේ සික්ෂාව සමාදන්ව එහි යෙදිය යුතු ය. එහි අර්ථ විවරණය මෙසේ ය.

**"පාණාතිපාතා"** යන මෙහි **"පාණ"** යනු ලෝක ව්‍යවහාරය අනුව ජීවත්වන සත්වයා ය. පරමාර්ථ වශයෙන් ගත් කල්හි **ජීවිතෙන්ද්‍රිය** නම් වේ. එයද **"නාම ජීවිතේන්ද්‍රිය, රූප ජීවිතේන්ද්‍රිය"** යනුවෙන් දෙවැදෑරුම් වේ. එයින් **"නාම ජීවිතේන්ද්‍රිය"** යනු භවයක් පාසා නොසිඳී පවතින සිත් පරම්පරාව ය. **"රූප ජීවිතේන්ද්‍රිය"** යනු මෙලොව පිළිසිඳගත් දා පටන් මරණාන්තය දක්වා කර්ම ශක්තිය අනුව පාලනය වන කර්මජ රූප පරම්පරාව ය. ප්‍රාණඝාතයෙහිදී ගැනෙනුයේ මේ **රූප ජීවිතෙන්ද්‍රය** ය. මෙසේ වූ ජීවිතින්ද්‍රිය හෙවත් ප්‍රාණය නැසීමේ චේතනාව **"පාණාතිපාතා"** නම් වේ.

**"වෙරමණී"** යන්නෙහි **"වෙරං මණතීති = වෙරමණී"** වෛරය දුරුකරන්නේ නුයි **"වෙරමණී"** නම් වේ. මෙයින් සත්ව ඝාතනයෙහි ආදීනව හෙවත් එහි විපාක දැක එයින් වැළකීමේ චේතනාවයි. මෙම විරතිය **"සම්පත්තවිරති, සමාදානවිරති, සමුච්ඡේදවිරති"** යනුවෙන් තෙවැදෑරුම් වේ. යමෙක් සිල් සමාදන් නොවී තම උපන් කුලය ගෝත්‍රය සළකා මෙවැනි පව්කම් කිරීම අපගේ කුල වංශයට නොගැලපෙයි යැයි සිතීමෙන් ද, ඇතමෙක් තම උගත්කම සැළකීමෙන් ද, ඇතමෙක් තම වයස සැළකීමෙන් ද දුසිරිත්වලින් වැළකෙති. මෙය **"සම්පත්තිවිරති"** නම් වේ. සික්ෂාපද සමාදන්ව තම ජීවිත හේතුවෙන්වත් නොබිඳ රැකීම **"සමාදානවිරති"** නම් වේ. නැවත නූපදනා ලෙස කෙලෙසුන් නැසූ ආර්‍ය උතුමන්ට ප්‍රාණඝාතාදී සිතකුදු පහළ නොවෙත්ම ය. මෙය **"සමුච්ඡේදවිරති"** නම් වේ. මෙහිදී **සමාදානවිරතිය** අදහස් කරන ලදී.

**"සික්ඛාපදං"** යන මෙහි සත්වඝාතනාදී වැරදි අතහැරීම, හික්මීම, සංවරවීම **"සික්ඛා"** නම් වේ. සීලය පරිපූර්ණය කිරීම නිවනට මාර්ගය වන බැවින් **"පද"** නම් වේ. මෙසේ නිස්සරණාධ්‍යාශයෙන් යුතුව ප්‍රාණඝාතයෙන් වැළකී උසස් ගුණ වැඩීම පිණිස සිල් සමාදන් වීම සියලු කුසලයන්ට මූලය වන බැවින්ද, නිර්වාණාධිගමයට උපාය මාර්ගය වන බැවින් ද **"සික්ඛාපද"** නම් වේ.

**ලාභ, කීර්ති, ප්‍රශංසා, ධන, ඥාති, පරිවාර, ශරීරාවයව, ජීවිතාදී** කිසිඳු හේතුවක් නිසාවත් නොබිඳ සිල් රැකීම ද, යම් හේතුවකින් සිල් බිඳුනේ නම් වහාම එය සමාදන්ව ආයති සංවරයෙහි පිහිටීම ද,

ක්‍රෝධය, බද්ධ වෛරය, ගුණමකු බව, උසස් ගුණවතුන් හා තමන් සම කිරීම, අන්‍යයන්ට ලැබෙන කීර්ති ප්‍රශංසා නො ඉවසීම, තමන් ළඟ ඇති ගුණධර්ම හෝ පරිභෝග වස්තූන් අනුන්ට නොදීම, තම අගුණ සැඟවීම, තමාතුළ නැති ගුණ පෙන්වීම, දරදඬුබව, එකට එක කිරීම, මානය, දැඩි මානය, සත්විසි මඳය, ප්‍රමාදය යන පාප ධර්මයන්ගෙන් තොරව "**අඛණ්ඩ, අඡිද්‍ර, අසබල, අකල්මාස, භුජිස්ස, විඤ්ඤුප්පසත්ථ, අපරාමට්ඨ, සමාධිසංවත්තනික**" වශයෙන් ගෞරව සම්ප්‍රයුක්තව රැකීම "**සමාදියාමි**" නම් වේ.

මුල හෝ අග ශික්ෂාපද නොබිඳ රැකීම "**අඛණ්ඩ**" නම් වේ. මැදින් සිකපද නොබිඳ රැකීම "**අඡිද්‍ර**" නම් වේ. එක පිළිවෙලට සිකපද නොබිඳ රැකීම "**අසබල**" නම් වේ. තැනින් තැනින් සිකපද නොබිඳ රැකීම "**අකල්මාස**" නම් වේ. ඉහත කී අංගයන්ගෙන් යුත් සීලය තෘෂ්ණා දසත්වයෙන් නිදහස් කරවන බැවින් "**භුජිස්ස**" නම් වේ. එබඳු සීලයම බුදු පසේබුදු මහරහත් ආදී උතුමන්ගේ ප්‍රශංසාවට ලක්වන බැවින් "**විඤ්ඤුප්පසත්ථ**" නම් වේ. එබඳු වූ සීලය මම මගේ යැයි තණ්හා දිට්ඨි වශයෙන් නොගන්නා බැවින් "**අපරාමට්ඨ**" නම් වේ. එසේ වූ සීලය උපචාර සමාධි අපර්ණා සමාධි විදර්ශනා ඥාන උපදවාලීමට සමත් බැවින් "**සමාධිසංවත්තනික**" නම් වේ.

මෙලෙස සීල විපත්තියෙහි ආදීනව හා සීල සම්පත්තියෙහි ආනිශංස සළකා මනා ගෞරවයෙන් සිල් රැකීම මෙලොව දියුණුව පරලොව සුගතිය හා ඒකාන්තයෙන්ම වැරදීමකින් තොරව නිවනින් සැනසීමට හේතු වන්නේම ය.

අංග පසක් සම්පූර්ණ වීමෙන් ප්‍රාණඝාතය සිදුවෙයි.

1. පණ ඇති සතෙකු වීම,
2. පණ ඇති සතෙකු බව දැනගැනීම,
3. මරණු කැමති සිත,
4. මැරීම පිණිස උපක්‍රම යෙදීම,
5. ඒ උපක්‍රමය නිසාම මැරීම යන පසයි.

මෙම අංග පසම සම්පූර්ණ නොවී ප්‍රාණඝාත අකුශලය සිදු නොවේ. සත්වයන් මරණ චේතනාවක් නැතිව ගොවිතැන් ආදී වැඩකටයුතු කිරීමෙහිදී ද, යන එන විටදී පෑගීමෙන් ද සතුන් මැරෙන නමුත් ප්‍රාණඝාතය සිදු නොවේ. මාගේ මේ ප්‍රයෝගයෙන් සත්වයෝ මැරෙත්වා යැයි සිතා කරන වැඩවල දී මැරෙන සත්වයන් ගේ ගණනින් ප්‍රාණඝාතය සිදු වෙයි. එක් සතෙකු මැරීමට කළ ප්‍රයෝගයෙන් අන් සතෙකු මැරෙයි ද, එම සතා මරණ අදහසක් නැති බැවින් ප්‍රාණඝාතය සිදු නොවේ. නොමැරීමේ අදහසින් කල ප්‍රයෝගයකින් සතෙකු මැරෙන්නේ ද, මරණ චේතනාවක් නැති බැවින් ප්‍රාණඝාතය සිදු නොවේ. ශල්‍යකර්මාදියෙහි ද මෙසේම ය. නිවෙස් හා භාජනාදිය පිරිසිදු කිරීම් ආදියෙහිදී සතුන් ඇත්තේ නම් මරණ චේතනාවක් හිංසා කිරීමේ චේතනාවක් නැතිවම එය කළ යුතු ය. යම් ක්‍රියාවකදී එයින් සතුන් මැරෙන බව දන්නේනම් එය නොකළ යුත්තේම ය.

ප්‍රාණඝාතය සිදුකළ හැකි ප්‍රයෝග සයකි. එනම් "**සාහත්ථික, ආණත්තික, නිස්සග්ගිය, ථාවර, විජ්ජාමය, ඍද්ධිමය**" යන සයයි.

සතෙකු මැරීම පිණිස ගැසීම, ඇනීම, කැපීම ආදිය තමන් විසින්ම කිරීම **සාහත්ථික ප්‍රයෝග** නම් වේ.

සතෙකු මැරීම පිණිස අනෙකෙකුට අන කිරීම **ආණත්තික ප්‍රයෝග** නම් වේ. මෙය **වස්තුව, කාලය, අවකාශය, ආයුධය, ඉරියව්ව, ක්‍රියාවිශේෂ** යැයි සයවැදෑරුම් වේ.

එහි **වස්තුව** යනු මරනු ලබන සත්වයාය. යමෙක් අසවල් සත්වයා මරන්නට යැයි අණ කළ කල්හි, අණ ලැබූ තැනැත්තා විසින් නොවරදවාම එම සතා මැරුවහොත් දෙදනාටම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා එම සතා නොමරා වෙන සතෙකු මැරුවහොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

**කාලය** යනු රාත්‍රී කාලය, දිවා කාලය වශයෙන් කාලය නියම කිරීමයි. අසවල් වේලාවෙහිදී මරන්නට යැයි අණ කළ කල්හි, අණ ලැබූ තැනැත්තා විසින් නොවරදවාම එම වේලාවෙහිදී ම මැරුවහොත් දෙදනාටම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා එම

වේලාවෙහිදී නොමරා වෙන වෙනත් කාලයකදී මැරුවහොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

**අවකාශය** යනු එම ක්‍රියාව කරන තැනය. අසවල් තැන සිටින සත්වයා මරන්නට යැයි අණ කළ කල්හි අණ ලැබූ තැනැත්තා නියමිත තැනදීම මැරුවහොත් දෙදනාටම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා එතැනදී නොමරා වෙන තැනකදී මැරුවහොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

**ආයුධය** යනු මැරීම සඳහා යොදගන්නා ආයුධයයි. අණ කරන්නා පිහියකින් ඇණ මරන්නට යැයි නියම කළ කල්හි අණ ලැබූ තැනැත්තා එලෙසම කළහොත් දෙදනාටම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා අන් ආයුධයකින් ඇණ මැරුවහොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ. ප්‍රාණඝාතය පිණිස ආයුධ සෑදූ කල්හි වසර දහස් ගණනක් වුව ද එම ආයුධයෙන් සතුන් මරන්නේ ද, ඒ තාක් එම ආයුධ සෑදූ තැනැත්තාට ප්‍රාණඝාත අකුශලය සිදු වේ. එබැවින් එම ආයුධ විනාශ කිරීම යහපති.

**ඉරියව්ව** යනු සත්වයා සිටින ඉරියව්වයි. නිඳ සිටින විට මරන්නට යැයි අණ කළ කල්හි අණ ලැබූ තැනැත්තා නිඳ සිටින සත්වයෙකුම මැරුවහොත් දෙදනාටම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා සිටගෙන සිටින සත්වයෙක් මැරුවහොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

**ක්‍රියාවිශේෂය** යනු මරණු සඳහා කරන උපක්‍රමයයි. වෙඩිතබා මරන්නට යැයි අණකළ විට අණ ලැබූ තැනැත්තා එලෙසම මැරුවහොත් දෙදනාටම ප්‍රාණඝාත අකුශලය සිදු වේ. අණ ලැබූ තැනැත්තා ගලකින් ගසා මැරුවහොත් ඔහුට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදු වේ. කෙසේ හෝ මරන්නට යැයි අණකළ විට අණ ලැබූ තැනැත්තා මොනයම් ක්‍රමයකින් හෝ මරන්නේ ද දෙදෙනාටම ප්‍රාණඝාත අකුශලය සිදු වේ.

උගුල් අටවා තැබීම, උල් සිටවා තැබීම, තුවක්කු බැඳ තැබීම, වළවල් සාරා තැබීමාදිය **ථාවර ප්‍රයෝග** නම් වේ. අසවල් සත්වයා

මැරීමට යැයි වළක් සෑරූ කල්හි එම සත්වයාම එහි වැටී මලහොත් ප්‍රාණඝාතය සිදු වේ. අන් සත්වයෙකු එයින් මලහොත් ප්‍රාණඝාතය සිදු නොවේ. එම සත්වයා මැරීමේ අදහසක් නැති බැවිනි. අසවල් සත්වයා මැරීමට යැයි නියමයක් නැතිව වළක් සාරා තැබීමෙන් කවර සත්වයෙකු හෝ වැටී මලහොත් ප්‍රාණඝාතය සිදු වේ. ඒ වළවල් ආදිය වසර දහස් ගණනක් වුව ද පවත් ද ඒ තාක් ඒවාට ගොදුරු වී මැරෙන සත්වයින්ගේ ගණනින් එම ප්‍රයෝග කළවුන්ට ප්‍රාණඝාතය සිදු වේ.

අංගම් පිඹීම, සූනියම් කිරීම, පිල්ලි යැවීමාදිය **විජ්ජාමයප්‍රයෝග** නම් වේ.

ඇතැම් අමනුෂ්‍යාදීන්ට තම ශරීරය දක්වීමෙන් ද, බිය ගැන්වීමෙන් ද අන්‍යයන් නැසිය හැකි ඍද්ධිවිශේෂ උපතින්ම පිහිටා තිබේ. එබඳු කර්මජ ශක්තීන් **ඍද්ධිමය ප්‍රයෝග** නම් වේ.

## ⌘ ප්‍රාණඝාත කර්මය පිළිබඳව දතයුතු වෙනත් කරුණු

මිනිසත්බව ලැබූ යම් කෙනෙක් මනුෂ්‍ය වූම තම මව හෝ පියා හෝ රහතන් වහන්සේ නමක් හෝ මරන්නේ ද, ඔහු දෙවන ජාතියෙහි නොවරදවාම අවීචි මහ නරකයෙහි උපදවාලීමට සමත්වන ආනන්තර්‍ය්‍ය පාප කර්මය කරගත්තෙකු වේ. තම මව හෝ පියා හෝ උපතින්ම තිරිසන් වූයේනම් හෝ පසුකලෙක තිරිසන් බවට පෙරලුනේ නම් හෝ එබඳු මව්පියන් මරණ මනුෂ්‍යව උපන් දරුවෙකුට ද, එසේම මනුෂ්‍ය මව්පියන්ට දව උපන් තිරිසන් දරුවෙක් විසින් හෝ පසුව තිරිසන් බවට පෙරලුණු දරුවෙක් විසින් හෝ තම මනුෂ්‍ය ජාතික මව්පියන් මරන්නේ නම් ඔහුට ද ආනන්තර්‍ය්‍ය කර්මය සිදු නොවේ. එයින් බරපතල ප්‍රාණඝාත අකුශලයක් පමණක් සිදු වේ.

දහවල් කාලයෙහි යම් තැනක එළුවෙකු නිදනු දක රාත්‍රී කාලයෙහි ගොස් ඌ මරමි යැයි සිතා රාත්‍රියෙහි එතැනට ගොස් එළුවා යැයි සිතා එහි සිටි තම මව හෝ පියා හෝ මරනු ලැබුවේ නම් ඔහුට ආනන්තර්‍ය්‍ය කර්මය සිදු වේ. මැරීමේ අදහසින් කළ බැවිනි.

ඇතමෙක් දුක් විඳින සතුන් දැක ඔවුන් දුකින් මිදවීම යහපත්ය, එයින් පවක් නොවේය යැයි කියා මරා දමති. මොන විදිහේ දුකක් වින්දේ නමුත් ඔවුන්ට ජීවිතයට වඩා ප්‍රිය දෙයක් නැත. මරණයට බිය නොවන කිසිම සත්වයෙක් නැත. ද්වේෂ සිතකින් තොරව ප්‍රාණ වධයක් කළ නොහැක.

සියපණ නසාගැනීමද බොහෝ සෙයින් ම ද්වේෂ සහගත සිතින්ම සිදුවන්නකි. එහෙත් එය ප්‍රාණඝාත කර්මයට අයත් නොවේ. එයින් අල්පසාවද්‍ය අකුශලයක් සිදු වේ. අන් සත්වයෙකු මැරීමෙන්ම ප්‍රාණඝාතය සිදු වේ.

## ⌘ ප්‍රාණඝාත කර්මයෙහි අල්පසාවද්‍ය මහාසාවද්‍ය භාවය

ප්‍රාණඝාත කර්ම සියල්ල එකිනෙකට සමාන නොවේ. සත්වයන් අතර මනුෂ්‍යයාගේ ගුණය මහත් බැවින් මනුෂ්‍ය ඝාතනය මහාසාවද්‍ය අකුශලයක් වේ. මනුෂ්‍ය ඝාතනයෙහි ද ආනන්තර්‍ය පාපකර්මය බලවත්ම අකුශලය වේ. ඒ අතරද ගුණ මහන්තතාවය උසස් හෙයින් රහතන් වහන්සේලා මැරීමෙහි අකුශලය බලවත් වේ. රහතන් වහන්සේලා අතරද අග්‍රශ්‍රාවක, මහාශ්‍රාවක, ප්‍රතිසම්භිදා ලාභී, ෂට් අභිඥා ලාභී, ත්‍රී විද්‍යා ලාභී, ශුෂ්ක විදර්ශකාදී රහතන්වහන්සේලාගේ ගුණ මහන්තතාවය අනුව අකුශලයෙහි බලවත්කම වෙනස් වේ. මවුපියන් අතර මවගේ ගුණය අධික හෙයින් පීතෘඝාතක අකුශලයට වඩා මාතෘ ඝාතක අකුශලය බලවත් වේ.

ඊළඟට අනාගාමී, සකදාගාමී, සෝවාන් ආර්‍යයන් වහන්සේලාගේ වශයෙන් ගුණ මහන්තතාවය අනුව අකුශලය බලවත් වේ. ඊළඟට කල්‍යාණ පෘථග්ජන භික්ෂූන් වහන්සේලාගේ ගුණ මහන්තතාවය අනුව අකුශලය බලවත් වේ. ඊළඟට ශාසනයෙන් බැහැර පැවිද්දන්, තම ගුරුවරයන්, සිල්වත් ගුණවත් මනුෂ්‍යාදීන් ගේ වශයෙන් අකුශලය බලවත් වේ. තිරිසන්ගත සත්වයින්ගෙන් දීර්ඝායුෂ ඇති සත්වයන් හා මහත් වූ ශරීර ඇති සත්වයන් මැරීමේ අකුශලය බලවත් වේ. මැරීමට යොදන උපක්‍රමයන්ගෙන් මහත් ශරීරයක් ඇති සත්වයෙකු මැරීමට මහත් උත්සාහයක් යෙදිය යුතු වීමෙන් කර්මය මහාසාවද්‍ය වේ.

ක්ලේශයන් ගේ සැටියට ද එහි අල්පසාවද්‍ය, මහාසාවද්‍ය බව වෙනස් වේ. බලවත් කෝපයකින් ප්‍රාණඝාතය කිරීමෙන් කර්‍මය මහාසාවද්‍ය වේ.

## ⌘ ප්‍රාණඝාත කර්‍මයෙහි විපාක

ප්‍රතිසන්ධි විපාක, ප්‍රවෘත්ති විපාක යැයි කර්‍ම විපාක දෙවැදෑරුම් වේ. සත්වයන් විසින් සිදුකරගනු ලබන කුශලාකුශල කර්‍මයන්ගේ ශක්තියෙන් භවයෙන් භවය ගලපමින් දිගට සංක්‍රමණය වන ජීවිත පරම්පරාවෙහි ඒ ඒ භවයෙහි පළමුවෙන්ම හටගන්නා සිත ප්‍රතිසන්ධි සිත ය. ඒ ඒ භවයෙහි සැප දුක් ලබාදෙමින් උපකාරවන ශක්තිය ප්‍රවෘත්ති විපාකයන් ය. එක කර්‍මයකින් ප්‍රතිසන්ධි විපාක ලැබෙන්නේ එක් වතාවක් පමණකි. එම කර්‍මයෙහිම ප්‍රවෘත්ති විපාක වශයෙන් ආත්මභාව සිය දහස් ගණන් වාර සැපදුක් ලබාදීමට සමත් වෙති.

ප්‍රාණඝාත කර්‍මයෙහි ප්‍රතිසන්ධි විපාක වශයෙන් සතර අපායන්ගෙන් තැනක උපදවයි. ප්‍රවෘත්ති විපාක වශයෙන් රෝගාදී අන්තරායන් ඇති වී අඩු ආයුෂයෙන් මරණය සිදුවෙයි. ප්‍රාණඝාත කළ තැනැත්තා අන් කුශල ශක්තියකින් සුගතියක උපන්නේ ද, විකල වූ ශරීරාංගයන් ඇතිව උපදියි. නොමනා ලෙස පිහිටි ශරීරාවයව ඇත්තෙක් වේ. අන්‍යයන්ට අප්‍රිය වූ අශෝභන වූ ශරීරාවයව ඇතියෙක් වේ. නොයෙක් විට දුකින් ශෝකයෙන් විසීමට සිදු වේ. නිශ්කාරණයෙහි බිය වන්නෙක් වේ. බිඳීයන පිරිස් ඇත්තෙක් වේ. බොහෝ සතුරන් ඇත්තෙක් වේ. සතුරන්ගෙන් හින්සාවට පීඩාවට ලක්වන්නෙක් වේ. පරෝපක්‍රමයන්ගෙන් මරණයට පැමිණෙන්නෙක් වේ.

තත්පරයක් තුළ කෝටි ලක්‍ෂයක් වාර අපගේ සිත පරම්පරා වශයෙන් ගෙවී යයි. මේ අතර තත්පරයක් තුළ ප්‍රාණඝාතයක් කළහොත් එම ක්‍රියාව තුළ කර්‍ම ජවන් දහසක් පමණ රැස්වෙයි. එම කර්‍මයන්ගෙන් මෙලොව විපාක දීමට සමත් කර්‍ම විපාක නොදුන්නේ නම් එම කර්‍ම අහෝසි කර්‍ම බවට පත් වේ. ඉතිරි කර්‍ම මතුවට ප්‍රතිසන්ධි විපාක, ප්‍රවෘත්ති විපාක වශයෙන් විපාක දීමට සමත් වේ. එක භවයක් යනු එක කර්‍මයක විපාකයකි. මෙසේ එක් ජීවිතයක් තුළ රැස්වන කර්‍ම කෝටි ගණනින්වත් ප්‍රමාණ කළ නොහැක. සසරෙහි භයානකත්වය මෙයින්

දත හැකිය. එබැවින් **"දිවි හිමියෙන් ප්‍රාණඝාතයක් නොකරන්නෙමි"** අධිෂ්ඨාන කරගැනීම මැනවි.

## ⌘ ප්‍රාණඝාතයෙන් වැළකීමේ ආනිශංස

පෙර ලක්දිව එක් ගොවියෙක් **අම්බරිය විහාරවාසී පිංගිල බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ** වෙතින් පන්සිල් සමාදන්ව ගොස් ගොවිතැනින් ජීවත් වූයේ ය. එක් දිනක් එතුමා කුඹුරෙහි වැඩට ගෙනගිය ගොනුන් නැති වී ඔවුන් සොයන්නට **උත්තර වඩ්ඪමාන පර්වතයට** නැංගේ ය. එහි දී පිඹුරෙකු විසින් ඔහුව වෙලා ගත්තේ ය. ගොවියා අත හොඳින් කැපෙන වෑයක් ද විය. ඔහුට පිඹුරාගේ හිස වෑයෙන් කපන්නට සිත් විය. නැවත ගරුකළ යුතු තෙරුන් වහන්සේගෙන් සමාදන්ව ගත් සීලය කුමට බිඳින්නේ ද යැයි සිතා එම අදහස අතහැර දැමීය. මෙලෙස පිඹුරා තදින් ශරීරය වෙලන විට තෙවරක්ම එම සතා මරන්නට සිත් වී තෙරුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් සිඛපද බිඳීම නුසුදුසු යැයි සිතා, එම අදහස අතහැර මේ සත්වයා මැරීමට අත ආයුධයක් ඇති බැවින් මරණ චේතනාව සිතට පැමිණෙයි. මගේ දිවි නැති වුව ද මම සීලය නො බිඳින්නෙමි යැයි සිහිකොට අත තිබූ වෑය විසිකළේ ය. එකෙනෙහිම පිඹුරා ද එම උපාසක තුමා අතහැර ගියේ ය. මේ වනාහී මනාකොට සිල් රැකීමේ සාන්දෘෂ්ටික ආනිශංස යි.

## ☸ අදින්නාදනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි

(මනුෂ්‍ය) වූ යම් කෙනෙකුට අයත් දෙයක් හිමිකරුවෙකු ඇතිබව දන දනම සොර සිතින් ගැනීම **"අදත්තාදනය"** නම් වේ. මෙලොව දියුණුව පරලොව සුගතිය කෙළවර නිවන බලාපොරොත්තු වන සැම දෙනාගේම එම අර්ථ සිද්ධිය මුඳුන් පමුණුවා ගැනීමට සොරකම නම් වූ අකුශලය මහත් බාධාවක් වන හෙයින් එයින් වැළකීම පිණිස **"අදින්නාදනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි"** සිකපදය පනවා වදළ සේක. එහි අර්ථ විවරණය මෙසේය.

"**අදින්නාදනා**" යන මෙහි "**අදින්න**" යන වචනය පාරාජික පාළියෙහි මෙසේ දක්වේ. "**යං අදින්නං, අනිස්සට්ඨං, අපරිච්චත්තං, රක්ඛිතං, ගොපිතං, මමායිතං, පරපරිග්ගහිතං = එතං අදින්නං නාම**"

එහි වස්තු හිමියාගේ අතින් හෝ අන් තිබූ තැනින් හෝ බැහැර නොකරන ලද දෙය "**අනිස්සට්ඨ**" නම් වේ. හිමිකරුවා විසින් අයිතිය අත් නොහරින ලදදෙය "**අපරිච්චත්ත**" නම් වේ. වැට කඩුලු හෝ මුරකරුවන් යොදා හෝ ආරක්‍ෂා කරන ලද්ද "**රක්ඛිත**" නම් වේ. මඤ්ජුසා ආදියෙහි බහා රකින ලදදෙය "**ගොපිත**" නම් වේ. මෙය මගේ යැයි තණ්හා මමත්වයෙන් අයිතිය ප්‍රකාශ කොට තබාගන්නා ලදදෙය "**මමායිත**" නම් වේ. වස්තු හිමියා විසින් අයිතිය අත් නොහරින ලද, රක්‍ෂා කරන ලද, මගේ යැයි තණ්හා මමත්වයෙන් තබාගන්නා ලදදෙය "**පරපරිග්ගහිත**" නම් වේ. මෙසේ වස්තු හිමියා විසින් සිතින් අත් නොහරින ලද කයින් හෝ වචනයෙන් අන්හට නොදෙනලද නොපවරනලද දෙය "**අදින්න**" නම් වේ.

"**ආදාන**" යනු ඉහත සඳහන් සස්වාමික දෙයක් සොර සිතින් ගැනීමයි. එසේ ගැනීම ද ආකාර විසි පහකින් කළහැක. එය "**පස්විසි අවහාරය**" නම් වේ. ඒවා **නානා භණ්ඩ පඤ්චකය, ඒකභණ්ඩ පඤ්චකය, සාහත්ථික පඤ්චකය, පුබ්බපයොග පඤ්චකය, ථෙය්‍යාවහාර පඤ්චකය** යනුවෙන් කොටස් පහකට බෙදා ඇත.

1. **නානා භණ්ඩ පඤ්චකය**

**ආදියෙය්‍ය, හරෙය්‍ය, අවහරෙය්‍ය, ඉරියාපථං විකොපෙය්‍ය, ඨානාචාවෙය්‍ය** යනුවෙන් ප්‍රයෝග පහකි.

i. අන් සතු වස්තු දේපල බොරු නඩු කියා අයිතිකර ගැනීම **ආදියෙය්‍ය** නම් වේ.

ii. අන් සතු දෙයක් තමා විසින් ගෙනයමින් සිටියදී අතරමඟදී සොර සිතින් හිසෙහි තබා සිටි දෙය කරට ගැනීම, එක් අතක තුබූ දෙයක් අනික් අතට මාරුකිරීම ආදී ලෙස මුලින් තිබූ තැනින් අන් තැනකට මාරුකිරීම **හරෙය්‍ය** නම් වේ. එයින් සොරකම සිද්ධ වේ.

iii. අන්‍යයන් විශ්වාසයෙන් තමන් ළඟ තැබූවක් පසුව ඉල්ලූ කල්හි "මම නොගත්තෙමි" යැයි කියා නැවත නොදෙයි. එහෙත් සීලයට හානියක් නැත. වස්තු හිමියා ද එය බලාපොරොත්තුවෙන් සිටින තාක් එය ඔහු සතුය. නැවත තමන්ට එය නොලැබේ යැයි සිතා එය අත්හරී ද, එවිට එය සොරසිත් ඇති තැනැත්තා සතුවීම ද, ඔහුගේ සීලය බිඳීම ද වෙයි. මෙය **අවහරෙය්‍ය** නම් වේ.

iv. යම් වස්තුවක් ගෙන යන්නකු දැක එය ගනු කැමතිව ගෙනයන්නහු ලවාම තමන් කැමති තැනට රැගෙන යාමට මාර්ගය වෙනස් කළ කල්හි වස්තු හිමියා ඒ මඟට හැරී දෙවන පියවර ඉක්මවනවාත් සමගම සොරසිත් ඇති තැනැත්තා ගේ සීලය බිඳෙයි. මෙය **ඉරියාපථං විකොපෙය්‍ය** නම් වේ.

v. අන් අය සතු වස්තුවක් තමා විසින්ම සොර සිතින් කෙසගක් පමණ හෝ තිබූ තැනින් එසවූ කල්හි සීලය බිඳෙයි. මෙය **ඨානාචාවෙය්‍ය** නම් වේ.

### 2. ඒකභණ්ඩ පඤ්චකය

නානා භණ්ඩ පඤ්චකයට අයත් කරුණුවලට සවිඤ්ඤාණක අවිඤ්ඤාණක සියල්ල අයත්ය. ඒකභණ්ඩ පඤ්චකයෙහි දක්වා ඇත්තේ **ආදියෙය්‍ය** ආදී ප්‍රයෝග පසම සවිඤ්ඤාණක (දාස දාසීන්, අලි ඇතුන් ආදී) සත්වයන් පිළිබඳව ය.

### 3. සාහත්ථික පඤ්චකය

මෙහිද **සාහත්ථික, ආණත්ථික, නිස්සග්ගිය, අත්ථසාධක, ධුරනික්ඛේප** යනුවෙන් ප්‍රයෝග පසකි.

i. සොර සිත් ඇතිව අන් සතු දෙයක් සියතින්ම ගැනීම **සාහත්ථික** නම් වේ.

ii. අනුන් ලවා සොරකම් කරවීම **ආණත්ථික** නම් වේ.

iii. බඩුවලට බදු අයකරන තැන්වලදී රාජ්‍ය නිලධාරීන්ට නොදැනෙන්න පිටතට බඩු විසිකොට බදු නොගෙවා යාම **නිස්සග්ගිය** නම් වේ.

iv. අසවල් භාණ්ඩය ඉඩ ලැබුණු විටෙක පැහැරගන්න යැයි අනෙකෙකුට අණකළ කල්හි වසර ගණනකට පසුව හෝ අණ ලැබූ තැනැත්තා එය පැහැර ගන්නේනම් අණකළ තැනැත්තා ගේ සීලය ඒ මොහොතෙහිදීම බිඳෙන්නේය. අණ ලැබූ තැනැත්තා ගේ සීලය වස්තුව පැහැරගත් විටම බිඳෙයි. මෙය **අත්ථසාධක** නම් වේ.

v. වස්තු හිමියා රවටා ගැනීම, පරෙස්සමට මෙන් ළඟ තැබූ දෙය නොදෙනු පිණිස කල්ගතකිරීම, තමන් විසින්ම ආපසු දීමට කියා ඉල්වාගෙන නැවත නොදෙනු පිණිස කල්ගතකිරීම, ණය ගෙන නොදී කල්ගතකිරීම ආදියෙන් වස්තු හිමියා ගේ අපේක්ෂාව දුරුකොට තමන් සතුකර ගැනීම **ධුරනික්ඛේප** නම් වේ.

4. **පුබ්බපයොග පඤ්චකය**

**පුබ්බපයොග, සහපයොග, සංවිධාවහාර, සංකෙතකම්ම, නිමිත්තකම්ම** යැයි මෙහි ප්‍රයෝග පසකි.

i. යම් වස්තුවක් සොරකම් කිරීමට අනිකෙකුට නියෝග කළ කල්හි අණ ලැබූ තැනැත්තා නොවරදවාම එය සොරකම් කරන්නේ නම් නියෝග කළ තැනැත්තා ගේ සීලය සොරකමටත් කලින්ම බිඳෙයි. මෙය **පුබ්බපයොග** නම් වේ.

ii. යමක් සියතින්ම සොරකම් කිරීමේදී ද, ඉඩම් මැනීමාදී අවස්ථාවන්හිදී මායිම් වෙනස් කොට වැට කඩුලු බැඳීමාදියෙහිදී ද එම ක්‍රියාව අවසන් වීමත් සීලය බිඳීමත් එකවිට සිදුවන බැවින් **සහපයොග** නම් වේ.

iii. පිරිසක් විසින් සොරකමක් පිණිස සංවිධාන වී ගොස් එයින් එක් අයෙක් හෝ එම වස්තුව සොරකම් කරයිනම් සියල්ලන්ගේම සීලය බිඳෙයි මෙය **සංවිධාවහාර** නම් වේ.

iv. අසවල් වෙලාවෙහිදී අසවල් භාණ්ඩය සොරාගනුව යැයි යමෙකුට අණකළ කල්හි අණ ලැබූ තැනැත්තා ඒ කියූ කාලයෙහිදීම ඒ භාණ්ඩය සොරාගන්නේම නම් අණකළ තැනැත්තා ගේ සීලය ඒ මොහොතේම බිඳෙයි. මෙය **සංකෙතකම්ම** නම් වේ.

v. මම මෙසේ සඤ්ඤා කළ විට සොරා ගනුව යැයි භාණ්ඩය ළඟට

කෙනෙකු කලින් යවා එය ගැනීමට සුදුසු කාලයෙහි කියූ ලෙස කළ සඤ්ඤාවෙන් අණ ලැබූ තැනැත්තා භාණ්ඩය සොරාගනී නම් දෙදෙනාගේම සීලය එකවිට බිඳෙයි. මෙය **නිමිත්තකම්ම** නම් වේ.

5. **ථෙය්‍යාවහාර පඤ්චකය**

**ථෙය්‍යාවහාර, පසය්‍යාවහාර, පරිකප්පාවහාර, පටිච්ඡන්නාවහාර, කුසාවහාර** යැයි මෙහි ප්‍රයෝග පසකි.

i. සොර පඩි, සොර තරාදි, භාජන ආදියෙන් වඤ්චාකොට කිරුම් මිනුම් ආදිය කිරීම, ව්‍යාජ මුදල් ආදියෙන් ගනුදෙනු කිරීම, තත්වයෙන් බාල භාණ්ඩ උසස් තත්වයේ භාණ්ඩ ලෙස විකිණීමාදී කූට උපක්‍රමවලින් අන්‍යයන්ට අලාභ කිරීම **ථෙය්‍යාවහාර** නම් වේ.

ii. අන්‍යයන්ට පහර දී බියගන්වා වස්තුව පැහැර ගැනීම **පසය්‍යාවහාර** නම් වේ.

iii. අසවල් දෙය ඇතොත් ගණිමි යැයි යම් තැනකට (රාත්‍රියෙහි) ගොස් අත ගා බලා යමක් ගත් කල්හි අපේක්ෂා කළ දෙයම ගත්තෙහි නම් එකෙනෙහිම සීලය බිඳෙයි. අපේක්ෂා කළ දෙය යැයි රැවටී වෙනත් දෙයක් ගෙන බැහැරට ගොස් පරීක්ෂාකොට බලා කුමක් වුවත් ලැබුණු දෙය හොඳයැයි ගත්තෙහි නම් එයින්ද සීලය බිඳෙයි. එය අනවශ්‍යයැයි දමා ගියේ නම් සීලය රැකේ. එම භාණ්ඩය හිමිකරුට නොලැබී විනාශ වූයේනම් එහි වටිනාකම ගෙවියයුතු වෙයි. නැතහොත් සීලය බිඳීම හා පාපය සිදුවෙයි. මෙය **පරිකප්පාවහාර** නම් වේ.

iv. අන්සතු වස්තුවක් දැක එය පසුව ගැනීමේ අදහසින් වැලි, පස්, කොළරොඩු ආදියකින් වසාදමා ගොස් හිමිකරුවන් විසින් සොයා බලා නොදැක ගිය කල්හි ඇවිත් ගත් කෙනෙහි සීලය බිඳෙයි. ඒවා වැල්ලෙහි හෝ කොළරොඩු ආදියෙහි යටකරන ලද්දෙහි නම් එකෙනෙහිම වරදට පැමිණෙයි. මෙය **පටිච්ඡන්නාවහාර** නම් වේ.

v. බඩු කොටස් කර බෙදන විටෙකදී නම් ලියූ කුසපත් ඒ ඒ ගොඩවල් මත දමා ඇති කල්හි අනිකෙකුට හිමි වූ දෙයක් ගනු කැමතිව තමන්ට හිමි කුසපත හෝ බඩු හෝ අන් කෙනෙකුට අයත්

ගොඩකින් තබා එහි ඇති කුසපත හෝ බඩු හෝ තමාට අයත් ගොඩෙහි දමූ කල්හි සොරකම සිදු වේ. මෙය **කුසාවහාර** නම් වේ.

අන්සතු දේ පිළිබඳව අන්සතු බව දන දනම සොර සිතින් යුතුව කියන ලද පස්විසි අවහාරයන්ගෙන් යම් අවහාරයකින් ගැනීම **අදින්නාදනා** නම් වේ.

හිමිකරුවෙකු නැති දෙයක් සොර සිතින් ගත් කල්හි ද, හිමිකරුවෙකු ඇති දෙයක් වුව ද සොර සිතින් තොරව හිමියා කෙරෙහි විශ්වාසයෙන් ගැනීමෙන් ද, අන්සතු දෙයක් තමාගේ යන හැඟීමෙන් ගැනීමෙන් ද සොරකම සිදු නොවේ.

"**වෙරමණී**" යන්නෙහි "**වෙරං මණතීති = වෙරමණී**" වෛරය දුරුකරන්නේ නුයි "**වෙරමණී**" නම් වේ. මෙයින් සොරකමෙහි ආදීනව හෙවත් එහි විපාක දක එයින් වැළකීමේ චේතනාවයි. "**සික්ඛාපදං**" යන මෙහි සොරකම් ආදී වැරදි අතහැරීම, හික්මීම, සංවරවීම "**සික්ඛා**" නම් වේ. සීලය පරිපූර්ණය කිරීම නිවනට මාර්ගය වන බැවින් "**පද**" නම් වේ. මෙසේ නිස්සරණධ්‍යාශයෙන් යුතුව සොරකමෙන් වැළකී උසස් ගුණ වැඩීම පිණිස සිල් සමාදන් වීම සියලු කුසලයන්ට මූලය වන බැවින්ද, නිර්වාණාධිගමයට උපාය මාර්ගය වන බැවින් ද "**සික්ඛාපද**" නම් වේ.

**ලාභ කීර්ති ප්‍රශංසා ධන ඥාති පරිවාර ශරීරාවයව ජීවිතාදී** කිසිඳු හේතුවක් නිසාවත් නොබිඳ සිල් රැකීමෙන් ද, යම් හේතුවකින් සිල් බිඳුනේ නම් වහාම එය සමාදන්ව ආයති සංවරයෙහි පිහිටීමෙන් ද, "**අඛණ්ඩ, අඡිද්‍ර, අසබල, අකල්මාස, භුජිස්ස, විඤ්ඤුප්පසත්ථ, අපරාමට්ඨ, සමාධිසංවත්තනික**" වශයෙන් ගෞරව සම්ප්‍රයුක්තව රැකීම "**සමාදියාමි**" නම් වේ.

අංග සතරක් සම්පූර්ණ වීමෙන් අදත්තාදනය සිදු වේ. ඒවා මෙසේය.

1. අන්සතු වස්තුවක් වීමය.
2. අන්සතු වස්තුවක් බව දැනීම.
3. පැහැර ගනු කැමති සිත.

4. පැහැර ගැනීමට උපක්‍රම කිරීම.

## ⌘ අදත්තාදානයෙහි අල්පසාවද්‍ය මහාසාවද්‍ය භාවය

මනුෂ්‍ය ජාතික සත්වයෙකුට අයත් සස්වාමික දෙයක් වීම, අනුන් අයත් දෙයක් බව දැනීම, සොර සිත, පස්විසි අවහාරයන්ගෙන් යමකින් උපක්‍රම කිරීම, එයින් ගැනීම යන අංග පස සම්පූර්ණ වීමෙන් සොරකම සිද්ධ වේ. මෙම අංග පසෙන් එකක් හෝ අඩු වූයේ නම් සොරකම සිද්ධ නොවේ. තිරිසන්ගත සත්වයන්ට අයත් දෙයක් ගැනීමෙන්ද, ප්‍රේතයන්ට අයත් දෙයක් ගැනීමෙන්ද, අස්වාමික දෙයක් ගැනීමෙන්ද, කෙනෙක් කෙරෙහි විශ්වාසයෙන් ගැනීමෙන්ද, තාවකාලික හැඟීමෙන් ගැනීමෙන්ද, පංශුකූලික චේතනාවෙන් ගැනීමෙන්ද, තමාගේ යන හැඟීමෙන් ගැනීමෙන්ද,ශාරීරික ධාතු කිපීමකින් හෝ අමනුෂ්‍ය ආරූඪයකින් උමතු වූ විටෙක ගැනීමෙන්ද සොරකම සිද්ධ නොවේ.

අඩු වටිනාකමක් ඇති දෙයක් සොරකම් කිරීම අල්ප සාවද්‍ය වේ. වැඩි වටිනාකමක් ඇති දෙයක් සොරකම් කිරීම මහා සාවද්‍ය වේ. ගුණ හීනයන්ගේ දෙයක් ගැනීම අල්ප සාවද්‍ය වේ. ගුණවතුන් සතු දෙයක් ගැනීම මහා සාවද්‍ය වේ. දුස්සීලයෙක් සතු දෙයක් ගැනීම අල්ප සාවද්‍ය වේ. සිල්වතෙකු සතු දෙයක් ගැනීම මහා සාවද්‍ය වේ. තිසරණ පන්සිල් රකින ගිහි පින්වතෙකුට අයත් දෙයක් ගැනීම ඊටත් වඩා මහා සාවද්‍ය වේ. අටසිල් දසසිල් රකින පින්වතෙකුට අයත් දෙයක් ගැනීම ඊටත් වඩා මහා සාවද්‍ය වේ. සාමණේරයන් වහන්සේ නමකට අයත් දෙයක් ගැනීම ඊටත් වඩා මහා සාවද්‍ය වේ. උපසම්පද භික්ෂුවකට අයත් දෙයක් ගැනීම ඊටත් වඩා අතිශයින් මහා සාවද්‍ය වේ. මෙලෙස සෝවාන් ආදී ආර්‍යයන් වහන්සේලාට අයත්දෙයක් ගැනීම ඊටත් වඩා අතිශයින් මහා සාවද්‍ය වේ. මෙලෙස මෙහි විභාගය දතයුතුය. රත්නත්‍රයට අයත් දේ ගැනීම මේ සියල්ලටම වඩා බැරෑරුම් වේ.

## ⌘ අදත්තාදන කර්මයෙහි විපාක

අන්සතු දේ සොරකම් කළ අයට මෙලොවදීම නින්ද ලබන්නට සිදු වේ. අත් පා ගල් මුගුරු ආදියෙන් පහර ලැබීමට සිදු වේ. සොරෙක් මංකොල්ල කරුවෙක් යැයි අපකීර්තියට පත්වෙයි. බරපතල වැඩ සහිත සිර දඬුවම් විඳීමට සිදුවෙයි.

රත්නත්‍රයට අයත් වූද, මවුපිය-ගුරුවරාදීන්ට අයත් වූද, සිල්වතුන්ට-ගුණවතුන්ට අයත් වූද වස්තූන් පැහැර ගත්තවුන් හා විනාශ කළවුන් මරණින් මතු මහා රෞරව නරකයෙහි උපදියි. එහිදී අතිශයින් රුදුරු වූ ගින්නෙන් හා දුමින් ශරීරය ඇතුළත හා පිටත තවනු ලැබීමෙන් ලෝදිය බොමින් ලෝහ ගුලි ගිලිමින් මහ හඬින් හඬමින් අපමණ දුක් විඳීමට සිදුවෙයි. එහි ආයුෂය මෙසේය. මනුෂ්‍ය වර්ෂ අටදහසක් (8000) නිම්මාණරතී දෙවු ලොවට එක් දවසකි. එසේ වූ දින තිසක් එක් මාසයකි. එසේ වූ මාස දෙළොසක් එක් වර්ෂයකි. එසේ වූ වර්ෂ අටදහසක් එහි ආයුෂය වේ. එම දිව්‍ය ආයුෂය මනුෂ්‍ය වර්ෂවලින් ගණනය කළවිට වර්ෂ දෙසිය තිස්කෝටි හතළිස් ලක්ෂයක් (230,40,000,00) වේ. මෙම වර්ෂ දෙසිය තිස්කෝටි හතළිස් ලක්ෂය මහා රෞරව නරකයට එක් දවසකි. එසේ වූ දින තිසක් එක් මාසයකි. එසේ වූ මාස දෙළොසක් එක් වර්ෂයකි. එසේ වූ වර්ෂ අටදහසක් එහි ආයුෂය වේ.

ඉන්පසු ප්‍රේත ලෝකයෙහි ඉපිද ස්වල්ප වූද ආහාරයක් පානයක් නැතිව, වස්ත්‍ර නැතිව, වාසස්ථාන නැතිව, කිසිවෙක්ගේ අනුකම්පාවක් පිහිටක් නැතිව, වසර දහස් ගණන් දුක් විඳීමට සිදුවෙයි.

ඉන්පසු තිරිසන් ලොව ඇත්, අස්, ගව ආදී ලෙස දහස් ගණන් වාරවල ඉපිද වස්තු හිමියන්ට මෙහෙ කරමින් දුක් විඳීමට සිදුවෙයි.

අපායෙන් නිදහස්ව මිනිසත් බව ලැබූ කල්හිද ඇට නහර මතු වූ කුණු තැවරුණු ශරීරයෙන් යුතුව උකුණු ආදී සත්වයන්ගෙන් පිරුණු හිස් ඇතිව නොයෙක් රෝග ආබාධ ඇතිව ඉරීගිය කිළිටි වූ වස්ත්‍ර ඇතිව ශෝකයෙන් පීඩිතව විසීමට සිදු වේ. ගිය ගිය තැන ගැරහුම් ලබමින් අනුන්ගේ ගෙවල්වල බැල මෙහෙවර කරමින් නින්ද ලබමින් තැන තැන

සිඟා කමින් විසීමට සිදුවෙයි. ධනය ඉපයීමට කොතෙක් වෙහෙසුනද බලාපොරොත්තු ඉටු නොවෙයි. යන්තමින් හෝ යමක් උපයා ගත්තේ නමුත් ඒවා ගින්නෙන් දැවෙයි. දියේ ගසාගෙන යයි. සොර සතුරන් පැහැර ගනියි. නොකළ වැරදිවලට හසුව වරදකරු වී එම වස්තුව රාජසන්තක වෙයි. උපදවා ගත් ධන ධාන්‍ය වැඩිකලක් නොරැඳී අස්ථාන ගතවෙයි. නිතරම පාහේ නැත නැත යැයි කියමින් තැවිතැවී සිටීමට සිදුවෙයි. අදත්තාදනය අප්‍රමාණ දුක් ගෙනදෙන සාපරාදී ක්‍රියාවක් වේ. එබැවින් මෙහි ආදීනව හා විපාකයන්හි බරපතලකම සලකා සොර සිතක්වත් නූපදනා ලෙස සිත සංවර කර ගැනීමට අධිෂ්ඨාන කරගත යුතුය.

## ☸ අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

**අබ්‍රහ්මචරියන්ති අසෙට්ඨචරියං**= බුද්ධාදී උතුමන් විසින් පිළිකුල් කරන ලද පහත් වූ ලාමක වූ නින්දිත වූ හැසිරීම අබ්‍රහ්මචරියාව නම් වේ. මෙයින් මෛථුන ධර්‍මය අදහස් කරන ලදී.

**බ්‍රහ්මන්ති= සෙට්ඨං උත්තමං විසුද්ධං**:- යන මෙහි බ්‍රහ්ම යන්නෙන් ශ්‍රේෂ්ඨ උත්තම විශුද්ධ යන අර්‍ථ කියවේ.

**චරිතන්ති චරියා**= හැසිරීම ක්‍රියාකිරීම චරියා නම් වේ. මෙහි චරියා යන්නෙන් පාරමිතා සංඛ්‍යාත දන සීල භාවනාමය ප්‍රතිපත්තියෙහි හැසිරීම කියන ලදී. මෙහි **ඉරියාපථචරියා, ආයතනචරියා, සතිචරියා, සමාධිචරියා, ඤාණචරියා, මග්ගචරියා, පත්තිචරියා, ලොකත්ථචරියා** චරියා අටකි.

සතර ඉරියව්ව සිහි නුවණින් විසීම **ඉරියාපථචරියා** නම් වේ. ඉන්ද්‍රිය සංවරය **ආයතනචරියා** නම් වේ. සතර සතිපට්ඨානයෙහි යෙදීම **සතිචරියා** නම් වේ. ධ්‍යාන භාවනාවෙහි යෙදීම **සමාධිචරියා** නම් වේ. ආර්‍ය්‍ය සත්‍ය විදර්‍ශනාව **ඤාණචරියා** නම් වේ. සෝවාන් ආදී මාර්‍ගයන්ට පැමිණීම **මග්ගචරියා** නම් වේ. සෝවාන් ආදී ඵලයන්ට පැමිණීම **පත්තිචරියා** නම් වේ. බුදු, පසේ බුදු, මහ රහතන්වහන්සේලා සත්වානුකම්පාවෙන් ලෝ වැඩ කිරීම **ලොකත්ථචරියා** නම් වේ.

**සෙට්ඨට්ඨෙන බ්‍රහ්මභූතානං බුද්ධ-පච්චෙකබුද්ධ-බුද්ධසාවකානං චරියතො බ්‍රහ්මචරියන්ති වුච්චති.** යන මේ නිරුක්තිය අනුව බ්‍රහ්මචරියාව යනු උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් ගත් කල්හි මෛථුන ධර්මයෙන් ද, රූප ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පඤ්ච කාමයන්ගෙන් ද සම්පූර්ණයෙන් වැළකී පිරිය යුතු වූ, බුදු පසේබුදු බුද්ධශ්‍රාවක උතුමන් වහන්සේලාට අයත් වූ ශ්‍රේෂ්ඨ චර්යාව වන ආර්ය මාර්ග ප්‍රතිපදාව හඳුන්වන විශේෂ නාමයකි.

තව ද "**බ්‍රහ්මචරියන්ති සික්ඛාත්තයසඞ්ගහිතං සකලං සාසනබ්‍රහ්මචරියං**" යන්නෙන් අධිසීල අධිචිත්ත අධිපඤ්ඤ යන ත්‍රිවිධ ශික්ෂාවෙන් සංගෘහිත වූ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවන් විසින් පිරිය යුතු ශාසන ප්‍රතිපත්ති මාර්ගය අදහස් කරන ලදී. තව ද "**බ්‍රහ්මචරියන්ති මෙථුනවිරති**" යන මෙහි මෛථුනයෙන් වැළකීමම බ්‍රහ්මචර්යාව යනුවෙන් අදහස් කරන ලදී. මේ කියන ලද්දේ උත්කෘෂ්ට පරිච්ඡේදයෙනි.

"**බ්‍රහ්මචරිය සදාරෙ දානෙ වෙය්‍යාවච්චෙ පඤ්චසික්ඛාපදසීලෙ අප්පමඤ්ඤාසු මෙථුනවිරතියං සදාරසන්තොසෙ වීරියෙ උපොසථඞ්ගෙසු අරියමග්ගෙ සාසනෙති ඉමෙසු අත්ථෙසු දිස්සති**" තව ද මේ බ්‍රහ්මචර්යාව යන්නෙහි විවිධ අර්ථ කුශලතා දක්වයි. ඒ අතර දන්දීම ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. වතාවත් කිරීම ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. පන්සිල් රැකීම ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. කරුණා-මුදිතා භාවනා වැඩීම ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. මෛථුනයෙන් වැළකීම ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. තම භාර්යාවගෙන් සතුටුවීම ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. කුශල වීර්ය ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. උපොසථ සිල්(අටසිල්, දසසිල්) රැකීම ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. ආර්ය මාර්ගය ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. සීල සමාධි ප්‍රඥා සඞ්ඛ්‍යාත බුද්ධානුශාසනාව ද ශ්‍රේෂ්ඨ චර්යාවකි. ගිහිව වාසය කරන්නෙකු විසින් වුව ද මෙසේ බ්‍රහ්මචරියක පඤ්චසීලය කලින් කලට හෝ සමාදන්ව පුරුදු කර ගැනීමෙන් පහසුවෙන් ආත්ම දමනය සිදුකළහැකි වේ.

"**වෙරමණී**" යන්නෙහි "**වෙරං මණතීති වෙරමණී**" වෛරය දුරුකරන්නේනුයි "**වෙරමණී**" නම් වේ. මෙයින් කාම මිථ්‍යාචාරයෙහි ආදීනව හෙවත් එහි විපාක දැක එයින් වැළකීමේ චේතනාවයි. "**සික්ඛාපදං**" යන මෙහි සත්ව ඝාතනාදී වැරදි අතහැරීම, හික්මීම,

සංවරවීම "**සික්ඛා**" නම් වේ. සීලය පරිපූර්ණය කිරීම නිවනට මාර්ගය වන බැවින් "පද" නම් වේ. මෙසේ නිස්සරණධ්‍යාශයෙන් යුතුව ප්‍රාණඝාතයෙන් වැළකී උසස් ගුණ වැඩීම පිණිස සිල් සමාදන්වීම සියලු කුසලයන්ට මූලය වනබැවින්ද, නිර්වාණාධිගමයට උපාය මාර්ගය වන බැවින් ද "**සික්ඛාපද**" නම් වේ.

ලාභ කීර්ති ප්‍රශංසා ධන ඥාති පරිවාර ශරීරාවයව ජීවිතාදී කිසිඳු හේතුවක් නිසාවත් නොබිඳ සිල් රැකීමෙන් ද, යම් හේතුවකින් සිල් බිඳුනේනම් වහාම එය සමාදන්ව ආයති සංවරයෙහි පිහිටීමෙන් ද **අඛණ්ඩ, අඡිද්‍ර, අසබල, අකල්මාස, භුජිස්ස, විඤ්ඤූපසත්‍ථ, අපරාමට්ඨ, සමාධිසංවත්තනික** වශයෙන් ගෞරව සම්ප්‍රයුක්තව රැකීම "**සමාදියාමි**" නම් වේ.

## ☸ මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි

**මුසා**:- යනු, සිදු නොවූ අසත්‍ය වූ දෙයයි. **වාද**:- යනු, එසේ සිදු නොවූ අසත්‍ය වූ දෙය සිදු වූ සත්‍ය වූ දෙයක් වශයෙන් හැඟවීමයි. **මුසාවාද**:- යනු අනුන් රවටන අදහස ඇතිව කීමට ප්‍රථමයෙන් ද, කියන කල්හි ද මුසාවක් කියන්නෙමි යැයි දැන දැනම සිදු වේ. අට ආකාරයකින් මුසාවාදය සිදු වේ. ඒවා මෙසේය.

**අදිට්ඨං දිට්ඨං මෙති**= නුදුටු දෙය දුටුවෙමි යැයි ද, **දිට්ඨං අදිට්ඨං මෙති**= දුටු දෙය නුදුටුවෙමි යැයි ද, **අසුතං සුතං මෙති**= නො ඇසූ දෙය ඇසුවෙමි යැයිද, **සුතං අසුතං මෙති**= ඇසූ දෙය නො ඇසුවෙමි යැයි ද, **අමුතං මුතං මෙති**= ගඳ සුවඳ නොවිඳි දෙය වින්දෙමි යැයි ද, රස නොවිඳි දෙය වින්දෙමි යැයි ද, කයෙන් නොවිඳි ස්පර්ශ වින්දෙමි යැයි ද, **මුතං අමුතං මෙති**= ගඳ සුවඳ විඳි දෙය නොවින්දෙමි යැයි ද, විඳි රස නොවින්දෙමි යැයි ද, විඳි ස්පර්ශ නොවින්දෙමි යැයි ද, **අවිඤ්ඤාතං විඤ්ඤාතං මෙති**= සිදු නොවූ දෙය සිදු වූයේයැයි ද, **විඤ්ඤාතං අවිඤ්ඤාතං මෙති**= සිදු වූ දෙය සිදු නොවූයේයැයි ද මෙසේ අසත්‍ය දෙය සත්‍ය දෙයක් ලෙස ද, සත්‍ය දෙය අසත්‍ය දෙයක් ලෙස ද කීමෙන් හෝ ලිවීමෙන් හෝ හස්තවිකාරාදියකින් හෝ හැඟවීම යි. අංග සතරක් සම්පූර්ණ වීමෙන් මුසාවාදය සිදු වේ. එනම්:-

1. කියන කරුණ මුසාවක් වීම,
2. අනුන් රවටන අදහස,
3. වචනයෙන් හෝ ලිවීමෙන් හෝ හස්තවිකාරාදියකින් උත්සාහ කිරීම,
4. අසන තැනැත්තා එය පිළිගැනීම ය.

කියන දෙය බොරුවක් වුව ද, නොදන්න භාෂාවකින් කීමෙන් ද, කලබල වීමකින් හෝ නොසිතා යමක් කියන විටෙකදී මුසාවක් කියැවුණු කල්හි ද එයින් මුසාවාද කර්‍මය සිදු නොවේ. යමක් කී කල්හි අසන්නා එය තේරුම් නොගැනීමෙන් ද මුසාවාද සිදු නොවේ. ඉටු කිරීමේ අදහසින් යමක් කිරීමට පොරොන්දු වී එය කිරීමට නොහැකි වීමෙන් ද මුසාවාදය සිදු නොවේ. සිදු නොකරන අදහසින් ම බාරගත්තහුට එකෙනෙහි ම මුසාවාදය සිදු වේ. ඒ දෙය පසුව කරන ලද්දේ නමුත් වරදින් නොමිදෙයි. එසේම අනුන් ලවා බොරු කියවීමේ දී කියන කියවන දෙදෙනාම බොරුකීමේ චේතනාව ඇතහොත් දෙදෙනාටම පාපය සිද්ධ වේ. වෙළඳම් කිරීමාදියෙහි දී අසත්‍ය දේවල් දැන්වීම් පලකිරීමාදී ක්‍රමවලින් ඉදිරිපත් කිරීමෙන් ඒවා පවතිනා තාක් කියවා බලා රැවටෙන අයගේ ගණනින් ඒවා කළවුන්ට මුසාවාදය අකුසල කර්‍ම රැස් වේ.

## ⌘ මුසාවාදයෙහි අල්පසාවද්‍ය මහාසාවද්‍ය භාවය.

තමා සතුව දීමට තරම් දෙයක් නැතිවිට නොදෙන අදහසින් බොරුකීම අල්පසාවද්‍යවේ. දීමට ප්‍රණීත දෙයක් ඇතිවිට නොදෙන අදහසින් බොරුකීම මහාසාවද්‍ය වේ. එසේම සත ගණනක් වැනි කුඩා දෙයක් වෙනුවෙන් බොරු කීම අල්පසාවද්‍ය වේ. සැළකිය යුතු වටිනාකමක් ඇති දෙයක් වෙනුවෙන් බොරුකීම මහාසාවද්‍ය වේ. අගයකළ නොහැකි මහත් වටිනාකම් ඇති දේ වෙනුවෙන් බොරුකීම අතිශයින් ම මහාසාවද්‍ය වේ. අවම වූ සීලයෙන් ගුණයෙන් යුක්ත වූවන් බොරු කියා රැවටීම අල්පසාවද්‍ය වේ. තිසරණ ගත උපාසකයා ගේ පටන් සීලයෙන් ගුණයෙන් උසස් වූවන් බොරු කියා රැවටීම මහාසාවද්‍ය වේ. ක්‍රීඩා පිණිස අනුන් රවටන අදහසින් කරන කියන දේ වලින් අල්පසාවද්‍ය කර්‍ම රැස් වේ. අන්‍යයන් රැවටීමට කරන

ප්‍රයෝගයන්හිදී සිතෙහි කෙලෙසුන් අඩුව යෙදුණු කල්හි කර්‍මය අල්පසාවද්‍ය වේ. වැඩියෙන් යෙදීම අනුව අනුව එහි මහාසාවද්‍ය භාවය වැඩි වේ.

## ⌘ මුසාවාදයෙහි විපාක

බොරු කියන්නා මෙලොවදීම නින්දවට අපහාසයට පිළිකුලට ලක් වේ. අන්‍යයන්ගෙන් පහර කෑමට ද රාජ දණ්ඩනාදී දඬුවම් විඳීමට ද සිදු වේ. තම මවුපිය ගුරුවර ඤාත්‍යාදීන්ගේ ද අන්‍යයන්ගේ ද අවිශ්වාසයට ලක්වන්නෙක් වේ.

මරණින් මතු අවීචි මහ නරකයෙහි ඉපිද අප්‍රමාණ කාලයක් අනේකවිධ දුක් විඳීමට සිදු වේ. එහි ඇති අධික තේජසින් යුත් ගින්නෙන් අතරක් නෑර පිළිස්සෙයි. යමපලුන් විසින් ගිනිගෙන දිළිසෙන අවි ආයුධ උල් ආදියෙන් අනිමින් කපමින් කොටමින් ඉරමින් අතරක් නෑර අප්‍රමාණ දුක් දෙති. නලයක අබ පිරෙව්වා සේ අබ රේණුවක් තරම් දෙයක් බිමට නොවැටෙන ලෙස සත්වයන්ගෙන් පිරී පවතී. එහෙත් එක් සත්වයෙකුට දුක් විඳින තව සතෙක් නොපෙණෙයි. මෙහි උපන් සත්වයන් අනේක කෝටි වර්‍ෂ ශත සහස්‍රයක් පැසෙති. බොහෝ කලකට පසු නරකයෙහි නැගෙනහිර දිසාවේ දොරටුව විවෘතව වෙයි. එය දුටු නිරි සතුන් ඒ විඳින දුකෙන් ගැලවෙනු කැමතිව එහි දුවත්. ඒ යන අතරදී යමපලුන් විසින් ගිනිගෙන දිළිසෙන අවි ආයුධ උල් ආදියෙන් අනිමින් කපමින් කොටමින් ඉරමින් අප්‍රමාණ දුක් දෙති. දොරටුව වෙත ළඟාවෙනවිට අපගේ වර්‍ෂ දහසක කාලයක් ගතවෙයි. ළංවත්ම දොර වැසෙයි. තවත් බෙහෝ කලකට පසු දකුණුදෙස,... බටහිරදෙස,... උතුරුදෙස දොරටුව විවෘත වෙයි. එය දුටු නිරි සතුන් ඒ විඳින දුකෙන් ගැලවෙනු කැමතිව එහි දුවත්. ඒ යන අතරදී යමපලුන් විසින් ගිනිගෙන දිළිසෙන අවි ආයුධ උල් ආදියෙන් අනිමින් කපමින් කොටමින් ඉරමින් අප්‍රමාණ දුක් දෙති. දොරටුව වෙත ළඟාවෙනවිට අපගේ වර්‍ෂ දහසක කාලයක් ගතවෙයි. ළංවත්ම දොර වැසෙයි. මෙසේ රැවටෙමින් බොහෝ කල් දුක් විඳිති. මෙපමණ කල් දුක්ම විඳි නමුත් බඩගිනි පිපාසා නිවාගැනීමට බත් ඇටයක් තරම් අහරක්වත් දිය බිඳක් තරම්වත් පානයක් ලැබී නැත. මෙසේ බඩගිනි පිපාසා දුකින් යුක්තව

රුදුරු වූ අප්‍රමාණ දුක් විඳින නිරිසතුන් වෙත යමපලුන් පැමිණ නුඹට අවශ්‍ය මොනවාදැයි අසයි. නිරිසතා "ස්වාමීනි, මට බඩගිනියි. අහරක් ලැබෙන්නේ නම් හොඳයි කියයි." එවිට යමපල්ලන් ගිනිගෙන දිළිසෙන ලෝහගුලි රැගෙන එයි. තමන්ට ලෝහගුලි ගිල්ලවන්නට සූදනම් වන බව දැන නිරිසතා කට පියා දත්වලින් තදකරගනී. කට අරින්නට කීවිට නො අරියි. එවිට යමපල්ලන් නිරිසතා දැඩිව අල්වාගෙන අඬු ආදියෙන් බලෙන් කට විවරකොට ලෝහගුලි ගිල්ලවයි. එයින් නිරිසතු ගේ කටත් දගෙන උගුරත් දගෙන පපුවත් දගෙන බඩවැල් ආදී සියල්ල දගෙන ගොස් අධෝ මාර්ගයෙන් පිටව යයි. මෙසේ තවත් බොහෝ කලකට පසු යමපලුන් නුඹට අවශ්‍ය මොනවාදැයි අසයි. එවිට නිරිසතු "ස්වාමීනි මට පිපාසයි. බීමට පානයක් ලැබෙයි නම් හොඳය යි කියයි." එවිට යමපල්ලන් ගිනිගෙන දිළිසෙන ලෝදිය රැගෙන එයි. තමන්ට ලෝදිය පොවන්නට සූදනම් වන බව දැන නිරිසතා කට පියා දත්වලින් තදකරගනී. කට අරින්නට කීවිට නො අරියි. එවිට යමපල්ලන් නිරිසතා දැඩිව අල්වාගෙන අඬු ආදියෙන් බලෙන් කට විවරකොට ලෝදිය පොවයි. එයින් නිරිසතු ගේ කටත් දගෙන උගුරත් දගෙන පපුවත් දගෙන බඩවැල් ආදී සියල්ල දගෙන ගොස් අධෝ මාර්ගයෙන් පිටව යයි." මෙලෙස මුසාවාදය හේතුවෙන් නරකයෙහි වැටී අප්‍රමාණ දුක් විඳීමට සිදු වේ.

ඉන්පසු ප්‍රේතව ඉපිද අනේක වර්ෂ ශත සහස්‍රයෙහි අප්‍රමාණ දුක් විඳීමට සිදු වේ. එයින් ච්‍යුතව තිරිසන්ව ඉපිද අප්‍රමාණ කාලයක් දුක් විඳීමට සිදු වේ.

මෙසේ මහත් වූ විපාකවාර අපාගතව විඳ එයින් ච්‍යුතව මිනිසත් බව ලැබූ කල්හි එම අකුසලයන්ගේ ශේෂවිපාක වශයෙන් සිය දහස්ගණන් ජාතිවලදී නොකළ වැරදිවලට හසුව නින්දා අපහාසයන්ට ලක් වේ. දඬුවම් විඳීමට සිදු වේ. අනුවණයන් වේ. දුප්පතුන් වේ. ගොත ගසමින් කථා කරන්නන් වේ. ගොළුවන් වේ. කට ගඳ ගසන්නන් වේ. අශෝභන දත් ඇත්තන් වේ. මුඛරෝග, දත්රෝග ඇත්තන් වේ. කල් නොපවත්නා දත් ඇත්තන් වේ. විරූප වූ ශරීර වර්ණය ඇත්තන් වේ. නිවෙසක හෝ ගමක හෝ රැකියා ආයතනයක හෝ රටක හෝ නායකත්වයට පත්වූයේ නමුත් අන්‍යයන් ඔහුගේ කීම නො අසයි. ඔහු අභිබවා යති. දරුවන් නොලබන්නන් වේ. උපදින්නේ නම් ගැහැනු

දරුවන් උපදිති. ඔවුහු ද අකීකරු දරුවෝ වෙති.

බොරු කියන්නාට නොකළහැකි පාපයක් නැත. බොරුව බොහෝ අකුසලයන්ට මුල්වන බලවත් පාපයක් වේ. නිවනට යන මාර්ගය සත්‍ය පදනම් කර ගත් එකකි. එයට බාධක ධර්ම අතර අසත්‍ය වූ බොරුවම බලවත් වේ. එබැවින් එයින් වැළකී සත්‍යවාදීව කටයුතුවල යෙදීමෙන් තමන්ටත් අන්‍යයන්ටත් සියලු යහපත උදාකර ගැනීමට හැකි වනවා ඇත.

## ☸ සුරාමෙරය මජ්ජ පමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි

සුරාඃ- යනු, පිටි ආදියෙන් සාද පෙරා ගන්නා ලද මද්‍යවර්ගයෝය. ඒවා **පිට්ඨසුරා, පූවසුරා, ඕදනීයසුරා, කිණ්ණපක්ඛිත්තසුරා, සම්භාරසංයුත්තසුරා** යැයි වර්ග පසක් වෙති.

පිටි භාජනයක දමා ප්‍රමාණවත් ලෙස ජලය වත්කොට කලතා පසුව පෙරාගන්නා ලද්ද **පිට්ඨසුරා** නම් වේ. **පූව** යනු කැවුම් ආදී කැවිලි වර්ගයන්ට නමකි. එබඳු කැවිලි වර්ග භාජනයක දමා ප්‍රමාණවත් ලෙස ජලය වත්කොට කලතා පසුව පෙරාගන්නා ලද්ද **පූවසුරා** නම් වේ. **ඕදන** යනු බත්ය. බත් හා ධාන්‍ය වර්ගවලින් පෙරසේම පෙරාගන්නා ලද්ද **ඕදනීයසුරා** නම් වේ. සුරා බීජ හෙවත් මණ්ඩි බහා පෙරාගන්නා ලද්ද **කිණ්ණපක්ඛිත්තසුරා** නම් වේ. මයිලමල්, අඹ ආදී නොයෙක් දේ මිශ්‍රකොට කලතා පැසුණු පසු පෙරාගන්නා ලද්ද **සම්භාරසංයුත්තසුරා** නම් වේ.

පල් කරන ලද දෙයින් සකසන ලද ආස්‍රව වර්ග **මේරය** නම් වේ. එය **පුප්ඵාසව, ඵලාසව, මධ්වාසව, ගුලාසව, සම්භාරසංයුත්ත** යැයි පඤ්චවිධ වේ. මී තෙල් පොල්මල් ආදී මල් වර්ගවල යුෂ ගෙන කිහිප දවසක් පල්කොට එයින් ගත් සාරය **පුප්ඵාසව** නම් වේ. වැල වරකාදී පල වර්ගවල යුෂ පල්කොට එයින් ගත් සාරය **ඵලාසව** නම් වේ. මිදියුෂ ආදිය ගෙන පල්කොට එයින් ගන්නා ලද්ද හා මී පැණි ආදියෙන් කරන ලද්ද **මධ්වාසව** නම් වේ. උක් පැණිවලින් හා හකුරු ආදියෙන් කරන

ලද්ද **ගුලාසව** නම් වේ. අරළු බුළු නෙල්ලි කුලුබඩු ආදී බොහෝ දෑ මිශ්‍රව ගෙන දියෙහි කලතා පල්කොට එයින් ගත් සාරය **සම්භාරසංයුත්ත** නම් වේ. මෙම ආශ්‍රව නාමයට අයත් වර්‍ග පැසෙනු පිණිස සැලියෙහි බහාලූ තැන් පටන් පානය කිරීම සුරාපානයටඅයත් වේ.

මේ කියනලද සුරා හා මේරය යන දෙකම පානය කළවුන් මත් කරවන බැවින් **මජ්ජ** නම් වේ. තවද වර්‍තමානයෙහි ඇති අරක්කු වර්‍ග, දුම්වැටි වශයෙන් පානය කරන කංස වැනි දෑ ද මත්වීමට හේතුවන ආහාර වර්‍ග ද **මජ්ජ** සංඛ්‍යාවෙන් ගැනෙයි. ආස්වාදයක් විඳීමේ චේතනාවෙන් පානය කරන බැවින් කුසල සිත පිරිහී ගොස් අකුසල් සිත බලවත්ව සසරෙහි පමා කරවන බැවින් **පමාදට්ඨානා** නම් වේ. මෙසේ මදයට හා ප්‍රමාදයට හේතුවන දෙයින් වැළකීම **වෙරමණී** නම් වේ.

සුරාව හා මේරය ස්වල්පයක් පානය කිරීම අල්පසාවද්‍ය වේ. වැඩියෙන් පානය කිරීම මහාසාවද්‍ය වේ. කාය බලය ලැබීමට මහත් කොට පානය කොට ගම් පැහැරීම් ආදිය කරන්නාට අතිශයින් බලවත් වූ මහාසාවද්‍ය කර්‍ම රැස් වේ.

## ⌘ සුරාපානයෙහි ආදීනව

සුරාපානය වනාහි මෙලොව පරලොව නසන්නා වූ මහත් අනර්‍ථකර ක්‍රියාවකි. සුරාවෙන් මත් වූ විට උන්මත්තකයන් මෙන් වෙයි. ස්වකීය සිත කය පාලනය කර ගැනීමට නොහැකි වෙයි. මවුපියන් වැඩිහිටියන් නො හඳුනන පිරිස් ඉදිරියෙහි නොහොබිනා ලෙස හැසිරෙන හිරි ඔත්තප්ප ගුණ නැත්තෙක් වේ.

බුදුරජාණන් වහන්සේ වැඩසිටි දවස කොසැඹෑ නුවර සාගත නම් පඤ්ච අභිඥලාභී කීර්තිමත් තෙරුන්වහන්සේ නමක් සිටියේය. ඒ කාල පරිච්ඡේදයෙහි අම්බතිත්ථ නම් ජටිලයාගේ අසපුවෙහි ඍද්ධිමත් දරුණු නාගයෙක් සිටියේය. තෙරුන් වහන්සේ වැඩ එම නාගයා තම ඍද්ධි බලයෙන් දමනය කළේය. එයින් සතුටු වූ මිනිස්සු තෙරුන් වහන්සේට මඟදිගට ම රැඳීසිට කාපොතිකා නම් සුරාවක් පූජා කළහ.

ඒ වනවිට සුරාව පිළිබඳ සිකපද පනවා නොතිබුණු බැවින්ද පානය කිරීමෙන් වන හානි නොදත් බැවින්ද තෙරණුවෝ මිනිසුන් කෙරෙහි මෛත්‍රියෙන් ඒවා පානය කළේය. එයින් මත් වී ටික දුරක් ගොස් නගරද්වාරයෙහි වැටුනේය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් පිරිවරා වඩිනවිට මත්ව වැටීසිටි තෙරුන් දැක භික්ෂූන් අමතා සාගතතෙරුන් ඔසවාගෙන එන ලෙස වදළහ. භික්ෂූහු තෙරුන් ඔසවාගෙන විත් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි භාග්‍යවතුන් වහන්සේ දෙසට හිස සිටින සේ බිම තැබූහ. තෙරණුවෝ සිහි විකල්ව කැරකී භාග්‍යවතුන් වහන්සේ දෙසට පා සිටින සේ සිටියේය. එවිට භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "මහණෙනි, මේ සාගත භික්ෂුව තථාගතයන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් යහපත් පැවැත්මෙන් සිටියෙහිද?"යි අසා වදළ සේක. "එසේය ස්වාමීනි" යැයි භික්ෂූහු පිළිවදන් දුන්හ. "දැනුත් සාගත තෙරුන් එසේමද?"යි අසා වදළ සේක. "නැත ස්වාමීනි" යැයි භික්ෂූහු පිළිවදන් දුන්හ. "මහණෙනි මේ සාගතතෙරුන් අම්බතීර්ථයෙහි නාගයත් සමග සංග්‍රාමයක් කොට පැමිණියේ නොවේ ද?"යි අසා වදළ සේක. "එසේය ස්වාමීනි" භික්ෂූහු පිළිවදන් දුන්හ. "සාගත තෙරුන්ට දැනුත් එසේ කළ හැකිද?"යි අසා වදළ සේක. "නොහැකිය ස්වාමීනි" භික්ෂූහු පිළිවදන් දුන්හ. මහණෙනි මෙය නොගැලපෙන දෙයකි යැයි එහි ආදීනව දක්වා භික්ෂූන්ට සුරාපානයෙන් වැළකීමට සිකපදයක් පනවා වදළ සේක.

සුරාවට පුරුදු වූවන් ඒ වෙනුවෙන් ධනය විනාශ කරයි. අඹු දරුවන්ට පහර දෙයි. දුටු දුටුවන් සමග කලහ කරයි. භාණ්ඩ උපකරණ විනාශ කරයි. මහා ධනවතුන්ව සිට දිළින්දන් බවට පත් වේ. ඉන්පසු සොරුන්, මංකොල්ලකරුවන්, ගෙවල් බිඳින්නන් බවට පත් වේ. ඒවාට වරදකරුවන් වී දඬුවමට ලක් වේ. සිර ගෙවල්වල දුකසේ විසීමට සිදු වේ. නොයෙක් රොග ව්‍යසනයන්ට ගොදුරු වී අකාලයෙහි මිය යාමට සිදු වේ. විකෘති සිතින් මියගොස් නරකයෙහි උපදිති. එහි අනේක වර්‍ෂ කෝටි ශත සහස්‍රයක් පැසී ඉන් ච්‍යුතව ප්‍රේතව උපදිති. එහිද බොහෝ කලක් දුක්විඳ එයින් ච්‍යුතව තිරිසන්ව උපදිති. එහිදී ද බොහෝ කලක් දුක්විඳ මනුලොව උපදිනවිට මන්දබුද්ධිකයන්ව උපදිති. උමතු බවටද පත් වේ. නොයෙක් ජාතිවල විරූප වූ ශරීර ඇත්තන් වේ.

උතුම් බුද්ධෝත්පාදය, සද්ධර්මශ්‍රවණය, කල්‍යාණමිත්‍ර ඇසුර සැමකල්හි හමුවන්නේ නොවේ. ඒ සියල්ල ලැබී ඇති විටෙක මන්දබුද්ධිකයන් හෝ සිහි විකල් වූවන් වුවහොත් කොතරම් අභාග්‍යයක්ද?. වත්මන් ලෝකය අධර්මීයන් දුසිරිතෙන් පිරී ගොස් ඇත. එවන් කලෙක අධර්මීයන් දුසිරිතෙන් වැළකී සියලු සසර දුකින් නිදහස්වීමට අවස්තාව බුද්ධෝත්පාදය, සද්ධර්මශ්‍රවණය, කල්‍යාණමිත්‍ර ඇසුර තුලින් හමුව ඇත. එබැවින් මේ උතුම් මොහොත අත් නොහැර යහපත් පැවැත්මෙන් යුත් සික්ෂාකාමී දිවි පෙවෙතක් ගොඩනගා ගැනීමට අධිෂ්ඨාන කරගත යුතුය.

## ☸ විකාලභොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි

"**විකාලභොජනා**" යන මෙහි "**විකාල**" යනු ඉර මුදුන් වූ තැන් පටන් පසු ද අරුණ නැගීම දක්වා වූ කාලයයි. "**භොජන**" යනු "**භුඤ්ජියතීති භොජනං**" බුදිනු ලබන හෙවත් වළඳනු ලබන දෙය භොජන නම් වේ. මෙයට "**ආහාර**" යැයි ද කියනු ලැබේ. "**ආහරතීති ආහාරො**" (අන්‍යයන්ට යැපීමට) තම ඵලය එළවන බැවින් "**ආහාර**" නම් වේ. මෙය අතින් පිඩුකොට ගෙන වළඳන බැවින් "**කබලිංකාර ආහාරය**" නම් වේ. මේ කබලිංකාර ආහාරය "**ඔදනො, සත්තු, කුම්මාසො, මච්ඡො, මංසං**" යනුවෙන් ප්‍රධාන වශයෙන් කොටස් පහකි.

එහි "**ඔදන**" යනු හැල් වී හා අනෙකුත් වී වර්ග, යව, බාර්ලි, මෙනේරි, තණහාල්, අමු, වර, තිරිඟු, ගෝධුම, රසාල යන සහල් වර්ගවලින් නිපදවන ලද බත් ය. "**සත්තු**" යනු හැල්, වී, යව ධාන්‍යවලින් කළ බැදි පිටි ය. "**කුම්මාස**" යනු යව කුරක්කන් සහල් තිරිඟු ආදී පිටිවලින් ආදියෙන් නිපදවන පිට්ටු ය. "**මංස**" යනු අලිමස්, කොටිමස්, වලස්මස්, කලු වලස්මස්, සිංහමස්, අශ්වමස්, බලුමස්, සර්පමස්, ව්‍යාග්‍රමස්, මිනීමස් යන මස් වර්ග දසය හැර අන් සියලු මස් වර්ග කැප වේ. "**මච්ඡ**" යනු දියෙහි උපදින සියලු මත්ස්‍ය වර්ගයන් ය. තව ද එළකිරි පිටිකිරි ආදී සියලු කිරි වර්ග ද, තැඹිලි පොල් වතුර ද, තල් පොල් පැණි සකුරු හා ඒ ආශ්‍රිත නිශ්පාදන ද අනුභව කරන්නාට විකාලභොජනය සිදු වේ. තව ද කිරිපිටි වැනි දෑ මිශ්‍ර කොට සාදන ලද ටොෆී වැනි දෑ ද සුදුසු නැත.

උදේ ආහාරය දිවා ආහාරය හා රාත්‍රී ආහාරය යැයි දිනකට මනුෂ්‍යයන් ආහාර අනුභව කරන කාල තුනකි. එයින් පෙරවරු ආහාරය අරුණ පටන් මධ්‍යාහ්නය දක්වා දසවරක් අනුභව කළේ නමුත් එය එක් ආහාරයක් ගැනීම් අර්ථයෙන් "**එකභත්තික**" (එක බතක්) නම් වේ. ඉර අවරට ගිය තැන් පටන් අනුභව කරන භෝජනය විකාලභොජනය නම් වේ. එය දහවල් හා රාත්‍රී වශයෙන් දෙකකි. විකාල භෝජනය යනාර්ථයෙන් එකකි. මෙසේ තුන්වේල ආහාර ගැනීම සංසාරයෙහි බොහෝ කලක් පුරුදු කරන ලද්දකි. ඉතා සියුමැලිව සැපෙන් වැඩුණු දිනකට තුන්වේල ආහාර අනුභව කළ ඇතමෙකුට එක් වරම දහවල් හා රාත්‍රී ආහාර වේල් දෙක අතහැරිය නොහැකි වූ බැවින් භාග්‍යවතුන් වහන්සේ ප්‍රථමයෙන් දහවල් ආහාරය වළක්වා පසුව රාත්‍රී ආහාරය වැළැක්වූ සේක. රාත්‍රී කාලය මනුෂ්‍යයන් නිදගන්නා කාලයයි. එසේම රාත්‍රියෙහි ගමන් යාම ද පහසු නොවේ. මේ හේතුවෙන් බුදු පසේබුදු මහ රහතන් වහන්සේලා රාත්‍රී භෝජනයෙන් වැළකුණාහු වෙති. මෙසේ පාලනය කොට ආහාර ගැනීමෙන් නිරෝගි බව ද නිදුක් බව ද සැහැල්ලු පැවැත්ම ද කාය බලය ද සුවසේ වාසය ද සිදු වේ. වර්තමානයෙහි රසයට ගිජුවීම හා පමණ නොදන ආහාර ගැනීම හේතුවෙන් බොහෝ දෙනා නොයෙක් රෝගාබාධයන්ට ලක්ව ඇත. එබැවින් පමණ දන ආහාර ගැනීම ඉතා වැදගත් වේ.

විකාලභොජන සිකපදය සමාදන් වූවහුට විකාලයෙහි දී පැමිණෙන වේදනා අපහසුතා ආබාධ වළක්වා ගැනීමට පළතුරු යුෂ වැනි දෑ පරිභෝග කිරීමට අනුදන වදාළ සේක. ඒවා අෂ්ටපාන නම් වේ. එනම් "**අම්බපාන, ජම්බුපාන, චොචපාන, මොචපාන, මධුපාන, මුද්දිකපාන, සාලුකපාන, ඵාරුසකපාන**" යන මේ අටයි.

"**අම්බපාන**" යනු අඹ යුෂවලින් සකසන ලද පානය. "**ජම්බුපාන**" යනු ජම්බු, දඹ වැනි ගෙඩිවල යුෂයෙන් සාදන ලද පානය. "**චොචපාන**" යනු ඉදුණු ඇටිකෙසෙල් ගෙඩිවලින් සාදන ලද පානය. "**මොචපාන**" යනු අනෙක් වර්ගවල ඉදුණු කෙසෙල් ගෙඩිවලින් සාදන ලද පානය. "**මධුපාන**" යනු මී පැණි හා අමු මුද්‍රප්පලම් වලින් සාදන ලද පානය. "**මුද්දිකපාන**" යනු වියලි මුද්‍රප්පලම් වලින් සාදන ලද පානය. "**සාලුකපාන**" යනු ඕලු ගෙඩිවලින් සාදන ලද පානය. "**ඵාරුසකපාන**" යනු උගුරැස්ස ගෙඩිවලින් සාදන ලද පානය.

තවද දෙහි දෙඩම් බෙලි, පේර, රට ඉඳි ආදී කුඩා පළතුරුවලින් කළ පානවර්‍ග සියල්ල කැප ය. මේ පානවර්‍ග සැකසීමේ දී ඇල් දියෙන් හෝ අවුවෙන් රත් වූ දියෙන් සකසා ගැනීම කැප ය. උණු දියෙන් කිරීම අකැප ය. පැපොල් වැළ වරකා ආදී මහ පලතුරුවලින් කරන ලද්ද අකැප වේ. එසේම තේ කෝපි හා අනෙකුත් ඖෂධ වර්‍ග ද බටර්, වෙඬරු, ගිතෙල් තලතෙල්, මී පැණි, හකුරු ද, චතුමධුර ද කැප වේ. උණුපැන් සිසිල් පැන් සැම කල්හිම කැප ය.

## ☸ නච්ච ගීත වාදිත විසූකදස්සන මාලාගන්‍ධවිලෙපන ධාරන මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

යන මෙහි "**නච්ච**" යනු නැටීම, නර්‍තනය, රංගනය යන මේවා ය. උපෝසථ සිල් සමාදන් වූවහුට අඩුම තරමින් මොනර නැටුමක් හෝ බැලීමට නො හැකි ය.

"**ගීත**" යනු භක්තිගීත, ගීත, කවි, ශ්ලෝක ආදියයි. බුද්ධ වචනය වූ ත්‍රිපිටක ධර්‍මයට අයත් කිසිවක් ගීත ස්වරයෙන් නො කිය යුතු ය. ගීත ස්වරය පිළිබඳව අංගුත්තර නිකාය පඤ්චක නිපාත අනාගත භය වර්‍ගයෙහි නවවන සූත්‍රයහි මෙසේ දැක්වේ.

මහණෙනි, අනාගත කාලයෙහි මාගේ ශ්‍රාවක වූ භික්‍ෂු භික්‍ෂුණී උපාසක උපාසිකාවන් සිත කය වචනය දමනය නොකරන ලද්දහු වෙති. මෙසේ ඉන්ද්‍රිය සංවරය නැති වීමෙන් ධ්‍යාන භාවනා, විදර්‍ශනා භාවනා වැඩීමට නො හැකි වූවන් වෙති. ඒ හේතුවෙන් සතර මාර්‍ග සතර ඵල නිවන යන නව ලෝකෝත්තර ධර්‍ම ප්‍රතිසංයුක්ත වූ ගැඹුරු අර්‍ථ විවරණ ඇති ත්‍රිපිටක බුද්ධ වචනය හා අට්ඨකථාවන්හි අන්තර්‍ගත වූ පඤ්චස්කන්‍ධ, පඨවි ආපො ආදී ධාතු, ඇස කණ ආදී ආයතන පටිච්ච සමුප්පාද හේතුඵල ධර්‍ම වශයෙන් බෙදා දක්වන ලද ශූන්‍යතා ප්‍රතිසංයුක්ත සූත්‍රධර්‍ම ආදිය දෙසනු ලබන කල්හි ඒවා ඇසීමට අකමැති වෙති. කන යොමු නොකරති. එබඳු ධර්‍ම ඥානය ලැබුමට අකමැති වෙති. උගත යුතුයැයි නො සිතති. කවියන් විසින් ගොතන ලද විසිතුරු යෙදුම් ඇතිව ගීත ස්වරූපයෙන් කියන දහම් ඇසීමට කැමති වෙති. ඒවා දැන

ඉගෙන ගැනීමට සිතති. මෙසේ පරම්පරා දෙක තුනක් යෑමෙන් මා විසින් අපමණ කලක් දුක්විඳ අවබෝධ කරගත් සාරවත් ධර්ම සාරය වැළලී යයි. ලොවෙන් අතුරුදහන්ව යයි. මෙසේ වූ භයක් අනාගතයෙහි වන්නේ ය. එබැවින් නුඹලා විසින් එසේ නොකිරීමට වග බලා ගත යුතු ය යැයි මෙසේ වදාළ සේක.

"**වාදිත**" යනු සංගීත භාන්ඩ වාදන කිරීමයි. "**විසූකදස්සන**" යනු සිතෙහි කෙලෙස් වැඩීමට හේතුවන කුසල් සිත විනාශ වන විෂම දේවල් බැලීමයි. ඒවා නම් නැටීම, ගී කීම, බෙර ආදිය වාදනය, බොහෝ නලු නිලියන් රැස්ව කරන නැටුම්, රාමායනය ආදී කථා කීම, තාලම් ගැසීම, ඇත් පොර, අශ්ව පොර, මී හරකුන් ගේ පොර, එළ හරකුන් ගේ පොර, එළු පොර, බැටළු පොර, කුකුළු පොර, වටු පොර, පොලුවලින් කරන පොර, මිටින් කරන පොර, මල්ලව පොර, සෙබලුන්ගේ යුද්ධ, යුධ සේනා ගණින තැන්, සේනා රැස්වන තැන්, ඇත්- අස්- රථ- පාබල බල ඇණි බැලීම යනාදියයි. මේවා තමන් සිටින තැනකට පෙනුනු විටෙකදී එය බලා සිටීමෙන් සීලය නො බිඳෙයි. නැවත එය බැලීම පිණිස හැරි හැරී බැලීමෙන් ද පියවරක් හෝ ඉදිරියට ගොස් බැලීමෙන් ද සීලය බිඳීම සිදු වේ.

"**මාලාගන්ධවිලෙපන**" යන මෙහි "**මාලා**" යනු වර්ණ ගන්ධ සම්පන්න මල් වර්ගයි. "**ගන්ධ**" යනු මල්, කොළ, ගෙඩි, පොතු, මුල්, කඳ, වැනි සුවඳ ජාතීහු ය. "**විලෙපන**" යනු ශරීරාලංකාරය පිණිස හා සුවඳවත් වීම පිණිස එවැනි දේවල් ද විලවුන් වර්ග ද, ඇඟ ගැල්වීම හා ඇඳුම්වලට යෙදීම හා සුවඳ දුම් වර්ග ඇල්ලීමයි.

"**ධාරණ**" යනු අලංකාරය පිණිස රන් රිදී මුතු මැණික් පළිඟු පබළු වැනි දෑ අලංකාරය පිණිස හා මහන්තත්වය පිණිස දැරීම හෙවත් පැළඳීමයි. "**මණ්ඩන**" යනු ශරීරයෙහි අඩු තැන් පිරවීම සඳහා යම් යම් දෑ ආලේප කිරීම හා ආභරණ ආදියෙන් සැරසීමයි. ශරීරයෙහි අඩු තැන් පිරවීම පිණිස ආහාර පාන වැළඳීමද නොකළ යුතු ය. "**විභූසනං**" යනු පැහැය පිණිස හා සුවඳ පිණිස ඉහත කී දෑ කැමති වීම හෙවත් සිතින් ඉවසීමයි. "**ඨාණං**" යනු මේ ඉහත කී නැටීම ගී කීම වාදනය කිරීමාදිය කිරීමේ චේතනාව ඇති බව හා ඒ ඒ දේවල් කිරීමයි. මේවායෙන් වැළකීමේ චේතනාව "**වෙරමණී**" නම් වේ. කයින් වචනයෙන් වරදට

නො පැමිණ සංවර වීම "**සික්ඛා**" නම් වේ. මෙසේ සංවරව කුසල් වැඩීම නිවනට මාර්ගය වීම "**පද**" නම් වේ. නැවත නැවත එම කුශලතා පුරුදු කිරීම ප්‍රගුණ කිරීම "**සමාදියාමි**"නම් වේ.

## ☸ උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි

"**උච්චාසයන**" යන මෙහි "**උච්ච**" යනු මිටි රියනකට වඩා උස් වූ "**ආසන්දි**" නම් වූ ආසන විශේෂයකි. මිටි රියන යනු අතේ ඇඟිලි මිට මොලවා ගත් කල්හි වැළමිට දක්වා වූ වියත් දෙකක් පමණ උස ඇති ආසන මෙයින් කියැවේ. "**සයන**" යනු නිඳන හිඳින ඇඳ පුටු ආදියයි. බුද්ධ කාලයෙහි උස් ආසන ගරුකොට සැලකූ බැවින් ද පරිහරණයේ දී අනතුරු සිදුවිය හැකි බැවින්ද උස් ආසන පරිහරණය වළක්වා ඇත්තේ ය. මෙසේ උස් ආසන ඇති විට එහි වැඩි කොටස කපා දමා හෝ පොළවෙහි යට කොට හෝ පරිභෝග කළ හැකිය.

"**මහාසයන**" යනු වටිනා කමින් වැඩි වූ අලංකාරමත් වූ ඉතා සුව පහසුව ඇති "**පල්ලඞ්ක, ගොණක, චිත්තක, පටිකා, පටලිකා, තූලිකා, විකතිකා, උද්දලොමි, එකන්තලොමි, කට්ඨිස්ස, කොසෙය්‍ය, කුත්තක, හත්ථත්ථර, අස්සත්ථර, රථත්ථර, අජිනප්පවෙණි, කදලිමිගපවර පච්චත්තරණ, සඋත්තරච්ඡද උභතොලොහිතකූපධාන**" යන මේවාය.

එහි "**පල්ලඞ්ක**" යනු පාදයන්හි සිංහ ව්‍යාඝ්‍රාදී සත්ව රූප යොදා කළ ඇඳපුටු ය. "**ගොණක**" යනු සතරඟුලකට වඩා දික් වූ එළුලොම්වලින් කළ ඇතිරිලි ය. "**චිත්තක**" යනු එළුලොම්වලින් විසිතුරු කොට වියන ලද ඇතිරිලි ය. "**පටිකා**" යනු එළුලොමින් කළ සුදු ඇතිරිලි ය. "**පටලිකා**" යනු ඝනට මල් ඇතිව කළ එළුලොම් ඇතිරිලි ය. "**තූලිකා**" යනු පුළුන් පුරවා කළ ඇතිරිලි ය. "**විකතිකා**" යනු සිංහ ව්‍යාග්‍රාදී රූපවලින් විසිතුරු කළ ඇතිරිලි ය. "**උද්දලොමි**" යනු එක් පැත්තක ලොම් මතුව ඇති සත්ව ලොම්වලින් කළ ඇතිරිලි ය. "**එකන්තලොමි**" යනු දෙපස ම ලොම් මතුව ඇති ඇතිරිලි ය. "**කට්ඨිස්ස**" යනු රන් නූලෙන් විසිතුරු කළ තිහිරි නූලෙන් කළ ඇතිරිලි ය. "**කොසෙය්‍ය**" යනු රන් නූලෙන් විසිතුරු කළ පටපණු නූලෙන් කළ

ඇතිරිලි ය. "**කුත්තක**" යනු නාටිකාවන් සොළොස් දෙනෙකුට නැටීමට ප්‍රමාණවත් වූ එළුලොමින් කළ ඇතිරිලි ය. "**හත්ථත්ථර**" යනු ඇතුපිට අතුරන ඇතිරිලි ය. "**අස්සත්ථර**" යනු අසුපිට අතුරන ඇතිරිලි ය. "**රථත්ථර**" යනු රථයෙහි අතුරන ඇතිරිය ය. "**අජිනප්පවෙණි**" යනු ඇඳේ ප්‍රමාණයට අඳුන් දිවි සමින් කළ ඇතිරිලි ය. "**කදලිමිගපවර පච්චත්තරණ**" යනු කදලිමිග නම් වූ මුවන්ගේ සමින් කළ උතුම් ඇතිරිලි ය. "**සඋත්තරච්ඡද උභතොලොහිතකූපධාන**" යනු රතු වියන් ඇති හිස සහ පාද තැබීමට දෙපස රතු කොට්ට තබන ලද ඇඳ (කවිච්චිය) යන මේවා ය. මේ කිය ලද දේවල් හැර කොහු මෙට්ට ද, ඒ හා සමාන අනෙක් මෙට්ට ද ගුදිරි ද පාවිච්චිය කැප වේ. පුළුන් යෙදූ කොට්ට මෙට්ට හිස තැබීමට කැපය. හිඳීමට නිදීමට අකැප ය.

උච්චාසයන මහාසයන පරිභෝගයෙන් වැළකීමේ චේතනාව "**වෙරමණී**" නම් වේ. කයින් වචනයෙන් වරදට නො පැමිණ සංවර වීම "**සික්ඛා**" නම් වෙ. මෙසේ සංවරව කුසල් වැඩීම නිවනට මාර්‍ගය වීම "**පද**" නම් වේ. නැවත නැවත එම කුශලතා පුරුදු කිරීම ප්‍රගුණ කිරීම "**සමාදියාමි**" නම් වේ.

## ❄ උපෝසථ සිල් සමාදන්ව කළයුතු කථා හා නොකළ යුතු කථා

### ☸ තිරච්ඡාන කථා සූත්‍රය

**මා භික්ඛවෙ, අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙය්‍යාථ, සෙය්‍යථීදං? රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං, භයකථං යුද්ධකථං, අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං, ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං, පුබ්බපෙතකථං නානත්තකථං, ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං ඉති වා. තං කිස්ස හෙතු? නෙසා, භික්ඛවෙ, කථා**

**අත්ථසංහිතා නාදිබ්‍රහ්මචරියකා න නිබ්බිදාය න විරාගාය න නිරෝධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බෝධාය න නිබ්බානාය සංවත්තන්ති.**

**කථෙන්තා ච ඛො තුම්හෙ, භික්ඛවෙ, 'ඉදං දුක්ඛ'න්ති කථෙය්‍යාථ, 'අයං දුක්ඛසමුදයො'ති කථෙය්‍යාථ, 'අයං දුක්ඛනිරොධො'ති කථෙය්‍යාථ, 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති කථෙය්‍යාථ. තං කිස්ස හෙතු? එසා, භික්ඛවෙ, කථා අත්ථසංහිතා, එසා ආදිබ්‍රහ්මචරියකා, එසා නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.**

**''තස්මාතිහ, භික්ඛවෙ, 'ඉදං දුක්ඛ'න්ති යොගො කරණීයො...පෙ.... 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යොගො කරණීයො'ති.**

## ❖ සූත්‍රයෙහි තේරුම

මහණෙනි, සග මොක් දෙකට බාධා කරන කථා නොකරව්. ඒ කවරහුද?

1. මහා සම්මත, මහා මන්ධාතු, ධර්මාශෝක ආදී මහා රජවරු මහානුභාව ඇත්තෝය[1] යනාදී රජුන් පිළිබඳ කථා,
2. අසවල් සොරා බල සම්පන්නය යනාදී සොරුන් පිළිබඳ කථා,
3. මහ ඇමතියන් පිළිබඳ කථා,
4. යුද සෙනා පිළිබඳ කථා,
5. භය පිළිබඳ කථා,
6. යුද්ධ පිළිබඳ කථා,
7. අසවල් ආහාර මෙසේ මෙසේ වූ රස ගුණ ඇත්තේය යනාදී ආහාර පිළිබඳ කථා,
8. පාන වර්ග පිළිබඳ කථා,
9. ඇඳුම් පිළිබඳ කථා,
10. ඇඳන් පිළිබඳ කථා,
11. මාලා පිළිබඳ කථා,

[1] මෙසේ මහානුභාව රජවරුන් පවා මරණයට පැමිණියහ සියල්ල වෙනස් වන්නේය යනාදී ලෙස කථා කිරීම ධර්ම කථාය.

12. සුවඳ ද්‍රව්‍යයන් පිළිබඳ කථා,
13. අපගේ ඤාතියෝ ශූරයෝ ය යනාදී නෑයන් පිළිබඳ කථා,
14. පෙර අපි සුඛෝපභෝගී රථවලින් ගමන් ගියෙමු යනාදී රථ පිළිබඳ කථා,
15. අසවල් ගම සරුසාර ය ඒ ගම් වැසියෝ ශූරයෝ ය යනාදී ගම් පිළිබඳ කථා,
16. නියම්ගම් පිළිබඳ කථා,
17. නගර පිළිබඳ කථා,
18. ජනපද පිළිබඳ කථා,
19. අසවල් ස්ත්‍රිය ලස්සන ය, ශරීරාවයව පිරිපුන් ය යනාදී ස්ත්‍රීන් පිළිබඳ කථා,
20. පුරුෂයන් පිළිබඳ කථා,
21. කුමාරයන් පිළිබඳ කථා,
22. කුමරියන් පිළිබඳ කථා,
23. නන්දිමිත්‍ර යෝධයා ශූරයෙකි යනාදී යෝධයන් (ශූරයන්) පිළිබඳ කථා,
24. අසවල් වීථිය හොඳින් සකසා ඇත යනාදී වීථි පිළිබඳ කථා,
25. ජල ස්නානය පිළිබඳ හා දිය ගෙන යන දාසීන් පිළිබඳ කථා,
26. කමටහනින් තොර වූ නිෂ්ඵල කථා,
27. ලෝකය කවරෙකු විසින් නිර්මාණය කරන ලද්දේ ද යනාදී ලොකය පිළිබඳ කථා,
28. සාගර දෙවියා විසින් සාරන ලද බැවින් සමුද්‍රය නම් විය. මා විසින් මෙය සාරන ලද්දේ යැයි හස්ත මුද්‍රාවෙන් තමා දැක්වූ බැවින් සමුද්‍රය නම් විය යනාදී වූ සමුද්‍රය පිළිබඳ කථා,
29. දියුණුව හා පිරිහීම පිළිබඳ කථා යන මොහුයි. ඊට හේතු කවරේද?

මේ කථා අර්ථය පිණිස පවත්නේ නොවෙයි. ආදි බ්‍රහ්මචර්‍ය්‍යාවට මුල්වූයේ නොවෙයි. කලකිරීම පිණිස නො ඇලීම පිණිස, නිරොධය පිණිස සංසිඳීම පිණිස විශෙෂයෙන් දැනීම පිණිස, මනා අවබොධය පිණිස නිවන් පිණිස නොපවතියි.

"මහණෙනි, නුඹලා කථාකරන්නහු නම් මේ දුකයයි කථා කරව්, මේ දුක්ඛ සමුදයයි කථා කරව්, මේ දුක්ඛ නිරොධ යයි කථා කරව්, මේ දුක්ඛ නිරොධ ගාමිනී පටිපදයයි කථා කරව්. ඊට හේතු කවරේද?

මහණෙනි, මේ කථාව අර්ථය පිණිස පවත්නේ වෙයි. මාර්ගබ්‍රහ්මචයර්‍යාවට මුල් වූයේ වෙයි. කලකිරීම පිණිස නො ඇල්ම පිණිස, නිරෝධය පිණිස, සංසිඳීම පිණිස, විශෙෂ නුවණින් දැනීම පිණිස, මනා අවබොධය පිණිස, නිවන් පිණිස පවතී.

මහණෙනි, එහෙයින් මේ දුකයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයි, මේ දුක් ඉපදීමේ හේතුවයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයි, මේ දුක්ඛ නිරොධයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයි, මේ දුක් නැතිකිරීමේ පිළිවෙතයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුය යැයි වදාළසේක.

## ☸ සිල්වතුන් විසින් කළයුතු දස කථා

උපෝසථ සීලයෙහි පිහිටියවුන් විසින් **අප්පිච්ඡකථා, සන්තුට්ඨිකථා, පවිවෙකකථා, අසංසග්ගකථා, වීරියාරම්භකථා, සීලකථා, සමාධිකථා, පඤ්ඤකථා, විමුත්තිකථා, විමුත්තිඤාණදස්සනකථා** යන දසවිධ කථා ඇතිව විසිය යුතු ය. එයින් සමාදන් වූ සීලය ආරක්‍ෂා වීම පිණිස, සිතෙහි කෙලෙසුන් තුනී වීම පිණිස නොලැබූ ධ්‍යාන සමාධි සමාපත්ති අභිඥ ගුණ වැඩීම පිණිස, ලබා ඇති ධ්‍යාන සමාධි සමාපත්ති අභිඥ ගුණ ආරක්‍ෂා වීම වැඩි දියුණු වීම පිණිස, නොලැබූ විදර්‍ශනා නුවණ ලැබීම පිණිස ලබා ඇති විදර්‍ශනා නුවණ වැඩි දියුණු වීම පිණිස, ආයර්‍ය සත්‍යය අවබෝධයෙන් නිර්‍වාණ සුවයට ඒකාන්තයෙන් පැමිණීම පිණිස මහෝපකාරී වේ.

### ❖ අප්පිච්ඡකථා

ලද දෙයින් සතුටු නොවී මතු මත්තෙහි නැවත ලාභ බලාපොරොත්තු වීම නම් වූ **අත්‍රිච්ඡතාවය** ද, ලාභාපේක්‍ෂාවෙන් නැති ගුණ හැඟවීම නම් වූ **පාපිච්ඡතාවය** ද, ඇති ගුණයන්ට ගරු බුහුමන් ලැබීමේ අපේක්‍ෂාවෙන් පිළිගැනීමෙහි පමණ නොදැනීම නම් වූ **මහිච්ඡතාවය** ද, යන දෝෂයන් දුරු කොට සන්සුන් ගුණ හඟවන අදහසින් යුත් පිළිගැනීමෙහි පමණ දැනීම අල්පේච්ඡතාවය යි. මේ අල්පේච්ඡතාවය **ප්‍රත්‍ය අල්පේච්ඡතාවය, ධුතාංග**

**අල්පේච්ඡතාවය, පයර්‍යාප්ති අල්පේච්ඡතාවය, අධිගම අල්පේච්ඡතාවය** යැයි සිව් වැදෑරුම් වේ. එහි :-

සිව්පසයෙහි අල්පේච්ඡ තැනැත්තා ප්‍රත්‍ය දායකයා ද, දාන වස්තුව ද, තම ශක්තිය ද බලා, දාන වස්තුව බහුල වේ ද, දායකයා ස්වල්පයක් දෙනු කැමැත්තේ ද, එහි දී දායකයාගේ අදහස සලකා ස්වල්පයක් ගනී. එසේම දාන වස්තුව ස්වල්ප වේ ද, දායකයා බොහෝ දෙනු කැමැත්තේ වේ ද, එහි දී දාන වස්තුව බලා ස්වල්පයක් ගනී. එසේම දාන වස්තුව බොහෝ වේ ද, දායකයා බොහෝ දෙනු කැමැත්තේ වේ ද, එහි දී තමාගේ ශක්තිය බලා යැපිය හැකි පමණ ගනී. මෙබඳු භික්‍ෂුව නූපන් ලාභ උපදව යි. උපන් ලාභ ස්ථාවර කරයි. දායකයන්ගේ සිත් සතුටු කරයි. මෙය **ප්‍රත්‍ය අල්පේච්ඡතාවය** නම් වේ.

සමාදන්ව ගත් ධුතාංග තමා කෙරෙහි ඇතිබව නොදන්වනු කැමති බව **ධුතාංග අල්පේච්ඡතාවය** යි.

යමෙක් තමාගේ බහුශ්‍රැතභාවය ප්‍රකට කරන්නට අකමැති වේ ද, මෙය **පයර්‍යාප්ති අල්පේච්ඡතාවය** යි.

යමෙක් සෝවාන් ආදී මාර්ගයකට පැමිණියේ වේ ද, ඒ බව සබ්‍රහ්මචාරීන්ට දන්වන්නට අකැමති වේ ද, මෙය **අධිගම අල්පේච්ඡතාවය** යි. මෙසේ වූ ගුණයන් පැහැදිලි කිරීම පිළිබඳ කථා ඇතිබව "**අප්පිච්ඡකථා**" නම් වේ.

## ❖ සන්තුට්ඨිකථා,

භාග්‍යවතුන් වහන්සේ අනුදන වදාළ ධාර්මික ක්‍රමවලින් ලැබෙන ප්‍රණීත වූ හෝ කටුක වූ හෝ ලද ප්‍රත්‍යයකින් සතුටු වීම **සන්තුෂ්ටිතාවය** යි. මෙහි සිව්පස ප්‍රත්‍යය පිළිබඳව **යථාලාභ, යථාබල, යථාසාරුප්‍ය** වශයෙන් වූ තෙවැදෑරුම් සන්තෝෂය දත යුතු ය. මෙලෙස වූ කථා ඇතිබව "**සන්තුට්ඨිකථා**" නම් වේ.

## ❖ පවිවෙකකථා

භාවනාවෙහි යෙදී විසීම "**පවිවේක කථා**" නම් වේ. එය **කාය විවේකය, චිත්ත විවේකය, උපධි විවේකය** යැයි තෙවැදෑරුම් වේ.

යම් භික්ෂුවක් පිරිසෙහි සිත් අලවා විසීමෙහි ආශාව අතහැර තම සියලු කටයුතු එකලාව අතරක් නැර අප්‍රමාදීව සිදුකර ගෙන කෙලෙසුන්ගෙන් දුරුව වෙසේ ද, එය **කාය විවේකය** නම් වේ. එසේ එකලා වී කුසීත නොවී අෂ්ට සමාපත්ති උපදවා නෙක්ඛම්මයෙහි ඇලී විසීම **චිත්ත විවේකය** නම් වේ. විදර්ශනාවෙහි යෙදී ආර්‍ය්‍ය සත්‍යයන් ප්‍රතිවේධ කොට නිවන ප්‍රත්‍යක්ෂ කොට උතුම් පාරිශුද්ධත්වයෙන් යුක්ත වීම **උපධි විවේකය** නම් වේ.

## ❖ අසංසග්ගකථා

ස්ත්‍රීන් පිළිබඳ වූ **ශ්‍රවණ, දර්ශන, සමුල්ලපන, සම්භෝග, කාය** යන සංසර්ගයන්ගෙන් වෙන්වීම පිළිබඳව ද, ගිහි පැවිදි කවරෙකු සම්බන්ධයෙන් හෝ අනනුලෝමික සම්බන්ධකම් ඇති නොකරගැනීම පිළිබඳව ද, සසරෙහි අස්ථිර බව පිළිබඳව ද කථා ඇතිබව "**අසංසග්ගකථා**" නම් වේ.

අසවල් ගමෙහි රූමත් ස්ත්‍රියක් සිටී යැයි අසා ඒ පිළිබඳ සිතැතිව සිහි මුලාව බඹසර රැකීමට නොහැකිව ගිහි බවට පත් වේ. මෙසේ විසභාග අරමුණු වශයෙන් උපන් කෙලෙස් සංවාසය **ශ්‍රවණ සංසර්ගය** නම් වේ. මෙලෙස විසභාග අරමුණු (ස්ත්‍රී රූප) දැක ගිහි වීමට හේතුවන දැකීම් වශයෙන් උපන් කෙලෙස් සංවාසය **දර්ශන සංසර්ගය** නම් වේ. එලෙස පිරිහීමට හේතුවන ස්ත්‍රීන් සමග කථා කිරීමට කැමැතිවීම් වශයෙන් උපන් කෙලෙස් සංවාසය **සමුල්ලපන සංසර්ගය** නම් වේ. ස්ත්‍රීන් සමග ඔවුනොවුන් සතු දෑ හුවමාරු කරගැනීම් වශයෙන් උපන් කෙලෙස් සංවාසය **සම්භෝග සංසර්ගය** නම් වේ. ස්ත්‍රියකගේ අතිනත ගැනීම් වශයෙන් උපන් කෙලෙස් සංවාසය **කාය සංසර්ගය** නම් වේ.

❖ **වීරියාරම්භකථා**

අකුසල ධර්ම දුරු කිරීම පිළිබඳව ද, කුසල ධර්ම වැඩීම පිළිබඳව ද ක්‍රමානුකූලව පැවැත්විය යුතු උත්සාහය වීර්‍ය්‍යය නම් වේ. මෙය **කාය, චිත්ත** වශයෙන් දෙවැදෑරුම් වේ. **ආරම්භධාතු, නික්ඛමධාතු, පරක්කමධාතු** වශයෙන් තෙවැදෑරුම් වේ. **සම්‍යප්‍රධාන** වශයෙන් සිව්වැදෑරුම් වේ. යම් ඉරියව්වක දී හටගත් ක්ලේශය අන් ඉරියව්වකට යෑම දක්වා ඇසුරු නොකොට එතැන්හිදී ම දුරු කිරීම පිණිස ආරම්භ කරන ලද වීර්‍ය්‍යය පිළිබඳ වූ කථා ඇතිබව "**විරියාරම්භකථා**" නම් වේ.

❖ **සීලකථා**

ලෞකික වශයෙන් චතු පාරිශුද්ධි සීලය ද, ලෝකෝත්තර වශයෙන් මාර්ගය හා ඵලය සමග එක් වූ සීලය පිළිබඳ වූ කථා ඇතිබව "**සීල කථා**" නම් වේ.

❖ **සමාධිකථා**

විදර්ශනාවට පාදක වූ උපචාර සමාධිය ද, අෂ්ට සමාපත්තීන් ද, මාර්ග සම්ප්‍රයුක්ත වූ ලෝකෝත්තර සමාධිය පිළිබඳ වූ ද කථා ඇතිබව "**සමාධි කථා**" නම් වේ.

❖ **පඤ්ඤකථා**

සුතමය ඥාණය, චින්තාමය ඥාණය හා විදර්ශනා ඥාණය ද, ලෝකෝත්තර මාර්ග - ඵල ඥාණයන් ද පිළිබඳ වූ කථා ඇතිබව "**පඤ්ඤ කථා**" නම් වේ.

❖ **විමුත්තිකථා**

ආර්‍ය්‍ය ඵල විමුක්තිය ද, නිර්වාණය ද පිළිබඳ වූ කථා ඇතිබව "**විමුත්ති කථා**" නම් වේ.

❖ **විමුත්තිඤාණදස්සනකථා**

එකුන්විසි ප්‍රත්‍යවේක්ෂා ඤාණයන්[1] පිළිබඳ වූ කථා ඇතිබව **"විමුත්තිඤාණදස්සන කථා"** නම් වේ.

# ❈ සීලයට හානිකර වූ අන්තරායක ධර්ම සිවුතිස

සීලයක පිහිටා එය මනාව රැකීම පහසු නොවේ. අපගේ සිතට පැමිණෙන ඇතැම් අරමුණු වලින් සමාදන්ව ගත් සිකපද බිඳීම ද සිදුවිය හැකි ය. එලෙස සිල් බිඳීමට හේතුවන සීලයට අන්තරායකර ධර්ම තිස් සතරක් ඇත. ඒවා මෙසේ ය.

1. **කොධො** = ඊෂ්‍ර්‍යාව වෛරය තරහව ක්‍රෝධය මෙහි ලක්‍ෂණයොයි. එරමිණියා කටු අත්තක් කෙනෙකු ගේ පිටට දමා ඇදි කල්හි කටු සම තුළට වැදී ඔහුට යන්නට නොදී නවත්වන්නාක් මෙන් කෝපාවිෂ්ට වූ සිත තම සතුරාට විරුද්ධ කාරයාට යන්නට ඉඩ නොදී ඇනුම් බැනුම් කියමින් නැවත නැවත එල්ලි එල්ලි යයි. මෙම ක්‍රෝධය තමන්ගේ ම සිතට ද කයට ද දේපල වස්තුන්ට ද බොහෝ හානි ඇති කරවයි. අන්‍යයන්ගේ ද සිතට ද කයට ද දේපල වස්තුන්ට ද බොහෝ හානි ඇති කරවයි. අන් සතු දේ පැහැර ගනියි. දන සීල භාවනාදිය නවත්වයි. ප්‍රාණඝාතාදී අකුසල් වැඩෙන බැවින් ද, දන සීල භාවනා දී කුසල් නසන හෙයින් ද ක්‍රෝධය ඉතා භයානක අකුසලයක් වේ.

2. **පලාසො** = ශ්‍රේෂ්ඨයන් හා සම කොට සිතන ගතිය **පලාස** නම් වේ. මේ හේතුවෙන් උගතුන් සිල්වතුන් ධනවතුන් හා තමන් සමකොට සිතා එලෙස පෙනී සිටීමට ගොස් වරදට පැමිණ සීල භේදයට පැමිණේ.

3. **ථම්භො** = යහපතට නො නැමෙන ගතිය **ථම්භ** නම් වේ. මවුපිය ගුරුවර වැඩිහිටියන්ට, සිල්වතුන්ට, ගුණවතුන්ට, අවවාදයට නො හික්මෙන ධර්මයට, යුතුකමට නො නැමෙන මෝල් ගසක් මෙන්

---

[1] ආය

නො නැමෙන දරදඬු ගතිය මෙහි ලක්‍ෂණයි.

4. **මායා** = ඇති වරද සඟවන ස්වභාවය **මායාව** නම් වේ. අකුසල් කිරීමට ලැජ්ජාව බිය නැතිකමින් සැඟවී වැරදි කොට එය සඟවා තමන් සිල්වතෙක් ගුණවතෙක් වශයෙන් පෙන්වයි.

5. **සාඨෙය්‍ය** = කපටිකම **සාඨෙය්‍ය** නම් වේ. මෙයින් තමා තුළ නැති ගුණ ඇති ලෙසට පෙන්වයි. සිල් නො රැක සිල්වතෙකු ලෙස ද, දන් නොදී ත්‍යාගවන්තයෙකු ලෙස ද, භාවනා නොවඩා යෝගියෙකු ලෙස ද මේ ආදී ලෙසට අනුන් රවටා බොහෝ අකුසල් රැස් කරන ගතිය මෙහි ලක්‍ෂණයි.

6. **මච්ඡරි** = **මසුරුකම** යි. තමා ට ලැබෙන ලාභ අන්‍යයන් ලබනවාට, තමා විඳින සැප අන්‍යයන් විඳනවාට, තමා උගතෙකු වී අන්‍යයන් එලෙස ඉගෙන ගන්නවාට අකමැති බව, විරුද්ධ බව මෙහි ලක්‍ෂණයි. තව ද තමාට ඇති දෙයින් අනුන් ප්‍රයොජන ගන්නවාට, එයින් අන්‍යයන්ට යහපතක් වෙනවාට අකැමති වේ. එබැවින් නොදෙයි.

7. **මාන** = අනුන් හා සමකොට මනින ස්වභාවය **මානය** නම් වේ. තම කුලවංශය, ධනය, උගත්කම, රූපවත්බව යනාදිය හේතුකොට තමන් අන්‍යයන්ට වඩා උසස් යැයි සිතීමෙන් සෙය්‍ය මානය උපදී. අන්‍යයන් හා සමාන යැයි සිතීමෙන් සදිස මානය උපදී. අන්‍යයන්ට වඩා පහත් යැයි සිතීමෙන් හීන මානය උපදී.

8. **අතිමානො** = අන්‍යයන්ට වඩා මම උසස් කෙනෙකු වෙමි යැයි සිතීම **අතිමානය** යි. ඒ හේතුවෙන් සිල්වතුන් ගුණවතුන් නැණවතුන් ඇසුරට අකමැති වෙයි. සිල්වතුන්ට ගුණවතුන්ට ඇනුම් බැනුම් ආදිය කියා අකුසල් කරගනී.

9. **සාරම්භ** = එකට එක කිරීම, එකට එක කීම, පලි ගැනීම හෙවත් සුළු වරදකට වැඩි වරදක් කිරීම **සාරම්භය** යි.

10. **අසම්පජඤ්ඤ** = අසිහියෙන් අනුවණින් ක්‍රියා කිරීම **අසම්පජඤ්ඤය** යි. මෙයින් අනිත්‍ය වූ දෙය නිත්‍ය යැයි ගැනීමෙන් ද, දුක් වූ දෙය සැප යැයි ගැනීමෙන් ද, අනාත්ම වූ දෙය ආත්ම යැයි ගැනීමෙන් ද, අසුභ වූ දෙය සුභ යැයි ගැනීමෙන් ද, සත්ව පුද්ගල නොවූ දෙය සත්ව පුද්ගල වශයෙන් ගැනීමෙන් ද වරදවා ගැනීම සිදු වේ.

11. **දුබ්බච** = සිල්වතුන්ට ගුණවතුන්ට මව්පියන්ට වැඩිහිටියන්ට අවවාදයට අවනත නොවන නොහික්මෙන ස්වභාවය දුර්වචබව නම් වේ.

12. **මද** = කොඩියක් මෙන් කොතක් මෙන් තමා අතිශයින් උසස් කෙනෙකු වශයෙන් සළකන්නා වූ ද, කළ යුත්ත නොකළ යුත්ත හොඳ නරක නොහඳුනන්නා වු ද, ගරු බුහුමන් කළ යුත්තන් නොහඳුනන්නා වූ ද බලවත් මෝහය **මදය** නම් වේ. මෙය ජාතිමද ගොත්තමද ආදී වශයෙන් විසිහත් වැදෑරුම් වේ. ඒ පිළිබඳ විස්තර රේරුකානේ චන්දවිමල මහානායක මාහිමිපාණන් වහන්සේගේ "**කෙලෙස් එක්දහස් පන්සියය**" පොතෙන් බලාගත මැනවි.

13. **පමාද** = නිත්‍ය සීල, උපෝසථ සීල, දස පුණ්‍යක්‍රියා, දස පාරමී, සත්තිස් බෝධිපාක්ෂික ධර්ම, කය වචනය මනස යන තිදෙරින් සිදුකළ යුතු සුචරිත ධර්මයන්ට අකමැත්තා වූ ද පඤ්ච දුෂ්චරිත, දස අකුසල කර්මාදී දුෂ්චරිතයන්ට කැමැත්තා වූ ද ලක්ෂණය හෙවත් ස්වභාවය **ප්‍රමාදය** නම් වේ.

14. **අලසො** = තුනුරුවන් වැඳීම, වත් පිළිවෙත් කිරීම, ධර්මශ්‍රවණය, භාවනාව ආදියට සිත නො යොදන පසුබසින කුසීතකම **අලසකම** නම් වේ.

15. **මිච්ඡාදිට්ඨි** = වැරදි අදහස්, මත පිළිගැනීම - දැරීම **මිථ්‍යාදෘෂ්ටිය** යි. නිවැරැදි වූ කායික වාචසික මානසික ක්‍රියාකාරකම් වැරදි යැයි ගැනීම ද, වැරදි වූ කායික වාචසික මානසික ක්‍රියාකාරකම් නිවැරදි යැයි ගැනීම ද මෙහි ලක්ෂණය වේ. මේ හේතුවෙන් බොහෝ අකුසල් සිදුවීම ද සිල් බිඳීම ද සිදුවිය හැකිය.

16. **අහිරික** = පාපය පිළකුල් නොකරන පව් කිරීමට ලැජ්ජා නැතිකම **අහිරික** නම් වේ.

17. **අනොත්තප්ප** = පව් කිරීමට බිය නොවන පව් කිරීම උසස් ක්‍රියාවක් වික්‍රමයක් කොට සැලකීම **අනොත්තප්පය** නම් වේ.

18. **මුට්ඨසති** = සිහියෙන් තොර බව සිහි මුළා බව **මුට්ඨසතිය** නම් වේ. කායික වාචසික මානසික සෑම ක්‍රියාකවදීම මෙය කුසල්ය, මෙය අකුසල්ය, මෙය වැරදිය, මෙය නිවැරදිය යනාදී ලෙස සිහිකොට අයහපත් දෙය අත් හැරීම ද, යහපත් දෙය කිරීම ද සිහියෙන් සිදු

වේ. එසේ සිහි නොකිරීම මුලාවීම **අසිහිය** හෙවත් **මුට්ඨසතිය** නම් වේ.

19. **දුප්පඤ්ඤ** = අනුවණකම මෝඩකම **දුප්පඤ්ඤ** නම් වේ. මෙය දන සීල භාවනා මාර්ග-ඵල පිළිබඳ අවබෝධය වළක්වයි. දුකින් නිදහස් වීමට ඉඩ නොදෙයි.

20. **පාපමිත්තතා** = පඤ්ච දුෂ්චරිතයන් කරන, දස අකුසල් කරන, දන සීල භාවනා ධර්මශ්‍රවණාදී කුසල් නොකරන, ලාමක අදහස් ඇති, අපිරිසිදු කාය වාක් මනෝ දුසිරිත් ඇති ගිහි වූ ද, පැවිදි වූ ද පුද්ගලයෝ පාපී පුද්ගලයෝ ය. එබඳු අය ඇසුරු කිරීම **පාපමිත්‍රතාවය** යි.

21. **අරති** = කුසලයෙහි නො ඇලීම **අරතිය** නම් වේ. සීල සමාධි ප්‍රඥ වැඩීමටත් ආරණ්‍ය වෘක්‍ෂමූල සේනාසන ඇසුරු කිරීමටත් පැවිද්දන්ට ඇතිවන අකමැත්ත නොසතුට හා සීල සමාදනය භාවනාව ධර්මශ්‍රවණය ආදියට ගිහියන්ට ඇතිවන අකමැත්ත මෙයින් සිදු වේ.

22. **ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා** = ඇස කන නාසය දිව ශරීරය මනස යන දොරටු සයෙහි සංවරය නැතිකම මෙයින් කියැවේ. ඉන්ද්‍රිය සංවරය නිවන් මගෙහි ඇති ප්‍රධාන අංගයකි. ඉන්ද්‍රය අසංවරය වැඩූ කුසලයෙන් ද වැඩීමට ඇති කුසලයන්ගෙන් ද පිරිහී සසරට අපා දුකට ඇද දමයි.

23. **අස්සද්ධතා** = රත්නත්‍රය නොපිළිගන්නා බව, විශ්වාස නොකරන බව **අශ්‍රද්ධාව** යි. නිවන් මග තහවුරු වීමට අත් නොහැර ඒ තුළ රඳ සිටීමට **ශ්‍රද්ධාව** ප්‍රධාන වේ. එය නැති කමින් නිවන් මගින් පහ වී මිථ්‍යාවන්ට හසු වී බොහෝ අකුසල් සිදු වී බෙහො කලක් දුක් විඳීමට හේතු වේ.

24. **අසන්තුට්ඨිතා** = ලද දෙයින් සතුටු නොවන බව සෑහීමට පත් නොවන බව **අසන්තුට්ඨිතාවය** යි.

25. **මහිච්ඡතා** = කොපමණ දේ ලැබුණත්, කොතෙක් දේ තිබුණත් සෑහීමකට පත් නොවී තව තවත් රැස්කරන සොයන ස්වභාවය **මහිච්ඡතාවය** නම් වේ.

26. **සංසග්ගාරාමතා** = සංසර්ගය යනු **ඇලීම** යි. එසේ ඇලීමේ කැමැත්ත **සංසර්ගකාමතාවය** යි. මෙය "**දර්ශන සංසර්ගය, ශ්‍රවණ සංසර්ගය, කාය සංසර්ගය, සමුල්ලපන සංසර්ගය, සම්භොග සංසර්ගය**" යනුවෙන් පස් වැදෑරුම් වේ. ප්‍රිය කරන ස්ත්‍රී පුරුෂ රූප භාණ්ඩ උපකරන දැකීමේ කැමැත්ත "**දර්ශන සංසර්ගය**" නම් වේ. අන්‍යයන් විසින් කරන ලද හෝ තමා විසින්ම කියන ලද පවසන ලද සිනාසෙන හඬ ඇසීමේ කැමැත්ත "**ශ්‍රවණ සංසර්ගය**" නම් වේ. ඔවුනොවුන් ගේ ශරීර ස්පර්ශ කිරීමෙහි කැමැත්ත "**කාය සංසර්ගය**" නම් වේ. ඔවුනොවුන් හා කථා කිරීමේ කැමැත්ත "**සමුල්ලපන සංසර්ගය**" නම් වේ. ඔවුනොවුන් ගේ වස්තු උපකරණ පරිභොග කිරීමේ කැමැත්ත "**සම්භොග සංසර්ගය**" නම් වේ. මෙලෙස මේ පස් වැදෑරුම් සංසර්ගයන්ට කැමැති බව එහි යෙදෙන බව **සංසර්ගකාමතාව** නම් වේ.

27. අගරු = **ගරු නොකිරීම** යි. අගෞරව සයකි. ඒවා මෙසේය.

i. **සත්ථරි** අගාරවො = ශාස්තෲන් වහන්සේ ජීවමාන කල්හි දවසට තෙවරක් උපස්ථානයට නොයාම, ශාස්තෲන් වහන්සේ පාවහන් නැතිව සක්මන් කරන විට පාවහන් සහිතව සක්මන් කිරීම, ශාස්තෲන් වහන්සේ පහත් තැනක සක්මන් කරන විට උස් තැනක සක්මන් කිරීම, ශාස්තෲන් වහන්සේ පහත් තැනක වැඩ හිඳින විට උස් තැනක විසීම, ශාස්තෲන් වහන්සේ පෙනෙන තැන දෙවුර වසා පොරවා සිටීම, කුඩ ඉසලීම, වහන් පයලා සිටීම, නෑම, මල මුත්‍ර පහ කිරීම ශාස්තෲන් වහන්සේට කරන අගෞරවයෝ ය. ශාස්තෲන් වහන්සේ පිරිනිවීමෙන් පසුව ද දවසට තුන්වරක් විහාරයට නොයාම, චෛත්‍ය ‑බෝධිය පෙනෙන තැන්හි කුඩ ඉහලා වහන් පයලා යාම, දෙවුර වසා පොරවා හැසිරීම, මල මුත්‍ර කිරීම, සෑ මලු, බෝ මලුවල කෙළ ගැසීම යන මේවා ශාස්තෲන් වහන්සේට කරන අගෞරවයන්ම ය.

ii. **ධම්මෙ අගාරවො** = ධර්මශ්‍රවණයට ආරාධනා කළ කල්හි යා හැකිව තිබියදී නොයාම, ගිය ද ගෞරවයෙන් ධර්මය නො ඇසීම, ධර්ම දේශනය කරන විට සිහි මුලාව සිටීම, කථා කරමින් සිටීම, ධර්මයට කරන අගෞරවයෝ ය.

iii. **සඞ්ඝෙ අගාරවො** = සංඝ ස්ථවිරයන් වහන්සේ ගේ ආරාධනාවක්

අවසරයක් නැතිව සඟ මැද දහම් දෙසීම, එසේම ප්‍රශ්න විසඳීම, වැඩිහිටි භික්ෂූන් ගේ කයෙහි ගැටෙමින් යාම, සිටීම, හිඳීම, සඟ මැද දෙවුර වසා පොරවා සිටීම, කුඩ පාවහන් දරා සිටීම, සංඝයාට කරන අගෞරවයෝ ය. සංඝයාට අයත් එක් භික්ෂුවකට වුව ද අගෞරව කරන්නේ ද එය සංඝයාට කරන අගෞරවයක්ම වේ.

iv. **සික්ඛාය අගාරවො** = සීල සමාධි ප්‍රඥා යන ත්‍රී ශික්ෂාවන් නොපිරීම **ශික්ෂා අගෞරවය** නම් වේ.

v. **අප්පමාදෙ අගාරවො** = අප්‍රමාදය ගැන නොසිතීම කුසලධර්මයන්හි නොයෙදීම **අප්‍රමාදයෙහි අගෞරවය** යි.

vi. **පටිසන්ථාරෙ අගාරවො** = මෙහි පටිසන්ථාර යනු **පිළිසඳර** හෙවත් **සංග්‍රහය** යි. එය "**ආමිස පිළිසඳර, ධර්ම පිළිසඳර**" යැයි දෙවැදෑරුම් වේ. එහි තමා වෙත පැමිණෙන දුගී මගී යාචකාදීන්ට ද, සිල්වත් ගුණවත් උතුමන්ට ද ආහාර පාන වස්ත්‍රාදියෙන් ද, සතුටු සාමීචිව කථා කිරීමෙන් ද කරන සංග්‍රහය "**ආමිස පිළිසඳර**" නම් වේ. තමන් දන උගත් ධර්මය, ශාස්ත්‍රය මනාකොට අන්‍යයන්ට ලබාදීම ඉගැන්වීම අවවාද අනුශාසනා කිරීම "**ධර්ම පිළිසඳර**" නම් වේ. මෙසේ නොකිරීම **පිළිසඳරෙහි අගෞරවය** යි.

28. **ඉත්ථි දස්සනකාමතා** = ස්ත්‍රීන්ගේ ගමන් බිමන් ශරීරාලංකාරය ශරීරාවයව නිතර දකිනු බලනු කැමැත්ත යි.

29. **ඉස්සා** = අන්‍යයන්ගේ රූප සම්පත්, ධනය, සැපය, කීර්තිය, ලාභ සත්කාරාදී සම්පත් නොයිවසන ඒවාට විරුද්ධ බව වූ **ඊෂ්‍යාව** යි.

30. **උපනාහ** = බද්ධ වෛරය **උපනාහය** නම් වේ. මෙයින් අප්‍රියයන්ට සතුරුකම් හිරිහැර කිරීමාදියෙන් සීලයට හානි වේ.

31. **මක්ඛ** = ගුණමකු බව **මක්ඛ** නම් වේ. මෙයින් සිල්වතුන්ගේ ගුණවතුන්ගේ සීලගුණ ද, උපකාර කළවුන්ගේ කළගුණ අමතක කිරීම අවලංගු කිරීම මකා දැමීම ද සිදු වේ.

32. **අජාගරතා** = **නිදි තොර නොකිරීම** යි. මෙයින් නිද නොගතයුතු කාලය වූ දහවල ද, රාත්‍රියෙහි ප්‍රථම යාමය වූ ප.ව. 6.00 සිට රාත්‍රී 10.00 දක්වා ද, පශ්චිම යාමය වූ රාත්‍රී 2.00 සිට අළුයම දක්වා ද වූ කාලයන්හි නිදගැනීම කියැවේ. නිදගත යුතු කාලය රාත්‍රියෙහි

මධ්‍යම යාමය වූ රාත්‍රී 10.00 සිට රාත්‍රී 2.00 දක්වා කාලයයි. මේ කාලය හැර අන් කාලයන්හි නිදගැනීම පරිහානිකර ධර්‍මයක් වේ. මෙය උත්කෘෂ්ට පරිච්ඡේදයෙනි.

33. **භොජනෙ අමත්තඤ්ඤුතා = පමණ නොදන ආහාර ගැනීම** යි. ආසාවන් බහුල නොකොට යැපිය හැකි පමණ සළකා ආහාර ගත යුතු ය.

34. **අභාවනච්ඡන්දතා** = සමථ විදර්ශනා භාවනා කිරීමට ඇති අකමැති බව හා එය නොකිරීම යි.

## ☸ ආශ්‍රිත ග්‍රන්ථ:-


| | |
|---|---|
| දීඝ නිකාය - 3 බු: ජ: මුද්‍රණය | බෞ: සං: මධ්‍යස්ථානය |
| මජ්ඣිම නිකාය III | " |
| සංයුත්ත නිකාය මහා වර්‍ගය | " |
| අංගු : නි: I බු ජ මුද්‍රණය | " |
| සම: පාසාදිකා විනයට්ඨකථා II සිංහල පරි: | " |
| මජ්ඣිමනිකායට්ඨකථා IV | " |
| අංගුත්තරනිකායට්ඨකථා I සිංහල පරි: | " |
| අංගුත්තරනිකාය ටීකාව පාලි සිංහල | " |
| විශුද්ධි මාර්‍ගය " | " |
| සද්ධර්‍ම සාගර ධම්මපද වර්‍ණනාව | අම්බ: ධම්මකුසල නා හිමි |
| බුද්ධ චරිතය | බ: ආනන්දමෛත්‍රෙය නාහිමි. |
| සූවිසි මහ ගුණය | රේරු: චන්දවිමල නා හිමි |
| පොහොය දිනය | " |
| පාලි සිංහල ශබ්දකෝෂය | මඩිතියවෙල සුමංගල හිමි |
| අභිධර්‍මාර්‍ථ ප්‍රදීපිකාව | අමරදස රත්නපාල මහත්මා |
| මහා සිංහල ශබ්දකෝෂය | හරිස්චන්ද්‍ර විජේතුංග මහත්මා |
| සාමඤ්ඤ ඵල සූත්‍රය | නි: ගුණරතන හිමි. |
| තෙරුවන් සරණ යාම | " |